ශ්‍රී ලංකාවේ යාචකයා



නන්දසේන රත්නපාල

ශ්‍රී ලංකාවේ යාචකයා

නන්දසේන රත්නපාල

ආරිය ප්‍රකාශකයෝ
බෞද්ධ විද්‍යාලය මාවත
වරකපොල

www.facebook.com/KiyawannaPdf

පිළිගැන්වීම

මේ පර්යේෂණය කරන්නට මුල් පියවර දැමූ අප හිතාදර සහෝදර කතිකාචාර්ය අභාවප්‍රාප්ත කේ. ජ්. ධර්මදස පෙරේරාණන්ගේ නාමයට හා මගේ ආදරණීය යාචක මිතුරු මිතුරියනට

www.facebook.com/KiyawannaPdf

පෙරවදන

මා හිඟන්නන් ගැන කළ පර්යේෂණයේ ප්‍රතිඵල මුලින් ම මීට දසවසර දෙකකට පමණ පෙර ඉහතදී ඉංග්‍රීසියෙන් පළවිය. මගේ ඒ ග්‍රන්ථයේ (The Beggar in Sri Lanka) හතරවැනි මුද්‍රණය මේ වර්ෂයේදී නිකුත්විණ.

බොහෝ දෙනා මේ ග්‍රන්ථය සිංහලෙන් පළකරන්නට මට කීහ. මම පරිවර්තන කලාව ගැන කිසිවක් නො දනිමි. පොතක් පරිවර්තනය කරන්නට කුශලතා මට නැත. මම ඒ කාරියෙන් රසයක්ද නොලබමි.

මට ලැබුන නිවාඩුවක දී මා කළේ මගේ පරණ අත්දැකීම් සිංහලෙන් ලිවීමය. ඉංග්‍රීසි පොතේ ආකෘතිය ඉතා පළල්ව අනුගමනය කළත් මේ පොත අමුතුවෙන්ම රචනා කළ සිංහල ග්‍රන්ථයකි. මම සිංහලෙන් සිතා සිංහලෙන් අලුත් පොතක් ලීවෙමි. එසේ ලිවීමෙන් නොමඳ රසාස්වාදයක්ද ලබා ගතිමි. මා එද සිට මෙද දක්වා අලුතින් ලද දැනනුවණ හා අත්දැකීම් නිසා ග්‍රන්ථයේ එන කරුණු පෙරට වඩා තවත් ආලෝකමත් කිරීමට හැකිවිය. ඉංග්‍රීසි ග්‍රන්ථයෙන් මා සමාජ විද්‍යා හා මානවවිද්‍යා ලෝකයට පළමුවෙන් හඳුන්වා දුන් ජීවන අත්දැකීම් ක්‍රමය මේ කාලය තුල තවදුරටත් වැඩි දියුණු කොට ඉන් පලේ ප්‍රයෝජන ගැනීමට මට හැකිවිය.

මගේ ඉංග්‍රීසි පොත පළවූ විට ලෝකයේ සෑම ප්‍රධාන රටකම පාහේ ශාස්ත්‍රීය සංග්‍රහ, සන්නිවේදන මාධ්‍ය හා වෙනත් අංශවලින් ඊට මහත් ප්‍රසිද්ධියක් ලබා දෙන ලදී. සමාජ විද්‍යා/මානව විද්‍යා පර්යේෂකයෙක් හැටියට මා ජාත්‍යන්තර අවධානයට ලක්වූයේ මේ ග්‍රන්ථයෙනි. මම මේ සියල්ල ගැන මට ආධාර වූ හැමදෙනාටම කෘතඥවෙමි.

මෙබඳු ග්‍රන්ථයක් සිංහල පාඨකයාට කියවන්නට හැකිවූයේ විශාල වියදමක් දරා මේ පොත මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කරන්නට පරිත්‍යාගශීලී ලෙස ඉදිරිපත් වූ ආරිය ප්‍රකාශකයන් නිසා ය. මගේ අවංක ස්තුතිය හා ඉමහත් කෘතඥතාව ඒ නිසා ආරියපාල ඉඹුල්දෙනිය හිතවතාණන්ට හිමි වෙයි.

මේ ග්‍රන්ථය කියවන ඔබ මින් රසක් වින්දොත්, දැනනුවණ දියුණු කරගතහොත්, ඒ සියල්ලටම වඩා ඉමහත් ද්‍රූකට පත් අපේ යාචක පරපුර ගැන අවබෝධය මුල්කරගත් අනුකම්පාවක් ඇතිකර ගත්තොත් පොත ලිවීමේ මගේ පරමාර්ථය ඉත් සපුරා ඉෂ්ටවන්නේය.

මහාචාර්ය නන්දසේන රත්නපාල.

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
නුගේගොඩ.

තුන්වනවන මුද්‍රණයට හැඳින්වීම

"ශ්‍රී ලංකාවේ යාචකයා" පොතේ තෙවැනි මුද්‍රණයට වචනයක් සැපයීමට හැකිවීම ප්‍රීතියට කරුණකි. අද වනවිට මේ පොත කළ අවදියට වඩා යාචකයන්ගේ ප්‍රමාණය වර්ධනය වී ඇත. එහෙත් ක්‍රමානුකූලව ගණන් බැලීමක් නොමැති නිසා ඒ ගැන යමක් නොකියමි. මේ පොතේ දක්වා ඇති කරුණු අදත් යාචක සමාජයට සුවිශේෂය. ඒවායින් ඒ සමාජය ගැන මනා අවබෝධයක් ලබා ගත හැකිය. මා විඳ ලබා ගත් අත්දැකීම් නිසා කරුණු එකතු කරන්නට හැකි විය. ඒවා ඔබට ප්‍රයෝජනවත් වෙතැයි සිතමි.

නන්දසේන රත්නපාල

හැඳින්වීම

යාචකයා කියන්නේ කාටද? අපේ පැරණි පොත්වල නම් 'දුගී-මගී-යාචක' යන වචන තුන දක්නට ලැබෙන්නේ එකටය. මින් අදහස් වූයේ මේ තුන් ගණයම එකක් බවද? නොඑසේනම් එකට එක ළඟ කොටස් තුනක් බවද?

යාචකයා හෝ හිඟන්නා නම් හිඟාකන, ඉල්ලාගෙන කන, ඒ හිඟාකෑම තම වෘත්තිය කරගත් තැනැත්තාය. ඒ අය මේ වෘත්තිය ඉබේම හෝ ක්‍රමවත් ලෙස උගෙන ගනිති. ගැහැනු - පිරිමි හෝ වයස, ජාති, කුල, ගෝත්‍ර භේදයක් නැතිව සමූහ වශයෙන් හෝ විටෙක තනිව මේ කටයුත්තේ යෙදෙති.

මගියා කියන්නේ, ඉස්සර කාලේනම් බොහෝම කටයුත්තකට හෝ මාර්ගයට පිළිපන් තැනැත්තාය. බොහෝවිට මගියන් වූයේ වන්දනාමාන, බාරහාර කටයුතුවලට එහාමෙහා ගමන් කළ අයයි. 'කිය මගිය එතුකොහි සිට, දද, යමහල ගොයිනා යන්හොත් යමහල කාරුණාකරත්තාට ගිය මගියෙකු ගැන අපේ පැරණි කවි පොතක කියැවේ.

පෙරකාලවලදී මොනම කටයුත්තකට හෝ මගට බැස්ස තැනැත්තාට ආධාර උපකාර කළේ ඔහු යනඑන මාර්ගය අසල ජීවත්වූ අයයි. විශේෂයෙන්ම වන්දනා ගමන් ගිය අයට ආහාරපාන ලබාදීම පින් ලැබෙන කටයුත්තක් ලෙස අපේ පැරැන්නෝ කල්පනා කළහ. ආගමික අර්ථයක් ,පරමාර්ථයක් ඇතිව මගට බැස්සත්, නැතත් ඒ තැනැත්තාට ආහාරපාන ගැනීමට තේ කෝපි කඩ,හෝටල් හෝ වෙනත් එවන් සංස්ථා එකල තිබුණේ නැත. ඒ නිසාම මගට බැස්ස කවිරුන් හෝ මගියෙකුවූ අතර, ඒ මගියා පාරෙහි යන එන තාක්, අනුන්ගෙන් යැපෙන එක්තරා විදිහක හිඟන්නෙකි.

දුගියා විටෙක අනුන්ගෙන් ඉල්ලයි: තවත් විටක නොඉල්ලා යමක් දුන්නොත් ගනියි. අප අද පුලන්නන් කියන්නේ යමක් කෙලින්ම නොඉල්ලන දුගී අයටයි. දුගී අය විටෙක කෙනෙක් බඩගින්නේ හිටියත් අනුන්ගෙන් යමක් නොඉල්ලන්නේ, අනුන්ට අත නොපාන්නේත් තමන් සතුවූ ආත්ම ගෞරවය නිසාය. ඒ කෙසේවුවත් ඔවුන් යාචක ගණයට ඉතා සමීපවන පිරිසක් බව කිව යුතු නැත.

අපේ පැරණි පතපොතවල යාචක වර්ග දහසයක් ගැන කියැවේ. ඒ සොළොස නම්, කථික, පඨික, පෞරාණික, තාර්කික, ගමික, වාදික, චක, මූක, භට, නට, බන්දී, අන්ධ, බධිර, පඞ්ගු, ගිලාන හා දීන යන වර්ගයි. මින් 'පඨික' හා 'ගමික' මගී ගණයට නොවැටෙන්නේද? අපේ අදහසේ හැටියට වන්දනා මාන

කතා හෝ වෙනත් පරමාර්ථයක් ඇතිව මහමගට බැස දීර්ඝ ගමන් යන්නා 'පථික' යෙකි. සමීප ගම්වල දන්නා අඳුනන අය වසන ප්‍රදේශවල සැරිසරන, දුරගමන් නොයන්නා (සමහරවිට) නගරවලට නොගොස් ගම්වලට පමණක් තම සංචාරය සීමා කරන්නා 'ගමික' නමින් හැඳින්වියැයි සිතේ.

මේ 16 වර්ගය ගැන නිශ්චිත තොරතුරු කියන මූලාශ්‍ර තවම අපට හමුව නැත. 'කථික' යන යාචක කොටස කතාවේ බලයෙන්, මුඛරිකමින් මිනිසුන් සන්තෝෂ කොට යමක් උපයා ගන්නා අය වන්නේය. අදත් යාචකයන් අතර කටේ බලයෙන් මුදල් උපයන හැනැත්තෝ වෙති. 'පෞරාණික' යනු වයසට ගිය හැනැත්තන්ද? වයස වැඩිකම නිසාම යමක් කරකියාගත නොහැකි අය නිකම්ම අනුන්ගෙන් යැපෙන්නෝ වෙති. ඒ අයට සමාජය ගරු කළේ ආගමික පූජකයන්ට මෙනි.

'තාර්කික' යනු විවිධ උප්පරවැට් යොදා විශ්වාසය දිනාගෙන යමක් ලබාගන්නා අයද? මේ අයගේ දක්ෂතම තර්කයයි. ඈත කාලයේ විවිධ දර්ශන, ආගම් මතවාද දැරූ අය තර්ක කරමින් රටපුරා එහාමෙහා ගිය බව කියැවේ. මේ අය වුවද යැපුනේ අනුන් දෙන මුදලින් හා ආහාරපාන වලිනි. මෑත කාලයේද මා දන්නා යාචකයන් කීපදෙනෙක් රටපුරා ගියේ මෙවන් 'තාර්කික' කටයුතුවලටය. නිවසකට ගොස් එහි ගෘහමූලිකයා හෝ වෙනත් වැඩිහිටියෙකු සමග සාකච්ඡා කරන ඔවුහු තර්කය ආයුධයට ගනිති. සමහරවිට අතබලා හිමිනි අල්ලා ශාස්ත්‍ර කියති. අසන්නාගේ හිත නොරිදවා තක්සේරුනම් තමන්ට අවශ්‍ය දේ ලබාගනිති. විශ්වාස ඇදහිලි උගන්වති.

වාදික, යනු පොල්කටුවීණාවක් හෝ වාදනය කරමින්, ඒ සංගීත භාණ්ඩ වාදනය ඔස්සේ යමක් උපයාගන්නා යාචකයායි. අදත් එවැනි යාචකයන් අප අතර දක්නට ලැබේ. 'වන' යනු 'නැකි ලෙඩ පෙන්වීම්' ආදියෙන් අනුන් රවටා හිඟාකන හැනැත්තාය. 'මුක' කියන්නේ ගොළු හිඟන්නාන්ටය. 'භට' යනු කවරේදැයි පැහැදිලිව කිව නොහේ. යුද්ධයට ගොස් අතපය කැඩිබිඳී ගිය, හිඟන තත්වයට පත්වූ යාචක සෙබළෙක්ද? 'භට' යනු රාත්‍රියෙහි හැසිරෙන යන අර්ථයද ඇති නිසා පැරණි කාලයේ මොවුන් හිඟාකෑවේ. නියමිත ස්ථානවල, රාත්‍රියේදී පමණයිද? (අදත් නිශාචර හිඟන්නන් සිටින බව මබ අමතක නොකළ යුතුය.)

'නට' යනු නළුවන් මෙන් විවිධ වෙස් ගෙන අනුන්ගෙන් හිඟාකන අයද? අදත් බොරුකකුල් කරුවන් හෝ නැට්ටුවන් මෙන් හැඳගෙන විකාර කරමින් යමක් උපයා ගන්නා පුද්ගලයන් දක්නට ලැබේ. 'ඛඤ්ජ' යනු කොර හිඟන විශේෂයකි: 'අන්ධ' යනු ඇස් අන්ධවූ අයයි: බධිර යනු බිහිරන්ය. 'පඞ්ගු' යනුවෙන් අදහස් වන්නේ අතපය කොර අයයි. නමුත් කලින් කී ඛඤ්ජ යන්නද, කොරුන් නම් මේ දෙකොටස අතර ව්‍යවහාරික වෙනසක් තිබිය යුතුය. රෝගාබාධ නිසා කොරවූ අය 'පඞ්ගු' ගණයටත්, වෙනත් යම්කිසි අතුරු අන්තරාවකින් අතපය කැඩුනු අය 'ඛඤ්ජ' ගණයටත් ගැනිනිද?

'ගිලාන' යනු වයසට ගිය, ඒ නිසාම ලෙඩ දුකින් පෙළෙන අය වන්නාහ. කලින් සඳහන් කළ 'පෞරාණික' ගණයේ යාචකයන් වයෝවෘද්ධ උදවිය, වයස නිසා කිසිවක් කරකියාගත නොහැකි අය වෙති. 'ගිලාන' යනු වයසත් සමග පුවකල්

නොහැකි රෝගාබාධ වලින් පෙළෙන්නාන්ය. 'දීන' යන අවසාන කොටස විවිධ පහත් සමාජ කොටස්වල උපදීම නිසා යාචක ගණයට දැමුණු හැනැත්තන්ය. ගෝම්ස් කෑම නිසා රජකුමරිය වුවත් සැඩොල් කුලයට ඇද දැමුණු බව අපේ ජනකතාවල එයි. සැඩොල් කුලයේ අය තමන් හඳුන්වන්නේ 'ඉල්ලාගන' කන චණ්ඩාලයන් ලෙසය.

අපේ අතීත සමාජය යාචක නමට විවරණයක් දී ඇත්තේ කෙතරම් පළල් ආකාරයකටද කියා ඔබට මින් වැටහෙයි. 'යාචක' නම කවරදාකවත් නිග්‍රහයක්, අවමානයක් හැටියට යොදා ගැනීම එකල සිදුවී නැත. බෞද්ධ භික්ෂූන් වහන්සේ පවා ගෙන්ගෙට පිඩු සිඟා වඩිමින් සිව්පසය ලබාගත්තේද එක්තරා අන්දමක යාචක වෘත්තියක් අනුගමනය කරමිනි. ආගමික අර්ථයක් ඇතිව කවිරුන් හෝ සිඟමනෙහි යෙදුනොත් ඒ අයට සැලකීම අපේ උසස් ගුණාංගයක් විය. ඒ අය කවර ආගම දහමකට අයත් වුවත්, සමාජය ඒ අයට සැලකුවේ ආධ්‍යාත්මික ගුණවගාවක් තිබෙන අය හැටියටය.

සමාජයේ සමහර කොටස් අනුන්ගෙන් යැපිය යුතු යැයි එකල සමාජය පිළිගත්තේය. ආගමික කොටස්වලට සැලකීමෙන් විශේෂ පිනක්දහමක් කරගැනීමට ඔවුන්ට හැකිවිණ. වයස ගිය අය, විවිධ අසනීපවලට ගොදුරුවූවන්, කාගේවත් පිහිටක් නැති අය සඳහා සමාජය පිහිටවිය යුතුය යන විශ්වාසය අපගේ පැරැණියන් තුළ දක්නට ලැබිණ. ඒ අයට පිහිටවීම එක් අතකින් තමන්ට 'පින්' ලබාදෙයි. අනික් අතට ඒ අයට කරදරයක් නැතිව සමාජයේ ජීවත්වීමට මඟ පාදයි.

'පින්' යන සංකල්පය තේරුම් නොගෙන අපේ සමාජයේ යාචකයාගේ කාර්යභාරය වටහාගත නොහැකිය. 'පින' බැංකුවක එකතුවන මුදල් මෙන්, කුසල් ක්‍රියාවක් කළ තැනැත්තා වෙනුවෙන් එකතුවෙයි. අපේ රජවරු මහවැව්, වාරිමාර්ග, දාගැබ්, පන්සල්, ආරාම, පිරිවෙන් ආදී දේ ගොඩනැංවීම සඳහා මහත් සේ වෙහෙසුනේ මේ පින තකාගෙනය. දීර්ඝවූ සංසාර ගමනේදී 'මහවැටුප්' වන්නේ තමන් එකතුකරගත් මේ පිනය. පින වර්ධනය වන්නේ එය හැකිතාක් අය සමග අනුමෝදන් කළවිටය. අන්‍යයන් ඒ සඳහා සහභාගී කරගත් විටය. (බලන්න. *Nandasena Ratnapala 1986, 66-71*)

අපේ මිනිසුන් යාචකයන්ට මුදල්හදල්, ආහාරපාන, ලබාදීමට පෙළඹුනේ මේ පින් සංකල්පය නිසාය. 'පින' යහපත් කර්මයක් නිසා ඇතිකරගත හැකිය. එයට මුල සිතෙහි ඇතිවන චෛතසිකයන්ය.

අප යාචකයන්ට යමක් දෙන්නේ පින ලබාගැනීම සඳහා බව සත්‍යයකි. නමුත් යාචකයාගේ ස්වභාවය - ඔහුගේ අසනීපයේ, තුවාලයේ, කිරපතල බව - 'පින' වැඩි කරන්නට කිසිසේත් හේතු නොවෙයි. මහාචාර්ය රැල්ෆ් පීරිස් යාචකයන් ගැන කතා කරන විට සඳහන් කළේ අපේරටේ යාචකයන් වර්ධනය වන්නේ 'පින' පිළිබඳ මේ සංකල්පය නිසා බවය. යාචකයන්ගේ තුවාලවල භයානකබව, අබිබිගාතබව වැඩිවන තරමට අප කරන පිනත් වැඩිවන බව අපේ විශ්වාසය බව ඔහු සඳහන් කරයි.

"සමහර සංස්කෘතිවල හිඟාකෑම සමාජ වෘත්තියකි. (ශ්‍රී ලංකාවේ රොඩී පිරිස සාම්ප්‍රදායික වශයෙන් හිඟාකන අය බව පිළිගෙන ඇත.) දුගීයන්ට දෙන දානය (බෞද්ධ රටවල නම් භික්ෂූන් වහන්සේට) අනාගත ජීවිතයේදී කෙනෙකුට පින් ලබාදෙන බව කියවේ. ඒ නිසාම සංස්කෘතික ජනාචාරයක් මගින් යාචකයාගේ වර්ධනයට අනුබල දී තිබේ." (රැල්ෆ් පීරිස් 1977, 45)

මහාචාර්යවරයාගේ මේ මතය කෙතෙරම් සදොස්දැයි වටහා ගැනීමට ඔබට එතරම් දුර යායුතු නැත. යාචකයන් හා බෞද්ධ භික්ෂූන් වහන්සේ සමාන කිරීමට කළ නොහැකිය. උන්වහන්සේට දානමාන කිරීමෙන් ලැබෙන පින, යාචකයෙකුට ආහාර පාන, මුදල් දීමෙන් ලබාගන්නා 'පිනට' සමාන නොවේ. අපේ සංස්කෘතියේ හිඟාකෑම සමාජ - අනුමත වෘත්තියක් ලෙස සැලකීම කළේයැයි ප්‍රකාශ කිරීම බොහෝ ප්‍රවේශමෙන් පැමිණිය යුතු නිගමනයකි. සමස්තයක් වශයෙන් සමාජය හා සංස්කෘතිය ගැන නොතකා මෙවන් නිගමනයකට පැමිණිය නොහැක. යහපත් කුසල කර්මයක් සිදුකළ විට ඉන් ලැබෙන පින උදෙක් ඊළඟ ආත්මයේදී පමණක් පලදෙන්නක් නොවේ. 'පින' මේ ආත්මයේදීත් පලදිය හැකිය. අපේ මේ 'පින් සංකල්පය නිසා යාචකයන්ගේ සංඛ්‍යාවේ වර්ධනයට ලැබුනු පිටුවහල කුමක්දැයි අපට නම් වැටහෙන්නේ නැත.

මහාචාර්යතුමා මේ කාරණය තවත් විස්තර කරමින් මෙසේ පවසයි.' '......අත්පා කැඩුණු බිඳුණු, පැසවා ගිය වණ පිළිකා ඇති යාචකයෝ පදික වේදිකාවලත්, ප්‍රසිද්ධ ස්ථානවලත්, පන්සල් අවටත් දක්නට ඇත. ශාරීරික විකෘතියේ බරපතලකම වැඩිවන තරමට තමන්ට වැළඳුනාවූ රෝගයේ බරපතලකම, දුගීබවේ බර වැඩි වූ තරමට එවන් අයට ආධාර කරන අය කරගන්නා පිනද වැඩිවන්නේය."

අප කලින් කීවාසේ බුදුදහමේ දැක්වෙන අන්දමට 'පින' වැඩිවන්නේ චේතනාවේ ස්වභාවය අනුවය. යාචකයාගේ අබල දුබල ස්වභාවය, ඔහුට වැළඳුන අසනීපයේ භයානකකම, ඔහුගේ ශරීරයේ ඇති තුවාලයේ බරපතලකම අනුව අප කරන 'පින' වැඩිවන්නේ නැත. මෙබඳු විශ්වාසයක් අප සමාජයේ-විශේෂයෙන් බෞද්ධයන් තුල පවත්නා නිසා- යාචකයන් වර්ධනය වීම සිදුවන බව පැවසීම සදොස් මතයකි.

අපේ පැරණි සමාජයේ 'යාචක' යන නම විවිධ ආකාර අර්ථ ඇතිව ප්‍රයෝජනයට ගත් වග අපි දුටුවෙමු. පළමුවෙන්ම බෞද්ධ භික්ෂූන්වහන්සේ හෝ වෙනත් ආගමික පූජකවරයෙක් භික්ෂාවෙන් යැපෙන බව සැබෑ. නමුත් ඒ අයට කවදාවත් යාචකයා, හිඟන්නා කියා ව්‍යවහාර වූයේ නැත. හාමුදුරුවරුන්ට යමක් 'හිඟමනක්' වශයෙන් දෙන සිරිතක් නැත. අපි උන්වහන්සේලාට යමක් පූජාකරමු. ගෞරවයත්, භක්තියත් අප තුල එවිට පිහිටා ඇත. එවන් ක්‍රියාවකත්, හිඟන්නාට දෙන හිඟමනත් අතර වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම බලවත් වෙනසක් ඇත.

පැරණි පෝසතුන් තමන්ගේ ධනය හිටිහැටියේ දන්දුන් බව අපේ ජනශ්‍රැතියේ එයි. මේ දන් ගන්නට බොහෝ අය පැමිණෙති. ඒ අය දුගී අයද, දුගී නොවන අයද සිටින්නට ඇත. නමුත් තාවකාලිකව අනුන්ගෙන් යමක් ලබන මේ අයට පවා අප යාචකයන් කීවේ නැත.

මහලු දෙමව්පියන් හෝ වැඩිමහලු සහෝදර සහෝදරියන් රැකබලා ගැනීම අපේ පැරණි සමාජයේ වැදගත් කාර්යභාරයක් විය. නමුත් සමහර අවස්ථාවලදී එවැන්නන් රැකබලාගැනීමට කවිරුත් සිටියේ නැත. මහලු දෙමව්පියන් හෝ නෑසියන් රැකීම සමාජය පිළිගත්, විශේෂයෙන් බෞද්ධයන් විසින් අවධාරණය කරනු ලැබූ ගණාචාරයක් විය. වයසට පත් අය පන්සලක හෝ ආගමික ස්ථානයක නැවතී, පූජාවන් වැඩපොලත් කරමින් විවේකීව ජීවත්වූ අවස්ථාද තිබිණ.

මේ කිසිවක් කරකියාගත නොහැකි වයසට ගිය (1) වයස නිසාම අබලන්වූ (2) වයසත් රෝගාබාධත් වැළඳුනු මහලු අය යාචකයන් ලෙස ජීවත්වීම සමාජ අනුමත කළ ගණාචාරයක් විය. ඒ අයට ආහාරපාන, වස්ත්‍ර ලබාදීම සඳහා මිනිස්සු බලවත් උනන්දුවක් දැක්වූහ. ඒ හැරෙන්නට ශාරීරික ආබාධ නිසා යමක් කරකියාගත නොහැකි අයටද මුලුමහත් සමාජයේම ආධාරය ලැබිය යුතුයැයි විශ්වාස කරන ලදී.

මින් එහා යාචක වෘත්තියේ නියැලුණු පැරණි අය තමන් යාචකයන් ලෙස යමක් ඉල්ලා ගැනීමට වඩා උපයා ගැනීමට උනන්දු වූහ. කතන්දරකීම, අත් බැලීම, අනාගතය කීම, සිංදු කීම, සංගීත භාණ්ඩ වාදනය කිරීම ඒ අයගේ සිරිත විය. තමන් සතු දක්ෂතාවක් විදහාපාමින් යමක් හොයාගන්නන් අයට යමක් දීම පිනකට වඩා, ඒ අය තමන් තුල ඇතිකළාවූ පහන් හැඟීම උදෙසා පෙරළා කරන කෘතඥතා - පාදක ක්‍රියාවක් බව මිනිස්සු විශ්වාස කළහ. සමහරවිට ශරීරයේ පවත්නා බාධකයක් ඇතිවත්, මනාව සංගීත භාණ්ඩයක් වාදනය කරන තැනැත්තා කෙරෙහි වැඩි ප්‍රසාදයක් අසන්නා තුල ඇතිවිය හැකිය.

අපේ සමාජය හා සංස්කෘතිය යාචක වෘත්තිය හෝ හිඟාකෑම ගණාචාරයක් (Mores) හැටියට අනුමත කළේ කුමන ආකාරයෙන්දැයි, කිනම් අවස්ථාවලදී දැයි ඔබට පැහැදිලිය. නූතන යුගයේ ජීවත්වන යාචකයන් මේ රටේ පහළවූයේ අපේ සංස්කෘතියේ පවත්නා, විශේෂයෙන් බුද්ධදහම නිසා අප උරුමකරගත්, ගණාචාර නිසා බව ප්‍රකාශ කිරීම අසත්‍යයකි. නූතන යාචක සංඛ්‍යාව වර්ධනය වීමට හේතුභූතවූ විවිධ කාරණා ගැන මේ ග්‍රන්ථයේ වෙනම පරිච්ඡේදයකදී සාකච්ඡා වෙයි.

යාචක ජීවිතය ඉතා සංකීර්ණ එකකි. පැහෙන කාලයක් යාචකයන් සමග ජීවත්වීමෙන් මම එය අත්දැකීමි. මා දුටු යාචකයන්ගෙන් වැඩි දෙනෙක් තම යාචක වෘත්තිය කරන්නේ, අප හැම වෙනත් වෘත්තියක් කරන්නාවූ ආකාරයෙනි. ඔව්හු ඒ සඳහා ප්‍රමාණවත් පුහුණුවක් විධිමත්ව හෝ අවිධිමත්ව ලබති. යාචකකම, කම්මැලිකම නිසාම කරන කටයුත්තක් බව කීම බලවත් මුසාවකි. මහ අව්වේ පදික වේදිකාවක වාඩිවී, වතුර උගුරක් නොකබා එක් වාක්‍ය ඛණ්ඩයක් දවසක් පුරා නැවත නැවත කීම පමණක් වුවත් කෙතරම් දුෂ්කර ක්‍රියාවක්දැයි ඔබට වැටහෙන්නේ ඒ අත්දැකීම ඔබත් ලදොත් පමණි.

යාචකයා කවරෙක්ද? අපේ පැරණි සමාජයේ හා සංස්කෘතියේ ...
ලබාගත්තාවූ ස්ථානය කුමක්දැයි ඔබට දැන් වැටහෙනවා ඇත. වෙස්සන්තර
ජාතකය කියවා ඇත්නම් අපේ පැරණි සමාජය 'යාචකයා යනු කවරෙක්ද? ...
පිළිතුරක් හැටි තේරුම් ගන්නට අවස්ථාවක් ඔබට ලැබෙයි.

ඉසකෙස් පුපුරැටි තඹ	රැවුලායේ
පලේ හලේ ඇති නටිටොළු	ඩායේ
ඉගිල ඉසිරි සිටි ඉස්සෝරි	යායේ
පිරිතබ ගිලී ඇස් කදුසු	පූරායේ
වැහෙන පිරෙන දිය එකත්	කුණායේ
නාස දෙපිට කැටි සොවු	වගුරායේ
නිකට උල්ව සිටි මුක	දැලියායේ
කෙලකොළ බොල්ලැ දත්	කැටියායේ
බුලත් නොකෑකට කිරි	වටුලායේ
ටිවත් ඇඹිරි සිටි කන්	කොරියායේ
පිට නොල දත් තා බස	වෙවුලායේ
කැසින් තදව එන මුහ	ගැටයායේ
නහර ඉගිලි සිටි ඇට	සැකිලායේ
කිඹුල් පිටක් වැනි ගත	රළුවායේ
නිබඳ ඉගිල සිටි කොරල	සමායේ
බඩවක පිටවක උදර	මොටායේ
රැළුරු වියරු ගුණ අවගති	යායේ
ඇඳි රෙදි කඳවට දහර	ගසායේ
වේයන් කෑ දඬු වැනි	කලවායේ
දන උකු වාදම් දෙපය	කොරායේ
නැඹිරුව කොරලැති පය	බකලායේ
කෙන්ඩ ඉදිම සිටි පය	බරවායේ
නිය පිරිත්න ඇති පතුල්	කුනායේ
මෙවැනි ලකුණ ඇති ඒකා	යකායේ (549-553 පද)

පැරණි ප්‍රමාණික (*Standard*) යාචකයා මහලු මිනිසෙකි. ඔහු ...
අප්‍රසන්න පෙනුමක් ඇති, බරපතල රෝග කීපයකින් පෙළෙන්නෙකු විය ...
ඔහු ඉතා අපිරිසිදුය. වයස නිසාම එක දෙපුනෙකි. ඔහුට ඇඳගැනීමට ...
නැත. රැවුල තඹය, ඉසකෙස් පුපුරුවිය. ඇස කඳුලෙන් පිරී ඇත: ...
හිස්සොරිය;

පැරැණි සමාජයේ නූතන සමාජයේ මෙන් අතපය සවිබල ඇති තරුණ උදවියට, ළමයින්ට, ළපටින්හට හිඟාකෑමට තිබුණු ඉඩකඩ සීමාසහිතය. අනුන්ගෙන් අනුකම්පාව උපදවන්නට ගීයක් ගයන, කතාවක් කියන, නාණ්ඩියක් වයන, සාස්තරයක් කියන අය වුවත් අසාමාන්‍ය දුබලතාවකින් පෙළෙන්නෝ විය යුතුය. එළිඅත්තනගලු වංශයේ පාලම් ළඟ සාස්තර කී නැනැත්තා ඔබට මතකද?

" එදවුදු මත්තෙහි කරන ලද විශ්‍රාමශාලායෙහි හුන් නුවණැති, අන්ධ, බමුණු මහල්ලෙක් ඒ කුමාරවරුන්ගේ පතුල් ඔබන ශබ්දය අසා තමා විසින් මනාවූ දන්නාලද ලක්‍ෂණානුසාරයෙන් නුවණින් පරීක්‍ෂාකොට මොහු තුන්දෙනම සිංහල ද්වීපයෙහි පෘථිවීශ්වරවූ රාජ ඓශ්වර්යයට පැමිණෙත්'යි ශාලායෙහි හුන් සෙසු ජනයනට ප්‍රකාශ කොට කීයේ.." (20 81)

මෙවැනි අන්ධ මහලු බමුණන් තමන් දන්නා ශාස්ත්‍රය අනුව පලා පල ප්‍රකාශ කිරීම නිසා අවට ඒ අය අසා සිටි අය ඔවුන්ට නැගිබෝග ආහාර පාන දුන්හ. එය පැරැණි සමාජයේ පැවැති එක්තරා සමාජ අනුමත ගෞරවාන්විත යාචන ක්‍රමයක් විය. මෙවන් සමාජ අනුමත යාචක ක්‍රම එකල පිහිටීම, අද පවත්නා සමාජ අනුමත නොවන යාචක ක්‍රම හා සසඳ බැලිය යුතුය. සමාජ ක්‍රමයක් මගින් අනුමත යාචක ක්‍රම පවත්නා තෙනයන තාක් යාචක වෘත්තිය සමාජ පිලිලක් නොවන්නේය. ඒ අනුමතයෙන් බැහැරවීම හේතුවෙන් අද පහළ වී ඇති දීන වූ යාචක වෘත්තිය නිසා උද්ගත වූ සමාජ ප්‍රශ්නවල දින පළෙ ඔබට වටහාගැනීම දුෂ්කර නැත.

----

1 ක්‍රම විද්‍යාව

යාචකයන් පිළිබඳ පර්යේෂණයක් කරන්නට අප මුලින්ම තීරණය කළේ 1960 දීය. එවක මගේ මිත්‍ර කේ.ඒ.ඩී පෙරේරා මහතා විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව උගන්වමින් ආර්ථික විද්‍යා අංශයේ කටයුතු කළේය. කුඩා කාලයේ ඔහුත් මමත් පානදුරේ ශාන්ත ජෝන් විද්‍යාලයේ ඉගෙනීම කළෙමු. ඉක්බිති ඔහු තමාගේ වැඩිදුර ඉගෙනීම සඳහා කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුළුවිය: මම රාජකීය විද්‍යාලයට ඇතුල්වුනෙමි. අප දෙදෙනම යළිත් එකතුවූයේ උපාධි අපේක්ෂකයන් ලෙස ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේදීය.

පේරාදෙනියේ උගෙනීමෙන් පසු එහිම සහකාර කථිකාචාර්යවරුන් වී කලක් සිට ඉන් අනතුරුව 1960 දී විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ ගුරුවරුන් ලෙස කටයුතු කිරීමට අපට හැකිවිය. අවිවාහකයන්වූ අප එකල නැවැතී සිටියේ බත්තරමුල්ලේය. විවිධ පර්යේෂණ ගැන අත්හදා බැලූ අපට යාචකයන් ගැන සහභාගිත්ව නිරීක්ෂණය ප්‍රයෝජනයට ගෙන පර්යේෂණයක් කරන්නට අදහස් වූයේ මේ අවදියේය.

මහාචාර්ය මැලිනොවුස්කිගේ සහභාගීත්ව නිරීක්ෂණය ගැන ඔබ දනිතැයි හගිමි. තමා නිරීක්ෂණය කරන්නාන් නිරීක්ෂණ කිරීමට ලක්වන අයෙකු විලස නිරීක්ෂණය කිරීම සහභාගිත්ව නිරීක්ෂණයේ ලක්ෂණයයි. මහාචාර්ය මැලිනොවුස්කි ට්‍රොබියන්ඩ් දූපත්වල කාලයක් නැවතී සිටියේය. ඒ දූපතේ වැසියන්ගේ භාෂාව උගත්තේය. සංස්කෘතිය අවබෝධ කරගත්තේය. ඕවුන් සමඟ ජීවත්වෙමින් ඒ අය බලන හැටියටම ඔවුන්ගේ ජීවිතය නිරීක්ෂණය කළේය. (නන්දසේන රත්නපාල, 1995, 144-150 (නව මුද්‍රණය)

මහාචාර්ය මැලිනොවුස්කි මේ දූපතේ කාලයක් ජීවත්වීම නිසාත්, ඔහුට දූපත් වැසියන්ගේ භාෂාව පුරුදුවූ නිසාත්, ඒ අයගේ සමාජය හා සංස්කෘතිය ගැන හොඳහැටි දත් නිසාත්, තමන් පිටස්තරයෙකුයැයි ඔවුන්ට සමාජ කටයුතුවලදී නොහැඟෙන ලෙස කටයුතු කිරීමට ඔහුට හැකිවිය. සුදු හම තිබුනත් දවස දෙවේලේ කාලයක් දැක පුරුදු නිසා මේ තැනැත්තා තමන්ගේ රටට බාහිරින් පැමිණුන අමුත්තෙකැයි සිතන්නට ට්‍රෝබියන් දූපත් වාසීන් පෙළඹුනේ නැත. සහභාගීත්ව නිරීක්ෂණයේ වාසිය මෙයයි. නිරීක්ෂණයට ලක්වන්නන් තමන්ගේ ආගන්තුකකමින් අවදිනොකර, ඒ අයගේ වැඩ කටයුතු නිවිහැල්ලේ නිරීක්ෂණය කිරීමේ වාසනාව ඉන් පැදෙයි.

මේ අතර මැලිනොව්ස්කි තමා සමාජ විද්‍යාඥයෙක් (මානව විද්‍යාඥයෙ... බව අමතක කළේ නැත. තමා ලබාගත් විද්‍යාත්මක දැනීම හා පුහුණුව ... කෙරෙහි දිගටම විද්‍යාමාන විය. එය කාගෙන්වත් සඟවා තැබීමට ඔහුට ... නොවීණ. මිනිසුන් නිරීක්ෂණය කරන විට ඔහු මේ දැනීමෙන් හා නුවණින් ... ප්‍රයෝජනය ලැබීය. පිය වෙයින්ම සිට ට්‍රෝබියන් දූපත් වාසීන් නිරීක්ෂණ... කරන්නටත් ඒ දූපත් වාසීන් තමන් කරන කියන දෑ දිහා බලන හැටි හා ... හැටි අන්දකින්නටත් මහාචාර්ය මැලිනොව්ස්කිට පුළුවන් විය.

සහභාගීත්ව නිරීක්ෂණය සෑම පර්යේෂණයටම සුදුසු නැත. පර්යේෂණ... ස්වභාවය අනුව ඒ සඳහා දත්ත එකතුකිරීමට යොදාගන්නා උපක්‍රම වෙනස්... මිනිසුන් ඉතා සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය නම්, තමන්ගේ නිරීක්ෂණ... තමන් නිරීක්ෂණය කරන අයට බලපෑමක් සිදුවනු දැකීමට අකමැතිනම්, ... නිරීක්ෂණය කරන අයගේ දෘෂ්ටි කෝණයෙන්ම ඔවුන් කරන කියන දෑ දකි... අවශ්‍ය නම්, පර්යේෂණයකදී තමා උපයෝගී කරගන්නට යන උපක්‍රම නුවණ... කර ගන්නට අපේක්ෂා කරන්නේ නම් එබඳු පර්යේෂණයකට සහභාගීත්ව නිරීක්ෂණය තරම් යහපත් උපක්‍රමයක් නැත. මේ ක්‍රමය උපයෝගී කරගෙන දත්ත සොයාගැනීම නිසා සොයාගත් දත්ත විග්‍රහ කිරීමටද ක්‍රමයම උදව්දෙයි.

සහභාගීත්ව නිරීක්ෂණය කරන පර්යේෂකයා සෑහෙන කාලයක් ... නිරීක්ෂණය කරන මිනිසුන් අතර ජීවත්වෙයි. ඒ අයගේ ක්ෂෙත්‍රයේ පැය විසිහතර... පර්යේෂකයා ඔවුන් සමග ජීවත්විය යුතුය. සතියකට දෙතුන් වතාවක් ගො... අතරින් පතර කාලය ගතකොට සහභාගීත්ව නිරීක්ෂකයෙකු විය නොහැ... තමන් පර්යේෂණයට භාජනවන අයගේ බස දන්නේ නැතිනම් පර්යේෂකයා ... මනාව උගත යුතුය. සහාය නිරීක්ෂණයන් ලවා හෝ තමන් පරිවර්තකයන් යොදා හෝ සහභාගී නිරීක්ෂණයක් කළ නොහැක.

මට හිතෙන හැටියට භාෂාව හොඳින් දන්නවා නම්, ඒ පර්යේෂණ... භාජනයවන අයගේ සංස්කෘතිය දන්නවානම් සහභාගීත්ව නිරීක්ෂණයක් කරන්න... හයමාසයක්වත් ඔවුන් හා ජීවත්විය යුතුය. එසේ බස නොදන්නවානම් එය ඉතෝ... අවුරුද්දක්වත් යටත් පිරිසෙයින් ජීවත්විය යුතුය. තමන්ගේ නිරීක්ෂණ... ලක්වන්නන්ගේ ජීවිතය සෑම අවස්ථාවක්ම, ඉතා සමීපව දැක ගන්නාත් ... අවස්ථාවල නිරීක්ෂකයෙකු ලෙස නොව සහභාගී වන්නෙකු ලෙස එකතුවන්නට අපේ පර්යේෂකයාට පුළුවන් විය යුතුය. තමා ක්ෂෙත්‍රයේ සෑහෙන කාලයක් ජීවත්වන්නේ නැත්නම් සහභාගීත්ව නිරීක්ෂකයෙකු විය නොහැක.

අප හිඟන්නන් වෙන්නට හිතුවේ මහාචාර්ය මැලිනොව්ස්කි අනුව යමින් ... එකල යන්නම් වයස විසිගණන්වල මුල් භාගයේ ගත කළ අපට මහාචාර්ය මැලිනොව්ස්කිගේ ක්‍රමවිද්‍යාව හරියට අවබෝධවී නොතිබුණු බව පසුව පෙනී ගියේය. කෙසේවෙතත් පළමුවෙන්ම හිඟන්නන් වෙන්නට සිතූ අපි හිඟන්නන් ... වෙස් වළාගෙන, ඇස්වාට්වුවේ දවටගහ පල්ලිය ඉදිරිපිට පදික වේදිකාවේ වාඩි වී අපේ අලුත් රස්සාව ආරම්භ කළෙමු.

එදා සිදුවූයේ කුමක්ද කියා මේ පළමු පර්යේෂණ අත්දැකීමට සහභාගී වූ තුන්වැන්නා වූ ආචාර්ය එච්.අයි. කරුණාදාස මහතා විස්තර කළ හැටි මගේ The Beggar in Sri Lanka(1995, 1-29) ග්‍රන්ථයේ සවිස්තරව දක්වා ඇත. හිඟන්නෙක් ලෙස එදා බිම වාඩි ගත් අපට වැඩිවේලාවක් ඒ රස්සාව කරන්නට බැරිවිය. එහෙත් මෙහෙත් ආ මැරයෝ අපට පහර දුන්හ. අපි අමාරුවෙන් වික්ටෝරියා උද්‍යානය දෙසට දිව අවුත් යන්තම් ගුටි නොකා බේරුණෙමු. "තොපි ආයිත් මේ පැත්තේ ගිහා කන්න ආවොත් මරනවා" යැයි මැරයන් අපට තර්ජනය කළහ.

කාරණ කාරණා සොයන්නේ නැතිව උදෙක් පර්යේෂණයක් කරන්න හිතේ තියාගෙන ගොස් මෙසේ පොට වරද්ද ගැනීම තරුණ අපට හොඳ පාඩමක් විය. පර්යේෂණය කරන්නට පෙර පර්යේෂණ ක්ෂෙත්‍රය ගැන කියවා බලා, ඉතා සුදුසු පර්යේෂණ උපක්‍රම තෝරාගැනීම කළ යුතු බව එදා අපට වැටහිණ. ඉන් ඉක්බිතිව ක්ෂෙත්‍රයට ප්‍රවේශවන මාර්ග සොයාගත යුතුවිය. ලෙන්ගතුකම ගොඩනගාගෙන පර්යේෂණයේදී දත්ත පවත්නා මූලාශ්‍ර හඳුනාගත යුතුය. අනතුරුව මූලාශ්‍රවලින් ලැබෙන දත්ත තක්සේරු කළ යුතුය. මේ සියල්ල කළ යුත්තේ අවසානයේදී කරන්නා වූ දත්ත විග්‍රහය සැමවිටම සිත තබාගනය.

මේ සිද්ධියෙන් පසු මම පශ්චාද් උපාධි අධ්‍යයනය සඳහා එකල බටහිර ජර්මනියට ගියෙමි. එහි මානව විද්‍යාවත්, ජනශ්‍රැතියත් සියුම් ලෙස හැදෑරීමට මට හැකිවිය. එකල ජර්මනියේ ජීවත්ව සිටි ලෝක ප්‍රකට මානව විද්‍යා හා ජනශ්‍රැති විද්‍යා මහාචාර්යවරුන් දැනහැඳින ගැනීමට මට හැකිවිය. ඉංග්‍රීසියෙන් මතුනොව ජර්මන් ආදී යුරෝපීය භාෂාවලින් ලියවුණු මානව විද්‍යාත්මක හා ජනශ්‍රැති විද්‍යාත්මක පතපොත මම කියවීමි. පර්යේෂණ ක්‍රම විද්‍යාව පිළිබඳ මට මේ නිසා සෑහෙන අවබෝධයක් ඇති කරගත හැකිවිය.

ශ්‍රී ලංකාවට ආපසු පැමිණි පසු යාචකයන් පිළිබඳ ගවේෂණය යළිත් ආරම්භ කිරීමට මට සිත්විය. සාමාන්‍යයෙන් යොදාගන්නා සමාජ විද්‍යාත්මක හෝ මානව විද්‍යාත්මක ක්‍රම ඒ අයුරින්ම යොදාගැනීමෙන් හිඟන්නන් ගැන දත්ත එකතුකිරීමේ කාර්යය සර්වප්‍රකාරයෙන්ම සාර්ථකව කළ නොහැකි බව මට එකහෙළාම අවබෝධ විය. සහභාගීත්ව නිරීක්ෂණයද මේ කාර්යට උචිත නොවන බව මට පෙනිණ. ඒ ක්‍රමය උපයෝගී කරගෙන තව ටිකක් ඉදිරියට ගොස් අලුත් උපක්‍රමයක් සොයාගත හැකියැයි මගේ විශ්වාසය විය.

යම් හෙයකින් මා හිඟන්නෙකු සේ සහභාගීත්ව නිරීක්ෂණයේ යෙදෙන විට ඒ අය මා කවුදැයි කියා දන්නවානම් කවදාවත් ඒ අයගේ හැඟීම් මට නොකියන බව විශ්වාසය. හිඟන්නන් ගැන කරුණු එකතු කළ මට පෙනුණේ ඒ අයගේ ලෝකය අපට ලේසියෙන් ඇතුල්වීමට නොහැකි ලෝකයක් ලෙසය. ඒ ලෝකයේ සෑම අංශුවක්ම මට දැනගත හැකි වන්නේ කෙසේද? සහභාගීත්ව නිරීක්ෂණය බොහෝ මානව විද්‍යා පර්යේෂණවල සාර්ථකව යොදාගත්තත් මෙහිදී ප්‍රයෝජනයට ගත නොහේ. මා මගේ මේ සුවිශේෂ පර්යේෂණ ගැටලුවට විසඳුමක් සෙවිය යුතුය.

එදා අපට පහර දුන් අය ගැන මම සොයා බැලුවෙමි. ඒ අය මැරවරයන් බව සැබෑය. හිහාකෑම මැරවරයන්ගේ අවසර නැතිව කළ නොහැකි බව මම මින් දැනගත්තෙමි. මැරවරයන්ගේ අවසරය ලබාගත යුත්තේ ඒ අයගේ නායකයා හමුවීමෙනි. එහෙත් අත්හදාබැලීමක් ලෙස හිහාකන්නට ඔවුන් මට කවදාවත් ඉඩ දෙන්නේ නැත. ඒ අයගේ ලෝකයේ රහස් ඒ ලෝකයෙන් එහාවූ අයට දෙන්නට ඔවුන් කැමති නැත. සහභාගීත්ව නිරීක්ෂණය උපයෝගී කරගෙන මොනම ආකාරයක 'ලෙන්සයක්' ප්‍රයෝජනයට ගත්තත්, ඔවුන්, මා පිටස්තරයෙකු ලෙස දකිනතුරු මගේ කාර්ය සාර්ථක නොවන්නේය.

සාකච්ඡා, ප්‍රශ්නමාලා, ප්‍රක්ෂේපණ ක්‍රම, නිරීක්ෂණ කියන කුමන උපක්‍රමයක් යොදා දත්ත එකතු කළත් හිඟන ලෝකය සංවේදීව අත් නොවිඳ, ඒවායින් එකතු කරන කරුණු විවරණය කර ගැනීම කළ නොහේ. දැන් මා කළ යුත්තේ හිඟන ලෝකයට සැබෑ ලෙසම පිවිසීමය. එහි අභ්‍යන්තරයට ගොස් ජීවත්වීමය. හිඟන්නෙකු ලෙසට ජීවත්වීමෙන් ඒ ලෝකය සාක්ෂාත් කරගන්නට මම ආශා කළෙමි. හිඟන්නන් අතර ජීවත්වන මා සිතින්ද ගතින්ද හිඟන්නෙකු විය යුතුය.

මෙබඳු අදහසක් මගේ හිතට එන්නට සාහිත්‍යයද මට උදව් කළේය. හිඟන්නෙකු වී ඇත්තටම හිඟාකෑවොත් මට සාහිත්‍ය පතපොත ලියන්නට පුදුමාකාර ජීවන අත්දැකීම් හා අවබෝධයක් ලැබෙනු ඇත. මේ අවබෝධය ලබාගන්නාට පසු සමාජ විද්‍යාවේ හෝ මානව විද්‍යාවේ උපයෝගී කරගන්නා ඕනෑම දත්ත එකතු කරන උපක්‍රමයකින් යළිත් අවශ්‍ය දත්ත එකතු කරගැනීමට පුළුවන: විග්‍රහ කර ගැනීමට පුළුවන.

මානව විද්‍යාඥයෙකු ලෙස හිඟන ලෝකයට ප්‍රවේශවී ඒ මිනිසුන්ගේ ජීවිතය දෙස මා බලන්නේ ඇයි? එය වැදගත් චර්යා ධර්මයක්ද? හරි වැඩක්ද? මම සාහිත්‍යකරුවෙකු ලෙස කල්පනා කළෙමි. මට හිඟන්නන් ගැන නවකතාවක් ලියන්නට අවශ්‍ය නම් මම හිඟන්නෙකු වීම, යථාර්ථයෙන්ම හිඟන්නෙකුවීම කෙතරම් ප්‍රයෝජනවත් දෙයක්ද? මට අවශ්‍ය වූයේ වෙස්වළාගත් හිඟන්නෙකු වීමට නොවේ. සමහරු අදත් මගේ මේ පර්යේෂණය ගැන කතා කරන විට මා හිඟන්නෙකු මෙන් වෙස්වළාගෙන සිටියේ යැයි කියති. නමුත් ඇත්ත වශයෙන්ම මා තවත් අය සමග හිඟන්නෙකු මෙන් වෙස්වළාගෙන ගියේ එක් දවසක් පමණය. එදා සිදුවූදේ ගැන ඔබ මේ පරිච්ඡේදය මුලදී කියවූ බව මතක ඇත. එදායින් පසු වෙස්වළාගෙන යෑම මට මෙවැනි පර්යේෂණ වලදී අප්‍රිය විය.

ජීවිතයේ විවිධ පැති හදවතින්ම අඳුනාගැනීමට මට අවශ්‍ය විය. මම ඒ නිසා යථාර්ථයෙන්ම හිඟන්නෙකු වන සැටි කල්පනා කළෙමි. මේ අතර මගේ පරණ වාසනාවක් මතුවිය. එක්තරා පළාතක පෝසත් මුදලාලි කෙනෙකුගේ පුතෙක් අසනීප විය. මේ අසනීපය ඉතා බරපතල වී මුදලාලි බලවත් කණස්සල්ලට පැමිණියේය. මගේ හිතවත් වෛද්‍යවරයෙකුගේ උදව් මම ඒ අයට ලබා දුනිමි. මේ වෛද්‍යවරයා අද ජීවතුන් අතර නැත. ඒ හෘද රෝග විශේෂඥ

දොස්තර අයිවර් ඔබේසේකර මහතාය. මේ උදව්ව නිසා මුදලාලිගේ පුතාගේ ජීවිතය බේරිණ.

ඒ මුදලාලි මට ඔනෑම උදව්වක් කරන්නට සූදානම් විය. මුදලින්, ඉඩකඩම් වලින් හෝ වෙනත් ආකාරයෙකින් මෙය උදව්ව කරදීමට ඔහු එළිපිටම අදහස් පළකළේය. මේ අතර මම මුදලාලිගේ නියම තතු දැනගතිමි. ඔහු හා හිඟන්නන් අතර සම්බන්ධයක් තිබිණ. මුදලාලිගෙන් මම එක් දෙයක් ඉල්ලා සිටියෙමි. "පුළුවන්නම් මට හිඟන්නෙක් වෙන්න උදව් වෙන්න". මුදලාලි කලින් හිතුවේ මා එය විහිළුවට කී දෙයක් ලෙසය. දෙවනුව ඔහු මගේ සිහිය නරක් වී ඇද්දැයි විමසාලීය. මුදලාලි හා ඔහු ජීවත්වන පළාතේ හිඟන්නන් අතර ඇති සමීප සම්බන්ධතා මා දන්නා බව ක්‍රමයෙන් ඇඟවූයෙමි.

මගේ ඉල්ලීම මුදලාලි කීපවරක් මගහැරියේය. බොහෝ අවස්ථාවල මා හමුවූවිට වෙනත් ආකර්ෂණීය දේ වෙතට මා ඇදගැනීමට ඔහු තැත් කළේය. නාගසේන හාමුදුරුවන්ගේ ගිහි නිවසට හත් අවුරුද්දක් හා හත් දවසක් පිඬු සිඟා ගිය තෙරුන් වහන්සේ නමක් ගැන මම සද්ධර්මරත්නාවලියේ නාගසේන වස්තුවේදී කියවා ඇත්තෙමි. නැවත නැවත කියනවිට කරන විට නොනැමෙන හිතක් පපුවක් නැති බව මේ නිසා මට විශ්වාස විය. මම නොසැලී මගේ ඉල්ලීම කරගෙන ගියෙමි. මුදලාලි ප්‍රතික්ෂේප කළත් ඔහු කියන දේ නෑසුනාක් මෙන් යළියළිත් ඇවිටිලි කළෙමි.

වරක් මුදලාලි මගේ කේන්දරයේ පිටපතක් ඉල්ලාගත්තේ අපේ අම්මාගෙනි. මට මුකුත් ඒරාෂ්ටකයක් ඇද්දැයි දැනගැනීම ඔහුට අවශ්‍යයි. කේන්දරයේ හැටියට එහෙම එකක් තිබුණේ නැත. මගේ තදබල ඉල්ලීම අහක දැම්මට මුදලාලිට නොහැකිය. "මේ නම් මහත්තයගේ ඇත්තටම පරණ පවක් පලදීලා, හැම කරුමයක්ම කේන්දරේ පේන්නේ නැහැ. හැංගුනු කරුම තියෙනවා. එහෙම ඒවා පලදෙනවාමයි. මහත්තයා කැමතිනම් මම වැඩේ කරදෙන්නම්. හැබැයි කොන්දේසියක් තියෙනවා."

කොන්දේසිය නම් මහනුවර දළදා මාලිගාවට ගොස් මේ කාරණේට අපේ මුදලාලි උදව් දුන් බව කවදාවත් එළි නොකිරීමයි. "මහත්තයා පොතක් ලියන කාලෙක මගේ නම එළිකරන්න එපා. ඒක සදාකාලික රහසක්, ඒක ගැන දළදා හාමුදුරුවෝ ඉදිරියේ දිවුරා පොරොන්දු වෙන්න ඕනෑ. ඊළඟට මේ කරන නොසංඩාල වැඩේ නිසා මහත්තයට යම් ප්‍රමාණයක කරදරයක් උනොත් මම ඒකට වගකිවයුතු නැහැ. මාව ඒකට අල්ලන්න බැහැ"

මා එක් දිනක මහනුවරට ගියේ මුදලාලි සමගය. ඒ කාලයේ හැටියට මුදලාලිගේ මොරිස් ඔක්ස්පර්ඩ් දැවැන්ත රථය ඉතා වටිනා එකකි. අපි එයින් නුවරට ගොස් දළදා හාමුදුරුවන් වැඳ මුදලාලිට ඕනෑ හැටියට ඒ වැඩේ කළෙමු. දළදා හාමුදුරුවන් වැඳීමට ගිය අපට මුදලාලිගේ දන්නා හඳුනන මල්වත්තේ හාමුදුරුවරු කීප නමක් උදව් කළහ. නමුත් උන්වහන්සේලා කවිරුවත් මුදලාලිගේත් මාගේත් මේ අපූරු ගිවිසුම ගැන දැන සිටියේ නැත.

අද මගේ මිත්‍ර මුදලාලි ජීවතුන් අතර නැත. මීට වසර ගණනකට පෙර ඔහු මියගියේය. මම තනිවම ඔහුගේ මළගමට ගියෙමි. එහිදී ඔහුගේ උගත් හා පෝසත් දූ පුතුන්, නව බෑනාවරු හා ලේලිවරුන් දැනගත්තෙමි. ඔවුන් කවුරුවත් මුදලාලි හා මා අතර තිබූ "රහස" දන්නේ නැත. මුදලාලි විශාල පෝසතෙක් වුනත් ඒ කාලයේ මුදලාලි යටතේ නීතිවිරෝධී ජාවාරම් රාශියක් තිබිණි. ඉන් එකක් නම් හිඟන වෘත්තියයි. ඒ පළාතේ හා තවත් පළාත් කීපයක හිඟන්නන් පාලනය කළේ මුදලාලිය. හිඟනන්ගේ ලෝකයට යෑමට එකල තිබූ ප්‍රධාන බාධකය නම් ඉතා දැඩි ලෙස ඔවුන් මෙවන් මුදලාලිලාගෙන් පාලනය වීමයි. හිඟන්නෙක් වීමට නම් මුදලාලිගේ අවසර ලැබිය යුතුය. මම ද ඒ අවසරය ලබාගතිමි. මුදලාලි මා රැගෙන ඒ පළාතේ හිඟන නායකයෙකුට බාරදුන්නේය. මගේ නම, මා උපන්ගම, අම්මා තාත්තාගේ නම මුදලාලි එක්තරා ගමකින් ලබාගත්තේය. "මීට පස්සේ මහත්තයා හිතන්න මම අහවල් ගමේ, අහවල් ගෙදර උපන් අහවලා" කියා. මුදලාලි ලබාගෙන ඇත්තේ ඇත්ත ගමක ඇත්ත නමක් බව මම පසුව දැනගන්ට ලැබිණි. ඒ නම ඇති දරුවා කුඩා කාලයේම කෙසේදෝ අතුරුදහන් වී ඇත. මට ලැබුණේ ඒ නමය.

මම ජරාවාස වූ ගොවනැගිල්ලක අපේ නායකයා සමඟ නැවතුනෙමි. මේ කාලය තුළ ක්‍රමයෙන් මා හිඟන ලෝකයට සමාජානුයෝජනය කරනු ලැබිණ. පළමුවෙන්ම අපේ නවාතැන අවට ප්‍රදේශයට මා රැගෙන ගිය නායකයා, ඒ අවට ප්‍රදේශය ගැන කියා දුන්නේය. පාරවල්, ගෙවල්, ඒවායේ ජීවත්වන අය, තවත් තොරතුරු, පන්සල්, පල්ලි, උත්සව, දානමාන දෙන තැන්, ඒවා පවත්වන දවස් මේ කාරණා සියල්ලම මම උගත්තෙමි. ඉක්බිතිව නගරයෙන් ඈත ගම්වලට පිටත් කෙරිණි. මට පුදුමය මගේ නායකයා මට මේ සියල්ල උගැන්වූ ආකාරයයි. පොතකපතක කලුලෑල්ලක නොලියා පොතක්පතක් කියවන්නට නොකියා ඔහු මට උගැන්වූ ඥාන සම්භාරය විශ්ව විද්‍යාලයේදීත් ශිෂ්‍යයනට උගන්වන්නට අප කීදෙනෙක් සමත්වෙත්ද?

භෞතික පරිසරය ගැන ඉගෙනගත්තාට පසු මේ ප්‍රදේශයේ පුද්ගලයන් ගැන මට උගැන්විණි. 'අහවල් ගෙදර මහත්තයා සැරයි, නෝනා කාරුණාවන්තයි, මේ ගෙදර සැර බල්ලෙක් ඉන්නවා, අර පන්සලේ ලොකු හාමුදුරුවෝ කරුණාවන්තයි මේ ගෙදරට සති අන්තයේ පමණයි යන්න ඕනෑ අහවලා ලෝභයි, මෙතැන අමාරු ලෙඩෙක් ඉන්නවා' යනාදී වශයෙන් අවට පුද්ගලයන් ගැන කරුණු එකතුකිරීම හිඟන්නන් අතර කෙතරම් සාරව කෙරෙන්නේද?

මම මින් ඉතා වැදගත් දෙයක් උගෙන ගතිමි. මට මේ උගන්වන්නේ හිඟන්නෙකු වශයෙන් ජීවිකාව ගෙනයෑමට මට අවශ්‍යදේය. ඒ උගැන්වූ එකක්වත් මට අනවශ්‍යදේ නොවේ. අධ්‍යාපනයේ කාර්යභාරය හරිහැටි මට වැටහෙන්නට පටන් ගත්තේ මේ හිඟන චර්යාවෙනි. අප විශ්ව විද්‍යාලයේ හා පාසැල්වල උගැන්වන දේවලින් කෙතරම් ප්‍රමාණයක් පසු කාලයක ඉගෙනගන්නා ළමයාගේ ජීවිතයට සම්බන්ධද?

උදේ රැයින්ම කහට සත් කෝප්පයක් බී 'ඇවිදින්න යන අප දවාලට කාගේ හෝ ගෙදරකින් ආහාර ගැනීම සිරිතය. "අද මේ ගෙදර අවුරුදු දානේ. අපි එහාට යමු" කියා මගේ ගුරුවරයා මා ගෙදරකට කැඳවාගෙන යයි. දානමාන පවත්නා ගෙවල් හේ හොඳින් දනියි. මඟුල් ගෙවල්,' මළගෙවල් මෙන්ම මල්වර මඟුල්, තොවිල් බලි වෙනත් ගම්මඩු වැනි යාතුකර්ම ආදිය පවත්නා දින ගැන පුදුම දැනුම් සම්භාරයක් ඔහු සතුවිය.

මා ගැන මගේ ගුරුවරයා එක්තරා ගෞරවයක් ඇතිකරගත තිබූ බව මම දැනගතිමි. "මු හොඳට බලාගන්නවා" කියා වරක් මුදලාලි මා පෙන්වා කී බව ඔහුට මතක ඇත. මුදලාලි වැනි සමාජයේ ගෞරවය ලබන කෙනෙක් මෙහෙම කියන්ට ඇත්තේ 'මමත් එක්තරා විදිහකින් මුදලාලිගේ ප්‍රසාදයට ලක්වූ නිසා බව ඔහු අනුමාන කරන්නට ඇත. (මුදලාලි හා හිඟන්නන් අතර සම්බන්ධය ඔවුන් කවිරුවත් දැන සිටියේ නැත)

හිඟන්නන්ගේ 'රහස් බස' මට උගැන්නුවේ මේ ගුරුවරයාය. එහෙම භාෂාවක් තිබෙන බව මම ඩබ්.ඒ. සිල්වා මහතාගේ 'හිඟන කොල්ලා' කියවන විට දැනගෙන සිටියෙමි. නමුත් ඒ භාෂාවේ ප්‍රායෝගික ස්වරූපය මට වටහාගත හැකි වූයේ මා එය උගත් විටය. ඇඟපත එහා මෙහා කිරීම,ඇස්,කන්,නාසය,කට,දිව මගින් කරන සංඥා ද්‍රව්‍ය එහා මෙහා කරමින් දෙන සංඥා, භාෂාව පාවිච්චි කරන ගුප්ත පිළිවෙලවල් සියල්ලම මම උගත්තෙමි. හිඟන්නෙකුට තව එකෙකු යන පැත්ත අන්තරාදායකයැයි හිතෙනවා නම් ඒ සඳහා කළ යුතු හස්ත සංඥාව දුන් විට එය දකින තැනැත්තා ආපසු හැරෙන්නේය.

ඊළඟට මගේ සමාජානුයෝජනය වැදගත්වූයේ හිඟන්නන්ගේ චර්යාධර්ම උගෙනීමටය. මගේ නායකයාට මා ගරු කළ යුතුය. ගෙදරක තාත්තාට දක්වන ගරුසරුකම කවිරුත් නායකයාට දක්වති. ස්ත්‍රීන්ට ගරු කළ යුතුය. අයථා ලෙස ලිංගික හැසිරීමක් තබා ගැහැනියකගේ ඇඟ ඇල්ලීමවත් නොකළ යුතුය. කුඩා දරුවන්ට කරුණාවන්ත විය යුතුය. හොරකම් නොකළ යුතුය. තමන්ගේ සහෝදර හිඟන්නන්ට බොරු නොකිය යුතුය, මෙබඳු චර්යාධර්ම රාශියක් මට උගෙනගන්නට වැඩි කාලයක් ගතවූනේ නැත.

මාස කිහිපයකට පසු මම කොළඹට පැමිණියෙමි. මා එසේ පැමිණෙන බව මුදලාලිට කලින් දැන්වීමි. තමාට පණිවිඩයක් එවන්නට අවශ්‍ය නම් තුන්වැන්නෙකු ඒ සඳහා ප්‍රයෝජනයට නොගෙන පණිවිඩය එවන සැටි මුදලාලි මට කීය. මේ වනවිට මගේ රවුල වැවී, කොණ්ඩය වැවී මා නිකම්ම අපිරිසිදු තැනැත්තෙකු බවට පත්වී තිබිණ.

මුලින්ම හිඟාකන්නට රැළට ගියවිට ගෙදර ගැන හිතුනේ නැද්දැයි ඔබ අසන්නට පුළුවන. උදේ තේ කෝප්පය බී, පොතක් කියවන එක තරම් මට විනෝදයක් නැත. කොළයක් රැගෙන මොකක් හෝ ලියන්නට නැත්නම් මගේ ජීවිතය එදාව හිස්ය. හිඟන ලෝකයේ මට මේ කිසිවක් කරගත නොහැකි විය. මුල් දිනවල "අනේ ! මම මේ කරගත්තේ මොන පාපයක්දැයි" මට සිතිණ. මුදලාලි කීවා වගේ මගේ පරණ කරුමයක් පලදී මෙයැයි විනැයි මම කල්පනා කළෙමි.

නමුත් චිත්ත ධෛර්යයෙන් මම ඒ සියල්ල ඉවසීමි. මම අනාගතයේදී ලියන්න යන පොත ගැන සිතීමි. හිඟන්නන් ගැන මානව විද්‍යා ගවේෂණයක් කළ වහාම අද පවත්නා ක්‍රමවිද්‍යාවලට වඩා අලුත් එකක් මට සොයාගත

හැකියැයි යන විශ්වාසය මා තුළ විය. එක් අතකින් සාහිත්‍යකරුවෙකු ලෙස සිතමින්ත්, අනික් අතින් මානව විද්‍යාඥයෙකු ලෙස කල්පනා කරමින්ත් සිත හදාගන කටයුතු කිරීම මට කළ හැකි විය.

පර්යේෂණයක් සඳහා ක්ෂේත්‍රයට බසින ඕනෑම විද්‍යාර්ථියෙකුට මට සිදුවූ මේ සිත්දෙගිඩියාව හා පසුතැවීම ඇතිවන්නේය. එය පර්යේෂණවල ස්වභාවයයි. පර්යේෂණ ක්‍රමවිද්‍යා ගැන පොත් ලියූ කවීරුත් මේ මානසික පසුබිම ගැන සඳහන් කරති. එහිදී කළ යුත්තේ හිත ධෛර්යයකරගතා තම කටයුත්ත නොසැලී දිගටම කරගෙනයෑමය. ජයග්‍රහණය ළඟාකරගත හැකිවන්නේ එවිටය.

මම කොළඹට එනවිට මා ගැන මුදලාලි කොළඹ හිඟන නායකයන්ට දන්වා තිබිණ. ඒ ඒ පළාත්වල හිඟන්නන්ට පණිවිඩ යැවීමේ රහස් ක්‍රමයක් ඔහු සතුවිය. මට මෙය අදත් පුදුමයකි. කොළඹ පසුකාලයේදී මා දැන හැඳිනගත් කිසිදු හිඟන්නෙක් අපේ මුදලාලි ගැන දැන සිටියේ නැත. ඔහුගේ පණිවිඩ ක්‍රමය මා එදා අධ්‍යයනය කළා නම් සමාජවිද්‍යාවට පමණ නොව අපරාධ විද්‍යාවටත් මහත් ආලෝකයක් ඉන් ලබාගන්නට තිබිණි.

කොළඹදී මම මා දන්නා හඳුනන හෝටලයකට ගොස් පෙලෙන්ටී එකක් ඉල්ලුවෙමි. හෝටලය අයිතිකරු මගේ මිතුරෙකි. හේ මේ හිඟන්නාට බැන එලවා ගත්තේය. ඔහු කී කුණුහරුප මට අදත් මතකය. හිඟන්නෙකු වන මා හෝටලයකට යනවිට මගේ ටින්කට්ට රැගෙන යා යුතුය. සල්ලි දුන්නත් හෝටල්වල හිඟන්නන්ට තේ කෝපි, කෝප්පවල හෝ වීදුරුවල දමා දෙන්නේ නැත.

එදා ඇත්ත වශයෙන්ම මම ආපසු එන අතර කඳුළු වැගිරීමි. මගේ හිතවතෙකුවූ මුදලාලි මේ මට සලකන හැටිද? ඒත් ඔහුගේ කවර වරදක්ද? මා හිඟන්නෙක් මිස ඊට එහා යමක් ඔහු දන්නේ නැත. බුදුන් කාලයේදී සිටුවරයෙක් මියගොස් බලුපැටවෙක් වී ඉපදුනු සැටි මා අසා ඇත. සිටුවරයාගේ පුතාට බලුපැටවා පෙන්වා "මේ තොපගේ පියායැ"යි බුදුන් වහන්සේ කී විට සිටු පුත්‍රයා එය පිළිගත්තේ නැත. මා ඇත්ත වශයෙන්ම මියගොස් ඉපිද නැතත් මේ හිඟන වේෂය මගේ පුරුදු වේෂය නොවේ. එහෙයින් මගේ මිත්‍රයන් මා හඳුනාගත්තේ කෙසේද?

මම කොළඹ ගමනින් පසු වරින්වර හිඟන ලෝකයට පැමිණියෙමි. මගේ සමාජානුයෝජන කාලයට අමතරව දින 180 ක් සම්පූර්ණයෙන්ම මුල් වතාවේ මට හිඟන්නෙකුව සිටිය හැකිවිය. හිඟන ලෝකයේ මා වරින් වර පසු වාර වලදී දළ වශයෙන් ගත කළ සම්පූර්ණ කාලය එකතු කළහොත් වසර එකහමාරක් හෝ දෙකක් පමණ වී යැයි මම සිතමි. හිඟන ලෝකයේ සෑම පැත්තක්ම මම මේ නිසා අත් දුටුවෙමි. වරක් මට මහරගමදී මගේම නැණියන් හමුවිය. ඕ තැපැල් කන්තෝරුවට විශ්‍රාම වැටුප් ගන්නට විත්, මා දැක මට මුදල් දුන්නාය. "අම්මේ මේ ඔබේ පුතා" කියා කෑගසන්නට මට සිතිණ. නමුත් ඈය මා හඳුනාගන්නේ කෙසේද? එතරම් ඉස වැවී, රැවුල වැවී ශරීරය අපිරිසිදුවී සිටි මා කියන දෙය පිළිගැනීමට කෙතරම් දුෂ්කර වේයිද? එසේ එළිකිරීමේ අර්ථය කුමක්ද?

මම වරක් විශ්ව විද්‍යාලයට ගියෙමි. විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ දොරකඩ අසලදී ළමයි මට හිඟමන් දුන්හ. මා දන්නා හඳුනන පොත්පත් විකිණීමේ යෙදුන සත්‍යපාල නම් මහතෙක් (පන්නිපිටියේ වාසය කළ) මට කාරුණිකව බත් පැකට් එකක් දුන්නේය. මම විශ්ව විද්‍යාලයේ දොරකඩ ළඟ ඉන්න විට බල්ලෙක් මා ළඟින් වාඩිවිය. ඌ වෙනදාට මගෙන් හා මහාචාර්ය ටී.බී. කාන්ගහආරච්චි මහතාගෙන් නිතර ආහාර ලබන සුනඛයෙකි. ඌ දැක්කොත් මහාචාර්ය කාන්ගහආරච්චි ඌට මොනවා හෝ කෑමට දෙයි. මමද එසේ කරමි. ඒ හැඳුනුම්කම ඉවෙන් දැනගත් බල්ලා නගුට වනමින් මා සමීපයට එන්නට පටන් ගත්තේය.

මම වහවහා විශ්ව විද්‍යාලයෙන් එළියට බැස්සෙමි. එසේ ගියේ මහාචාර්ය කාන්ගහආරච්චිට හමුවුනොත් මා ගැන සැක සිතාවියැයි බියෙනි. මා අවුරුදු ගණනාවක් එකට වාසය කළ තැනක ආචාර්ය මණ්ඩලයටවත්, මගේ ශිෂ්‍යයන්ටවත් මා හඳුනාගත නොහැකි විය.

මගේ අත්දැකීම් සාහිත්‍ය පොතක් ලෙස ඉදිරිපත් කළ යුත්තේ එබඳු දේ මානව විද්‍යාවට වඩා සාහිත්‍යයට සමීප නිසාය. එය ඉදිරි අනාගතයේ මට කළ හැකිවේතැයි මම සිතමි. මානව විද්‍යාව වැදගත් වන්නේ මගේ මේ අත්දැකීම් තුලින් හදාවඩාගත් ක්‍රමවිද්‍යාවටයි. මා මේ විදිහට හිඟන ජීවිතය අත්දුටුවේ ඇයි?

මගේ ප්‍රථම පරමාර්ථය හිඟන ජීවිතය හැකිතාක් ගැඹුරින් අවබෝධ කරගැනීමය. එසේ කරන්නට මා යොදාගත් මේ ක්‍රමය අනුව මිස වෙනත් ක්‍රමයක් නැත. මා මානව විද්‍යාඥයෙක් බව හිඟන්නන්ට නොකීම චර්යාධර්ම පිළිබඳ වැරැද්දක්ද? එහෙම කියන්න ගියානම් මට හිඟන ලෝකයේ ජීවත් වන්නට බැරි වනු ඇත. මා කියන දේ හිඟන්නන්ට වැටහේද්දැයි මට සැක සහිතය. යම් හෙයකින් වැටහී ඔවුන් මගින් හිඟන ලෝකය පාලනය කරන අයට ගියොත් මගේ ජීවිතය පවා විනාශවනු ඇත.

හිඟන්නන්ට නොදන්වා හිඟන්නෙකු ලෙස ජීවත්වීම වරදකැයි මම නොසිතමි. කිසිම තැනක මට හමුවූ හිඟන්නන්ගේ අනන්‍යතාව ඔවුන්ගේ කැමැත්ත නැතිව කිසිදාක මා විසින් එළි නොවනු ඇත. ඔවුන් වෙනුවෙන් යහපතක් විනා කිසිදු අයහපතක් මානව විද්‍යාඥයෙක් වශයෙන් මගෙන් සිදුනොවේ. ඔවුන්ගේ ලෝකයේ මා ජීවත්වූයේ ඔවුන් තේරුම් ගැනීමටය. ඒ ලෝකයෙන් ඉවතට ආ මම මගේ අත්දැකීම් දෙස මානව විද්‍යාඥයෙක් ලෙස බලන්නට පුරුදුවීමි. ඒ ලෝකයේ ඉන්නා තාක් මම මා දන්නා මානව විද්‍යාව හා දැනීම ඉවත් කළෙමි. හිඟන්නෙකු ලෙස ඒ ජීවිතය අත්දැකීමි.

මගේ මේ ක්‍රමය මා හඳුන්වන්නේ ජීවන අත්දැකීම් ක්‍රමය කියාය. එය යොදා ගැනීම සෑම පර්යේෂණයකදීම කළ නොහැකිය. මේ ක්‍රමය යොදා උසස් ප්‍රතිඵල ලබන්නට පුළුවන් පර්යේෂණයකදී පමණක් ඒ ක්‍රමය යෙදිය හැකිය. මම හිඟන්නන්ගේ පර්යේෂණයට පසු ගණිකාවන් ගැන, පොලිසිය හා අපරාධ ගැන, මත්පැන් හා මත්ද්‍රව්‍ය හා දුප්පත්කම ගැන කළ පර්යේෂණ ගණනකදී මේ ක්‍රමය, වෙනත් ක්‍රමවිද්‍යාවන් සමග එකට යොදාගතිමි. සහභාගීත්ව

නිරීක්ෂණ ක්‍රමය යොදාගන්නා නැතැත්තා කෙනෙකුගේ ගත කරන කාලය, සහ [illegible] කාලයක් කෙනෙකුගේ ගත කිරීමට මේ [illegible] [illegible] නැතැත්තා [illegible] විය යුතුය.

එහෙත් අත්දැකීම් ක්‍රමය භාවිත කරන්නට නම් [illegible] පර්යේෂකයාට මේ ක්‍රමය අදාළ [illegible] [illegible] පර්යේෂකයාට [illegible] විද්‍යා හෝ මානව විද්‍යා [illegible] කිරීම සඳහා [illegible] විද්‍යාත්මක ක්‍රම [illegible] සහභාගිත්ව නිරීක්ෂණ [illegible] [illegible] නොහැකිවිය.

සහභාගිත්ව නිරීක්ෂණය මගින් යම් කෙනෙකුගේ ජීවිත නිරීක්ෂණය කරන්නට 'ලංවීම' හැකිවේ. මානවවිද්‍යාඥයින් [illegible] මේ ක්‍රමය [illegible] [illegible] පර්යේෂණ [illegible] පර්යේෂණ [illegible] (පර්යේෂකයා) [illegible] පර්යේෂකයාට [illegible]

සමාජ සහභාගිත්ව නිරීක්ෂණ පර්යේෂණවලදී පර්යේෂකයා [illegible] පර්යේෂකයාට [illegible] 'ප්‍රස්තුතයකු' [illegible] නිරීක්ෂණය [illegible] (Lewis) [illegible]

දැන් [illegible] සමාජ සේවය (Social Work) [illegible] 'කේස්' (Doc) [illegible]

[illegible] 'කේස්' [illegible] 'කේස්' [illegible]

බවද කීය. 'ඩොක්' මේ අදහසට එකඟ විය. එදායින් පසු 'ඩොක්ගේ' ආධාර ඇතිව මේ ජනසමූහය ඉතා සමීපව අධ්‍යයනය කරගන්නට වයිට්ට හැකිවිය. 'ඩොක්' කෝනර්විල්හි කව්රුත් දන්නා ජනප්‍රිය තැනැත්තෙකු වූ නිසා ඔහුට ඒ ජනසමූහය සමීපව අධ්‍යයනය කරගන්නට මහා ප්‍රවේශයක් 'ඩොක්ගෙන්' ලැබිණි.

තමන් තෝරාගත් ජනසමූහය අතරට පිවිසෙන්නට, ක්ෂේත්‍රයට පා තබන්නට ලීබෝ (Liebow) යොදාගත් ක්‍රමය මීට වඩා වෙනස්ය. ඒ ජනසමූහයේ එක් අයෙකුට නඩුවක් පැවරුනවිට, ඒ සඳහා උදව්කිරීමට ලීබෝ සූදානම් විය. මේ ආධාරය නිසා ඒ ජනසමූහයේ සාමාජිකයන්ගේ විශ්වාසය දිනාගන්නට ඔහුට හැකිවිය. මේ කාරණය සිද්ධ වීමට පෙර ලීබෝ අදහස් කළේ කලු මිනිසුන් අතරට ගොස් ඒ අයගේ ජීවිතය පිළිබඳ මහා අවබෝධයක් ලබාගැනීමය. ඔහු කෙතෙක් වෑයම් කළත් මේ කලුමිනිසුන්ගේ විශ්වාසය දිනාගැනීමට ඔහුට නොහැකිවිය. ඒ මිනිසුන් අතර ජීවත්වූ ලෝන් නමැත්තා මිනීමැරුමකට චෝදනා ලැබීය. ටිලී යන ගැහැනියට මේ මිනීමැරුම ගැන සාක්ෂිකාරියක ලෙස ඉදිරිපත් වන්නට සිදුවිය. ටිලීට උසාවියට යෑමටවත් මුදල් නොතිබිණි, තමා විසින් කුමක් කළ යුතුද කියා ඇය නොදන්නාය. ලීබෝ මෙහිදී ඇයට පිහිටට ආවේය. ඒ පිහිට ඔහු සිදුකළේ හදවත තුලින්ම ඇතිවූ අනුකම්පාව නිසාය. මේ නිසා යථෝක්ත කාරණය ගැන ජනසමූහයේ අවශේෂ අය දැනගත්හ. ටිලීත් ලීබෝට විශ්වාසී විය. ඒ මිනිසුන් අතර විශ්වාසය දිනා කටයුතුකිරීමට ලීබෝට හැකිවිය.

සමහරවිට මා මුදලාලිගේ පුතාට උදව්වීම මීට සමාන සිද්ධියකි. සාමාන්‍යයෙන් හැකි සෑම තැනකදීම කාට හෝ මා උදව්වන්නේ යමක් අපේක්ෂා කරමින් නොවේ. මේ උදව්ව කළාට පසුය මට මුදලාලි හා යාචකයන් අතර සම්බන්ධය දැනගන්නට ලැබුනේ. මා එවන් උදව්වක් කළේ අර විදිහේ ප්‍රතිඋපකාරයක් බලාගෙන නොවේ. නමුත් උදව්වෙන් පසු මුදලාලි ගැන කරුණු දැනගත් මම ඒ සම්බන්ධතාව ප්‍රයෝජනයට ගෙන යාචක ලෝකයට පිවිසුනෙමි.

මා තෝරාගත් ක්ෂේත්‍රයට පිවිසීමට ඔබට යොදාගත හැකි උපක්‍රම බොහෝය. සහභාගීත්ව නිරීක්ෂණයක් කරන්නට ගිය ජෝන් එච්.ග්‍රිෆින්ස් (Black Like Me 1962) තමා සුදු මිනිසෙකු නිසා මුලු වර්ණයම කලුවීමට, ඇගට බෙහෙත් විද ගත් වග මම කලින් සඳහන් කළෙමි. සුදු මිනිසෙකු වූ ඔහු මාස කීපයක් ඇමරිකාව වටා යමින් සුදු මිනිසුන්, කලු මිනිසුන්ට සලකන හැටි සමීප ඇසකින් නිරීක්ෂණය කළේය. සහභාගීත්ව නිරීක්ෂණය ඉතා සාර්ථකකර ගැනීමට ඔහුගේ මේ උපක්‍රමය ප්‍රයෝජනවත්ය. නමුත් ඔහු මෙසේ ඇමරිකාව පුරා සැරිසැරුවේ මාස තුනකි. ඊට අනතුරුව තමා කරගෙන එන්නා වූ මේ පරිත්‍යාගශීලි සමාජ විද්‍යාඥයා මරණයට පත්විය.

සහභාගීත්ව නිරීක්ෂණයේදී හැකිතාක් තමා නිරීක්ෂණය කරන කර්මයට (Object) සමීප වන්නට ග්‍රිෆින්ස් මේ ක්‍රමය යොදාගත්තේය. ඔහුට, සුද්දන් කලු අයට සලකන හැටි අත්දැකීමක් ලෙස මෙහිදී වටහාගත හැකිවිය. මාස තුනක් නොව අවුරුදු දෙකක් පමණ ඔහු කලුමිනිසුන් අතර ජීවත්ව පර්යේෂණය

කළා නම් ග්‍රිෆින්ස්ගේ ක්‍රමය මගේ ජීවන අත්දැකීම් ක්‍රමය හා සමාන වෙයි. මාස තුනකදී ඔහුට කලු මිනිසුන්ගේ ජීවිතයේ සෑම පැත්තක්ම වටහාගන්නට නොහැකිවිය. ඔහුට හැකිවූයේ කලුමිනිසුන්ට සුද්දන් සලකන හැටි ඉතා සමීප දෘෂ්ටි කෝණයකින් දැන ගැනීමට හැකි වීම එත්තරා දුරකට පමණි. මගේ ජීවන අත්දැකීම් ක්‍රමය මීට එහා ගමන් කරයි.

මෙසේ සහභාගීත්ව නිරීක්ෂණයේ යෙදෙමින් තම නිරීක්ෂණය තමා ගවේෂණය කරන කර්මයට ඉතා ළං කරන්නට වෙහෙසගත් සමාජ හා මානව විද්‍යාඥයන් අපඅතර ඇත. එක්තරා අපූරු ආගමික කොටසක් අතර ගවේෂණයට ගිය රැන්ඩ් ඇල්ප්‍රඩ් (The New Religious Consciousness 1976) ඒ ආගමික කොටසේ විශ්වාසය දිනාගත්තේ තමන්ද එබඳු විශ්වාස ගරු කරන්නෙකු ලෙසය. ඔහු කෙතරම් ඔවුන්ගේ විශ්වාසය දිනාගත්තාද කියතහොත් ඒ ආගමික කොටසේ නායකයෙක් බවට තමා පත්කරවා ගන්නට ඔහු සමත් විය. සහභාගීත්ව නිරීක්ෂණය ඇල්ප්‍රඩ් කෙතෙරම් සාර්ථක ලෙස දියුණු කර ගත්තද කියා ඔබට පෙනේ. සහභාගීත්ව නිරීක්ෂණය ඉතා ඉදිරියට ගෙනගිය ඔහු මගේ ජීවන අත්දැකීම් ක්‍රමයට ළං නොවන්නේ ඇයි?

ඇල්ප්‍රඩ් ඒ ආගමික කොටස අතර ජීවත්වුවත්, ඒ අය ඔහු තමන්ගෙන් කෙනෙකු බව කිසිම සැකයක් නැතිව පිළිගත්හ. නමුත් තමා සමාජ මානව විද්‍යාඥයෙක් බව ඇල්ප්‍රඩ් විඥානිකව අමතක කළේ නැත. ඔහු තමා විඳින අත්දැකීම් සාක්ෂාත් කළේ සමාජ/මානව විද්‍යාඥයෙකු ලෙසය. හෙතෙම හැකිනාක් සටහන් ලියා ගත්තේය; දකින දේ ලේඛනගත කළේය. මගේ ක්‍රමය අනුව 'මම' යාචක ලොවට පිවිසුනේ හිඟන්නෙකු ලෙසය. ඒ සමාජානුයෝජනය ලබා යථොක්ත ලෝකයට ගිය මම මගේ විශ්වවිද්‍යාල කථිකාචාර්ය අනන්‍යතාව තාවකාලිකව අත්හැර දැමීමි.

මා මෙය උගත්තේ බුදුදහමෙනි. එහි එන අභිනිෂ්ක්‍රමණ මා සිත් පැහැරගත් වචනයකි. හිඟන්නෙක් වන මට මගේ උගත් ලෝකයෙන් අභිනිෂ්ක්‍රමණ කළ නොහැකිද? මා හිඟන්නෙකුව් අත්දකින දේ දිහා මා බැලිය යුත්තේ මානව විද්‍යාඥයෙකු ලෙස නොවේ. මගේ සමාජානුයෝජනයෙන් පසු මම මා මෙතෙක් සිටි ලොවින් අත්මිදීමි; අභිනිෂ්ක්‍රමණ කළෙමි. යාචක ලෝකය, එදා සිට මගේ ලෝකය විය. මම යාචක ලොවින් සෑම දෙයක්ම යාචකයෙකු ලෙස අත්වින්දා මිස මානව විද්‍යාඥයෙකු ලෙස අත්නොවින්දෙමි.

මේ අභිනිෂ්ක්‍රමණ එක වරට කළ නොහේ. එය කළයුත්තේ මනා සමාජානුයෝජනයකට අනුව්මෙනි. තමාගේ අනන්‍යතාව තමා විසින්ම පරිවර්තනය කරගැනීමෙනි. කෙනෙකු ගිහිව සිට මහණවූ විට කරන්නේ මේ සමාජ විද්‍යානුකූල අභිනිෂ්ක්‍රමණ නොවේද? මගේ විශ්ව විද්‍යාල කථිකාචාර්ය අනන්‍යතාව මට තිබුනතාක් කල් හිඟන ජීවිතය මගේ ජීවිතය ලෙස අත්දකින්නට මට නොහැකිවිය. ඒ අනන්‍යතාව නැතිවී ගොස් කාලයකට පසු මම නියම හිඟන්නෙක් වීමි. ජීවන අත්දැකීම් ක්‍රමය සමත් ගවේෂණය කරන්නට යන ක්ෂේත්‍රයේ අත්දැකීම මූලික අත්දැකීම් ලෙස තමා වෙත ගෙන එන්නේය.

ලෝඩ් හම්ප්‍රිගේ ඉතා ප්‍රකට සමලිංගික අධ්‍යයනය ගැන ඔබ දන්නවා ඇත. (Tearoom Trade: Impersonal Sex in Public Places 1975) ලෝඩ් මේ පර්යේෂණය කළේ තම 'සහභාගීත්ව' නිරීක්ෂණය සඳහා අලුත්ම උපක්‍රමයක් යොදමිනි. සමලිංගික කටයුතුවල යෙදෙන්නන් පොදු වැසිකිළිවල ඒ කටයුතු කරන බව දැනගත් හෙතෙම ඒ අය නිරීක්ෂණය කිරීමට යෙදූ උපක්‍රමය කුමක්ද? ඇමරිකාවේ මේ වැසිකිළිවලට ඇතුළුවී මෙබඳු කටයුතුවල යෙදෙන අය වෙනුවෙන් 'ඔත්තුබැලීමට' මුරවැත්තෙක් යොදවනු ලැබේ. ලෝඩ් මෙබඳු මුරවැත්තෙක් ලෙස කටයුතු කළේය. වැසිකිළිවල සමලිංගික කටයුතු කරුණු අයට ඔහු ඇඟවූයේ තමා මෙසේ ඔත්තු බලමින් ඒ අය ආරක්ෂා කරන තැනැත්තෙකු බවය. පිටස්තරයෙකු එනවා නම් එසේ එන බව මුරවැත්තා සමලිංගිකයන්ට අඟවයි.

ලෝඩ් මෙසේ 'මුරවැත්තෙකු' ලෙස කටයුතුකිරීම නිසා කිසිදු බාධාවක් නැතිව ඒ වැසිකිළිවල සමලිංගිකයන් කරන කියන දේ ඔහුට නිරීක්ෂණය කරගත හැකිවිය. එබඳු කටයුත්තක් ගැන කරුණු දැන ගැනීමට මීට වඩා සාර්ථක උපක්‍රමයක් නොමැත. ඒ නිසා සහභාගීත්ව නිරීක්ෂණය ගැන සාකච්ඡාකරන විට ලෝඩ් යොදා ගත් මේ අලුත් උපක්‍රමය ඔබ සිහියේ තබාගත යුතුය. ලෝඩ් සේම මහත් ගත් හොප්මාන් තම පර්යේෂණයේදී මානසික රෝහලක සේවය කරන තැනැත්තෙකු ලෙස කටයුතු කළ සැටි කලින් සඳහන් විය. එසේ කරමින් මානසික රෝගීන් වෛද්‍යවරුන් හා අවශේෂ සේවකයන් ඉතා සමීපව දැකගත්තේය. මේ දෙදෙනාම සහභාගීත්ව නිරීක්ෂණය සාර්ථක කරගැනීමට ඉතා ඵලදායී 'කාච' (lenses) යොදාගත් සැටි ඔබට මින් පැහැදිලිය.

මගේ ක්‍රමය සහභාගීත්ව නිරීක්ෂණය ඉක්මවා යයි. ඒ ක්‍රමයේ මුල් අංග දෙක ඔබට දැනගන්නට ලැබිණ. පර්යේෂණ ක්ෂේත්‍රය තෝරාගෙන ඊට උචිත ප්‍රවේශ ක්‍රමයක් තනාගැනීම, පර්යේෂණ ක්ෂේත්‍රයට ඇතුළුවී එහි පුද්ගලයන්ගේ විශ්වාසය දිනාගැනීම මේ අංග දෙකය. අනතුරුව ඒ අය සමග සැහෙන දීර්ඝ කාලයක් ජීවත්විය යුතුය. එසේ ජීවත්වන්නේ සමාජ හෝ මානව විද්‍යාඥයෙක් හැටියට නොව ඔවුන්ගේම සමාජයේ ඔවුන්ගේම කෙනෙක් හැටියටය. මේ සියල්ලක් කරන්නේ ඇයි? ඒ අයගේ ජීවිතයේ සෑම අංශයක්ම අත්විඳ විනිවිද දැකගන්නටය.

මේ දීර්ඝ කාලයේදී මම සටහන් නොගනිමි. ඒ අයගේ ඇසින්ම හැම දෙයම දැකගන්නට ඒ කාලයේ වෙහෙසවමි. මාස ගණනකට පසු මගේ පළපුරුදු ජීවිතයට ආපිට ලබාගත් අත්දැකීම් දෙස බලා ඒ සියල්ල නිරීක්ෂණය කිරීම සඳහා ආකෘති පිළියෙල කර ගනිමි. ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හෝ ප්‍රක්ෂේපණ ක්‍රම ආදී දේ අවශ්‍ය නම් ඒවා සාදාගනිමි. සමාජ හා මානව විද්‍යාවේ පවත්නා මට ප්‍රයෝජනයට ගත හැකි සෑම උපක්‍රමයක්ම දැන් වඩාත් පහසුවෙන් යොදාගත හැකිබව මට ප්‍රත්‍යක්ෂ විය.

ජීවිත අත්දැකීම් ක්‍රමය ඔබට ක්ෂේත්‍රයේ ජීවත්වී ඔබගේ පසිඳුරන්ගෙන් හා අධ්‍යාත්මයෙන් ජනසමූහයක් ප්‍රත්‍යක්ෂ කරගන්නට මාර්ගය සලසයි. ඔබ ඒ අය අතර ජීවත්වන්නේ කුමන පරමාර්ථයක් නිසාද? ඇත්ත වශයෙන්ම මම ඔවුන්ගේ ජීවිතය රස වින්දෙමි. කවදා හෝ සාහිත්‍ය නිර්මාණයක් ඔවුන් අරභයා

කරන්නටද මගේ සිත පෙළඹුනි. ඔවුන්ගේ ජීවිතය වටහාගත්විට මා මේ ක්ෂෙත්‍රයෙන් ඉවත්වූ පසු ඔවුන් ගැන වෙනත් මානව විද්‍යා හෝ සමාජ විද්‍යා උපක්‍රම යොදා කරුණු පලකරන්නට මට හැකි වන බව මම කල්පනා කළෙමි.

දීර්ඝ කාලයක් ඔවුන් සමග ජීවත්වූවාට පසු ඔවුන්ගෙන් අසන්නට අවශ්‍ය පර්යේෂණ ප්‍රශ්න මගේ සිතේ මතුවිය. ඔවුන් හා සම්මුඛ සාකච්ඡා කල යුත්තේ කෙසේද කියා මම දැනගතිමි. මා ලත් නිරීක්ෂණ වීටිමත් ලෙය සකස්කරගන්නා සැටින්, අලුත් නිරීක්ෂණ ආකෘති සකස්කරගෙන ඔවුන්ගේ සමාජය දිහා බලන හැටින් මම උගතිමි. මානව විද්‍යාවේ හා සමාජ විද්‍යාවේ කුමන උපක්‍රමයක් දත්ත එකතුකිරීමට යොදාගත්තත්, මතුවන්නාවූ බාධාවන් නිසා ඒ කටයුත්ත හරියාකාර කරන්නට ඉඩ නැති අවස්ථා තිබේ.

මම එවන් අවස්ථා ගැන නොයෙක්විට සඳහන් කොට ඇත්තෙමි. (Ratnapala 1986). එහිදී මම පර්යේෂණයේදී යොදාගත හැකි 'විද්‍යාත්මක ක්‍රම' (Intution) ගැන සඳහන් කොට ඇත. මෙබඳු "පර්යේෂණ ක්‍රම" දියුණු කරගත හැකිවන්නේ ජීවිත අත්දැකීම් මගින් යම්කිසි මිනිස් කොටසක් හඳුනාගන්නට ප්‍රයත්න කළ විටය, ඉව ඔස්සේ සොයායාම ගැනද මා පවසා ඇත. සැඟවී ඇති මූලාශ්‍ර සොයාගැනීමට මෙන්ම මූලාශ්‍රවලින් අමුතු දත්ත ගරාගැනීමත්, සොයාගත් දත්ත විග්‍රහයට දත්ත මූලාශ්‍ර යොදා ගත හැකි අන්දමත් වටහාගත හැක්කේ එවන අත්දැකීම් ක්‍රමය පුහුණු කළවිටය. පර්යේෂකයාට තමාගේ මූලාශ්‍ර සම්පත් හරිහැටි තක්සේරුකොට විග්‍රහ කරගැනීමට මගේ ක්‍රමය මගින් ලැබෙන ආධාර ඉමහත්ය (ibid 13-14)'

ලෙන්ගතුකම ඇතිකර ගැනීමෙන් පසු එය දියුණු කර ගැනීම ලෙන්ගතුකමට මුලින්ම ප්‍රවේශවීමටත් වඩා වැදගත්ය. ක්ෂෙත්‍රයේදී පහළ කරගත් ලෙන්ගතුකම එකදිගටම පවතී නම්, තමා දත්ත එකතු කරන්නට පටන් ගත්විට තව තවත් එය හැදී වැඩී සශ්‍රීක නොවේනම් ඒ ලෙන්ගතුකමෙන් අර්ථයක් නැත. මෙසේ ලෙන්ගතුකම වැඩිදියුණු කරගන්නට මගේ ජීවිත අත්දැකීමේ ක්‍රමයෙන් ලැබෙන පිටුවහල ඉමහත්ය. (ibid 15-24)

නිරීක්ෂණය කෙතරම් දුරට පර්යේෂකයාට දියුණු තියුණු කරගත හැකිද? එසේ දියුණු කිරීමක් අවශ්‍ය නම්, නිවැරදිව නිරීක්ෂණය කිරීමට මග පාදාගන්නට උවමනා නම් ජීවිත අත්දැකීම් ක්‍රමයෙන් ඒ සඳහා ලබාගත හැකි ආධාර ඉමහත්ය.(ibid-86-91). නිරීක්ෂණයේදී දකින දේ, පසිඳුරන්ට ප්‍රත්‍යක්ෂවන දේ, අපේ පැරණ්නෝ වනපොත් කළහ. ඒ ක්‍රමය මා ප්‍රයෝජනයට ගත්තේ නිරීක්ෂණයේදී දකින දේ මනසේ සටහන්කර ගැනීමෙනි. එවා ප්‍රශ්න ලෙස නොලියා ඒවාට උත්තර සහටන් නොකර, වනපොත් කිරීම මගින් සිතේ පදහන් කරගෙන ජීවිත අත්දැකීම් ක්‍රමයේදී ඒ දත්ත ප්‍රයෝජනයට ගෙන ඇත.

ප්‍රශ්න ඇසීමේ 'විද්‍යාව' ගැන දැනගැනීම ප්‍රශ්නාවලියෙන් ඩිවනිත වෙයි හාමුත් ප්‍රශ්නාවලිය කෙතරම් අවිද්‍යානුකූල පර්යේෂණ උපකරණයක්දැයි පෙනෙන්නේ එය සෙනු පර්යේෂණයේදී උපයෝගී කරගන්නා විටය. ප්‍රශ්නය

ප්‍රශ්නාවලියකට ප්‍රවේශ කරවා, එය දත්ත දායකයෙකු අරභයා නගනවිට ප්‍රශ්නයට හා උත්තරයට බලපාන්නාවූ කරුණු පහක් ගැන මා සඳහන් කොට ඇත (ibid93). ජීවිත අත්දැකීම් ක්‍රමය පුහුණු කරගන්නා අය ප්‍රශ්නයක් නොඅසා, ප්‍රශ්නවලට උත්තර සපයා ගනිති, යන්න මා සඳහන් කළේ මේ හේතු කොටගෙනය. ඕනෑම ක්ෂේත්‍රයක් අරභයා ප්‍රශ්නමාලාවක්, නිරීක්ෂණ ආකෘතියක් සාදාගැනීමට මඳ කලක් හෝ ජීවන අත්දැකීම් ක්‍රමය ප්‍රයෝජනයට ගැනීමෙන් ලැබෙන වාසිය ඉමහත්ය.

පර්යේෂණවලදී අපේ චර්යාගුණ ගැන (Ethics) අපි කතා කරමු. ඒ කියන්නේ අප පර්යේෂණ කරනවිට අනුගමනය කළ යුතු චර්යාගුණය. මම කිසිවිටක මේ චර්යාගුණ ඉක්මවා යන්නට නොකැමැත්තෙමි. යාචක ලොවට ගොස් මා යාචකයෙකු ලෙස ජීවත් වූයේ ඔවුන්ගේ ජීවිතය අත්දැකීමටය. මම කිසිදිනක ඒ අයගේ අනන්‍යතාව ඔවුන්ගේ අවසරයක් නැතිව පිටට නොකියමි. මගේ පොතේ ලියන්නට යන කාරණා ගැන කලින් මම ඔවුන්ගේ නායකයන් සමග සාකච්ඡා කළෙමි. මගේ ජීවන අත්දැකීම් ක්‍රමය අවසන්වූ විට මම ඔවුන් හමුවී මා කව්ද, එසේ ජීවත්වූයේ ඇයිදැයි කියා දුන්නෙමි. මගේ පොතේ ඔවුන් අපහසුතාවයට පත්කරන, කිසිම පෞද්ගලික කරුණක් ඇතුළත් නොකරන්නට මම පරිස්සම් වීමි.

චර්යාගුණ සැලකීම පර්යේෂණයකට ඉතාම වැදගත්ය. අප කවදාවත් අපේ පර්යේෂණයට අනභිතදුන් අය පාවා දිය යුතු නැත. අප කරන්නට යන කටයුත්තේ ස්වාභාවය කොතැනකදී හෝ ඔවුන්ට කියාදිය යුතුය. ඔවුන් රැවටීම අපට කළ නොහේ. මට අදත් සමහර යාචකයන් හමුවනවිට ඔව්හු 'පොත' ගැන ප්‍රශ්න කරති. වසර ගණනකට පෙර මගේ රූපවාහිනී සාකච්ඡාවක් දුටු ඔවුන් ('සුබ උදෑසනක්') මගෙන් ඉඳහිට එසේ ප්‍රශ්න කරන්නේ " මහත්තයා පොතක් ලිව්වාට, මොන ආණ්ඩුවක්වත් අපට පොතේ තියෙන විදියට පිහිට වෙලා නැහැ" කියාය. මා පොතින් කියා ඇති කරුණු ඔවුන්ද දන්නාසේය! මගේ පොත ඔවුන්ගේ ප්‍රශ්න රටේ, ලෝකයේ අවධානයට ගෙන ආවේය. ඔවුනට දැනට වඩා හොඳ ලොවක් ඇති කරන්නට මගේ පර්යේෂණයෙන් මඳවූද සහායක් ලැබේ නම් මා ගත් වෙහෙසට ඒ ප්‍රතිඵලය සෑසදෙන බව මගේ විශ්වාසයයි.

මගේ ජීවන අත්දැකීම් ක්‍රමය සර්ව සම්පූර්ණ ක්‍රමයකැයි මම නොකියමි. එය යොදාගත යුත්තේ මා කලින් කීවාක් මෙන්ම සෑම මානවවිද්‍යා සමාජ විද්‍යා පර්යේෂණයකදී නොව, මේ ක්‍රමය යොදවමින් මිස වෙනත් ක්‍රමයකින් දත්ත ලබාගත නොහැකි පර්යේෂණයකදී පමණය. මේ ක්‍රමය සමාජ විද්‍යාවේ හා මානව විද්‍යාවේ අවශේෂ ප්‍රමාණික ක්‍රම සමග එකට යොදාගැනීමටද පුළුවන. සමහරවිට එබඳු ක්‍රම වඩාත් සාර්ථකව ප්‍රයෝජනයට ගැනීම, ටික කාලයක් මේ ක්‍රමය ප්‍රයෝජනයට ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉක්බිති ක්ෂේත්‍රය සමග ලෙන්ගතුකම දියුණු කරගනිමින්, අවශේෂ ක්‍රම සාර්ථකව ප්‍රයෝජනයට ගත හැකිය.

මගේ මේ ක්‍රමය වෙනත් තැනක (The Beggar in Sri Lanka) ලියූ කෙටි සටහනක් මෙහිදීද දැක්වීමට කැමැත්තෙමි.

1. සහභාගීත්ව නිරීක්ෂණයට කරන්නා මෙන් නොව, මේ ජීවන අත්දැකීම් ක්‍රමයේදී පර්යේෂකයා තමා පර්යේෂණය කරන සමූහයාගෙන් කෙනෙකු බවට, සෑම අර්ථයකින්ම, පරිවර්තනය වෙයි.

2. තමන් තුල ආධාන ගාහී දෘෂ්ටි කෝණයෙන් තැතිව (තම සමාජ විද්‍යාඥයෙකුයැයි මානව විද්‍යාඥයෙකුයැයි නොසිතා) කටයුතු කිරීම නිසා මේ අවදියේ ඔහු තුල 'උගත් වපර, හෝ ආකල්ප ඇතිවීම වලකියි.

3. ජීවන අත්දැකීම් ක්‍රමය ප්‍රයෝජනයට ගෙන ක්ෂේත්‍රයේ ජීවත්වන ඔහු සිතේ සටහන් කරන කිසිදු දෙයක් තම මානව හෝ සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් දැකීම විග්‍රහ කිරීම මේ කාලය තුල ප්‍රතික්ෂප කරයි.

4. ක්ෂේත්‍රයේ මේ සඳහා දීර්ඝ වාසයක් අවශ්‍යවේ. මුලදී කෙටි වාසයක්, ක්‍රමක්‍රමයෙන් දීර්ඝ වාසය හෝ මුලදී දීර්ඝවාසයක් අනතුරුව කෙටිවාසයත් තමාට කැමති පරිදි, පර්යේෂණයට උචිත පරිදි යොදාගත හැකිය. මුලදී කෙටිවාසය අවශ්‍යවන්නේ (මගේ අත්දැකීමේ හැටියට) පර්යේෂකයා, අපේක්ෂිත ක්ෂේත්‍රයට සමජානුයෝජනය වීමටය.

5. මේ ක්ෂේත්‍රගතවීම, තමා පර්යේෂණයට අදාල වූ ක්ෂේත්‍රය සහමුලින් ග්‍රහණය කළායැයි යන පූර්ණ තෘප්තිය හමුවන තුරු ගෙනයිය හැකිය.

6. ජීවන අත්දැකීම් ක්‍රමය ආරම්භ කොට ක්ෂේත්‍රයට යෑමට පෙර වෙනත් ක්‍රමවලින් ක්ෂේත්‍රය ගැන කරුණු සොයා දැනගත "හැඟීමක්" ඇති කරගෙන ප්‍රවේශවීම වාසිදායකය. ක්ෂේත්‍රයේදී පැන නැගිය හැකි ප්‍රශ්න ගැන කලින් "අපේක්ෂාවක්" ඇතිකර ගැනීමට ඉන් අවස්ථාව ලැබේ.

7. ජීවන අත්දැකීම් ලැබුවාට පසු, සමාජ විද්‍යාවේ හෝ මානව විද්‍යාවේ ප්‍රකට ප්‍රමාණික ඕනෑම ක්‍රමයක් උපයෝගී කරගෙන ලද අත්දැකීම් දෙස විද්‍යානුකූලව බැලිය හැකිය. අලුතින් අවශ්‍ය දත්ත එකතු කිරීමට මාර්ග සැලසිය හැකිය.

මේ ජීවන අත්දැකීම් ක්‍රමය පසුකාලයේදී මා ප්‍රයෝජනයට ගත්සැටි හා දියුණු කරගත් සැටි අනාගතයේදී වෙනත් ග්‍රන්ථයකින් විස්තර කිරීමට අපේක්ෂා කරමි.

2 යාචක ජනශ්‍රැතිය (යාචක වේදය)

හිඟන්නන් අතර ජනශ්‍රැතියක් ඇත. මේ ජනශ්‍රැතිය මුඛපරම්පරාගතව පැවත එයි. හිඟන්නන් යාචක ලෝකයට පැමිණ සිංහල හා දෙමළ සමාජයේ පවත්නා පොදු ජනශ්‍රැතිය නිර් උරුමයෙන්ම ඔවුන්ගේද ජනශ්‍රැතිය වෙයි. තමුදු වෙනසකට ඇත්තේ යාචකයන් අතර පවත්නා ජනශ්‍රැතිය යාචක ජීවිතයට අවශ්‍ය දෙයක් වීමය: ඒ යාචක ජීවිතය අනුව හැඩ ගැසී නව ලක්ෂණවලින් සමන්විත වීමය.

හිඟන්නන්ට ජනශ්‍රැතිය තුන් ආකාරයකින් ප්‍රයෝජනවත්ය. ඔවුන්ගේ ලෝකයේ ජීවත්වනවිට දරුවන්ට සමාජානුයෝජනය ලබාදීමට, අවශේෂ මහා සමාජයට මෙන්ම, ඔවුන්ට ද ජනශ්‍රැතිය අවශ්‍ය වෙයි. දරුවා අවට ලෝකය ගැන ඉගෙනගන්නේ, ජීවිතය ගැන දැනගන්නේ ජනශ්‍රැතිය මිස්සේය.

ජනශ්‍රැතිය හිඟන්නාගේ ජීවිතය ගත කරන්නට උදව්වීම ඊළඟ වැදගත් කාරණයයි. අම්බලමක හෝ වෙනත් ස්ථානයක නැවතී ඉන්නාවිට ඇඟපතේ කාන්සිය, හිතේ පාලුව නැති කරගන්නට හැකිවන්නේ ජනකවියක් ජනකතාවක් කීමෙනි. සමහර විට කෙනෙක් ජනකවිය තනිවම කියයි. විටක ජනකතාවන් ආශාවෙන් ශ්‍රවණය කරන්නෝ ද ඔවුන් අතර වෙති. ප්‍රස්තාපිරුළු හා වැකිය හා සත්වශ්‍රැති, යන්ත්‍රමන්ත්‍ර විශ්වාසය ආදී වෙනත් ජනශ්‍රැති අංග ඔවුන් අතර දකින්ට පුළුවන. ජනශ්‍රැතියේ ඊළඟ වැදගත්කම හිඟන ජීවිතයට කෙනෙකු සමාජානුයෝජනය කිරීම හා සම්බන්ධ වීමය. හිඟන ලෝකයට ප්‍රවේශ වූන යුගයේ හිඟන්නන් සමාජානුයෝජනය කරනු ලැබුයේ විධිමත් පිළිවෙලකටය. එසේ විධිමත්ව සමාජානුයෝජනය කිරීම මෙන්ම අවිධිමත් ලෙස සමාජානුයෝජනය වීමද ඔවුන් අතර ඇත. මේ අවස්ථාවලදී ජනශ්‍රැතිය පිහිට කරගෙනය ඉහත කී සමාජානුයෝජනා ක්‍රියාවලින් දෙකම සිද්ධ වන්නේ.

යාචකයන්ගේ ජනශ්‍රැතිය විවෘත හා විවෘත නොවූ (නිලීන) යැයි කොටස් දෙකකින් යුක්තය. විවෘත ජනශ්‍රැතිය නම් කොයිකවුරුත් දන්නා, කොතැනත් එළිපිට කියන ජනශ්‍රැතියයි. ආවෘත ජනශ්‍රැතිය (නිලීන) නම් උදක් ඔවුන්ටම සීමාවූ ගුප්ත මුඛපරම්පරාගත දැනුමයි. ඔවුන් අතර ඇති 'ගුප්ත භාෂාව' (රහස්බස) මීට උදාහරණයකි. ඔවුන්ගේ ජීවනවීමේ විවිධ රටා තවත් එක් නිදර්ශනයකි. හිඟාකෑමට යොදෙන උපක්‍රම ගුප්ත ජනශ්‍රැතියට අයත් තවත් කොටසකි.

යාචක ලෝකයේ ඉතාම ජනප්‍රිය ජනශ්‍රැති අංශය ජනකවිය වන්නේය. සිංහල සමාජයේ ඇති සමහර ජනකවි යාචකයන් උගෙන ඇති බව පෙනේ. මේ ජනකවි අතරින් තනිව ඉන්න විට ඔවුන් කියන්නේ බොහෝවිට දුක, වේදනාව හා සම්බන්ධ කවිය. දුප්පත්කම නිසා තමන්ට පැමිණෙන විවිධ ගැහැට බොහෝ ජනකවිවල දක්නට ලැබේ. මේවා කියවීමෙන් තමන්ගේ හිතට එන දුක හා සාංකාව තුරන් කර ගැනීම ඔවුන්ගේ අපේක්ෂාවයි.

මහා සමාජයෙන් ඔවුන් ලබාගත් අන්‍ය ජනකවි අතර උපදේශ කවි මුල් තැනක් ගනියි. ඒ ජනකවි පවා බොහෝවිට මිනිස් ජීවිතය පිළිබඳ සියුම් නිරීක්ෂණ අප වෙත ගෙන එයි. තනිවම කියනවාට වඩා ඒ ජනකවි හිගාකන අතර ශබ්ද නගා ගායනා කිරීම ඔවුන්ට පුරුදුය. නිතර නිතර මට ශ්‍රවණය කරන්නට ලැබුණු එවන් පද්‍ය අතර පහත සඳහන් කවි විශේෂය.

දුකකට පිහිට පුලු මිනිසුන්ගෙන් විතර
ලොකුවට සිටින අයගෙන් නැත කිසිම වර
නිබඳට වතුර බීමට පුලු මිඳ විතර
කිසිවට පිහිට නැත ගැඹුරැති මහ සයුර

නැගියා නොහැක තනියෙන් ගනෙහි වාරුව
ලැගියා තැනින් තැන අගුවල අසීරුව
නොගියා මෙන් ගෙදී පව් කරපු පුරුව
දුගියාටමය කවදත් හැම අමාරුව

හිඟන්නන් සමහරවිට මේ කවි ගායනා කරන්නේ තනිවම නොවේ. දෙදෙනෙක් එක්වීගෙනය. පළමුවැන්නා ගායනය කරනවාට වඩා වෙනස් ස්වරයෙකින් හා උස් හඬකින් දෙවැන්නා කවිය කියයි. එවිට එය අසා සිටින්නාට ඉතා ප්‍රියමනාපය.

ආගමික මුහුණුවරක් ඇති ජනකවි ගායනාව හිඟන්නන් කරන්නේ භක්තිවන්තයන් සතුටු කොට හිඟමන් ලබාගැනීමටය. අකුරු ඉගෙන ගෙන නැතත් ආගමික කවි ඔවුන්ට උගන්වන අය සිටිති. මා සමාජාශ්‍රයෝජනය ලබන කාලයේ මටත් එවන් කවි ඉගෙනගැනීමට ලැබුණි. බුදුහාමුදුරුවන් ගැන, ශ්‍රීපාදය ගැන, පමණක් නොව බුදුහාමුදුරුවන්ගේ හා සම්බන්ධ ඇතැම් සිද්ධි හා ජාතක කතා අපට උගන්වන ලැබුයේ ඒවා ගායනා කොට ජනතාවගේ ප්‍රසාදය දිනාගැනීමටය. සමහර ඒවා කවි වුවත්, ඇතැම් රචනා අප ඉගෙන ගත්තේ විරුදු ලෙස ගායනා කිරීමටය. මේ කවි අතර වෙස්සන්තර ජාතකයේ ඇතැම් කවි එකල හිඟන්නන් වන අප සාගේත් සිත් යාන්තේය.

දරුවන් දෙන්නා දන් දුන්නාට පසු මද්‍රී දේවී නගන විලාපය අපට උගන්වන ලද්දේ දුක්ඛිත ස්වරයකින් පිරිස මැද ගායනා කරන්නටය. මට මිහිරි ලෙස ගායනා කළ නොහැකි විය. නමුත් අපේ කණ්ඩායමේ වැඩිහිටියෙක් ඉතා මියුරු හඬින් මේ පද්‍ය ගායනා කළේ අසන්නන් තුළ පුදුම කම්පනයක් පහළ කරමිනි. සමහරවිට අපගෙන් දෙතුන් දෙනකට මෙවන් කවියක් උගෙන සමූහ ගායනාවක් ලෙස ඉදිරිපත් කරන්නට දැනුම් දෙන ලදී.

බාලේ පෙම්බර කොන්ඩා බැන්දත් තපසට නොගනිති
දෙකනේ පුස්කොල තෝඩු තිබුවත් තපසට නොගනිති
සන්නාඩි කැඩපත් ලුහු බැලුවත් තපසට නොගනිති
දෙකන දෙමස්කන් මේවර ලූවත් තපසට නොගනිති

සිංහල ජනකවිවලින් ඉතා අවශ්‍ය කොටස් තෝරාගෙන ඉගැන්වීම ඒ අයගේ සමජානුයෝජනයේ වැදගත් කොටසක් විණ. අසන්නන් සිත් තුළ කම්පනය ඇති කරන කොටස් වෙස්සන්තර ජාතකය, භූරිදත්ත ජාතකය, විදුර ජාතකය ආදී ජාතක කතාවලින් පමණක් නොව වංචිමානවිකාවගේ කතාව, යශෝදරාවත අංගුලිමාල කතාව ආදී කතාන්තරවලින්ද ඊගෙන පද්‍යයට නගා කියන්නට අපට උගන්වන ලදී. ඉතා උස් හඬින් කියන්නට මටත්, තව දෙදෙනකුටත් බාර කළ කවි දෙකක් අදත් මට සිහියට නැගෙයි.

වෙසතුරුගේ රුව රන්කඳ වැන්නේ
බියවුන්ගේ රුව පුන් සඳ වැන්නේ
දරුවන්ගේ රුව රන්කඳ වැන්නේ
යද්දී නිවසේ කෙලෙසද ඉන්නේ

මේ දන් දුන්නා මිහිකත් දකිමින්
පොළවද ගුගුරා මෙරගල් නටමින්
තුන්ලොව දෙවියෝ දිවැසින් දකිමින්
වෙසතුරු රජු හට මල් වැසි වසිමින්

සමහරවිට හිගන්නන් තුන් හතර දෙනෙක් දිගටම ජාතක කතාවක් පද්‍යයෙන් කියාගෙන යන අවස්ථා ඇත. එවන් අවස්ථා නාට්‍ය මුහුණුවරකින් ඉදිරිපත් කිරීමට දක්ෂතා ඇති අය තෝරා ඒ සඳහා යෙදවීම සමාජානුයෝජනයේදී සිදු කෙරිණ.

හිඟාකෑම සඳහා අවශ්‍යයෙන්ම උගත යුතු පද්‍ය වාක්‍යබන්ධ හා කවි තිබිණ. ඔබ සමහරවිට නිතර අසා ඇති ඉතා ප්‍රකට යාචක කවියකින් දෙපදයක් නම් මෙසේය.

අනේ මහතුනේ මට වන් මේදුක බලා
සෙනේ සිතින් අනුකම්පා උපදවලා

දානයේ උතුම්කම කියන්නාවූ පද්‍ය අපට උගැන්වූ කවි අතර ප්‍රධාන තැනක් ගනියි.

කෑ දේ ගඳය, දුන් දේ සුවඳය සත්තේ
දානය තමයි සව්රුන් ගරු කළ යුත්තේ

හිගන්නන් යාචක ලෝකයට සමජානුයෝජනය වන විධිමත් හා අවිධිමත් විධි දෙකක් ඇත. විධිමත් විධිය නම් මා එයට ප්‍රවේශ වූ ආකාරයයි. හිඟන සමූහයක් අලුත් නැනැත්තා බාරගෙන ඔහුට හිඟාකන්නට අවශ්‍ය

දැනනුවණ හා උපක්‍රම කියා දෙයි. 1950 ගණන්වල සමාජ සේවා අධ්‍යක්‍ෂව සිටි කොහොඹන් වික්‍රම මහතාගේ වාර්තාවක මේ යාචකයන් සමාජානුයෝජනයට පත් කරන ඉතා විධිමත් වූ "හිඟන ඉස්කෝලයක්" ගැන සඳහන් වන බව එච්. ඇස්.ඇස්. නිශ්ශංක පවසයි (1961,27). 1940 ගණන්වල තිබූ එවන් හිඟන ඉස්කෝලයක් ගැන එච්. ගුණතිලකගේ කෞතුක සංග්‍රහය දී සඳහන් කොට ඇත (කෑගල්ල 1949).

කොළඹට නුදුරු පෙදෙසක මෙබඳුම ආකාරයේ යාචකයන් සමාජානුයෝජනයට පත් කරන 'හිඟන පාසලක්' මෑත දුටුවෙමි. ඒ පාසැලේ කරනු ලබන සමාජානුයෝජනයේදී ජනශ්‍රැතිය බෙහෙවින් ප්‍රයෝජනයට ගනු ලැබේ. හිඟාකෑමට ප්‍රයෝජන වන කියුම්, කවි හා ගද්‍ය ඡේද පාඨ කටපාඩම් වන තුරු උගන්වනු ලැබේ. "පින්වන්ත මහත්වරු මේ දෙපා නැති කාලකන්නියාට අනුකම්පා කරලා බඩපාය නිවාගන්න කීයක්වත් ලබාදේවි" යනාදි වශයෙන් කලින් සූදානම් කළ වාක්‍ය කටපාඩම් කරවනු ලැබේ.

මෙබඳු වාක්‍ය හිඟන්නන් වන අප කියනවා අසන්නට අපේ 'ගුරුවරු' පැමිණෙති. ඒවා අසා සිට ආපසු නවාතැනට ගියවිට අපේ වැරදි හරි ගස්වා නැවතත් ඒවා සාර්ථකව කියන සැටි උගන්වති. කුඩා ළමයින්ට පවා කෙටි පාඨ මේ ආකාරයෙන් උගන්වනු ලැබේ. හිඟන වෘත්තියට සම්බන්ධ කවි සෑහෙන ගණනක් ඔවුන් අතර මුඛ පරම්පරාවෙන් රැගෙන ආරක්‍ෂා වී ඇත. ඒවා ඉගෙන ගැනීම පමණක් නොව ගායනා කළ යුතු ආකාරය පවා අපට අපේ ගුරුවරු උගන්වති.

ගුප්ත ජනශ්‍රැතියේ දී වැදගත් වන්නේ අප ප්‍රයෝජනයට ගන්නා 'රහස් බසයි'. සංඥා, ශබ්ද, සංකේතවලින් පිරුණු මේ බස නැතිව හිඟන ජීවිතය ගත යා නොහැකිය. යාචක වෘත්තියට අවශ්‍ය සෑහෙන දැනනුවණක් මේ භාෂාවේ අන්තර්ගත වී ඇත. අප හිඟාකන්නට යන ප්‍රදේශයේ ජීවත් වන අය මසුරු, දානශීලි යැයි කිව හැකි කොටස් දෙකකට බෙදා ඒ අයව අපට හඳුන්වා දෙන්නේ මේ 'භාෂාව' මගිනි. ඒ අයගේ ඇතැම් ගතිගුණ අපි ඉන් ඉගෙන ගනිමු. එපමණක් නොව ඔවුන්ගේ නිවෙස්වල ජීවත්වන අනික් අයගේ ස්වභාවය, සතාසිව්පාවාගේ හැසිරීම අප දැනගන්නේ මේ භාෂාවෙනි. අන් අයට හොරා උදවියට යම්යම් දේ අප අහවන්නේ විවිධ ශබ්ද, ස්වර සංකේත උපයෝගී කරගත් මේ භාෂාවෙන්ය.

පසු කාලයේදී සිඟන ගොළු බිහිරි හෝඩිය ජනකවි ලෙස මා විසින් දැක ඇත. ඒ හෝඩියේ එන අකුරු ශරීරයේ විවිධ ස්ථාන ශබ්ද හා බැඳී පවතී. නළල මැද ඇල්ලුවොත් 'අ' යන්න; ඇස බැම ඇල්ලුවොත් 'ඉ' යන්න; ඇස ඇල්ලුවොත් 'උ' යන්න, නාසය ඇල්ලුවොත් 'එ' යන්න ය. මේ ආකාරයෙන්ම හිස, නළල, ඇස, කන ආදි තැන් ඇල්ලීමෙන් අදහස් ප්‍රකාශ කිරීම යාචක ජනශ්‍රැතියේ දක්නට ලැබේ. ඒ හැම සංකේතයක්ම දැන ගැනීම යාචක ජීවිතයට ප්‍රයෝජනවත්ය.

පාරේ යන එනවිට යාචකයා සංකේත හා සංඥා ගැන සොයා බලයි. ඒද ඔහුගේ ජනශ්‍රැතියේ අංගයකි. වෙනත් යාචකයෙක් මගදී ඔහුට සංඥාවක් දුන් ඇත. ශරීරයේ යම් තැනක් ඇල්ලීමෙන් හෝ වෙනත් ක්‍රියාවකින් අඟවන මේ සංඥාවේ අර්ථය ඔහු දත යුතුය. "ඔය පැත්තට යන්න එපා. හිඟමන් නෑ" කියා හෝ 'බොහොම හොඳ ගෙදරක් තියෙනවා. ඉක්මනින් ගියොත් කෑම වේලක් ලැබේ" කියා හෝ ඒ සංඥාවේ අර්ථ කියනු ඇත.

පාරේ හෝ නිවෙස් ළඟ යම්යම් ලකුණු සටහන් කොට යෑමද යාචක ජීවිතයේ කොටසකි. මේ ලකුණු යොදන්නේ කාටවත් ලේසියෙන් නොපෙනෙන ආකාරයෙනි. ගේට්ටුව ළඟ ගලක් එහාමෙහා කොට තැබීමෙන් "මේ ගෙදර හොඳ කරුණාවන්ත කෙනෙක්" කියා තවත් යාචකයෙකුට පණිවිඩයක් ලබාදිය හැකිය. මේ පණිවිඩ කෙතරම් අර්ථවත්ද? යාචක ජීවිතයට ඒවා මොන තරම් ප්‍රයෝජනවත් දැයි දැනෙන්නේ හිඟන්නන්ගේ ජනශ්‍රැතිය වටහාගත් විටය.

හිඟන්නන් මහා සමාජයේ ජීවත් වෙතත්, ඒ ඇතුළතම උප සංස්කෘතියකට අයත් වන නිසා ඔවුන්ගේ බසද ඒ අනුව වෙනස් වෙයි. සාමාන්‍ය ජීවිතයේ වචනවලට දෙන අර්ථ ඔවුහු වෙනස් කරති. මේ අර්ථ වැදගත් වන්නේ හිඟන උප සංස්කෘතියට පමණය. ඒ සංස්කෘතියෙන් එහා කිසිවෙකුට ඒ බස වැටහෙන්නේ නැත.

හිඟන වේෂය දුටුවන් සිත් අනුකම්පාවට භාජන කළ යුතුය. හිඟමන් ලැබෙන්නේ එවිටය. ඒ නිසාම එවන් වේෂයන් අමුතුවෙන් ආරූඪ කරගන්නා හැටි හෝ තිබෙන ස්වභාවික සානුකම්පිත ලක්ෂණ තවත් වැඩි දියුණු කරගන්නා හැටි හිඟන සමාජානුයෝජනයේදී උගත් වනු ලැබේ. ඒ සියලු උගැන්වීම්ද යාචක ජනශ්‍රැතියේ අවශ්‍ය අංගෝපාංග වෙයි. කකුලේ තුවාලයක් සදහා කරවල කැල්ලක් බැඳ ගැනීම හා ඒ 'තුවාලය' අවට පැණි ගෑම සාමාන්‍යයෙන් සිදු කරන්නේ තුවාලයේ භයානකකමත්, මැස්සන් පිරී අපිරිසිදු කමත් වැඩි කිරීමටය.

සබන් කැල්ලක් කටේ දමාගෙන බිම පෙරලී මීමැස්මොරය සෑදුනු බව අඟවන්නට නම් ඒ ක්‍රියාව රඟ දක්වන සැටි යාචක ජනශ්‍රැතියෙන් උගත යුතුය. අන්ධයෙකු නොවේ නම් අන්ධබව බාහිර ලෝකයට පෙන්වන්නට හෝ ගොලු බිහිරි බව පෙන්වන්නට ජනශ්‍රැතිය උගත යුතුය. ජනශ්‍රැතියෙන් යාචක බස්වහර දැන ගැනීම නිසා ආරූඪ කරගත් ගොලු බිහිරි බව අන්‍යයන්ට සැකයක් නොවන ලෙස ප්‍රයෝජනයට ගැනීමට මාර්ගය සකස් වෙයි.

ඇස් පෙනෙන නමුත් 'අන්ධබව' මවාපාන හිඟන්නා අවට ඉන්න තම සගයන්ගේ උදව් මත ජීවත් වෙයි. මේ සගයන් කරන ශබ්ද, සංඥා අනුව තමන්ට සමීපව පිටස්තර අය ඉන්නවාද නැද්ද කියා දැනගැනීමට ඔහුට හැකිවෙයි. පොල්කටුවකට සෙමින් ගසන සහචරයා ඒ ශබ්දයේ එකී ස්වරයකින් අඟවන්නේ

ළඟ ළඟම කරුණාවන්ත දරු පවුලක් එන බවයි. අන්ධයා එවිට ඇස් පියාගෙන අනුකම්පාව යොමුවන ආකාරයෙන් කෑ ගසයි. කවරුත් නැති විට පොල්කටු හඬ වෙනස් වෙයි: නැත්නම් නැතිව යයි. අන්ධයා බිය සැක නැතිව ඇස් හැර අවට බලයි.

අනුන් රවටා හිඟමන් ලබා ගත හැකි 'විධි හා ක්‍රම' සමාජානුයෝජනයෙන් ලබාගන්නත් ඒවා රැඳී පවතින්නේ යාචක ජනශ්‍රැතිය (යාචක වේදය) තුලය. හිඟාකෑම කරන්නට යන 'සමූහය' තමන්ගේ හිඟන ප්‍රදේශය සිතියම්කට ගන්නේ ඒ ප්‍රදේශයෙන් එකතු කරගන්නා ජනශ්‍රැතිය උපයෝගී කරගෙනය. මගේ අත්දැකීමේ හැටියට ඔවුහු මේ 'යාචක සිතියම් කරණය' ජනශ්‍රැතිය උදව් කරගෙන සාර්ථක අන්දමින් සිදු කරති.

1. දාන ගෙවල් ඇත්තේ කොයිතැන් වලද?

2. පන්සල්, පල්ලි, කෝවිල් හා ඒවායේ උත්සව දිනම් වකවානුවේ පවත්වයිද?

3. පෝසත්, දන්දීමට කැමැති අය කවිද? නොදෙන අය කවිද?

4. තමන්ගේ හිඟන ප්‍රදේශයේ ඉන්නා වැඩියෙන් දන් දෙන අයගේ වාසිදායක ලක්ෂණ මොනවාද? "එයාගේ පුතා මැරිලා ඒ ගැන හරි දුකයි. මේ කාරණය ප්‍රයෝජනයට ගන්න පුළුවන්. කොහොම හරි පුතා ගැන කතාව පටන් ගන්න ඕනෑ"

   "මේ පුද්ගලයා වර්ණනා කරනවාට ආසයි. හාමු කියා කතා කරන්න ඕනෑ. එයාගෙ පෝසත්කම ගැන කතා කරන්න ඕනෑ. එයා අසවලා එක්ක තරහයි. තරහකාරයා ගැන නරක කියා කතාව ගෙනියන්න ඕනෑ."

   මෙබඳු කරුණු එකතු කරගෙන සමූහයේ අභ්‍යයනට බෙදා දෙනු ලබන්නේ යාචක ජනශ්‍රැතිය මාර්ගයෙනි.

5. පොළවල්,විවාහ මංගල්‍ය උත්සව, අවමගුල්, දනමාන ආදී මිනිසුන් රැස් වන අවස්ථා ගැන දැන සිටීම.

6. ප්‍රදේශයේ භූගෝල ශාස්ත්‍රය ගැන දැන ගැනීම.

යාචක සමාජයේ ජීවත්වීමට ඒ අයට උරුම වූ ජනශ්‍රැතිය කෙතරම් අවශ්‍ය න්නේ දැයි ඔබට මින් වැටහේ. හිඟාකෑම සාර්ථකව කරගැනීම මෙන්ම යාචක ලෝකයේ ජීවත්වීමට ඒ අයගේ ජනශ්‍රැතිය ගැන මනා අවබෝධයක් ඔවුන්ට තිබිය තුය. ප්‍රදේශයේ භූගෝලීය ලක්ෂණ ගැන, ඔවුහු දැන ගන්නේ ජනශ්‍රැතිය ඔස්සේය. වහ සොහොනාගේ ගේ," "මළ පෙරේත කඩේ", "දිය ඇල්ල ළඟ බංගලාව" මුදේවිගේ පන්සල" "හොල්මන් ගෙදර", " සැර ස්වාමි ඉන්න පල්ලිය", "අවලම්

ගුරු ගෙදර", හූනියම් බාස්ගේ ගෙදර", "කටු බැල්ලි වගේ හාමුගේ වලව්ව", "කටකාර අප්පුහාමිගෙ වත්ත" "පූජක මුදලාලිගේ කඩේ", "කදුළු නෝනාගේ ගෙදර" යනාදි වශයෙන් ප්‍රදේශයේ හා එහි ජීවත්වන්නන් පිළිබඳ ඇතැම් ලක්ෂණ යාචකයන් විසින් හඳුන්වන්නේ ජනශ්‍රැතිය පිහිට කරගෙනය.

යාචක ජනශ්‍රැතිය කල්පනාවෙන් අධ්‍යයනය කළහොත් පහත සඳහන් ලක්ෂණ මේ ජනශ්‍රැතිය තුළ ඔබට හමුවනු ඇත.

1. අනුන් තුළ අනුකම්පාව විශ්වාසය ඇතිවන ආකාරයට කතා කිරීමටත්, හැසිරීමටත්, අවශ්‍ය නම් විශේෂ උපාය මාර්ග යොදා ගැනීමේ ක්‍රම කියාදීම.

2. අනුන් ආශා කරන දේ පිළිබඳව කියා ඔවුන්ගේ සිත් සැනසීම.

කාලයක් එක් ප්‍රදේශයක හිඟාකන විට ඒ ප්‍රදේශයේ වාසය කරනා අය පිළිබඳව ව්‍යවහාර ජනශ්‍රැතිය (කටකතා) එකතු කෙරේ. හවසට හිඟා කා අම්බලමට ඇවිත් හිඟන්නෝ මේ ජනශ්‍රැතිය හුවමාරු කරති. 'මම අද ගිය පැත්ත මෙහෙමයි. හම්බ වුනේ මේ අය, මෙන්න මේ ගතිගුණ ඒ අයට තිබෙනවා. මට ඒ නිසා හිඟමන් හුඟක් ලබන්න පුළුවන් වුණා. "කියා කී විට ඒ ප්‍රදේශයේ මිනිසුන් ගැන හොඳ ජනශ්‍රැතියක් ගොඩ නැගේ. ඒ. අනුව ඊළඟට එවන් පුද්ගලයන් හමු වී, ඔවුන්ගේ යටෝක්ත දුර්වලකම් දැනගෙන, තමන්ට අනුකම්පාව දිනා ගැනීමට අන්‍ය යාචකයනට හැකිය.

නිදර්ශනයකින් මෙය වටහා ගන්න. " ඒ කියන තැනැත්තා තමන්ගේ මිය ගිය පියා ගැන තදින් දුක් වෙනවා. මේ බව එක් යාචකයෙක් දකිනවා. ඔහු අනින් අයට එය දන්වනවා. ඉහත කී කාරණය දැන් යාචක 'ජනශ්‍රැතිය' ට එකතු වෙනවා. හෙට ඒ තැනැත්තා හමුවීමට යන යාචකයා මේ ජනශ්‍රැතියෙන් ප්‍රයෝජන ගන්නවා. "අනේ ඔබතුමාගේ මිය ගිය කරුණාවන්ත පියතුමා ඒ රටක් වටිනා මුදලිතුමාට පින්සිද්ධ වන්න මේ දුප්පත් අබ්බගාතයාට යමක් දෙනවාද".

3. මේ ආත්මයේම නිදුක් - නිරෝගීව ජීවත් වන්නට පුළුවන් බව පැවසීම. බොහෝ විට දක්ෂ යාචකයා මේ සඳහා ද ජනශ්‍රැතිය ප්‍රයෝජනයට ගනියි.

"මේ කළ දානයෙන් සීවලී මහා රහතන් වහන්සේට මෙන් කිසිම ලැබීමකින් අඩුවක් නොවේවා."

" බක්කුල මහා රහතන් වහන්සේට වගේ නිරෝගී බව ලැබී..."

" විශාඛා වගේ මහා උපාසිකාවක් වී....."

4. ඊළඟ උපතේදී යැම අනතිනම සමෘද්ධිමත් වීමේ ප්‍රාර්ථනාව ඇති කිරීම.

"මට කළා වූ මේ උපකාරයේ බලයෙන් අනේක දිව්‍ය මනුෂ්‍ය සම්පත් ලබා අවසානයේදී නිවන් සැපයම ඔබතුමන්ට ලැබේවා!."

සාමාන්‍යයෙන් යාචකයා තමන් හිගාකන ප්‍රදේශයේ 'ආගම' ගැන ද ජනශ්‍රැතියෙන් උගෙන ගනියි. මඩු පල්ලියට, තලවිලට, කොච්චිකඩේට යන බොහෝ ක්‍රිස්තියානි ආගම පිළිබඳ ජනශ්‍රැති ප්‍රයෝජනයට ගන්නේය. කතරගම, කැළණිය, මහනුවර, අනුරාධපුරයට වැනි ප්‍රදේශවලට යනවිට බෞද්ධ ජනශ්‍රැතිය තමන්ගේ කටයුතු සාර්ථක කරගැනීමට යොදන්නේය. එබඳු දක්ෂ කමක් නැතිව, තමන් කටයුතු කරන ක්ෂේත්‍රයේ ජනශ්‍රැතිය ගැන ජන විශ්වාස ඇදහිලි ගැන වැටහීමක් නැතිව යාචකයාට කවදාවත් තමන්ගේ හිඟන ජීවිතය සාර්ථක කරගත නොහැකි වන්නේය.

හිඟන්නන් මුල් කරගෙන අප අතර පවා ප්‍රචලිත කියමන් ඉතා ප්‍රකටය. "හිඟන්නාගේ තුවාලය වගෙයි" යන කියමන (ප්‍රස්තා පිරුළ) අපි නිතර යොදා ගනිමු. 'හිඟන්නන්ට කොයින්ද උඩු බත්" මෙවැනි තවත් ප්‍රකට කියමනකි. මෙබඳු ප්‍රස්තා පිරුළු හා කියමන් හිඟන්නන් කේන්ද්‍ර කරගත්තත් ප්‍රචලිතවී ඇත්තේ ඒ අය අතර නොවේ.

හිඟන ජනශ්‍රැතිය මුල් කරගෙන රචිත සාහිත්‍ය නිර්මාණද අපඅතර ඇත. ඩබ්.ඒ. සිල්වා ගේ '**හිඟන කොල්ලා**' ඉන් ඉතා ප්‍රකට නවකතාවයි. හිඟන ජීවිතය, විශේෂයෙන්ම ජනශ්‍රැතිය ගැන ඩබ්.ඒ. සිල්වා ගේ තිබූ ප්‍රත්‍යක්ෂ අවබෝධය මට පැහැදිලි වූයේ හිඟන සමාජයේ ජීවත් වී මා විසින්ම ඒ ජීවිතය අත් දැක ගත්තාට පසුවය. හිඟන්නන්ගේ ජනශ්‍රැතිය ඩබ්.ඒ සිල්වා විස්තර කරන්නේ මෙසේය.

"ජේදුරු අයියා! මගේ නම සයියා. තාත්තාගේ නම වයියා. මගේ තාත්තාත් අම්මාත් මාත් අපි ඔක්කොම හිඟන්නෝ. හිඟන්නා වුනාට මොකද මගේ තාත්තා මහ නපුරු මිනිහ. අලිම අලි හොරා. ඔහුට තෙණක්වත් නැහැ - ඒකට මොකද කණෙක්, පොට්ටයෙක්, කොරෙක්, ගොළුවෙක්, බිහිරෙක් වගේ ඕනෑ කෙනෙක් රවටලා, හිඟමන් ගන්න දන්නවා. මගේ පිට තැළෙනා කං තල තලා එයා ඉගැන්නුවෙ, මේවා කරන සැටි තමා. නාහින් කටින් පෙන දමා ගෙන අපස්මාර කාරයෙක් වගේ වැටෙන්න ඉගැන්නුවෙත් එයාම තමා. අපේ අම්මා බොරුවට පිස්සු ගාන්වා. ඉහටියෙන් බැඳගෙන, ඔහු පාරක් ගානේ නටව නටවා හිඟමන් ගන්නවා. එයාට මේ පිස්සු ගෑනි නිසා රැකීමක් - රක්පාවක් කර ගන්නා හැටියක් නැත. දැන් මේ ලෙඩේට වෙදකම් කරලා ඇති තත්තේ නැති වෙලාය. බේත් හේත් කරන්න තියා කන්න දෙන්න වත් බැරි තරමට හිඟ පාඩු වෙලා ය කියා, මුදල් එකතු කරනවා. තවත් කාලෙක එයා ඔලගුවක් කරේ දමාගෙන වන්දනා කාරයෙක් වගේ පිටිහර යනවා. ඒ ඔලගුවේ නැති ලෙවවක් නැහැ.

ගල්කැට, අලු හෙප්පු, මිනී ඇට කෑලි, වෙලිච්ච බෝ කොළ, වතුර බෝතල, ඔහොම කොළවරක් නැති දේ ඕකෝ තියෙනවා. ඉතින් කෝපි කඩයක් ගානේ ගොහින්, මේ කුණු කසල එළියට අරන්, මෝඩ ගෑනු රවටා, සම්මාදන් ගන්නවා. ගල් කැට නේරංජනා ගඟේ ගල් ලු - වතුර අනෝතත්ත විලේ වතුරලු-අලු බුදුහාමුදුරුවන්ගෙ දර සෑයේ අලුලු-බෝ කොළ, ජයමහ හාමුදුරුවන්ගෙ කොළලු-වැලි ලුම්බිනි උයනේ වැලි ලු-ඇට කෑලි සීවලී හාමුදුරුවන්ගෙ ධාතුලු- ඔය විදිහට අහන් සිටින්නන්ගේ මයිල් කෙළින් සිටිනා තුරු, දෑස් වලින් කඳුළු වැගිරෙන තුරු, බොරු බේගල් ඇද බානවා. ඔහු ඒ ගමන් ගැන කියන කොට අහන්න පුදුමයි.

" .....අනේ පින්වත්නි මේ පන්දහසක් වටිනා සාසනය පවතින්නේ කා නිසාද? සර්දාවන්තයා නිසායි. සර්දාවන්තයා නැති වු සාසනයක් නැහැ. මා නම් පුංචි කාලේ පටන්ම කලේ ආගමේ අතේ වැඩ තමයි. ඔය පවුලක් පන්සලක් වත්න බැලුවේ නැහැ. හිඟා කතා වගේ කෙළේම කුසල් තමා. මේ පාර දඹදිව ගමනින් මට මොන තරම් අතුරු අන්තරා උණාද?.....

"අපේ හිඟන රැළේ නායකයාත් ඔහු තමා. හිඟන්නන්ගේ නඩු අහන්නෙත් එයා තමයි. ඒකටත් කප්පමක් අය කරනවා. හිඟන්නන්ට රහස් මායාව ගෙන්වන්නේත් ඔහු තමා

"රහස් බාසාව කියන්නේ ගෙවල් ලකුණු කරන බාසාව.ඔහු දෙතුන් මාසෙකට සැරයක්-ගෙයක් ගානේ හිඟාකෑමේ ගොසින් ඒ ඒ ගෙවල්වල හිඟන්නන්ට බලා ගන්න ලකුණු වගයක් දමයි. ඒ ලකුණු වලින් ඔහුගේ කාංඩේ හිඟන්නෝ මේ තැන හපා කන බල්ලෝ ඉන්න තැනක්ය. මේ තැන බුරන බල්ලෝ ඉන්න තැනක්ය. මේතැන හාම්පුතා හොඳය. මේ තැන වැඩකාරයා හොඳය.- ඔය විදියට නොයෙක් දේ දැනගන්නවා." (හිඟන කොල්ලා, 45-48)

ඩබ්.ඒ. සිල්වා ගේ මේ විස්තරය හිඟන ජීවිතය ගැන ගැඹුරු අවබෝධයකින් ලියන ලද්දක් වැන්න. හිඟන ලෝකයේ සැබෑ තත්වය නිරූපනය නොකරන සුලු අඩුපාඩු කීපයක් පමණක්ය එහි ඇත්තේ. හිඟන්නන් හැම කෙනෙක්ම අනුන් රවටන්නේ නැත. බොහෝ හිඟන්නෝ ඇත්තටම දුක්ඛිතයෝ වන්නාහ. අනුන් රවටන්නට උපක්‍රම යොදන හිඟන්නන් ගැන සඳහන් කරන විස්තර හැටියට ගතහොත් ඩබ්.ඒ. සිල්වා ගේ විස්තරය කදිම එකකි. පැරණි හිඟන වර්ගවලින් වර්ග කීපයක්ම ඔහුගේ විස්තරයට අසුවෙයි. කපොක්, පොට්ටයෙක්, අබ්බගාතයෙක් මෙන් අනුන් රවටන හිඟන්නන්, කතාවෙන් අනුන්ගේ අනුකම්පාව දිනා ගන්නා හිඟන්නන් ඔහු අතින් කදිමට සිත්තම් වෙයි.

හිඟන්නන්ගේ රහස් බාසාව හිඟන ජීවිතයේ විවිධ අංගවලට සම්බන්ධය. එය උදෙක් ගෙවල් ලකුණු පිළිබඳව පමණක් සීමාවන්නේ නැත. හිඟන ජීවිතයට අවශ්‍ය විශාල දැනුමුවණක් මේ රහස් බාසාවේ ඇතුළත්ව තිබේ. ඩබ්.ඒ. සිල්වා

නවකතාකරුවෙකු හැටියට හිඟන්නා මේ තරම් යථාර්ථ ලෙස හඳුනා ගැනීම අද අප විශ්මයට පත් කරයි. හිඟන ජීවිතය ගැන කෙලින්ම අත්දැකීම් නොබලා ඇසූ දුටු දෙයින් මෙවන් පැබැ නිරූපනයක් කිරීම සඳහා ඩබ්.ඒ. සිල්වාට තිබූ පරිකල්පනා ශක්තිය අප අගය කළ යුතුය.

හිඟන්නාගේ දුක්ඛිත ජීවිතය තම නිර්මාන කුසලතාවෙන් හඳුනාගෙන යාචක ජනශ්‍රැතියද ප්‍රයෝජනයට ගෙන ලියූ තවත් කදිම රචනාවක් අපේ සාහිත්‍යයේ ඇත. එනම් මුනිදාස කුමාරතුංගයන්ගේ "හිඟන්නා" කවි පෙළයි. (ශික්ෂා මාර්ගය 2) මගේ හිඟන ජීවිතය ගත කරන විට මට නිතර මේ කවි පෙළ මතක් විණ. මුල් දවස්වලම කාටත් නොඇසෙන සේ මට කුමාරතුංගයන්ගේ මේ පද්‍ය නිකම්ම කියැවිණ.

ඇති වන්නට බැ මෙවන් දුකක්
නිරයේවත් ඇතහොත් එනම් තැනක්
මට මේ ලොවමයි අපාය නම්
ඇවිලෙනනෙ ගිනිදැල් පිවිත් නොවේ

බොහෝ විට එළිමහනේ නිදා ගන්නා විට මට යලිත් කුමාරතුංගයන් සිහියට නැගිණ.

ලොව ගේ අහසයි පියස්ස මේ
පොළොවයි මා ඇඳ කොටට ගල් මුලුයි

ඇත්ත වශයෙන්ම මේ නිදහස මට ඒ කාලයේදී දුකක් වගේ දැනුනේ නැත. මම එය අගය කළෙමි. එහි රස මනා සේ විඳ ගත්තෙමි. මා තරුණ වියේ සිටි නිසා මට එසේ දැනුණද? මට වඩා වෙනස් විදිහකට ලෝකය ගැන හිතන්නාවූ හිඟන්නන්ද මට හමු විණ. හිඟන ජීවිතයේ අප්‍රමාණ දුක් විඳින හිඟන්නන්ට සිතෙන්නට ඇත්තේ කුමාරතුංගයන්ගේ කවි පෙළේ ආ අන්දමට වෙන්නට ඇත.

"මරණේ මැයි සරණේ ඉතින් අනේ"

මා ආශ්‍රය කළ විවිධ ලෙඩ දුක් වලින් පෙළෙන බොහෝ හිඟන උදවිය 'අනේ අපි මැරිලා යනවා නම්' හොඳයි කීවේ ජීවිතයේ දුක ඉවසන්නටම බැරි නිසාය.

හිඟන්නන්ගේ 'හදවත' අවබෝධ කර ගැනීමට කුමාරතුංග කවියා සමත් වූයේ ඔවුන්ගේ ජනශ්‍රැතිය පිළිබඳ මනා අවබෝධයක් ඔහුට තිබුන නිසාය. ඒ තරම් කාව්‍යමය දක්ෂකමක් ඔහුට ඇති වූයේ හිඟන ජනශ්‍රැතිය හා ජීවිතය ඉවෙන් මෙන් වටහාගත් නිසාය:

කරපත් වැඩ ගොස් හිගා තොකා
කිම ? අප් පා නැතුවාද නෑ කියා
එළවීම ඉතාම පහසු වෙයි
වැඩ දෙන්නැයි කිවුවත් වැඩක් නොදෙත්

සමාට යමක් නුදුන් පැනැත්තාටද හිගන්නා වෛර කරන්නේ නැත. 'ඒ මගේ ලැබීම' යැයි ඔහු සිතයි. දුගීකමේ වේදනාව හඳුනා ගන්නට ඒ සඳහා හුරු පුරුදු වූ හදවතක් තිබිය යුතුය. මේ කා කෙරෙහිත් හිගන්නා තුල පවත්නා හැඟීම කවියා ඉතා දක්ෂ ලෙස පද්‍යයට නගන්නේ මෙසේය.

නුදුනත් පෝසත් දනන් කෙරේ
මසිතේ හටගන්නෙ නෑ කෝපයක්
නොලැබෙන්නේ මගේම පාපයෙන්
ඔහු නම් මා වැනි වන්න නැත් නෙරෙත්

හිගන්නාට යමක් දීම ඔබ විසින් ප්‍රතික්ෂේප නොකළ යුතුය. කුමාරතුංග කවියා නිර්මාණාත්මක ලේඛකයෙකුගේ අපූරු කල්පනා ශක්තියෙන් මේ කාරණය වටහා ගත්තේය. හිගන්නන් අතර 'බොරුකාරයන්', හිටියත් ඒ අය එසේ බොරුකාරයන් වන්නේ ඇයි? ඇත්ත වශයෙන්ම ඔවුන්ට වැඩක් දෙන්නේ කව්ද? ඔවුන් වැනි දෙනෙකුන්ගේ වේදනා දුක අවබෝධ කරගත හැක්කේ කීයෙන් කී දෙනාටද?

3 හිඟාකෑම ක්‍රම සහ විධි

හිඟාකෑම උපතින්මෙන් පුහුණුවා ගන්නා කුශලතා ඇති වෘත්තියක් බව බොහෝ දෙනා නොදනිති. මේ කුශලතා විධිමත්ව ලබාගත හැකිවාක් මෙන්ම යාචක ලෝකය ආශ්‍රය කිරීමෙන්ම අවිධිමත්වද ලබාගත හැකිය. කුශලතා වර්ධනය කරගෙන ප්‍රායෝගිකව ඒවා ක්‍රියාවට නැගීමෙන් අත්දැකීම් බහුල කරගත් තරමට යාචක වෘත්තියද සාර්ථකව ගෙන ගිය හැකිවන්නේය.

පැරණි යාචක වර්ග ගැන අපි කලින් සඳහන් කළෙමු. මින් කුමන ගණවල ඇත්තන් විධිමත්ව පුහුණුව ලත් යාචකයන් වීදැයි අප හරි හැටි නොදන්නාවූ නමුත් අපට ලැබී ඇති වත්‍ර තොරතුරු ආශ්‍රයෙන් එක්තරා අන්දමක විධිමත් පුහුණුවක් ඒ කාලයේද තිබුන බව අපට සිතාගත හැකිය. ජාතක පොතේ එන කතා, ඇතැම් ජනකවි හා ජනකතා අතීතයේදී යාචකයන් ලැබූ විධිමත් පුහුණුව ගැන යම්යම් ඉඟි අප වෙත ගෙන එන්නේය.

සොළොස් වර්ගයක් වූ පැරණි යාචක ගණය අතර වූ කථික, තාර්කික, වාදක, නට, යන වර්ගවල අය නම් යම්යම් වර්ධනය කරගත් කුශලතාවලින් සමන්-විත වූ බවට සැකයක් නැත. කථික යන වර්ගය කතාබහට අනුන් වසඟ කරගන්නට හැකි වූ අය වන්නාහ. මේ අය අනුන් වසඟ කරගන්න සුදුසු කථා ක්‍රම හදාළ, ඒ පිළිබඳ කුශලතා දියුණු කරගත් ඇත්තන් විය යුතුය. තාර්කික යන්නෙන් අදහස් වූයේ ආගම්,ඇදහිලි, විශ්වාස හා වෙනස් මතිමතාන්තර තර්කානුකූල ලෙස දක්වමින් එහාමෙහා ගිය 'දාර්ශනික යාචකයන්' නම් ඒ අයටද එක්තරා පුහුණුවක් හා කුශලතා තිබෙන්න ඇතැයි අනුමාන කිරීම සාධාරණය. 'වාදක' යාචකයන්ට හා 'නට' ගණයට අයත් අයට සංගීත භාණ්ඩ වාදනය කරන්නට හා නැටීම් ආදිය දක්වන්නට අවශ්‍ය දක්ෂතා හා පුහුණුවක් අවශ්‍යමය. ඔවුන් ඒ පුහුණුව ලබාගත්තේ කෙසේද?

අතීතයේ මේ අයට යථෝක්ත පුහුණුව ලබාදුන්නේ කවුද? අපට ඒ ගැන ස්ථිරව දැන ගැනීමට මාර්ග නැත. පැරණි යාචකයා නම් බොහෝවිට අබලදුබල මහලු දුප්පත් කෙනෙකු හැටියට දැක්වීම ජාතක කතාවල හා ජනකතාවල සිරිතය. ඒ අයට නම් එබඳු තත්වයක සිට හිඟාකන්නට විශේෂ දක්ෂතා අවශ්‍ය නොවීණ. ශක්‍රයා හෝ වෙනත් දෙවිවරුන් හිටපු හැටියේ යාචක වෙස්ගෙන මිනිස් ලොවට ප්‍රකටවූ වග බොහෝවිට සඳහන් වේ. නමුත් 'ගිලන්' බව හේතුවෙන් හෝ තමාට ස්වභාවයෙන් ඇති හෝ තැනැත්තා මෙන්ම නැති, ගොළු, බිහිරි අබ්බගාත බව විදහාපාමින් යාචකයෙක් ඒ කටයුතු කරන තැනැත්තා, පැබවින්ම එබන්දකු නොවේ නම් එබඳු කටයුතු කරන්නට සෑහෙන දක්ෂතා වගා කරගත් අයෙකු විය යුතුය.

අපේරටේ නූතන යුගයේ නම් එබඳු කුශලතා වගා කරගන්නටත්, අලුතෙන් කුශලතා පුහුණු කරන්නටත් යාචක පාසැල් තිබිණි. එබඳු 'පාසල්' ගැන එක්දහස් නමසිය පණස් ගණන්වල හා හැට හැත්තෑව විවිධ මූලාශ්‍රයන්හි සඳහන් වී ඇති සැටි අපි මීට කලින් සඳහන් කළෙමු. එබඳු 'පාසල්වලදී' අඳ, ගොළු, බිහිරි වෙස් ගන්නා සැටි, අතපය කැඩුනු බිඳුනු අය ලෙස පෙන්නුම් කරන සැටි, පමණක් නොව තමන් තවත් සතු මේ වෘත්තියට ප්‍රයෝජනවත් වන වෙනත් එවන් කුශලතා දියුණු කරගන්නා සැටිද උගන්වන ලදී.

මෙබඳු දේ උගැන්වූයේ යාචකයන් විසින් පමණක් නොවේ. යාචක ලෝකයට බැහැරවූ පුද්ගලයෝද ඒ කටයුතු යාචකයන්ට කියා දුන්හ. එක්දහස් නවසිය හැටගණන්වල අගනුවර තිබූ එබඳු 'පාසල්' කීපයක් ගැන මම දැන සිටියෙමි. ඒවාට 'උගන්වන්ට' සිටනින් පැමිණි අය සමාජයේ වෙනත් රස්සාවල් කරන අය වූහ. ඒ අය තුන් ආකාරයක උගැන්වීමක් ලබා දුන්හ.

1 ස්වභාවික අබලදුබලකම් නැතත් ඇතැයි කියා පෙන්නුම් කරන සැටි: අතක් පයක් කැඩුනු විලාසය පෙන්වන සැටි, නැති තුවාලයක් මවාපාන සැටි, අන්ධ, ගොලු, බිහිරි එකිබගාන ස්වභාවය පෙන්නුම් කරන ආකාරය.

2. ස්වභාවිකව පවත්නා අබලදුබලකමත් තවත් වැඩි කොට පෙන්වන අන්දම. තුවාලයක් දුටුවන් එසේ දකින්නට බියපත් වන තරමට 'වණ' කරගන්නා අන්දම, බාගයට නොපෙනෙන ඇස් දරුණු ඇස් ලෙඩකට භාජන වූ ආකාරය කියාපෑම.

3. සංගීත භාණ්ඩ (පොල්කටු වීණා,මැන්ඩලින් ආදී) වාදනය කරන්නට, ගායනය කරන්නට පුරුදු කිරීම.

මෙබඳු අය යාචකයන්ට ලබා දුන්නේ යාචක ලෝකය පාලනය කළ මුදලාලිලාය. ඒ මුදලාලිලා යථෝක්ත 'ගුරුවරුන්ට' මුදල් ගෙවූ බව මම දනිමි. ඒ හැරෙන්නට යාචකයෝද මෙම කටයුතු පුහුණු කරන්නට තමන් වෙත එන බාහිර ගුරුවරුන්ට මෙන්ම යම්යම් යාචක ගුරුවරුන්ටද මුදල් ගෙවා මේවා උගෙන ගත්හ. හිරු එළිය වැටෙන්ට පෙර යාචකයන් ඉන්න තැනට පැමිණ මේ ආකාරයේ 'අංග රචනා' කරන බාහිර පුද්ගලයෝ එකල මෙන්ම අදත් විරල වශයෙන් හෝ දක්නට පුළුවන.

ඒ අතින් බලන විට යාචකයා එක්තරා අන්දමක දක්ෂතා උපතින් හිමි කරගත්තෙකු විය යුතුය. අනුන්ගේ අනුකම්පාව යොමු කරන්නට වාක්‍යයක් දෙකක් කියා කෑ ගැසීම වුවත් කෙතරම් දුෂ්කර දෙයක් දැයි ඔබට සිතෙන්නේ අත්හදා බැලීමක් ලෙස එබඳු කාරියක හෝරාවක් දෙකක්වත් යෙදුනහොත් පමණය. මහ අව්වේ පදින වේදිකාව පෙරලි කෑගසන යාචකයා මුලු දවසම එතන ඉන්න බව පවා සමහරවිට ඔබට අමතක වනු නොඅනුමානය. ඒ අතින් මෙනෙහි කරතොත් යාචක කටයුත්ත කෙතෙරම් දුෂ්කර දෙයක්ද යනු යාන්තමින් වටහාගත හැකිය. යාචකයින් උදෙසා අංග රචනය කිරීම සූක්ෂම කලාවක් බව සිහිපත් කිරීම මෙහිදී වැදගත්ය.

අද බොහෝවිට විදුලි එළි එළි ඇති නගරම හංදිවල ඉන්නා අබ්බගාත යාචකයන් බව දැක ඇද්ද? මේ අය මෙබඳු තැන්වලට ගෙන එන්නේ 'ව්‍යාපාරිකයන්' විසිනි. ඒ අය අබ්බගාතයන් වුවත්, ඒ දුර්වලකම් අනුකම්පාව මතුවන හැටියට මවාපාන්නට උගන්වන්නේ යථෝක්ත යාචක වෙළෙන්දන් විසිනි. සැබැවින්ම මේ තැනැත්තන් අපේ අනුකම්පාවට ලක්විය යුතු අය බව සැබෑය. නමුත් ඔවුන් මෙසේ යාචක වෘත්තියට යොදා ලාබ ලබන්නේ මේ 'වෙළඳ ව්‍යාපාරිකයන්' බව අප අමතක නොකළ යුතුය.

යාචකයා වීදියේදී කරන කියන දේ උගෙන ගන්නේ තමන්ගේම 'අවශේෂ' වැඩිමහල්ලන් හා තම සමවයස්කරුවන් වෙතිනි. මුබරිකම මෙහිදී නැවත නැවතත් අවධාරණය කෙරේ. යාචක ලෝකයේ ගොළුවන් ලෙස නොහැසිරෙන අනික් හැම හිඟන්නෙක්ම මුබරිකම ප්‍රයෝජනයට ගනිති. ගොළුවා වුවද වචන කතා නොකළත්, යම්යම් ශබ්ද හා සංකේත මගින් භාෂාවක් සාදගෙන ඒ භාෂාව අරබයා වූ 'මුබරිකම' නිපුණ කරගන්නේය.

හිඟනකමේ යෑම ජීවන වෘත්තිය කරගත් රොඩී අය ඊට කියන්නේ හිඟාකෑම නොව ඉල්ලාගෙන කෑම කියාය. 'ඉල්ලාගෙන කන හුලවාලියා ආවා හාමුදුරුවනේ, පිනට යමක් දෙන්න' කියා ඔවුහු කියති. එසේ ඉල්ලීම හිඟාකෑම යැයි හඳුන්වන්නට රොඩී මිනිසා අකැමැතිය. ඔවුන් බොහෝ විට තමන්ගේ 'ගොදුරුබිම්' වලට යන්නේ හවරි, පනා, ඉදල්, කොහු, වේවැල් කූඩ ආදිය හදගෙනය. මේවා රැගෙන යන ඔවුන් විසින් ඒවා විකිණීමද යාචක වෘත්තියේ කොටසක් කරගෙන ඇත. 'ගොදුරුගම්' කීවේ ඒ අය නිතර නිතර පරම්පරා ගණනක් ගොස් හුරුපුරුදු ගම්ය. ඒ ගම් හා ඔවුන් අතර සම්බන්ධතාම ඉතා සමීප එකක් වේ.

අප කුඩා කාලයේදී බණ්ඩාරවෙල, කුරුකුදේගම වාසය කරන විට ඒ ගමට නිතර නිතර ආ බණ්ඩාරවෙල රොඩී නායකයා වූ විජයා මට හොඳට මතකය. විශාල බඩක් ඇති විජයා එනවිට අපේ අම්මා කුඩා අප ඔහුට නොපෙනෙන්නට සඟවාලන්නීය. විජයා මන්තර දන්නා නිසා අපට ඔහුගෙන් අයහපතක් වෙතැයි සිතන අම්මා එසේ කරන බව කුඩා අපි දැන සිටියෙමු. ඔහු මන්තර ජප කළොත් අපටත් ඔහු පසු පස්සේ යන්නට හිතෙන බව අම්මා මෙන්ම ගමේ වැඩිහිටියන්ද අපට කියා ඇත. ඒ නිසා අපි විජයා දුටුවිට ඇත්තෙන්ම බියට පත්වීමු. අම්මා හංගන්නට කියන්නට පෙර කුඩා ළමුන් වන අපි වහා ගේ ඇතුළට ගොස් සැඟවෙන අතර, යළිත් එළියට එන්නේ විජයා ගියාට පසුය.

විජයා වරක් වලව්වකට ගිය විට වලව්වෙන් කිසි දෙයක් නොදී ඔහුට අපහාස කළ බව අපේ ගමේ අය අතර ප්‍රචලිත ජනශ්‍රැතියක එයි. විජයා එවිට කළේ වැලි ටිකක් මතුරා බිමට දමා ආපසු යෑමය. වලව්වේ ඇත්තන්ගේ තරුණ දියනිය ඊට දින කීපයකට පසු විජය සොයා ගොස් ඔවුගේ කුප්පායමේම නැවතුනාය. කොපමණ බල උපක්‍රම යෙදුවත් ඇය ආපසු වලව්වට ආවේ නැත. විජයාගේ මන්තර බලය ඒ තරම් ප්‍රබලය.

විජයා අපේ වත්තට විත් වැටලඟ වාඩිවෙයි. අම්මා ඔහුට හාල්,තුනපහ මල්ලක් හා මුදල් ඔහු වෙත යවයි. කෑම වේලාවක නම් ලොකු බත් පිඟානක්ද ඔහුට අපේ ගෙදරින් ලැබේ. සමහර දවස්වල විජයාගේ බිරින්දෑවරු ලෙස හඳුන්වනු ලබන රොඩී ගෑනු හවරි ගෙනාවිට අම්මා ඒවා මිලයට ගනියි. හවරිවල වටිනාකමට වඩා බොහෝවින් වැඩි මුදලක් අම්මා ඒ අයට දෙයි. අපේ ගෙදරින් වරකට ඔහුට දුන් 'හිඟමන්' රැගෙන ආපසු යන විජයා යලිත් එන්නේ මාස දෙකකට පමණ පසුවය.

බඩල්ගම, කතනොලුව, මාතාන වැනි ගම්වලදීත් බලන්ගොඩ අසලත් මම රොඩී මිනිසුන් දැක ඇත්තෙමි. ඔවුන්ගේ හිඟාකෑම ඉල්ලාගෙන කෑම යයි හඳුන්වන්නේ කාරණා කීපයක් නිසාය. ඔවුන් යන්නේ නොදුරු ගම්වලටය. පරම්පරා ගණනක් ඒ රොඩී රෑනේ අය මේ ගම්වලට හොඳ පුරුදු වී ඇත. ඔවුන්ට හිඟමන් දෙන අය මේ රොඩී ඇත්තන් ගැන දනිති. ඊළඟට ඔවුන් වේවැල් තුවා, හවරි යන භාණ්ඩ රැගෙන යන්නේ 'හිඟමනේ' අනිවාර්ය කොටසක් ලෙසය. ඒ භාණ්ඩ ගම්මුන්ට දුන්විට ඒවා වෙනුවෙන් මුදල් දෙන්නේ භාණ්ඩවල මිලට වඩා වැඩි වශයෙනි. භාණ්ඩ රැගෙන යෑම එනිසා ඒ රොඩී මිනිසුන්ගේ යාචක ක්‍රමයේ වක්‍ර අංගයක් විය.

භාණ්ඩවලට වැඩියෙන් මුදල් දෙන අතර, ඒ අයට හාල්, වී එළවළු ආදියද ආපසු ලැබේ. අපේ කුරුකුදෙගමේ කුඹුරු අස්වැද්දූ විට විජයා පැමිණ පෝසත් අයගෙන් වී මලු දෙක තුනක් රැගෙන යයි. ඔහුට එසේ නොදුන්න හොත් ඔවුන් කොඩිවින කරන බව ගමේ මිනිස්සු විශ්වාස කළහ. රොඩී මිනිසුන් සතු වූ මේ අභිචාර බලය පිළිබඳ විශ්වාසද ඔවුන්ගේ යාචකබවේ අනිවාර්ය අංගයක් විය.

රොඩී මිනිසුන්ට හිඟමන්දීම පිළිබඳ විශ්වාස අප අතර පවත්නා ජනශ්‍රැතියෙන්ද පෝෂණය වෙයි. අපේරටේ රොඩී අයගේ උපත ජනශ්‍රැතියේ එන මහා පරාක්‍රම බාහු රජුගේ කාලය දක්වා යයි. ඒ රජුගේ දූව රත්තාවලි ගවමස් කෑවාය. මේ වැරැද්ද නිසා ඇය රොඩී රැහැනට එළවා දැමුණු බවත් කතාවක එන හැටියට රත්තාවලි මිනීමස් කෑමට පුරුදු වූවාය. ඇයව රොඩී රැහැන හිමිවූයේ ඒ නිසාය. මේ කතා දෙකම කියන්නේ 'මිනීමස්' හෝ 'ගවමස්' කෑමේ අභාග්‍යය නිසා රොඩී රැහැනට යමෙකු එළවා දැමූ බවය. ඒ අනුව රොඩී කුලයේ උපත යම්කිසි ක්‍රියාවක් මුල් කරගෙන පැවති බව පළවෙයි. මේ වැනි නිදර්ශන කතා ලංකාවේ කුලභේදය ඉන්දියාවේ කුලභේදයට වඩා වෙනස්වන එක් තැනක් මෙහෙන බව මතක තබා ගැනීම වැදගත්ය.

බුද්ධාගමේ වුනත් උගැන්වෙන්නේ 'කම්මුනා වසලො හොති' ක්‍රියාවෙන් වසලයෙකු වන බව කියා නේද? රොඩී රැහැන හිමිවූයේ යම්කිසි ක්‍රියාවක ප්‍රතිඵලයක් හැටියට මිස දෙවියකු හෝ වෙනත් අයෙකු ඇති කළ කුල ක්‍රමයක ඇති සමාජ පිළිවෙලක් නිසා නොවේ. ඒ රොඩී තැනැත්තන් අද යැපෙන්නේ සමාජයෙනි. මීට හේතුව ඔවුන් කළ ඒ බරපතල වැරැද්දයි. අපත් එතැනට නොවැටෙන්නට නම්, ඒ අයට ජීවත්වන්නට උදව් කළ යුතුය. මේ ජනශ්‍රැතිය රොඩී මිනිසුන්ට හිඟමන් දීමට අප පොළඹන අභිප්‍රේරණය නොවන්නේද?

හිඟාකෑමේදී අවශ්‍ය හිඟන්නන් වෑයම් කරන්නේ සමාජයේ අනුකම්පාව දිනා ගැනීමටය. කතාව හා ක්‍රියාව මේ සඳහා යොදාගැනීම ඔවුන්ගේ ක්‍රමවේදයයි. කතාව හැකිතාක් දුරට ආගමනුකූල කිරීම අසන්නාගේ අනුකම්පාව දිනාගැනීමේ යහපත්ම මාර්ගයයි. බෞද්ධයෙක් නම් කර්මඵල මතක් කිරීම ඉතා වාසිදායකය. 'කෑ දේ ගඳයි දුන් දේ සුවඳයි' යන නියමය බොහෝ යාචකයන් අතින් කියවෙන්නේය. 'කර්මය' තරම් යාචකයන් විසින් අනුන්ගේ අනුකම්පාව උපදවන්නට යොදාගන්නා තවත් මාර්ගයක් නැති තරම්ය.

ඊළඟට අනුකම්පාව ඇති කිරීමට උපයෝගී කරගන්නේ බුදුන්ගේ සරණ හා දෙවියන්ගේ පිහිටය. සිංහල බෞද්ධයා බුදුන්-දහම්-සඟුන් සරණ යෑම සෑම අවස්ථාවකදීම කරයි; දෙවි පිහිට පතයි. දෙවියන් සරණ යෑමක් බුද්ධාගමේ නැත. තමන් බුදුන් දහම් සඟුන් උදෙසා කළ පින් දෙවියන්ට අනුමෝදන් කොට, ඒ අය සතුටු කොට, තමන්ට ආරක්ෂාව ලබාගැනීම බෞද්ධ විශ්වාසයයි. හිඟන අය තම වෘත්තිය කරගෙන යෑමේදී මේ විශ්වාසය ප්‍රයෝජනයට ගනිති.

මා යාචකයෙකු හැටියට සමාජානුයෝජනය ලබන විට බුදුන්-දහම්-සඟුන් සරණ යෑමේ කවි පාඩම් කිරීම අනිවාර්ය විය. කාටකාටත් තුන් සරණේ ආශිර්වාදය ලබාදීම කළ යුතු බව මගේ ගුරුවරයා මට නිතර කීය. 'තිසරණ සරණයි' 'දෙවි පිහිටයි' යන පාඨ දෙක නිතර මන්ත්‍රයක් මෙන් කිව යුතු බව ඔහු අවධාරණය කළේය. තුන්සරණය හා සම්බන්ධ පද්‍ය එකක් දෙකක් ගායනා කිරීම මිනිසුන්ගේ සිත් දිනා ගැනීමට යහපත්ම උපක්‍රමය වග ඔහු මට මතක් කළේ වරක් දෙවරක් නොවේ.

බෞද්ධ සිංහලයන්ගේ සිත් දිනාගැනීමට ඊළඟට උගැන්වෙන්නේ කර්මය ගැන කතා කිරීමය. බුදුන් වහන්සේ උගැන්වීම අනුව සියල්ලම සිදුවන්නේ කර්මය නිසා නොවේ. ඒ තරම් සියුම් උගැන්වීමක් සාමාන්‍ය ජනයාට හරිහැටි අවබෝධ වී නැත. ඔවුන්ගේ විශ්වය අනුව කරන සෑම ක්‍රියාවක්ම, ලබන හැම ප්‍රතික්‍රියාවක්ම සිදුවන්නේ කර්මය අනුවය. "අනේ මේ ඇස්දෙක නැතිවුනේ මගේ පෙර කරුමයෙනි. මගේ අතපය නැතිවෙලා ගියේ කරුමෙටයි. තමුන්නාන්සේලාට ජාතිජාති මෙවන් දුක් නොවේවා' යැයි ශෝකී ස්වරයෙන් කියන්නට යාචකයන් වන අපට පුරුදු කෙරිණ.

' යාචකයන් මෙසේ පුහුණු කරන විට නිරීක්ෂණය කොතරම් සූක්ෂමව යොදා ගත්තේ දැයි මට අවබෝධ වූයේ. ඔවුන් සමග ජීවත් වන විටය. නිරීක්ෂණය ගැන අපි සමාජවිද්‍යා පර්යේෂණ ක්‍රමවලදී උගන්වමු. යාචකයා එය හිඟාකෑමට පුරුදු කරන අයට කියාදෙයි. තමන් අසලට යනඑන අය දෙස හොඳට කල්පනාවෙන් බලා ඉන්නට අපට කියා දී ඇත. ඒ අයගේ ඇඳුම් පැළඳුම් අතේ ඇති බඩු බාහිර, මුහුණේ පෙනුම හා ඉරියව් ක්‍රියා යන කාරණ අපගේ විශේෂ උපාන්දුවට ලක්විණ.

හොඳට ඇඳ පැළඳගෙන යනවා නම් වර්ණනා කළ යුතුය. කතා කළ යුත්තේ හාමු මහත්තයා, වලව්වේ මහත්තයා රජතුමා, යන වචන වලිනි. එහෙම ඇඳගෙන පැළඳගෙන යන "අපේ හාමුට, අනේ මේ සිටුතුමාට, වලව්වෙ හාමුමහත්තයට මේ සම්පත් ලැබුණෙ පුරුවෙ පින් කළ නිසා. අදත් පින් කළාට පින් අඩු නැහැ. අපි වගේ දුප්පත් අය දැකලා අහක බලාගෙන යන්නෙ නැහැ."

මැදිවියේ හා වයසක අය ගැන විශේෂයෙන් සැලකිය යුතු බවට අපට උපදෙස් ලැබිණ.

අතේ ඇති බඩු බාහිරවලින් ඒ අය යන එන ගමන් ගැන දැක ගත හැකිය. පන්සලට දේවාලයට යනවිට සුවඳ පැන්, මල් රැගෙන යති: පලතුරු වට්ටි රැගෙන යති. ඒ අය හිතෙන් ලතැවුණු කරගෙන හිඟමන් ඉල්ලිය යුත්තේ ආපසු යනවිටය. "අනේ ඔබතුමන් කතරගම දෙවියන්වහන්සේට සුවඳ පැන්,මල් පලතුරු පූජා කරලා, පොල් ගහලා යමක් ඉල්ලා සිටියද, ඒ ප්‍රාර්ථනාව ඒ තැනැත්තාගෙන් ලැබෙනවා නියතයි. උන්වහන්සේගේ දේව කරුණාව ලැබෙනවා නියතයි."

ආරෝග්‍යශාලාවලට යන අය අතේ තියෙන බඩු බාහිරාදියෙන් ඉක්මනින් හඳුනා ගත හැකිය. " මේ පින්කදගේ අසනීපකාරයාට වහාම දෙවිපිහිටෙන් අසනීපය සුව වෙලා ගේදොර බලා යන්නට දේව කරුණාව ලැබෙනවා නියතයි."

මේ විදිහට හිඟමන් ඉල්ලන විට ආගම ගැන සලකන්නට අපට කියා දී ඇත. කොච්චිකඩේ පල්ලිය, කතරගම දේවාලය, මඩු පල්ලිය, කැලණිය පන්සල, දවටගහ මුස්ලිම් පල්ලිය ආදී ස්ථානවල ඒ ඒ තැනැත්තන් කවර ආගමිකයන්දැයි හඳුනාගැනීමට දුෂ්කර නැත. දවටගහ පල්ලිය ළඟට යන සිංහල යාචක ස්ත්‍රීන්ට මොට්ටක්කිලිය දාගෙන යන්නට කියන අතර, මා කොච්චිකඩේ පල්ලිය ළඟ සිඟාකන විට මගේ කරේ කාටත් පේන්න කුරුසියක් එල්ලාගෙන යන්නට උපදෙස් ලැබිණි.

ඉතා සියුම් ලෙස නිරීක්ෂණය දියුණු කරගත් අපේ සමාජවිද්‍යා පර්යේෂකයන් වැනි යාචකයන් මට හමු වී ඇත. 'ස්ත්‍රියකගේ මුහුණ බලා මෙයාගේ ළඟ කෙනෙකුට හොඳටම අසනීපය අමාරුයි. "කියා දැනගෙන ඇගේ සිත දුවපත් වන විදිහට කතා කළ වයසක හිඟන්නෙක් විය. තවත් මැදිවියේ හිඟන්නෙකුට ඇස් නැතත් කෙනෙකුගේ අඩි ශබ්දයෙන් ඔහු ගැන නිවැරදි කස්සේරුවක් කිරීමට හැකිවිය. මට මෙහිදී මතක් වුයේ අත්තනගලු වංශයේ එන අන්ධ නෙමිත්තකයාය. ඔහු සංඝබෝධි - සංඝතිස්ස - ගෝඨාභය තිදෙනා ගැන අනාගත වාක්‍ය කීවේ ඒ අයගේ පියවර ශබ්දයට අනුව බව ඒ ග්‍රන්ථයේ එයි.

අන්ධ නුහත් අන්ධයෙකු ලෙස ඇස් පියාගෙන අවට ශබ්දවලින් යම්යම් නිගමන වලට පැමිණෙන සැටි අපට උගැන්විණ. කටහඬවල් අතරින් අනුකම්පා සහගත කටහඬ තෝරාගන්නේ කෙසේ දැයි කටහඬ මාරු කරමින් අන් අයට කියා දුන් හිඟන මිනියෙක් මට හමු වී ඇත. ඒ ආකාරයෙන් තමන් හිඟමන් යදින විට කටහඬ මාරු කරන හැටි, ඉකි බිඳින අවස්ථා ගැන ඔහු අපට කියා දුන්නේය.

හිහමන් ඉල්ලන විට කෙනෙකු සමීපයට නොයා යුතුය. ඒ අයගේ ස්වභාවය ඇසින් මැන, දුරින් සිටිය යුතුය. මෙහිදී යාචකයන්ට උගන්වන කරුණු අද අප ශාරීරික භාෂාව (Body Language) යැයි කියන විෂයට ඉතා සමීප වෙයි. දීර්ඝ කාලයක අත්දැකීම් තුලින් මේ අය ඉහත කී දැනීම ලබාගත් බව මට අවබෝධ විය. ඔවුන්ගේ මේ 'ශාරීරික භාෂාවේ' දැනීම කොටස් කීපයකින් යුක්තය. අද සමාජවිද්‍යාව මේ ශාරීරික භාෂාව ගැන කතා කරන විට මතු කරන ඇතැම් ලක්ෂණ මා එදා හිඟන්නන්ගෙන් ඉගෙන ගත් බව ගැන සිතීම පවා මට පුදුමයකි.

හිඟන්නන්ට පළමුවෙන් කියා දෙන්නේ හිහමන් ඉල්ලන විට අනු ග්‍රාහකයාගෙන් මෑත්ව සිටිය යුතු දුර ගැනය. ඒ තීරණය කරන්නට ඔහුට අමාරු නැත. මගේ හිඟන ගුරුතුමා අප මුලින් කී ප්‍රදේශයේ හිඟා කන්නට යන විට ඒ ඒ ගෙවල්වල ඉන්නා අයගේ තරාතිරම මට කියා දුන්නේය. ඒ අය ගෙදරදී හමුවුනත්, පාරේදී හමුවුනත් කතාබහ කළ යුත්තේ නියමිත දුරක පරතරයක් තබා ගනිමිනි.

රොඩී මිනිසුන් හිඟාකන විට ගෙදරක වත්තේ සීමාවෙන් අභ්‍යන්තරයට නොපැමිණෙන බව කලින් කියා ඇත. ඒ අන්දමේ දුරක් යාචකයන් වන අප තබා ගත යුතු නැත. මේ පරතරය අවශ්‍ය වන්නේ අප හිහමන් ඉල්ලන අය සන්තෝෂ කරන්නටය." අර වලව්වේ ලොකු හාමු හරිම හඳයා: කිසි වැඩකට නැහැ" යැයි අපේ හිඟන ගුරුතුමා රාත්‍රී කාලයේදී කිවේ. දවල් කාලයේදී අප ගරුසැරුකම් දක්වා එකත්පස්ව සිට ගරු කරන අයෙකු ගැනය.

බොහෝවිට මේ දුර සමාජ ස්ථාරයනය හා සම්බන්ධ වන සැටි මට කල්පනා විණ. සමාජයේ ඉහළ තලයන්හි ඉන්නා අයට අප ළඟා ළං නොවිය යුතුය. ඉහළ තලවල ඇත්තන්ද එසේ ඉතා සමීපව අපට හිහමින් දිය යුතුද නැත. විශේෂයෙන්ම කාන්තාවන් අසලට යාමක් ඇත්තේම නැත. අලුත් පළාතකට හිඟන්නට ගිය විට මේ සියල්ල උගත යුතුය. එහෙම නැත්නම් තමන්ගේ අත්දැකීම් ප්‍රයෝජනයට ගෙන නිරීක්ෂණ ශක්තිය යොදවමින් තමන් සිටිය යුතු දුර තීරණය කළ යුතුය.

සමාජ විද්‍යා හා මානව විද්‍යා පර්යේෂණ අතර නිරීක්ෂණය ඉතා වැදගත් දත්ත එකතු කිරීමේ උපක්‍රමයකි. ඒ සඳහා පර්යේෂකයාට ක්‍රමවත් පුහුණුවක් ලැබිය යුතුය. යාචක ලෝකයේදී මම නිරීක්ෂණය පිළිබඳව මනා පුහුණුවක් ලැබුවෙමි. ඒ ඒ අය ඇඳුමෙන්, බැල්මෙන්, යන එන ගමනින්, අතේ ඇති දෙයින්, කතා කරන වචන වලින් හඳුනාගෙන, ඒ අයගේ සිතට වැටෙන ආකාරයට හැසිරීමට හෝ කතා කිරීමට මා පුරුදු වූයේ මගේ හිඟන ගුරුවරයාගෙනි. නිරීක්ෂණය ගැන මා පසුව පර්යේෂණ ග්‍රන්ථවල ලියූ කරුණු බොහෝමයක් සමාජවිද්‍යාවෙන් හෝ මානවවිද්‍යාවෙන් හෝ අපරාධ විද්‍යාවෙන් උගත් කාරණා නොව යාචක ගුරුවරුන්ගේ උගත් දේ ය.

ශාරීරික භාෂාවේ තවත් අංගයකි 'සංකේත', උම්මග්ග ජාතකය කියවා ඇති ඔබට අමරා දේවියගෙන් සංකේත මගින් ප්‍රශ්න ඇසූ මහෞෂධයන් මතකද?

“ මගේ සැමියන් ඇති නැති බව නොදනිමි. එපවත් හස්ත මුද්‍රායෙන් විචාරමි.. යි සිතා. දූරම සිට ඇඟිලි හකුළා මිට කළ සේක. ඒ අමරා දේවින් මේ පුරුෂයා මාගෙන් සැමියන් ඇත්ත නැත්ත විචාරන්නේ, යි දැන අත්ල විදාලූහ” (උම්මග්ග ජාතකය 43 පිට) මේ ආකාරයෙන් අත්ල, අත මෙන්ම මුහුණේ ස්වරූපය වෙනස් කොට සංකේත මගින් පණිවිඩයක් අන් අයට කියන්නට හිඟන ගුරුවරු අපට කියා දෙන්නාහ. මින් ඉතාමත්ම ප්‍රකට සංකේතය අත්ල නවා විදහා පෑමය. රොටී මිනිසුන් යමක් ඉල්ලන්නේ සොලපනින් නැතු ඉල්ලා කන භාණ්ඩයක් දික් කිරීමෙනි. හිඟන අප අත්ල, භාජනයක්, පොල් කට්ටක්, පිඟානක් එසේත් නැත්නම් රෙදි කැල්ලක් යොදාගන්නේ මේ ආකාරයෙන්ම සංකේත මගින් අනුන්ගේ අනුකම්පාව දිනා ගන්නට කරන වෑයම් ද එමටය.

ශරීරයේ විවිධ ඉරියව්, ඇසින් කරන සංඥා, කටහඬ, උරුගහන්බෑම ආදි 17ක්‍රියා සිදුකරන හැටි, තමන්ගේ ඇඳුම් පැළඳුම් හා අතේ තබාගත යා යුතු දේ, යම්යම් ආබාධ ඇත්නම් ඒවා වැඩි දියුණු කරගන්නා අන්දම, නැති ආබාධ ඇති කරගන්නා සැටි හිඟන වෘත්තියේදී විධිමත්ව ඉගැන්වේ. එසේ අලුතෙන් හිඟන වෘත්තියට පැමිණෙන තැනැත්තා තම අත්දැකීමෙන්ම මේ සියල්ල උගෙන ගනියි.

'කතා දැමීද' යාචක වෘත්තිය උගෙන ගත යුතු ඉතා සශ්‍රීක ලෙස ආදායම ලැබිය හැකි අංගයකි. අනුන්ගේ අනුකම්පාව දිනා ගැනීමට හැකි කතා මැවීමේ හැකියාව ඇත්නම් මින් ලබාගත හැකි හිඟමන් එමටය. තමන්ට සිදු වූ විපතක් ගැන 'කතා දැමීම' කරන්නේ ඒ විපය අයා සිටින්නා කම්පාවන විලාශයෙනි. ඒ සමඟම කවුරුන් හෝ අබිබිගාතයෙක් ළඟ ඇත්නම් ඒ අය පෙන්වා 'කතා දැමීම' කළ හැකිය. තමන්ගේ බිරිඳ ලනුවකින් බැඳගෙන පිස්සු ඇයට වෙදකම් කරන්නට මුදල් එකතු කරන ආකාරයේ කතා දැමිලි ගැන නූතන සිංහල ග්‍රන්ථවල පවා සඳහන් වූ ආකාරය 'හිඟන කොල්ලා' ග්‍රන්ථයෙන් අප ඉහත උපුටා දැක්වූ පාඨයෙන් පෙනේ.

බොහෝවිට ගැහැනියක් දරුවන් අතින් ගෙන හිඟාකෑම සාමාන්‍ය සිරිතකි. දරුවා අසාමාන්‍ය ලෙඩින් පෙළෙන්නේ නම් අනුකම්පාව උපදවා ගැනීමට එය ඉතා ප්‍රයෝජනවත්ය. විශේෂයෙන්ම පිටරටින් එන කරුණාවන්ත තැනැත්තෝ මෙබඳු අසරණයන් දුටු වහාම ඒ අයට උදව් කරති. තවත් අවස්ථාවලදී එබඳු අසරණ අබිබියාතයන් කුලියට ගෙන යැමද හිඟන ලෝකයේ සිරිතක් වෙයි. එබඳු ව්‍යාපාර ගෙනියන්නේ හිඟන ලෝකය පාලනය කරන බාහිර පුද්ගලයන් විසිනි.

නූතන ලෝකයේ යාචකයෝ අලුත් අලුත් උපක්‍රම යොදාගෙන තම ජීවිතය ගෙනියන්නට මාන බලති. ආරෝග්‍යශාලාවෙන් බෙහෙත් ගත් තුණ්ඩුව පෙන්වන ඔවුන් මුදල් ඉල්ලන්නේ බේත් ගැනීමටය. මානසික ආරෝග්‍යශාලාවේ බේත් ගත් තුණ්ඩු හා හෘදරෝග ආදි බරපතල රෝග සඳහා නියම කළ බේත් ඇති තුන්ඩු වැඩි වශයෙන් ඔවුන් අතර ප්‍රයෝජනයට ගනු ලැබේ.

දවාලට කෑමට බත් එකක්, පාන් බාගයක් ඉල්ලන අයද මේ අතර ඇත. මින් සමහරු ඇත්ත වශයෙන්ම බඩගින්නේ පෙළෙන්නෝය. තවත් අය මෙසේ මුදල් ලබාගන්නේ බඩගින්නට හා ආහාර හෝ ලෙඩට බේත් ලබා ගැනීමට නොව

මෙසේ හිඟාකෑමෙන් ලබන මුදල අරක්කු බොන්නට හෝ මත්ද්‍රව්‍ය වලට වියදම් කිරීමටය. අගනුවරට පැමිණ මුදල් පසුම්බිය සොරකම් කළ බව කියා ගෙදර යෑමට බස් ගාස්තුව ඉල්ලන වැදගත් සේ ඇඳ පැළඳගත් යාචකයන්ද ඇත. මේ අය අතර යිත් ගන්නා පෙනුම ඇති 'නෝනා මහත්වරුද' දකින්නට පුළුවන.

මනා ලෙස ඇඳ පැළඳගෙන මෙබඳු සිත් කම්පාවන කතාවක් කියා අසන්නාගේ අනුකම්පාව උපදවා මුදල් සපයාගැනීම අද කොළඹ නගරයේ බෙහෙවින් ප්‍රචලිත යාචක උපක්‍රමයකි. පෙර කාලයේ වන්දනා ගමන් යන්නට මුදල් එකතු කළාක් මෙන් මහත්වරුන් හෝ නෝනා මහත්වරුන් ලෙස පැමිණ, කතාවෙන්ම අනුන් රවටා මුදල් සොයා ගැනීම සමහර නූතන යාචකයන් විසින් යොදාලනු ලබන ඉතා ප්‍රචලිත උපක්‍රමයක් වන්නේය. ශ්‍රමණ වේශය රැගෙන සම්මාදන් එකතු කිරීමද මේ උපක්‍රමයේම තවත් විකාශනයක් වෙයි.

4 යාචක වර්ග

පැරණි යුගවලදී නම් දුගී මගී යාචක යන්නට අමතරව දුගී මගී යාචක වනිබ්බක යන යෙදුම්ද දක්නට ලැබිණ. දුප්පත් අයත්, මඟියනුත්, යාචකයනුත්, වනිබ්බකයනුත් එකම වර්ගයේ නැත්නම් එකට එක ඉතා සමීප වර්ග බව මින් වටහාගත හැකිය. වනිබ්බක යන්නෙන් කියවුයේ 'දුන් දෙයෙහි ඉෂ්ට කාන්තාදී අනුසස් කියමින් යදින්නා' බව ශාබ්දිකයෝ සඳහන් කරති.

පැරණි දහසය වර්ගයක් වූ යාචකයන් ඇත්ත වශයෙන් අපේ රටේ සිටින්නට ඇත. නැත්නම් මේ සොළොස් වර්ගය ගැන ගත්කතුවරුන් සඳහන් කරතියි සිතිය නොහේ. මේ දහසය වර්ගය නම් කථික, පථික, පෞරාණික, තාර්තික, ගම්ක, වාදික, වක, මූක, හට, නට, ඛඤ්ජ, අන්ධ, බධිර, පඩිඟු, ගිලාන හා දීන යන නම්වලින් හැඳිනවේ.

කථික යනු 'කතා දමමින් හිඟාකන අයයි' කතා පැවැත්වීමෙන් ජීවිකාව කරන අයයි.'' මේ අයට කතන්දර මවා කීමට ශක්තියක් තිබූ බව පෙනේ. අනුන්ගේ විශ්වාසය හා අනුකම්පාව දිනා ගැනීම මේ කථික යාචකයන්ගේ ස්වරූපය බව පැහැදිලිය. ආගමික කතා කියා ශ්‍රද්ධාව ඇති කිරීමත්, තමන්ට වූ විපත් ආදිය ගැන කියා අනුකම්පාව දිනා ගැනීමත් කළ මේ අය තමන් සතු කතා ශක්තියෙන් උපරිම ප්‍රයෝජනය ලබාගැනීමට හැකි අය වූහ.

පථික යනු මඟියන්ය. මගට බැස ගමන් යන තැනැත්තා මඟියෙකි. ඔහු කුමන කාරණයකට මගට බැස්සත්, අතීතයේදී නම් මග යන ගමනේදී අනුන්ගෙන් යැපිය යුතුය. යාචක ගණයට මඟියා ගැනුනේ මේ හේතුවෙනි. ගමන අවසාන කළ විට මඟියා යලිත් අනුන්ගෙන් යැපීමට නොපතන නිසා ඔහු එතැන් සිට යාචකයෙක් නොවන්නේය. මේ නිසා මඟියා, තාවකාලික යාචකයෙකි. අදත් යම්කිසි බාරහාරයකට මගට බැස හිඟාකමින් ගොස් බාරය ඉටු කළාට පසු හිඟාකෑම නවත්වන අය දැකගන්නට බැරි නැත. අද මඟියන් තාවකාලික යාචකයන් නොවෙතත් මේ ගණයේ වෙනත් අන්දමේ යාචකයන් අපට ඇත.

පෞරාණික යන යාචක වර්ගය ගැන නිශ්චිත යමක් නොමැතිය. වයසට යෑම නිසා අබල දුබල වූ තැනැත්තන් - මහල්ලන් මේ ගණයට අයත් වීද? අද සමාජයේ මෙවැනි වයසක අය රාශියක් දක්නට ලැබේ. පැරණි යුගයේත් තමන්ට සලකන්නට කව්රුත් නැති මෙබඳු අය සිටින්නට ඇත. මේ වයසක අය පෞරාණික ගණයෙහි ලා ගැනිණිද? පෞරාණික කීවේ පරණකම වැඩි වයස ගැන සලකමින්ද?

තාර්කික යනු 'තර්ක ශාස්ත්‍රය යොදා ගනිමින් ඒ මගින් යාචක වෘත්තියේ යෙදුණු තැනැත්තන්ය. තැනින් තැන යමින් මෙබඳු අන්දමට තර්ක කළ පුද්ගලයන් ගැන අපේ ග්‍රන්ථවල සඳහන් වන්නේය. තර්කය යොදාගන ඒ අය කතා කරන විට, සාකච්ඡා කරන විට මේ එක්තරා වර්ගයක් යමක් දැන උගත් තැනැත්තන් බව මිනිස්සු කල්පනා කළහ. ඒ නිසාම උගත්කමට ගරු කරමින් ඔවුන්ට පුද පඬුරු දුන්හ, ආහාර පාන සැපයූහ.

ගමික යන්නෙන් අදහස් කරන්නේ 'ගමන් ගන්නා' යනුයි. මින් ඇඟවෙන්නේ 'මගී' යනු යාචක කොට්ඨාශයද? එසේ නම් අප කලින් කී 'පථික' යන වර්ගයට වඩා ගමිකයන් වෙනස්වන්නේ කොහොමද? 'පථික යනු ඉතා දුර ගමන් යන 'මගියා' කියාද? 'ගමික' යනු ගමක් ඇතුළත හෝ ගම් ඇතුළත වඩා දීර්ඝ නොවූ ගමන් ගත් මගියාද යනුවෙන් වෙන් කර ගැනීම සාවද්‍ය නොවේ යැයි මට සිතේ.

වාදක යනු යම් කිසි සංගීත භාණ්ඩයක් වාදනය කරමින් අනුන්ට ඉන් විනෝදය ගෙන දී ආධාරයක් අපේක්ෂා කරන්නාය. මෙබඳු අය අතීතයේ අපේ රටේ ජීවත් වූ බව පෙනේ. මේ භාණ්ඩය මනා ලෙස වාදනය කරන්නට ඔවුහු උගත්හ. සමහරවිට භාණ්ඩය වාදනය කරන අතරම ගයන්නටද ඔවුන් දැන සිටි බව පෙනේ. අදත් හිඟන්නන් අතර පොල්කටු වීණා, මැන්ඩලින්, සර්පිනා වාදනය කරන තැනැත්තන් දක්නට පුළුවන.

වක යනු නැති ලෙඩ පෙන්වීම් ආදියෙන් අපේ අනුකම්පාව දිනා යමක් හිඟා කන්නාය. මූක ස්වභාවයන්ම ගොළු තැනැත්තායි. 'හට' යනු කවරේදැයි පැහැදිලිව කිව නොහේ. සමහරවිට යුද්ධයට ගොස් අබ්බගාත වී අනුන්ගේ පිහිට පතන තැනැත්තෙකු විය හැකිය. රාත්‍රියෙහි හැසිරෙන්නාට ද මේ නම කියන නිසා රාත්‍රියෙහි පමණක් හිඟාකන තැනැත්තන්ද මේ ගණයෙහි ලා ගන්නට පුළුවන. එබඳු වර්ගයක - නිශාචර හිඟන්නන් අප අතර අතීතයෙහිදී දක්නට ලැබිණිද?

'නට' යන්නෙන් අදහස් කරන්නේ අතීත කාලයේ ජීවත් වූ, නැටීමෙන් යමක් උපයා ගන්නා යාචක විශේෂයකි. අද ජීවත්වන 'බොරුකකුල්කාරයන්, 'රිලවුන්' 'නයින්' ආදීන් සතුන් රැගෙන ගොස් නටවමින් මුදල් ලබා ගන්නා තැනැත්තන් දකිනවිට පැරණි 'නට' ගණයේ යාචකයා කෙබන්දෙක්දැයි අනුමාන කරගත හැකි වන්නේය.

බජ්ජ යනු 'කොරැන්ය' අතපය කොරවීම නිසා අනුන්ට එය පෙන්වා හිඟමන් යදින තැනැත්තන්ය. අන්ධ යනු ඇස නැති යාචකයන්ය. බධිර යනු බීරන්ය. පඬගු යනුවෙන් හැඳින්වූයේද කොරැන්ය. ඒ අය 'බජ්ජ' ගණයෙන් වෙනස් වන්නේ කෙසේද? පඬගු යාචකයා වාතාදි රෝගබිය නිසා ගිලාන තත්වයට පත්වූවෙකු වන අතර, උපතින්ම, සහජයෙන්ම අබ්බගාත වූ තැනැත්තා බජ්ජ යනුවෙන් සලකනු ලැබිණිද?

ගිලාන යනු සුව නොකළ හැකි නිතර වැළඳෙන ආබාධ වලින් යුක්ත තැනැත්තන්ය. ඒ තැනැත්තාට පිහිටවන්නට කව්රුත් නැත. 'දීන' යන අවසාන වර්ගය තාටත් මුලුව පහත් කරමින් අසරණකම, තමන්ගේ දීන බව පෙන්වා යම් යම් දේ හිඟාකන තැනැත්තන්ය. මෙබඳු අන්දමේ දීන චර්යා රටා ඇති තැනැත්තන් අප අතර කවදත් ජීවත් වූ බව පෙනේ.

පැරණි සොළොස් වර්ගයම අදත් විවිධ මුහුණුවරින් අපට දැකගත හැකිය. පෞරාණික නැත්නම් වයසට ගිය වැඩිමහලු අය අද හිඟන්නන් අතර ප්‍රධාන තැනක් ගනිති. ඊට අමතරව ගිලාන නම් විවිධ සුව කළ නොහැකි නිතර නිතර සැදෙන රෝගාබාධ වලින් පෙළෙන අය ඇත. අන්ධ හිඟන්නන්, කොරුන් බීරන්, ගොලුවන්, හිඟන්නන් අතර දක්නට ඇත. ඒ සමගම මෙබඳු රෝගාබාධ, ශරීර බාධක තමන්ට ඇතැයි මවාපාමින් හිඟාකන 'වංක' ගණයට නූතන සමාජය පුරුදුය. 'තාර්කික' යන්නෙන් ඇඟවෙන අය නැතින් නැත ගොස් තමන් දන්නා වූ ශාස්ත්‍රය කියා පාමින් යමක් උපයා ගනිති.

අත බලා, මුහුණ බලා, නිමිති අල්ලා පාස්තර කියන අය මේ වර්ගයට වැටෙන්නේ නැද්ද? නක්ෂත්‍රය කියාදීම, ආගම ධර්මය කියාදීම ඒ අයගේ පිරිතය. එදා අත්තනගලු වංශයේ කුමාරවරුන් තිදෙනාට අනාගතය ගැන කී අන්ධ නක්ෂත්‍රකාර බ්‍රහ්මයා මෙබඳු තැනැත්තෙකි.

අද මගී කොටස පැරණි ආකාරයටම හිඟන්නන් ලෙස ගැනෙන්නෝ නැත. ගමන් යනවිට නවාතැන් හා ආහාරපාන ලබාගැනීමට හෝටල් හා වෙනත් වාසස්ථාන ඇති නිසා පෙර මෙන් මගියාට අනුන්ගෙන් යැපීම අවශ්‍ය නැත. එහෙත් 'යාතුකර්ම' යාචකයන් අදත් දක්නට ලැබේ. තමා යම් භාරයක් වී ඒ බාරය ඉටු කරන්නට හිඟාකමින් මග යන මේ අය බැරය ඉටු කළාට පසු හිඟාකෑම අත් හරිති. ඒ අයට යාතුකර්ම හිඟන්නන් කියන්නේ මේ නිසාය.

පෙර කාලයේ කුල යාචකයන් ගැන මේ සොළොස්වර්ගය තුල සඳහන් නොවේ. අද නම් සමහර කුලවල අය අනුන්ගෙන් ඉල්ලාගෙන කති. රොඩී මිනිසුන් මේ ගණයෙහි ලා ගැනේ. ඒ අය තමන් හිඟන්නන් නොවන බවත්, ඉල්ලාගෙන කන අය බවත් වෙසෙයින් සඳහන් කරති. ඉල්ලාගෙන කෑම කරන්නේ එක්තරා පැරණි සම්ප්‍රදායක් අනුවය. රොඩී මනුෂ්‍යයාට ගොදුරුකම් තිබේ. ඔහු මේ ගම්වලට කලින් කලට යයි. ඔහුගේ සම්ප්‍රාප්තිය සම්ප්‍රදායිකය. ගමේ ගෙදර වැට මායිමට එන ඔහු 'ඉල්ලාගෙන කන හුලවාලියා ආවා, හාංදුරුවනේ පිනට මුකුත් කියා හඬ නගයි. ඔහු එය කියන්නේ එක්තරා අන්දමකට වාක්‍යය ඇදපැද තලවා තාලයක් අනුගමනය කරමිනි. මේ තාලය එබඳු වාක්‍ය කියන රොඩී මිනිසුන් කාටත් පුරුදු එකකි. ගෙදර අය වී ආදී ධාන්‍ය එළවළු, පලතුරු හා මුදල් දෙති.

මේ සම්ප්‍රදාය සමහර පළාත්වල මීට වඩා සංකීර්ණය. රොඩී අය මෙයේ පැමිණෙන්නේ වේවැල් ආදියෙන් කළ මලු, හවරි, කොහු, ඉදල්, ඉලපත් ආදියද රැගෙනය. ගමේ මිනිස්සු ඒවා ලබාදෙන වටිනාකමට වඩා මුදල් ඔවුන්ට දෙති. මෙහි ඇත්තේ සාම්ප්‍රදායික හුවමාරුවකි. මිල නියම කොට හරියටම එය ගෙවීමට

වඩා මිලට වැඩියෙන් යමක් ආපසු හුලවාලියාට දීම ඒ හුවමාරුවයි. මේ සම්බන්ධතාව සමාජ විද්‍යාඥයන් විසින් සූක්ෂමව විග්‍රහ කොට අවබෝධ කරගත යුත්තකි. එය සාම්ප්‍රදායික කොටස දෙකක් අතර (ගැමියන් හා හුලවාලියන්) අතර කෙරෙන ද්‍රව්‍ය හුවමාරුවක් වුවත් ඉන් ඔවුන් දෙකොටසේ සම්බන්ධතා තහවුරු වෙයි: සමාජ තත්වයන් හා සමාජකාර්යභාරයන් ඉන් පුනරුච්චාරනය වෙයි;

වයසට ගොස් හිඟාකෑම අද වැඩි වී ඇත්තේ ආර්ථික සමාජහේතු නිසාය. ශක්තිය තියෙන තෙක් වැඩක්පලක් කොට ජීවත් වුවත්, එසේ කිරීමට බැරි වූ විට බොහෝ අයට ආධාර කරන්නට කව්රුත් නොමැති වෙයි. බොහෝවිට දරුවන් පවා දෙමාපියන් අතහැර දමන්නට පෙළඹී ඇත්තේ ආර්ථික හේතු නිසාය. තමන් ජීවත් වූ නිදහස් රටාවට වෙනස්ව ජීවත්වන්නට අකැමැති දෙමව්පියෝ දරුවන් සමඟ එකට වාසය කරන්නට රුචි නොකරති.

මේ නිසා අද වැඩිහිටියන් රාශියක් මහාමාර්ගවල හිඟාකනු දක්නට හැකිය. බුදුන්ගේ කාලයේදීත් එක්තරා පියෙකු දරුවන් විසින් අත්හැර දැමූ සැටි බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. ඒ පියා පසුව බුදුරදුන් වෙතැ පැමිණ තම දුක ප්‍රකාශ කළේය. දරුවන් ආපසු තමන් වෙත ගෙන්වා ගන්නට ක්‍රමයක් බුදුන් වහන්සේ ඔහුට කියා දුන් සේක. මේ උපාය නිසා සමාජයේ අප්‍රසාදයට හා ගැරහීමට පාත්‍රවූ දරුවෝ පසුව පියා සලකන්නට පටන් ගත්හ.

අද සමාජයේ සමහර ඉතා ,වැදගත් තානාන්තර දරන දරුවන්ගේ දෙමාපියන් මහමග හිඟාකන බව අපට පෙනිණ. මේ වැඩිහිටි හා ගිලාන හිඟන්නෝ තමන්ගේ දරුවන්ගේ නම්ගම්, වත‍ගොත අපට කීහ. එක් අයගේ දරුවන් අතර ඉංජිනේරුවන් හා ගුරුවරු සිටියහ. තවත් අයගේ සහෝදරයකු රටේ ඉන්නා ප්‍රසිද්ධ රාජ්‍ය සේවකයෙකි. තවත් කීපදෙනෙකුගේ දරුවන් ව්‍යාපාරිකයන් උගතුන් හා වෙනත් උසස් රැකියා දරන අයන්ය. මේ වැඩිහිටියන් අද ඉන්න හිඟන තත්වයට පත්වූ හේතු කුමක් වුවත්, ඒ අයට මහ පාරේ ජීවත් වන්නට ඉඩ සැලසීම දරුවන්ගේ යුතුකම නොවෙයි. 1992-93 වනවිට වයසක හිඟන්නන්ගේ ගණන 1986-82 ට වඩා සෑහෙන ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත.

හිඟන්නන් වූ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව දිනෙන් දින වර්ධනය වේ. වැඩිහිටියන්ට ජීවිත රක්‍ෂණ හා එවැනි සහනාධාර ක්‍රම දක්නට නැත. විශ්‍රාම වැටුප ආදිය ලබාගැනීමටද හැමෝටම වාසනාවක් නැත. වයසට පත්වන විට අතීතයේදී නම් වෙනත් පිහිටක් නැත්නම් විහාරයකට පන්සලකට යෑමට සිරිත වුවත් අද එබඳු වැඩිහිටියන්ගේ සංඛ්‍යාව වැඩිවීම නිසා ඊටද අවසරයක් නැත්තේය.

වයසත් සමග ගිලාන බවට පැමිණීම තත්වය තවත් භයානක කරන්නේය. කොළඹ ප්‍රධාන ආරෝග්‍යශාලාව වටා ඉන්නා යාචකයන්ගෙන් වැඩි ගණනක් ගිලාන වූ වයසක හිඟන්නන්ය. විශේෂයෙන්ම මොවුන් වැඩි දෙනෙක් ඇදුම රෝගයට භාජන වූ අයයි. ආරෝග්‍යශාලාවෙන් බෙහෙත් ලබාගෙන රෝගය (ඇදුම වැනි) සුව වූවාට පසු, ඒ අසලම වාසය කරන්නට මේ අය පෙළඹෙන්නේ යළිත් රෝගය වැළඳුනහොත් වහාම ආරෝග්‍යශාලාවට දුව ගොස් බෙහෙත් ලබාගැනීමටය.

ඈත පළාත්වලින් අපේ ආරෝග්‍යශාලාවට අසනීප හැදී ගෙනැවිත් දමන නෑදෑ ගිලාන අය රෝගය සුවවූවාට පසු අතරමං වෙති. දරුමල්ලන් ඒ අය බලන්නට එන්නේ නැත. ශල්‍යකර්ම ආදියට ගොදුරු වී ආරෝග්‍යශාලාවෙන් පිටතට දැමීමට පසු ඒ අයට යන්නට තැනක් නැත. ආපසු ගමට යෑමට මුදල් ද නැත. මේ වයසක ගිලාන අයට එකම පිහිට පදිකවේදිකාවයි.

වයසට ගොස් අබ්බගාත බවට පත්වූවන්ගේ ගණන වයසක උදවියගේ ගණන මෙන් ඉක්මනින් වැඩි වී නැතත් 1980 ගණන්වලට වඩා අද මදක් වැඩිය. අබ්බගාත වැඩිහිටියන් යොදවා ගැනීමට හිඟන මුදලාලිලා අකැමැතිය. ඒ අබ්බගාත වැඩිහිටියන්ට හිඟාකෑමද හරිහැටි කළ නොහේ. ඒ නිසා වැඩි දවසක් වීදියේ රඳා පවත්නට නොහැකි වීම එවැනි අය යාචකයන් අතර බහුල නොවීමට හේතුවයි. එහාමෙහා යන්ට පුළුවන් මහලු අබ්බගාතයාට හැර, එසේ කළ නොහැකි මහලු අබ්බගාතයනට හිඟන ලෝකයේ වැඩක් නැත.

විවිධාකාර ශාරීරික හා මානසික අබ්බගාතයන් පැහෙන සංඛ්‍යාවක් අප අතර අද දක්නට නැත. මේ අයගෙන් ඉතාමත් කණගාටුදායක අබ්බගාත ළමුන් හා මානසික රෝගාබාධ වලින් පෙළෙන්නාවූ දරුවන්ය. විකෘති පෙනුම් ඇති දරුවන් මුදලක් දී "කුලියට" ගැනීම සාමාන්‍ය සිරිතය. පාර අද්දර මේ වැනි දරුවන් තබා ඒ අයගේ දුක වේදනාව තුලින් මුදල් හම්බකිරීම වර්තමානයේදීත් සිදුවෙයි.

කුඩා දරුවන් පමණක් නොව හැඩුනු වැඩුණු සිරුරු ඇති එහෙත් අබ්බගාතයන් වූ තරුණ අයද මේ සූරාකෑමට භාජන වෙති. ඉතාම අහිංසක පෙනුමක් ඇති ශරීරයේ යෝධයකුගේ සේ වැඩුනු පුද්ගලයකු බොහෝ විට අගනුවර පදික වේදිකාවේ දක්නට ඇත. බිම වැතිරී සිටිනු මේ යෝධ මිනිසා දකින තාගේත් සිත අනුකම්පාවෙන් බාරවෙයි. ඔහු ළඟ මුදල් දමන්නට භාජනයක් හෝ රෙද්දක් අතුරා ඇත. " මේ යෝධයාට ඕන් යන්නට මයකට මෙතරම් වියදමක් අවශ්‍ය" යැයි එහි ලියා ඇත.

අසරණ මිනිසාට අනුකම්පාවෙන් මහජනයා දෙන මුදල් ඔහු වෙනුවෙන් වැයවෙන්නේ කලාතුරකිනි. මෙවන් තැනත්තන් රථවාහනවල තබා තැන්තැන් වලට ගෙන ගොස් මුදල් හම්බ කිරීම කරන්නේ මුදලාලිලාය. ඇත්ත වශයෙන්ම මුදලාලිගේ හා වංචාකාරයාගේ ග්‍රහණයෙන් තොරව මේ අසරණ පුද්ගලයන්ට උදව් කිරීමේ මගක් මහජනයා විසින් සොයා, ගත යුතුය.

අබ්බගාතයන් අද වඩාත් දක්නට ලැබෙන්නේ වර්ණ ආලෝක ඇති මහාමාර්ග සන්ධි අසලය. මීට අවුරුදු දහයකට පමණ පෙර අපේ රටේ මෙබඳු හිඟන්නන් හිටියේ නැත. අද කොළඹ ප්‍රධාන පාරවල්වල හා සම්බන්ධ හන්දිවල වර්ණ ආලෝක සංඥා ඇත්නම් එතැන කීප වර්ගයක යාචකයන් දැකිය හැකිය.

1) කුඩා දරුවන් අතින් ගත් තරුණ ගැහැනු
2) අබ්බගාත තරුණ පිරිමි
3) අබ්බගාත හෝ අබ්බගාත නොවන කුඩා ළමයි
4) අබ්බගාත හෝ අබ්බගාත නොවන එහාමෙහා යන්ට පුළුවන් මහලු පුද්ගලයන්

මේ අය එතැන සිටින්නේ මහා මාර්ගයේ ගමන් කරන රථවාහන වල ආලෝක වෙනස් වනතුරු එහි නතරවන නිසාය. මේ අය බොහෝ දෙනෙක් යමක් ඉල්ලන්නේ කතා නොකරය. රථ නැවැත්වූ පසු ඔවුහු අත පාමින් රථයෙන් රථයට යති. කුඩා ළමයි වුවත් හිංමත් ඉල්ලන්නේ මේ ආකාරයෙනි. ඊට එක් හේතුවක් නම් කොළඹට ගෙනා ද්‍රවිඩ ජාතිකයන් වූ ඔවුන් සිංහල තරමක්වත් නොදැනීමය. වැඩිහරියක් මේ අය උතුරේ සිට පැමිණි අභිබගාත ජනකායට අයත්ය. සමහරු එකල කොළඹ පිහිටා තිබූ (දැනටත් ඇති) සමහර සරණාගත කඳවුරුවල නැවතී සිට හිගාකෑමට මේ තැන්වලට පැමිණෙන අයයි. ඒ අයගෙන් වැඩි කොටසක් මහා ලෙස සංවිධානය කරන්නේ මෙබඳු කටයුතුවලින් මුදල් උපයන තැනැත්තන්ය.

හිගාකෑමට යොද ඇති කුඩා ළමයි කොළඹ නගරයේ හැමතැනම දක්නට ලැබේ. බම්බලපිටිය, කොල්ලුපිටිය, කොටුව, මරදාන, බොරැල්ල යන කොතැනක බැලුවත් මේ ළමයි ඔබට හමුවෙයි. බම්බලපිටියේ හංදියේ ගාලු පාර දිගේ ඉන්න ළමයි පොලිසිය හඳුනති. පොලිසියේ කාර් එකක් හෝ පොලිස් නිලධාරියෙක් ඇත එනවිට පැන යති. ඒ අය හිඟමන් ඉල්ලා වධා කරදර කරන්නේ විදේශිකයන්ටය.

හිගන්නන් අතර ඉතාමත් ප්‍රසන්න අය ගී ගයා භාණ්ඩ හඬවා අසන්නන්ගේ හිත් සතුටු කොට යමක් උපයා ගන්නා අයයි. පිටකොටුවේ පළුසල අසල වාඩි වී සර්පිනාවක් ගයමින් ගී ගයන අන්ධ මිනිසුන් දෙදෙනා හා ගැහැනිය ඔබ දැක තිබේද? මැන්ඩලින් එකක් ගසමින් සිංදු කියන අය හිගන්නන් අතර ඇත. ඉතාමත් ප්‍රකට ක්‍රමය රබාන වාදනය කරමින් විරිඳු කියා යමක් ඉල්ලා ගැනීමයි. බොරු කකුල් කාරයන් (බොහෝවිට මෙය කරන්නේ පොන්නයන් විසිනි) බොරු කකුල් දමාගෙන නටා ගයා යමක් ලබාගන්නට වෑයම් කරන තැනැත්තන්ය. යම් කෙනෙකු 'ගැහැනියක' ලෙස අන්දවා ඒ තැනැත්තා බෙරයක් ගසමින් තැනින් තැන රැගෙන යමක් හිගාකෑමද එක්තරා ක්‍රමයකි.

මෙබඳු කලාකාර හිගන්නන් කුමන වයස් සීමාවක වුවද දැකගත හැකිය. තාත්තා බෙරය ගසන විට සිංදු කියන හිඟන ළමයි සිටිති. නුගේගොඩ, දෙහිවල, නුවර හා තවත් නගරවල දක්නට ලැබෙන අන්ධයන් විරිඳු කියන්නේ (බොහෝවිට) දෙදෙනෙක් හෝ තිදෙනෙක් එකට එක්වී ගෙනය. එක්කෙනෙක් කියා ඉවර වෙන විට අනිකා කිමත්, දෙදෙනාම එකට විරිඳු ගැයීමත් ඔවුනට පුරුදුය. පාරේ යනඑන බස්වලට නැගී විරුදු කියා ජීවත්වීමට අවශ්‍ය මුදල සොයාගන්නා සැම වයසකම විරිඳුකාර හිගන්නන් ඇත. තරුණ වයසේ ගැහැණු ළමයි මේ අතර දක්නට පුළුවන.

පවුල් පිටින් හිගාකෑම අද හිගන්නන් අතර ප්‍රචලිත ක්‍රමයකි. නුගේගොඩ පවුලක තාත්තා අබ්බගාතයෙකි. බිරිඳ හා දරුවන් නගරය පුරාම හිගාකන අතර, තාත්තා බම්බලපිටියට ගොස් හිගා කා ආපසු 'ගෙදර' එයි. ඔවුන් පදිංචිව සිටින්නේ නුගේගොඩ පල්ලිය ඉදිරිපිටය. මේ පවුලට දැන් තරුණ වියට පත්වූ දියනියක්ද ඇත.

පවුල් පිටින් හිඟාකෑම මීට දසවසරකට පෙර හිමිවූයේ වයස්ගත ජෝඩුවලටය. අද මුළු පවුලම හිඟාකන අවස්ථාමෙන්ම අම්මා හා දරුවන් හිඟමනට යොමු කොට තාත්තා අලස ජීවිතයක් ගත කරන පවුල්ද ඇත. බොහෝ නගරවල මෙබඳු තරුණ තාත්තලා දකින්ට පුළුවන. ඒ තාත්තලා අතර මත්පැනට හෝ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ අය වෙති. බිරිඳ හා දරුවන් යමක් උපයා ගන්නා තුරු ඒ අය බලා ඉන්නේ මෙම මුදලින් කොටසක් හිමිකරගෙන මත්පැන් හෝ මත්ද්‍රව්‍ය රස විඳීමටය.

පවත් හිඟන පවුල් වල සිරිතක් නම් අම්මා තාත්තා හිඟාකන අතර දරුවන් ස්ටිප් ටිකට් විකිණීම, හඳුන්කූරු විකිණීම ආදී කටයුතුවල යෙදවීමය. මෙසේ කරන වෙළඳාම අර්ධ - වෙළඳාමකි. දරුවා වෙළඳාමත් සමග යමක් අනුන්ගෙන් ඉල්ලාගැනීමටද බොහෝවිට වෑයම් කරයි. ඔහු හෝ ඇ එසේ ඉල්ලන්නේ මුදල් නොවේ. ආහාරපාන, රෙදිපිළි හා ඇඳුම් ඉල්ලීමට මේ දරුවන් පුරුදු වී ඇති බව පෙනේ.

1977 දී කොළඹ නගරයේ යාචක පවුල් යයි කිව හැකි පවුල් 687 ක් විය. අද තත්වය මේ මෙන් තුන් ගුණයකි. 1971 දී නුගේගොඩ සිටියේ පවුල් දෙකයි. අද ඒ සංඛ්‍යාව 46 ක් වී ඇති අතර, යාචකයන්ගේ සංඛ්‍යාව 156 ද ඉක්මවන සුළුය. සමහර පොළ දිනවල මේ සංඛ්‍යාව දෙගුණ වන්නේය. මහරගම තිබූ පවුල් 6 වෙනුවට අද 38 ක් පවුල් එහි දක්නට ලැබේ. හිඟන පවුල් සංඛ්‍යාව වර්ධනය වූ අන්දම වටහාගැනීමට මෙය හොඳ නිදර්ශනයකි.

අද දක්නට ලැබෙන හිඟන පවුල්වල ස්වරූපය දෙආකාරයක් ගනියි.

1) අම්මා, තාත්තා හා දරුවන්

2) අම්මා හෝ තාත්තා හා දරුවන් මේ පවුල් වල ඇත. ඉහත දී නම් මේ අය අම්බලම් ඇදී තැන්වල වාසය කළත් දැන් වාසය කරන්නේ කුමන හෝ අගුපිලකය. සමහර පවුල් හිඟාකෑමට පෙළඹී ඇත්තේ ගම්වල ඔවුන්ගේ ඉඩකඩම් සතු කරගත් ජනයන් මේ අය බලයෙන් ගමින් පන්නා දැමීමෙනි.

නූතන යාචකයන් අතර යාචක 'මහත්වරු' මෙන්ම නෝනාවරුන්ද ඇත. ඉතා මැනවින් ඇඳ පැළඳගත් මේ අය සමහර විට අනුන්ට, විශේෂයෙන්ම ඉංග්‍රීසි දන්නේ යැයි ඔවුන් සිතන අයට, කතා කරන්නේ ඉංග්‍රීසියෙනි. කතාබහෙන් හා ඉරියව්වෙන් මේ අය ඉතා මනා සංස්කෘතික වටපිටාවකින් එන තැනැත්තන් යයි සිතා ගැනීමට මහජනයා පෙළඹෙති. තමන්ට වූ දුකක්, කරදරයක් ගැන කියා, අනුකම්පාව හා විශ්වාසය දිනාගෙන යම් ආධාරයක් ලබාගැනීම මේ අයගේ සිරිත වේ.

යාචක නෝනාවරු හා මහත්වරු සමහරවිට හිඟාකන්නේ 'සහතික පත්‍ර' අතින් ගෙනය. මේ සහතික පත්‍ර කවිරුන් හෝ වැදගත් අය විසින් ඔවුන්ට දුන් ඒවාය. සමහර විටක මේ අය ඉතා දක්ෂ උපක්‍රම යොදාගෙන හමුවූවන් රවටති. අනුන්ගේ විශ්වාසය දිනාගන්නට හැකි එබඳු ක්‍රම නිසා ඒ අයට කරදරයක් නැතිව මුදල් සෑහෙන ගණනක් සොයා ගන්නට ඉඩ ලැබේ.

සමහරු හිඟන්නෝ බීමත්කම හෝ මත්ද්‍රව්‍ය නිසා අන්ත පිරිහීමට පත්වූ නිසාය. කලකට පෙර සමාජයේ ඉතා වැදගත් තැන්වල සිටි උදවිය කලක් ගත වන විට මේ අවාසනාවන්ත තත්වයට වැටෙන්නේ ඉහත කී අන්දමේ පුරුදුවලට ඇබ්බැහි වීමෙනි. මැරෙන තුරා හිඟාකෑමෙන් මුදල් උපයාගෙන ජීවත්වීම ඔවුන්ගේ අරමුණයි.

'තාවකාලික' යාචකයන් යැයි කොටසක් ද අප අතර ඇත. 1982 වනවිට මෙවැනි හිඟන යාචකයන් එකල සම්පූර්ණ සංඛ්‍යාවෙන් සියයට හයක් පමණ විය. ආගමික සිද්ධස්ථානයකට වන්දනාවේ යන තැනැත්තා හිඟාකමින් එහ කාලය ගත කරන අතර, ආපසු එන්නේ හිඟාකමිනි: බාරයක් ඉටුකිරීමට මු නටයුත්ත කරන්නා යාත්‍රා-කාර්මික යාචකයා වශයෙන් අපි හැඳින්වීමු. වන්දනාවේ යෑමට පමණක් එසේ කරන තැනැත්තා තාවකාලික යාචකයෙකි: ආරෝග්‍යශාලාවල යොස් අසනීපය සුවවූවාට පසු ආපසු ගෙදර ඒමට පෙර යාචක වෘත්තියේ යෙදෙන අය ඇත. ඒ අයද තාවකාලික යාචකයන්ය.

පිස්සු හිඟන්නන් අපේ රටේ ඇතැම් මාර්ගවල මෙන් ගම්වල ද දැකගත හැකිය. මින් සමහරු පුදුමාකාර ක්‍රියා පිළිවෙත්වල යෙදෙති. අවිස්සාවේල්ල නගරයේ ස්ත්‍රීන්ට පමණක් වැඳ වැටෙන පිස්සු හිඟන්නෙක් සිටියේය. ඔහුට හිඟමන් ලැබෙන්නේද ස්ත්‍රීන්ගෙන්මය. මහරගම නගරයේ 1978 - 80 කාලය තුළ පිස්සු හිඟන්නන් දෙදෙනෙක් යාචකයන් අතර දක්නට ලැබිණි. ඔවුහු හිඟමන් ඉල්ලන්නේ සැඩ පරුෂ වචනයෙනි. හිඟමන් නුදුන්නොත් ඔවුහු මිනිසුන්ට බැණ වදිති. සමහර පිස්සු අය මෙසේ කර්කශ ලෙස හැසිරෙන්නේ නැත. හිටිනැතම් බලාගෙන සිටින ඔවුන්ට දන්නා හඳුනන අයගෙන් මිස හිඟමන් ලැබෙන්නේ නැත.

ළමා යාචකයන් නූතන සමාජයේ බරපතල ප්‍රශ්නයක් වී ඇත. යාචක වර්ගයක් හැටියට ඒ අයගේ ප්‍රමාණය ක්‍රමයෙන් වර්ධනය වන්නේය. 1976-7 1438 කොළඹ පුරා ළමා යාචකයන් සිටියත්,1993 වනවිට මේ ගණන තෙගුණයක් වී ඇත. උතුරේ යුද්ධය නිසා හා වෙනත් හේතු නිසාත් දෙමව්පියන් අහිමිවී සමහර දෙමාපියන්ට දරුවන්ගේ බර උසුලාගත නොහැකිවීම මෙන්ම ආර්ථික සමාජීය කරුණු හේතුකොට ගෙන දරුවන් තම දෙමාපියන් සමගම පිටිසර පළාත්වලින් අගනුවරට සම්ප්‍රාප්ත වීම මේ ජනගහනය වැඩිවීමට ප්‍රධාන හේතුවන්ය. ඇතැම් දෙමාපියන් හා හිඟන මුදලාලිලා ළමයින් හිඟා කෑමේ යොදවා මුදල් හම්බ කරති.

'සංචාරක හිඟන්නා' සංචාරකයන් පසු පස යන යාචකයාය. 198 පමණ වන තෙක් සංචාරක හිඟන්නන් සිටියේ ස්වල්ප වශයෙනි. නමුත් පසුගිය දස අවුරුද්ද තුළ සංචාරක හිඟන්නන්ගේ ගණන වැඩිවිය. මේ අය අගනුවරදී සංචාරකයන් පසු පස යනු දැකගත හැකිය. ඊට අමතරව මීගමුව බෙන්තර, හික්කඩුව, ගාල්ල, දික්වැල්ල, කෑගල්ල යන ප්‍රදේශවලද මේ අය දැකගන්නට පුළුවන. මුලදී වයසක පිරිමි මේ කාරියේ යෙදුනත් පසුගිය අවුරුදු පහ තුළදී සංචාරක යාචකයන් අතර ළමුන්ගේ ප්‍රමාණය වැඩිවී ඇත.

සංචාරක යාචකයන් ලෙස ගණන් ගත හැකි අය අපේ වැදි පරපුරේ ද වෙයි. දඹානට ගියොත් එහි වැද්දන් ගෙන් වැඩි දෙනෙක් සංචාරකයන්ගෙන් හිඟාකෑම පුරුදු වී ඇති හැටි දැකගත හැකිය. ඉතා දුක්ඛිත සමාජ ආර්ථික තත්වයක පසුවන වැදි ජනතාවට අද හිඟාකෑම හැර වෙනත් කළ හැකි දෙයක් නොමැති වීම මීට හේතුවයි. වැදි ජනතාව මේ තත්වයට පත්කිරීම ගැන දෝෂාරෝපනය ඇඟිය යුත්තේ සංචාරකයන් නොව මහා සමාජයේ ජීවත්වන අප හැම දෙනායි.

5 යාචක සංවිධානයේ ස්වරූපය

අපේ යාචකයන් විශේෂයෙන්ම කොළඹ ඉන්න අය මනාව සංවිධානය වූ අය බව ඔබ දන්නවාද? මීට අසූවසරකට පෙර නම් මුළු ලංකාවම පළාත්වලට බෙදා ඒ ඒ පළාත් වලට වෙනම ප්‍රධාන සංවිධායකයන් වූ මුදලාලිලා සිටියත් අද එය නැත. තනිව හිඟාකෑම බොහෝ කලක් කළ නොහැකි දෙයකි. හිඟන්නන් සංවිධානය කරන අය - මුදලාලින් සගයනුත් - ඊට ඔබට ඉඩ නොදෙයි. හිඟන ලෝකයම ඊළඟට ඔබට විරුද්ධව නැඟී සිටිනු ඇත.

බොහෝ සංවිධාන සැදී ඇත්තේ පිටස්තර අය හා යාචකයන් එකතුවිය. කොළඹ නම් නගරබද හයිකාරයන්ට හිඟන්නන් යටත් විය යුතුය. මේ නිසා ම යාචකයෝ නගරයේ හයිකාරයෙකුට හා ඔහුගේ අනුගාමිකයන්ට යටත් වෙත්: ඒ අයගේ මූලිකත්වය නැතිව ඔවුන් සංවිධානය විය නොහැකිය. එවන් සංවිධානයක ආධාරය නැතුව හිඟාකෑම කළ නොහේ.

මේ යාචක සංවිධාන ඔබට පියෙවි ඇසට නොපෙනේ. ඔබ හිඟන්නෙකු ලෙස වෙස්වළාගෙන ගොස් කැලණි රජමහා විහාරය අසල වාඩිවන්න. දවසක් දෙකක් දිගටම ඔබ මෙය කරගෙන ගියොත් හිඟන්නාන්ම ඔබගෙන් මෙසේ ප්‍රශ්න කරනු ඇත: ඔබ කව්ද? ඔබට එතනට එන්නට කීවේ කව්ද? අවසර දුන්නේ කව්ද? එහෙම අවසරයක් නැත්නම් ඔබ වෙන පළාතකට යා යුතුය. නැත්නම් හිඟන්නෝ ඔබට අවහිර කරති. හිඟන සංවිධානය බාර නායකයෝ ඔබට තලති.

හිඟන සංවිධානයට බැඳෙන්නට ඔබට මාර්ග තිබේ. එකක් විධිමත් පුහුණුවක් ලබා ඊට ප්‍රවේශ වීමය. මා ඒ සංවිධානයට එක්වූයේ මේ විධිමත් පුහුණුව ලබමිනි. සමහරවිට හිඟන සංවිධානයේ හයිකාරයෙකු හෝ හිඟන නායකයෙකුගේ ආධාර මගින් ඔබට සංවිධානයට ඇතුළු විය හැකිය. ඔබට එවිට හිඟන ලෝකයට අනුකූලව සමාජානුයෝජනය විය යුත්තේ එහි ජීවත් වීමෙන් ලබන අත්දැකීම් ඔස්සේය. ඔබට සලසන ආරක්ෂාව උදෙසා හයිකාරයන්ට ලබන ආදායමෙන් සියයට ගණනක් දිය යුතුය. එසේම ඔවුන්ගේ කොන්දේසි පිළිපැදිය යුතුය.

මේ යොන්දේනි ඔබ අයිති යාචක සමූහයේ මූලිකයා විසින් ක්‍රියාවල තනතුරු ලැබේ. පුරුෂයෙන්ම ඔබට නියමිත භූගෝලීය ප්‍රදේශයෙන් එහාට ඔබ නිසමින් තොයා සිටිය යුතුය. දෙවනුව ඔබගේ නායකයා ඇතුළු වැඩිහිටියන්ට ජ්‍යෙෂ්ඨයනට ගරු කළ යුතුය. තෙවනුව යාචක චර්යාධර්ම අකුරට අනුගමනය කළ යුතුය. හතරවනුව ඔබ හිඟාකෑමෙන් ලබන ආදායමෙන් කොටසක් සංවිධානයට දිය යුතුය.

හිඟන නායකයා ඔබගේ භූගෝලීය සීමාව නියම කරයි. ඔබ හිඟාකෑමට අනුගමනය කළයුතු මාර්ග හා උපක්‍රම යෝජනා කරන්නේ හෝ අනුමත කරන්නේ ඔහුය. මේ නායකයා හා හිඟන සමූහය අතර සම්බන්ධය ඉතා දැඩි එකකි. හිඟන සමූහ කුඩා සමූහ රාශියකින් - පවුල හා යාචක ඒකක - සෑදී ඇත. එක නායකයා යටතේ හිඟාකන හෝ පවුලක් පුංචි සමූහයකට රැස්වී එකරැයි වන හෝ එක නායක හිඟාකන හෝ පවුලක් පුංචි සමූහ මගින් මුළු මහත් දයක් වෙයි. හිඟාකන නායකයාගේ අණසක මේ පුංචි සමූහ මගින් මුළු මහත් හිඟන සමූහයම දැඩි ලෙස බැඳ ගනියි.

හිඟන නායකයාගේ කාර්ය භාරය මෙහෙයවීම අවබෝධ කරගැනීමට නම් ඔබ යාචකයෙකුම වී ඒ අත්දැකීම ලබාගත යුතුය. ඔහු ඔබට හිඟාකෑමට අවශ්‍ය සියලුම රහස්‍යතා නියාමදයි. පුද්ගලිකවම හෝ ඔහු පසෙකින් ඇත්තේ වැඩිහිටි සියලුම ජනශ්‍රැතිය විස්තර කර දෙන්නේය. ඔබට හිඟන ලෝකයේ හිඟන ජෝෂ්ඨයෙන් මේ ජනශ්‍රැතිය විස්තර කර දෙන්නේ නායකයා නැත්නම් ඔහු සහායක සියලුම චර්යාධර්ම, වත්පිළිවෙත් උගන්වන්නේ හිඟන්නන් අතර සියලුම ආරවුල් විසඳ, අවසාන අනායනය. ඔබගේ හා අනිත් හිඟන්නන් අතර යාචක ලෝකයෙන් පිට ඇති පමණ ඔබ තීරණය දෙන්නේ ඔහුය. සමහරවිට යාචක ලෝකයෙන් පිට විසඳුම් ලැබෙන්නේ ද ඔබගේ නායකයාගෙනි. ගැටලුවක් ඇති කර ගන්නේ නම් ඔහුගේ අණසක ඔබට කවදාවත් ඉක්මවිය නොහැක.

ඔබ නායකයාගේ අණසක (සමූහයේ අණසක) ඉක්මවූවහොත් ඔබ හිඟාකෑමට කුමක්ද? හිඟන රැකෙන් ඔබට ඉවතට යාමට සිදුවේවිය. ඔබ නායකයාට අවනත නොවන ඔබ සටකපටයෙන් සකල හිඟන සමූහයා අසාරම වැලියෙයි. දැන් සමාජයේ ඔබ හා කතා නොකරති: ඔබ වර්ජනය කරති. තත්වය මෙසේ වුවිට ඔබට හිඟන්නන් අතර රැඳී සිටිය නොහැක. ඒ අතර සංවිධානයේ හයිකාරයන් සවස් හිඟන්නන් මගින් හෝ පිට අය මගින් ඔබට හයනක අවන්තේවීම කරන්නටද පුළුවන.

ඔබට ලෙඩක් දුකක් වුවත් නායකයා එය දැනගනියි. සුළු අසනීපයක් කොටේ නම් ඔබට කළ යුතු දේ ඔහු වෙනින් තීරණය වන්නේය. සමහර හිඟන නායකයන් අත්බේත්, මන්ත්‍ර ගුරුකම් දනිති. බල්ලන් කපා කෑ විට කරන මන්තර හා බේත්, දත් කැක්කුමට යම්කම් අබිවාර විට් හා බේත්, බංගී නැක්කුම් හිසේ කැක්කුම් ආදී වඩා ප්‍රචලිත අසනීපවලට බෙහෙත් ද කිරීමට ඔහුට පුළුවන.

මා යාචකයෙකුව සිටි දිනවල මගේ සිතවත් මුදලාලි යාචකයන් කෙරෙහි සුළුල බලකෑමක් කරන්නට පුරුවන් හැකියාව සිටියේය. ඔහු කොළඹින් පිට සිටියන් කොළඹ යාචකයන් කෙරෙහි පවා බලපාන්නට ඔහුට හැකිවූයේ අගනුවර

යාචකයන් අතර ඇති නායකයන් ඔහුගේද සියවලුන් වූ නිසාය. කොළඹ ඒ දවස්වල මගේ පන්සල අසල තිබූ යාචක වෙන්දේසියෙන් ඔහුටද එක්තරා ප්‍රියයට ගණනක් ලැබිණි. මේ යාචක කොළේ වෙන්දේසි සැලේ අභිමාතයයක්ය.

යාචකපොළ ඒ දිනවල ආරම්භ වූයේ උදේ සතට පමණය: එය වැටෙන්නාවක් පොරය. ඒ වෙස්වල මේ වෙන්දේසි තිබූ ස්ථානය පාදු ඉවිමනි. කරත්තවල තබා හෝ උස්සාගෙන එන අබිබගාතයන් විශේෂයෙන් ම කුඩා ළමයි - සැබෙනා යනුකමක් පොළට ගෙන එන ලදී. ඒ ඒ අබිබගාතයන් වෙන්දේසි කරන්නේ හයිකාරයෙකු විසිනි. අබිබගාතයන්ගේ ස්වභාවය දක්වීම වන්නාට වන්නාට වෙන්දේසියේ ලන්සුවද වැඩිවෙයි. මට මතක හැටියට එකල ඉතා ඉහළ වෙන්දේසි මිලකට විකුණුනේ යනතු මෙන් විරූපී අබිබගාත ළමයෙකි. මේ ළමයා ලබාගන්නට හිඟන මුදලාලිලා හා හයිකාරයෝ පොරකෑහ. එසේ වෙන්දේසියෙන් ලබාගත් ළමයා යාචකයෙකුට හෝ හැරවිකාරුවෙකුට හෝ ලබාදෙයි. ඉක්බිතිව ඔහුට රැගෙන යායුතු ස්ථානය කියයි. ළමයා මාර්ගයේ තබා සිතන්නන් ලබාගන්නේ මෙහිදීය.

වෙන්දේසියෙන් ලබාගන්නා අබිබගාත ළමයින් හිඟාකෑමට ගෙන යායුතු තැන ඒ ඒ වෙන්දේසිය අනුව වෙනස් වෙයි. දුර්ලභ පොරනැරට හැකිනියට ගෙන යාම, බෙල්ලන්විල පෙරහැරට, මහනුවර දළදා මාලිගාවට, කොච්චිකඩේ පල්ලියේ මංගල්‍යයට ගෙනයන විට වෙන්දේසි මිල වැඩිවෙයි. හිඟන්නන්ට වුවද මේ සමූහ ස්ථානවල හිඟා කන්නට නම් තම සංවිධානයට (හයිකාරයාට) ඉහළ මිලක් ගෙවන්නට සිදුවෙයි.

යාචක වෙන්දේසියේදී කරුණු තුනක් කළ හැකිය.

1. අබිබගාත හෝ දරුණු ලෙඩකින් පෙළෙන ළමයෙකු ඉහළ මිලකට වෙන්දේසියකින් ලබාගත හැකිය. ඉන්පසු යාචකයා හෝ හැරවිකාරයෝ මේ අවාසනාවන්ත ළමයා නැතින් තැන රැගෙන යති.

2. ඊ හා සමගම හිඟා කෑ යුතු ස්ථානයක් ද වෙන්දේසියෙන් ලබාගත හැක. අප කලින් කිවා සේ සමූහ ස්ථාන ලබාගැනීමට වැඩි මුදලක් ගෙවිය යුතුය.

3. සමහර සාමාන්‍ය අබිබගාතයෙකු හෝ දරුණු රෝගියෙකු ලෙස පෙනී සිටීමට සිතූ නම් ඒ වෙස්වලාගැනීම මේ වෙන්දේසියේදී සමුවන විශේෂඥයන් ලවා (යාචක කොටස) සරවාගත හැකි වන්නේය.

ඒ දිනවල පසිගේ පැම දිනකම හා සෙනසුරාදා දිනවල මේ වෙන්දේසි තිබිණ. ඇතැම් වංශයෙහි වෙන්දේසියෙන් පසු අබිබගාත දරුවන් මිලදී ගන්නට සිදුවන්නේ යනතක අත්දැකීමකටය. ඔහු රැගෙන ජනාකීර්ණ තැනකට, පන්සලකට, පල්ලියකට යන හැරවිකාරුවෙන් කොහොනත හෝ ඔහු සිම දිනා

කනවාති. අනතුරුව රෙදි කෑල්ලක් දමා ඒ මත කායි තබති. ඉක්බිති දරුවාට කැඳෙහෙට කියති. දරුවා නැ නොගැලපෙන් ඔහුට හෝ ඇයට බලවත් හිරිහැර කති. බොහෝවිට දරුවාට මිය දවසටම ලැබෙන ආහාරය බනිස් ගෙඩියක් හා තැට තේ එකක් පමණය. හවසට දරුවා තල්ලු කරගෙන ගොස් කොටුතැන හෝ හවසා තමන්ගේ ගෙට උදේ යලින් වෙන්දේසියට ගෙන යෑමටය.

සමහරවිට යාචක ලෝකයේ හිගන සමූහ නායකයනට වියදීමට බැරි ලෙස ණය වීම් ඇතිව්‍ය හැකිය. නැවත ඉවුවහොත් ඒවා අවසානයේදී අපේ හිගන මුදලාලි වෙත ආ අවස්ථාද නැවුණු මතුවුවහොත් ඒවා පිළිබඳ තීරණය දෙන්නේ යාචකයන් පුද්ගලිකව හමුවී මට මතකය. ඔහු ඒවා පිළිබඳ තීරණය දෙන්නේ යාචකයන් පුද්ගලිකව හමුවී නොවේ. කාරණය ගැන අසා තම යටතේ ඉන්නා හයිකාරයන් මගිනි. බොහෝවිට මෙබඳු තීරණ (1) යාචක වෙන්දේසිය හා යාචක සමූහවලට හෝ පුද්ගලයනට භූගෝලීය ප්‍රදේශ වෙන් කිරීම හා සම්බන්ධව ද (2) හයිකාරයන් හා එවන් වෙනත් අය ලවා හිගන්නාට ආරක්ෂාව ලබාදීම සම්බන්ධවද (3) ඉතා දරුණු 'අපරාධ' වලට යාචකයනට දඬුවම් දීම (බරපතල ලෙස පහර දීම) සම්බන්ධවද පැවතුන බව මට මතකය.

නූතනයේ නම් මීට දසවසර දෙකකට පෙර මෙන් මුලු මහත් යාචක සංවිධානයම බාරව කටයුතු කරන මුදලාලිලා නැත. අද බොහෝ සෙයින් ඒ ඒ ප්‍රදේශවල යාචකයන් සංවිධානය වී ඇත්තේ තමන්ගේ යාචක සමූහ නායකයා හා ඒ ප්‍රදේශයේ හයිකාරයන් සමගය. පැරණි වෙන්දේසි පවා අද සිදුවන්නේ ප්‍රසිද්ධියේ නොව අප්‍රකටවය. ඒ ඒ යාචක නායකයන් එක්තරා අන්දමේ ලිහිල් සංවිධානාත්මක ස්වරූපයක් ඒ අයගේ සමූහයට ලබා දී ඇත.

පුංචි හෝ කුඩා සමූහ, භූගෝලීය සමූහ ඇතිවීම නූතන යුගයේ ලක්ෂණයකි. එක්තරා වීදියක යාචකයන් සමූහයක් ඇතැයි සිතන්න. බොහෝ විට මේ අය කටයුතු කරන්නේ පෙර මෙන් මහලු නායකයන් යටතේ නොව අලුත් තරුණ නායකයන් යටතේය. තරුණ නායකත්වය මෙසේ මතුවීම නිසා යාචකයන් නොවන අයගේ ආධිපත්‍යය අද බලවත් වී ඇත. ඒ අය යාචකයන් ලවා, විශේෂයෙන් ස්ත්‍රීන් හා කුඩා දරුවන් ලවා මත්ද්‍රව්‍ය අලෙවිය, සුලු හොරකම් ආදී සමාජ විරෝධී කටයුතු කරවන්නට එළඹෙන්නාහ. ඒ අය මේවා කරන්නේ යාචකයන්ට හයිකාරයන් ලවා 'ආරක්ෂාව' සලසමිනි.

මෙබඳු ආරක්ෂාව සපයන්නේ ඒ සඳහා ප්‍රතිඋපකාර අපේක්ෂාවෙනි. බොහෝවිට එවැනි ප්‍රතිඋපකාර වන්නේ යාචකයන් ලබන මුදලින් කොටසක් දීම, මත්ද්‍රව්‍ය අලෙවිය වැනි කටයුතුවලට කුඩා දරුවන් යෙදවීම, යම්යම් ඔත්තු සැපයීම් ආදී කටයුතු වලිනි. මෙබඳු නායකත්වයක් අද බොහෝ මහලු හා වැඩිහිටි යාචකයන්ට ප්‍රිය නොවන බව ඔවුහු අපට නිතර කියති.

නූතන යාචක සංවිධානය ගැන සාකච්ඡා කරන විට ඔවුන් අතර දැන් බහුලව පෙනෙන 'නව ස්වභාවික පවුල' අපට දැකගත හැකිය. අතීතයේදී පවුලක් ලෙස සැලකුවේ ගමකින් හෝ නගරයකින් මොනයම් හේතුවක් නිසා හෝ යාචක ලෝකයට එකතු වූන අම්මා - තාත්තා හා දරුවන්ය. වත්මනයේදී මෙබඳු

ජෛවවිද්‍යාත්මක පදනමක් හිඟන පවුලට අවශ්‍ය නැත. 'අම්මා' රත්නපුරයෙන් එන අතර 'තාත්තා' පැමිණෙන්නේ කෑගල්ලෙනි. 'දරුවන්' අම්පාරෙන් හෝ බදුල්ලෙන් පැමිණිය හැක. ඔවුන් පවුලක් වන්නේ විවාහ වූ නිසා හෝ ජීවවිද්‍යාත්මක වශයෙන් තාත්තා අම්මා ගේ දරුවන් වීම නිසා හෝ දරුවන් නීත්‍යානුකූලව සම්බන්ධ කරගත් නිසා නොවේ. හිඟන ලෝකයට සම්ප්‍රාප්ත වූවාට පසු පවුලක් ලෙස එකට ජීවත් වන නිසාය.

බොහෝ විට මේ කෘත්‍රිම පවුල ක්‍රමයෙන් පැරණි ක්‍රමයේ මහ පවුලක් (Extended Family) බවට පත්වන්නේ ආච්චිලා, සීයලා, මාමලා, තාත්තලා අතරමගදී එකතු වී ඒ සියලු දෙනාම එකම ස්ථානයක රාත්‍රියේ වාසය කිරීමට යෑමෙනි. සැමවිටම ආහාර එකම ලිපකින් සකස් කර නොගත්තත්, ලැබෙන දේ බෙදා හදා ගැනීම මේ කෘත්‍රිම පවුල් ස්වභාවය වන්නේය.

කෘත්‍රිම පවුල හිඟන සංවිධානයේ ඇති කුඩා සමූහ අතර ඉතා වැදගත් තැනක් ගනියි. ඒ පවුල් සාමාජිකයින් අතර සම්බන්ධතාව ඉතා සමීපය. ඔවහු සියලු කටයුතුවලදී එකට බැඳී සිටිති. යම්කිසි සන්නිවේදනයක් නම් ඉතා ඉක්මනින් ඔවුන් අතර පැතිරී යයි. පවුලේ විවිධ කාර්ය භාරයන් ඔවහු මනාව වෙන් කොට බෙදා ගනිති. කිසිදු විටක ඒ කාර්ය භාරය පටලවා ගැනීමක් ඔවුන් අතර දැකිය නොහැක.

ස්වභාවික පවුලක සාමාජිකයින් අතර පවතින සිරිත් පැවතුණු ගති පැවතුම්, ජනචර්යා හා ගණචර්යා මේ අය අතරද ප්‍රචලිතය. ඔවුන් නෑකම් කියා (තාත්තා, අම්මා, අයියා, අක්කා) එකිනෙකාට ආමන්ත්‍රණය කිරීම සාමාන්‍ය දෙයකි. වැඩිහිටි අයට ගරු කිරීම, ඒ අයගේ අණසක නොඉක්මවීම බොහෝවිට පවුලේ බාල සාමාජිකයින්ට පුරුදුය.

ඉතා සූක්ෂමව සොයා බලනහොත් එක්තරා අන්දමක සමාජ ස්වරූපයක් යාචකයන් අතර ඇති බව පෙනේ. කුල, ජාති, ආගම් ආදී භේද ඔවුන් අතර තීරණාත්මක වෙනස්කම් ඇති කරන සාධක නොවේ. එහෙත් යාචකයෝ තමන් සමහර කුල යාචකයන්ගෙන් වෙන් කර ගනිති. 'අපි රොඩී නොවෙයි. රොඩී වෙන කට්ටියක්' කියමින් කුල-යාචක තත්වයේ ලා සලකන රොඩී මිනිසුන්ගෙන් තමන් වෙන් කර ගන්නේ කුලභේදය එක් අතකට සැලකිල්ලට ගනිමිනි.

කුල පිළිබඳ හැඟීම අපට මහා සමාජයේ තරම් ප්‍රබල නොවුවත් ඔවුන් අතර ඉඳහිට මතුවන අවස්ථා අප දැක ඇත. සමහර හිඟන්නන් තමන්ට වඩා පහත් කුලවල අය සැලකුවේ එක්තරා අන්දමක පිළිකුලකිනි. විශේෂයෙන්ම උඩරට පළාත්වල හිඟන්නෝ මේ කුලභේදය වඩාලාම ගරු කළහ. තමන් බණ්ඩාරලා යැයි ආඩම්බරයෙන් කියාගන්නා හිඟාකන්නෝද එකල වූහ. 'බණ්ඩාරට වුනත් හිඟා කන්න වෙනවා' යන කියමන හිඟන්නන් අතර ප්‍රචලිත වූයේ මේ නිසා වන්නට ඇත.

ජාති වශයෙන් තම ජාතිකයන් සමග සිටින්නට හිඟන්නෝ ප්‍රිය කරති. එසේ වුවද සිංහල - දෙමළ - මරක්කල කියා තද භේදයක් ඔවුන් අතර නැත. ආර්ථික අහිතර දුර්වල සමාජ කොටස් තුළ (මුඩුක්කු වැනි) එබඳු ජාති භේද අඩු බව සිංහල දෙමළ මරක්කල කවිරුත් එකට එබඳු ස්ථානවල වාසය කිරීමෙන්

ජීවවිද්‍යාත්මක පදනමක් හිඟන පවුලට අවශ්‍ය නැත. 'අම්මා' රත්නපුරයෙන් එන අතර 'තාත්තා' පැමිණෙන්නේ කතරගමිනි. 'දරුවන්' අම්පාරෙන් හෝ බදුල්ලෙන් පැමිණිය හැක. ඔවුන් පවුලක් වන්නේ විවාහ වූ නිසා හෝ ජීවවිද්‍යාත්මක වශයෙන් තාත්තා අම්මා ගේ දරුවන් වීම නිසා හෝ දරුවන් නීත්‍යනුකූලව සම්බන්ධ කරගත් නිසා නොවේ. හිඟන ලෝකයට සම්ප්‍රාප්ත වූවාට පසු පවුලක් ලෙස එකට ජීවත් වන නිසාය.

බොහෝ විට මේ කෘත්‍රිම පවුල ක්‍රමයෙන් පැරණි ක්‍රමයේ මහ පවුලක් (Extended Family) බවට පත්වන්නේ ආච්චිලා, සීයලා, මාමලා, තාත්තලා අතරමගදී එකතු වී ඒ සියලු දෙනාම එකම ස්ථානයක රාත්‍රියේ වාසය කිරීමට යැමෙනි. සැමවිටම ආහාර එකම ලිපකින් සකස් කර නොගත්තත්, ලැබෙන දේ බෙදා හදා ගැනීම මේ කෘත්‍රිම පවුල් ස්වභාවය වන්නේය.

කෘත්‍රිම පවුල හිඟන සංවිධානයේ ඇති කුඩා සමූහ අතර ඉතා වැදගත් තැනක් ගනියි. ඒ පවුල් සාමාජිකයින් අතර සම්බන්ධතාව ඉතා සමීපය. ඔවුනු සියලු කටයුතුවලදී එකට බැඳී සිටිති. යම්කිසි සන්නිවේදනයක් නම් ඉතා ඉක්මනින් ඔවුන් අතර පැතිරී යයි. පවුලේ විවිධ කාර්ය භාරයන් ඔව්හු මනාව වෙන් කොට බෙදා ගනිති. කිසිදු විටෙක ඒ කාර්ය භාරය පටලවා ගැනීමක් ඔවුන් අතර දැකිය නොහැක.

ස්වභාවික පවුලක සාමාජිකයින් අතර පවතින සිරිත් පැවතුම් ගති පැවතුම්, ජනචර්යා හා ගණචර්යා මේ අය අතරද ප්‍රචලිතය. ඔවුන් නෑකම් කියා (තාත්තා, අම්මා, අයියා, අක්කා) එකිනෙකාට ආමන්ත්‍රණය කිරීම සාමාන්‍ය දෙයකි. වැඩිහිටි අයට ගරු කිරීම, ඒ අයගේ අණයක නොඉක්මවීම බොහෝවිට පවුලේ බාල සාමාජිකයින්ට පුරුදුය.

ඉතා සූක්ෂමව සොයා බලනහොත් එක්තරා අන්දමක සමාජ ස්වරූපයක් යාචකයන් අතර ඇති බව පෙනේ. කුල, ජාති, ආගම් ආදී භේද ඔවුන් අතර තීරණාත්මක වෙනස්කම් ඇති කරන සාධක නොවේ. එහෙත් යාචකයෝ තමන් සමහර කුල යාචකයන්ගෙන් වෙන් කර ගනිති. 'අපි රොඩී නොවෙයි. රොඩී වෙන කට්ටියක්.' කියමින් කුල-යාචක තත්වයේ ලා සලකන රොඩි මිනිසුන්ගෙන් තමන් වෙන් කර ගන්නේ කුලභේදය එක් අතකට සැලකිල්ලට ගනිමිනි.

කුල පිළිබඳ හැඟීම අපට මහා සමාජයේ තරම් ප්‍රබල නොවූවත් ඔවුන් අතර ඉඳහිට මතුවන අවස්ථා අප දැක ඇත. සමහර හිඟන්නන් තමන්ට වඩා පහත් කුලවල අය සැලකුවේ එක්තරා අන්දමක පිළිකුලකිනි. විශේෂයෙන්ම උඩරට පළාත්වල හිඟන්නෝ මේ කුලභේදය වඩාලාම ගරු කළහ. තමන් බණ්ඩාරලා යැයි ආඩම්බරයෙන් කියාගත්තා හිඟාකන්නෝද එකල වූහ. බණ්ඩාරට වුනත් හිඟා කන්න වෙනවා' යන කියමන හිඟන්නන් අතර ප්‍රචලිත වූයේ මේ නිසා වන්නට ඇත.

ජාති වශයෙන් තම ජාතිකයන් සමග සිටින්නට හිඟන්නෝ ප්‍රිය කරති. එසේ වුවද සිංහල - දෙමළ - මරක්කල කියා තද භේදයක් ඔවුන් අතර නැත. ආර්ථික අතින් දුර්වල සමාජ කොටස් තුල (මුඩුක්කු වැනි) එබඳු ජාති භේද අඩු බව සිංහල දෙමළ මරක්කල කව්රුත් එකට එබඳු ස්ථානවල වාසය කිරීමෙන්

පාතෙන්. එසේ රැකී හිඟන්නන් අතර දෙමළ අය ප්‍රමාණයෙන් වැඩි වුවද එහි ජනගහන විශේෂයක් නැතුවය. අද හිඟන්නන් අතර මේ සෑම ජාතියකම - සිංහල, දෙමළ, මුස්ලිම් හා සෑම ආගමිකයන් අය දක්නට ලැබේ.

හිඟන්නන් පිළිබඳව සූක්ෂම විමසා බලන කල වැඩිහරියක් ඔවුන් අතර ඇත්තේ නීච යැයි සම්මත කුලවල අය බව පෙනේ. ඉහළම කුලයේ අය දක්නට ලැබෙන්නේ ඉතා විරල වශයෙනි. ඒ කුලයේ ජනගහනයට අනුව හිඟන්නන් ඇත්තේ ඉතා ස්වල්ප දෙනෙකි. පහළ කුලවල අය, විශේෂයෙන්ම ගම්වල කුලය නිසා ඉතා පීඩාකාරී ජීවිත ගත කරන අය ලේසියෙන්ම හිඟන ජීවිතයට වැටෙති.

ස්ත්‍රී-පුරුෂ භේදය ඔවුන් අතර ඇත. කවර තැනකදී වුවත් ස්ත්‍රී පුරුෂයෝ වෙන වෙනම ජීවත්වෙති. සාමාන්‍ය පවුලක ස්ත්‍රියකට ලැබෙන කාර්ය භාරයට වඩා පළල් කාර්ය භාරයක් යාචක ස්ත්‍රියට ලැබේ. ඇය කරන කටයුතු ස්වාමියා කරන්නාවූ කටයුතු මෙන්ම වැදගත්ය. ස්වාමියා මෙන්ම ඇයද දරුවෝද හිඟාකති. මේ නිසා ස්ත්‍රිය හා පුරුෂයා අතර, සාමාන්‍ය පවුල්වල පවත්නා සම්බන්ධතාවලට වඩා වෙනස් සම්බන්ධතා යාචක ලෝකයේ දක්නට ලැබේ.

ආහාර පිළියෙල කිරීමත්, පිසීමත් ඔවුන් අතර සිදුවන්නේ කලාතුරකිනි. සමහරවිට කුඩා ළමයි ඇත්නම් අම්මා ආහාර බෙදා දුන්නත්, එයද සිදුවන්නේ කලාතුරකිනි. ආහාර පිසීමේ හා බෙදාදීමේ කාරිය මෙන්ම දරුවන් නිවසේ කඩාගත සමාජානුයෝජනය කිරීමේ කාරියද අම්මා යතුව නැත. දරුවෝ කුඩා කල සිටම හිඟාකෑමේ යති. කුඩා අය, ඊට වැඩිමහලු අය පසුපස යමින් හිඟාකති. ඒ අය සමාජානුයෝජනය වන්නේ මේ අන්දමිනි. අම්මාට එහි ඇති නියමිත කාර්යයක් නැත.

යාචක දරුවන් සමාජානුයෝජනය වන්නේ ඔවුන්ගේ අවට සමාජය අනුවය. ගැහැනු පිරිමි දෙගොල්ලන්ට වෙනම සිදුවන සමාජානුයෝජනයක් එහි නැත. අවට සමාජීය තත්වයන් අනුව පිරිමි ළමයා හා ගැහැනු ළමයා හැඩ ගැසෙන්නේ ගැහැනු පිරිමි වෙනසක් නැතුවය. යාන්තමින් වත් එබඳු වෙනසක් අප දකින්නේ ඇඳුමින් පමණය. වැඩිවියට පැමිණුනුතාට පසු වුවත් ගැහැනු ළමයා ගැන සැලකිල්ලක් දක්වන්නට යාචකයෝ සූදානම් නොවෙති. ඊට හේතුව ඔවුන් මුහුණ දෙන දෛනික අත්දැකීම්වලට එවැනි සූදානමක් උචිත නැති බවයි.

හිඟන දරුවන්ගේ සමාජානුයෝජනය පිළිබඳ ශෝකජනක කාරණය නම් බොහෝ පෙයින් ඒ අය අකුරු ඉගෙනීමට පාසැලකට නොයැවීමයි. යාචක ලෝකයේ ඉන්න අය හැම කෙනෙක්ම පාහේ ඉතා අඩු අධ්‍යාපනයක් ලැබූ අයයි. ඒ අයගේ ළමාලපටින්ද කවදාවත් පාසලකට නොයැවීම නිසා ඊළඟ පරම්පරාව, අද ඉන්නා හිඟන්නන්ටත් වඩා අධ්‍යාපනය අතින් පහළ තත්වයකට වැටෙනු ඇත. මේ හේතුවෙන් කිසි දිනක හිඟන දරුවන්ගේ පෞරුෂයේ දියුණුවක් ඇතිවන්නේ නැත.

සමහර හිඟන්නන් අනිත් අයට වඩා මලවන් පුද්ගලයන් වන්නේ ඔවුන්ගේ ධනය හෝ දැනීම හේතු කොටගෙන. ඇතැම මුදලක් එකතු කරගත් හිඟන්නන් ගැන අවශේෂ හිඟන්නෝ එක්තරා ගෞරවයක් දක්වති. යන්ත්‍රමන්ත්‍ර අණවින කෙම්හෝත් ආදී කාරණා දන්නා හිඟන්නන්ටද මෙබඳුම ගෞරවයක් ඔවුන් අල ඇත. සමහර විට ඉහළ පවුල් වලින් හිඟන ලෝකයට මොනයම් හේතුවක් නිසා හෝ ඇද වැටෙන අය ඇත. හිඟන්නන් ඒ අයට ආමන්ත්‍රණය කරන්නේ පරණ නාම වලින් වුවත්, එසේ ආමන්ත්‍රණය කරනවිට ගෞරවයට වඩා එක්තරා අන්දමක උපහාසයක් එබඳු වදන් තුල ගැබ්ව ඇති බව අපට පෙනේ.

සල්ලි ඇති සමහර හිඟන්නෝ අවශේෂ හිඟන්නන්ට සල්ලි පොලියට දෙති. පොලී අනුපාතය මසකට සියයට පහේ සිට දහයකි. මෙසේ පොලියට ගන්නා හිඟන්නා හැමදාම ණයකාරයෙක් වෙයි. ඔහුට හෝ ඇයට පොලියෙන් නැලවිය නොහේ. සල්ලිකාර හිඟන්නා පොලියට දෙන්නේ හෝ තවත් සැලකිය යුතු හිඟන්නෙකුගේ වචනය මතය. ණයට ගත් සල්ලි ආපසු නොදී හිඟන ලෝකයේ ජීවත් විය නොහැක. මෙසේ සල්ලි ඇති හිඟන්නන් බොහෝවිට මුදල් තමා ළඟ තබාගන්නවා මිස ආරක්ෂාව සඳහා බැංකුවක තැන්පත් කරන්නේ කලාතුරකිනි. කොළඹ දිස්ත්‍රික්කය තුල ඒ කාලයේ එබඳු සල්ලි පොලියට දෙන හිඟන අය දහදෙනෙක් වූහ.

වරක් හිඟන්නන් ඒ එක් පොලිකාර හිඟන්නාගු සමඟ උරණ වී යෙදූ උපක්‍රමය මට මතකය. පොලිකාර හිඟන්නා සිත්පිත් නැතිව ගන්නා පොලිය ගැන මේ හිඟන්නෝ කුපිතව සිටියහ. බොහොම අමාරුවෙන් සල්ලි ටිකක් එකතු කළ ඔවුහු මැරයන් කීපදෙනෙකුට අරක්කු පොවා, පොලිකාර හිඟන්නාට පහර දීමට සැලසූහ. නමුත් පොලිකාර හිඟන්නා මුදල් වියදම් කොට ඒ මැරයන්ම යොදා තමාට පහර දුන් හිඟන්නන්ට ආපසු බලවත් ලෙස පහර දීමෙන් පලියට පලිය ගත්තේය. ඒ හිඟන්නෝ ප්‍රදේශය අත්හැර ගියහ. පොලිකාර හිඟන්නාගේ 'සමාජ බලය' ඊට පසු තවත් වර්ධනය විය.

එක්තරා වලව්වකින් යම්කිසි ආබාධයක් හැදී ඒ නිසාම හිඟන රැළට එකතුවූ මැදිවියේ අයෙක් විය. ඔහුට හිඟන්නන් අභිමුඛයේදී කීවේ 'හාමු' කියාය. 'හාමු' යන නම හිඟන්නන් අතර පමණක් නොව සාමාන්‍ය ජනයා අතරද එකල ප්‍රකට විය. සල්ලිබාගේ ඇති හිඟන්නන් අනයන් විසින් හැඳින්වූයේ 'සිටාණවරු' ලෙසය. ඒ අතර ලෝභී අයෙක් 'මසුරු සිටාණ' ලෙස හැඳින්විනා. නක්ෂත්‍රය ගැන දැනුමක් ඇති වයසක හිඟන්නෙක් එකල විය. කවිරුක් ඔහුට ගරු කළේ දැනුම නිසාය. හිඟන්නන්ට අවශ්‍ය වූ විට නක්ෂත්‍ර වැඩ කරන ඔහු හඳුන්වනු ලද්දේ ගුරුන්නාන්සේ නමිනි. අවට ලෝකය ඔහු 'හිඟන ගුරා' නමින් එකල දැන්න.

හිඟන්නන්ගේ ජනචර්යා ඇත. ගණචර්යාද ඇත. හොරකම් නොකිරීම ඒ කාලයේ ඔවුන්ගේ ගණ චර්යාවකි. හොරකමක් කොට අසුවුවොත් හිඟන රැළෙන් නෙරපා දැමීමට තරම් මේ ගණචර්යාව ප්‍රබල විය. එකල එබඳු පැමිණිලි විසඳුවේ හිඟන රැළේ නායකයාය. එක්තරා අවස්ථාවක හිඟන්නෙක් හිඟාකෑමේ ගොස් කඩයකින් සරමක් හොරකම් කළ පුවත මට මතකය.

සොරකම් කළ හිඟන්නා ගැන අපේ හිඟන නායකයාට පැමිණිල්ල ලැබුනේ තවත් හිඟන්නෙක් ගෙනි. 'නඩු විභාගය' ආරම්භ වූයේ හැන්දෑවේ හතට පමණය. පැමිණිල්ල කළ තැනැත්තාගේ පැමිණිල්ල අසා ඒ ගැන තමාට කුමක් කියන්නට ඇද්දැයි හිඟන නායකයා, විත්තිකරුගෙන් ඇසීය. තමා නිවැරදි යැයි ඔහු කීය. නඩු විභාගය පසුවදාට කල් දමා හිඟන නායකයා පසුවදා සරමක් රැගෙන එය සොරකම් කළ නිවස බලා ගියේය. එදා සවස ඔහු යළිත් නඩුව විභාගයට ගත්තේය. 'මම ඒ ගෙදරට ගියා. මේ සරම ඒ ගෙදරින් තමයි සොරකම් කළේ?' විත්තිකරු කිසිවක් කීවේ නැත. 'ආපසු සරම ගිහින් බාර දෙනව. උඹට මාසයක් හිඟාකන්න බැහැ.' නායකයා තීන්දුව දුන්නේය.

විත්තිකරු තීන්දුවට අකැමැති විය. ඊට දින කීපයකට පසු මැරයන් කීපදෙනෙකුන් විසින් පහර දෙනු ලැබ විත්තිකරු ආරෝග්‍යශාලාවට ඇතුළු කළ බව අපට සැලවිය. හිඟන නායකයා මගින් මුදලාලිට මේ සොරකම ගැන දැනුම් දෙන්නට ඇතැයි මම අනුමාන කළෙමි. හිඟන නායකයාට අවනත නොවූ විට සිදුවන්නේ මෙබඳු බරපතල දඬුවම් විඳීමටය. ඊට පසු මම විත්තිකාර හිඟන්නා කොතැනකදීවත් නුදුටුවෙමි. වෙනත් රක්ෂාවක් කළොත් මිස හිඟාකෑම නම් ඔහුට කෙසේවත් කළ නොහැකි බව මම ප්‍රත්‍යක්ෂයෙන්ම දනිමි.

අනාචාරයේ හැසිරීම හිඟන්නන් අතර සිදුවන්නේ කලාතුරකිනි. 'විවාහක' හෝ එකට ඉන්නා පවුලක් ඇත්නම් ඒ අයට ගරුකිරීම හිඟන ලෝකයේ සිරිතය. තනි ගැහැනු වශයෙන් ඉන්නේ බොහෝ විට මහලු වියේ අයයි. තරුණියන් තරුණ ගැහැනුන් අතර ඇත්නම් ඒ අය මානසික ආබාධ ඇති අය වෙති. එබඳු අය හිඟන සමාජයෙන් එපිට බලවතුන් විසින් දූෂනය වනු මා දැක ඇත. මානසික තත්වය නිසා ඒ ගැහැනුන්ට කළ කියා ගත හැකි දෙයක් නැත. එක්තරා නගරයක එවන් ගැහැනියක්, නගරයේ පෝසත් මුදලාලි කෙනෙක් නිසා තුන්වරක්ම ගැබ්ගත්තාය.

හිඟන සංවිධානයට සොරකම් කරන අය එකතුවූයේ මෑතකය. ඒ අය හිඟන්නන් නොවේ. හිඟන වෙස් දරා (හිඟන්නන් ලෙස පෙනී සිටිමින්) සොරකම්වල යෙදෙන බාහිර පුද්ගලයන්ය. වර්තමානයේ මේ හිඟන හොරු ඇති බව දැනගන්නට ලැබ ඇත. 'අද ඉස්සර වගේ හිඟන්නෝ අපි කියන දේ අහන්නෙ නැහැ. උන් බය නැහැ.' හිඟන සමූහ නායකයෙක් මට මෑතකදී කීවේය. පෙර කාලයේදී තිබූ මුදලාලිගේ හෝ මුදලාලිගේ දැඩි පාලනය අද දක්නට නොහැක.

6 යාචක පුරාණය

අතීතයේදී අපේ රටේ යාචකයන් ජීවත්වූයේ කෙසේද? වෙනත් දවනවලින් කියනවා නම් ඒ අයගේ එකල ජීවන රටාව කෙබඳු එකක්ද? ජනතාව කුමන ආකාරයේ ආකල්ප මත පිහිටා යාචකයන් දෙස බලන්නට ඇත්ද? යාචකයන්ගේ සංඛ්‍යාව රටට, රටේ ජනතාවට කරදරයක් වීද? එකල රාජ්‍ය ප්‍රතිපත්තිය තුල මේ පිළිබඳ යමක් දකින්නට පුළුවන්ද?

ක්‍රි.පූ. තුන්වැනි වර්ෂයේදී බුදුදහම අපේ රටට පැමිණියාට පසු දන්දීම ඉතා වැදගත් ක්‍රියාවක් ලෙස බෞද්ධයන් විසින් සැලකිණ. සමාජ විද්‍යාත්මකව බලතහොත් දන්දීම විවිධාකාරයෙන් කළ හැකිය.

1) ගුණවත්බවින් හා අධ්‍යාත්මික වශයෙන් තමාට වඩා ඉහළ අයට
2) තමා හා සමාන උදවියට
3) තමාට වඩා යමක්කමක් අඩු අයට.
4) යමක් අවශ්‍ය යැයි පැහැදිලිව පෙනෙන එහෙත් වචනයෙන් නොඉල්ලන අයට
5) තමන්ගේ උදව් යදින යාචකයාට. මෙසේ දන් ලබාදෙන්නට යෙදිණ.

බෞද්ධ සම්ප්‍රදාය මේ පන් කොටසම ගැන සඳහන් කරයි: ඒ අයට දන්දීම අනුමත කරයි. ආහාරපාන, නිවාස, මිලමුදල්, බේත්හේත් ආදී ඕනෑම ද්‍රව්‍යාත්මක අධ්‍යාත්මික දෙයක් (ආධ්‍යාපනික දැනීම යනාදි) දන් සඳහා ලබාදිය හැකිවන්නේය. ද්‍රව්‍යාත්මක දානය මෙන්ම අධ්‍යාත්මික දානයද ඉතා මහත් ආනිසංසයෙන් යුක්තය. අපේ රටේ පැරණි සංස්කෘතිය මේ දාන දෙකම ඉතා ඉහළින් සැලකූ බව පෙනේ.

දුගී දුප්පතාට, අසරණයාට පිහිටවීම කුමන ආකාරයකින් හෝ කෙරෙන්නේ නම් එය ඉතා වැදගත් දෙයක් සැලකිනි. පෝසත් පිටුවරු හිටිහැටියේම මහා දාන දුන්හ. සමහර තම වස්තුව සියල්ලම ගෙනායැමට අත්‍යයනට පිටුමැදුරුවල. රජමාලිගාවල දොර-යතුරු විවෘත කළහ. එසේ දන් දුන්නාට පසු ඒ අය යලිත් ජීවිතය පටන්ගත්තේ කිසිම ධනයක් තමන් අත ඇතිව නොවේ.

එකල මෙසේ මහා රජමැදුරුවල, සිටුගෙවල්වල දොර යතුරු හැර දන්දීම රටේ දුගී බව තුරන් කිරීමට යොදාගත් මගක්ද? උවමනාවට වඩා එක්තැනක හෝ නැත් කිහිපයක ධනය රැස්වීමෙන් රටට පොදුවේ සිදුවන හානිය වළකාගන්නට සමාජය විසින් සකස් කළා වූ එක්තරා උපක්‍රමයක් ලෙස මෙය සැලකීම වරදක් නොවේ. රජවරු සිටුවරු මෙසේ දන්දී විටක ගිහි ජීවිතය අතහැර වනගත වූහ. එසේ ඔවුන් ගියේ පුද්ගලික අධ්‍යාත්මික සුවයක් පතාගෙනය. එසේ කරන්නට පෙර ඔවුහු පොදු සමාජයට තම ධනය බෙදා දී භෞතික වශයෙන් සියලු දෙනාටම පොදු යහපතක්ද කළහ.

අපේ ජාතකපොත මේ උපක්‍රමය ගැන නිතර සඳහන් කරයි. ජාතක පොතේ කතාවලින් පිළිබිඹු වන්නේ දඹදිව සමාජය වුවත්, ඒවායේ එන කරුණු බොහොමයක් දඹදිවට මෙන්ම අපේ සමාජයටද පොදු වූ බව කිවයුතුය. විශේෂයෙන්ම අප අතර ප්‍රචලිත සිංහල ජාතක කතා සම්ප්‍රදාය බොහෝ දුරට පිළිබිඹු කළේ අපේ ලංකාවේම පසුබිම බව අප අමතක නොකළ යුතුය.

ඉල්ලීස ජාතකය තමන්ගේ වස්තුව රටට බෙදා දුන් දෙමින් අන්දම අපට පෙන්වා දෙයි. රජ්ජුරුවන්ගේ අවසර ලබාගෙන දොරවල් හැර කැමැති කෙනෙක් මේ වස්තුව ගෙනියත්වා යැයි නුවර බෙරලීම එකින්දකට ප්‍රමාණවත් විය. ඉන්පසු මිනිස්සු එහි පැමිණ කැමති පරිදි වස්තුව ගෙනගියහ. ඉල්ලීස කතාන්තරයේ හරය තමන් ලත් වස්තුව යාචකාදීන්ටද සංග්‍රහ කරන්නට යොදා ගත යුතු බවය. මසුරුකමෙහි පිහිටා, අන්‍යයන් ගැන නොතකා විශේෂයෙන් යාචකයන් පිටමං කොට වස්තුව රැස් කිරීම' ජීවිතයෙහි හරය නොවන්නේය. ඉල්ලීස සිටාණන්ගේ වර්තමාන වස්තුවෙහි කියවෙන්නේ ඔහු සතු වස්තුව සියලු විහාරයෙහි භික්ෂූන්වහන්සේලාටත්, සිඟන්නන් හා යාචකයන්ටත් දුන් කල්හිත් එහි කෙළවරක් නොපෙනෙන බවයි."

පැරණි කාලයේ සිඟන්නන් හා යාචකයන් කෙරෙහි පැවැතිය යුතු අන්දම විග්‍රහකරන කදිම කතන්දරයක් ලෙස ඉල්ලීස ජාතකය හැඳින්විය හැකිය. වස්තුව රැස්කරන්නේ තමන්ට මෙන්ම අන්‍යයන්ටද යහපත සලසන්නටය. මසුරුකමින් වස්තුවෙන් තමා පමණක් රැකෙන්නට, ඉන් සැපපෙන්නට නොවේ. ඉල්ලීස එසේ කරන්නට ගොස් ඉහත ආත්මයකදී අමාරුවේ වැටුණේය. ඔහුගේ සියලු වස්තුව නැතිවන්නට ඉන් මාර්ගය යෙදින. නුවණැත්තා වස්තුව තමාද ප්‍රයෝජනයට ගෙන්නා ගමන් විශේෂයෙන් යාචක-හිඟන ආදීන්ට ද ඉන් සංග්‍රහ කළ යුතුය.

යාචක - හිඟන දෙකොටසක් ජාතක කතාවේ සඳහන් වූයේ එකල සමාජය විසින් මේ කොටස් දෙක වෙනවෙනම කොටස් දෙකක් ලෙස සලකන ලද නිසාද? මේ ගැන නිශ්චිත වැටහීමක් ලබාගත හැකි තැනක් නැත. සමහරවිට හිඟන කොටස් සොළොස අතරින් "දීන" යන කොටස හිඟන්නන් වූ අතර, අනික් කොටස් සියල්ලම පාහේ "යාචකයන්" ලෙස සලකනු ලැබිණැයි සිතීම වරදක්ද?

දුප්පත්කම සහමුලින් නැති කිරීමට වඩා දුගීකමින් පෙළෙන අයගේ මූලික අවශ්‍යතා සපුරාලීමට බෞද්ධ සිංහල සංස්කෘතියේ පරමාර්ථය විය. ඉතා ලෝභත් විත දෙනා අතර මෙවන් දන්දීමේ පුරුද්ද සංස්කෘතික රටාවක් බවට පත්වූයේ මේ නිසාය. මූලික අවශ්‍යතා නැති අයට ඒවා ලබාදීමට ඉහත සඳහන් දානමය ක්‍රියාව යොදවන ලද්දේ එබඳු අය අඩුකිරීමට මිස වැඩි කිරීමට නොවේ. දානමය ගුණය සංස්කෘතික පුරුද්දක් වූ නිසා යාචකයන්ගේ සංඛ්‍යාව වුවමනාවට වැඩිවූයේ නැත.

රජවරුන්ගේ දශරාජ ධර්මයේදී ප්‍රධාන ගුණය වූයේ දානයයි. රජ්ජුරුවන් දන් දෙන්නේ මේ ඉහත කී වර්ගවලටය. පොදුවේ සඳහන් කරතොත් දන් ගන්නට එන කාට වුවද වෙනසක් නොතකා දන්දීම රජුගේ සිරිතය. මේ නියාම රජ යටතේ ඇති අවශේෂ නායකයෝද (ප්‍රාදේශීය නායකයන්) දන්දීමට පුරුදු වූහ. මුලුමහත් සංස්කෘතිය තුලම දානය ඉතා වැදගත් අංගයක් විය.

බෞද්ධ භික්ෂූන් වහන්සේ යැපුනේ භික්ෂාවෙනි. උන්වහන්සේට දන්දීම අප අතර ඉතා වටිනා කුශල ධර්මයක් විය. අවශේෂ ආගමික පූජකවරුන්ට දෙන්නාවූ දානමානද ඒ අන්දමින්ම පූජාවයට පත්විණ. දානය යන වචනය ඒ නිසා අපේ සංස්කෘතියේ ඉතා වැදගත් වචනයක් විය. එය ක්‍රියාත්මක සමාජයේදී වඩාත්ම ලංවූයේ 'බෙදාහදා ගැනීම' යන අර්ථයටය. තමන්ට යමක් වැඩියෙන් ඇති නිසා, නැති කෙනෙකු සමග වැඩියෙන් ඇති දේ බෙදා හදා ගැනීම එහි අර්ථය විය. අපේ සමාජීය මෙන්ම ආර්ථික ජීවිතයට තේරුම් ගැනීමට මේ ලක්ෂණය වටහා ගැනීම ඉතා වැදගත් වේ.

දානය රටේ සංවර්ධනයටද සමීප වූ සංකල්පයකි. අධ්‍යාත්මික වශයෙන් දානයේ ඇති වැදගත්කම පෙනෙන්නේ පුරාණ කාලයේ ගොඩනගා ඇති දාගැබ් හා මහා වැව් දකින විටය. මේවා තනන ලද්දේ වෙනත් රටවල් මෙන් වහල් සේවය යොදවමින් නොවේ. ථූපවංශයේ එන හැටියට රත්නමාලි මහා චෛත්‍යය ගොඩනගන අවස්ථාවේදී ඒ සඳහා යන්තමින්වත් සහාය වූ අයට ඊට සරිලන වැටුප ලබාදෙන ලදී. වැටුපක් නොමැතිව කිසිවෙක් මහා චෛත්‍යයේ වැඩ නොකල යුතු යැයි දුටුගැමුණු රජුගේ ආඥාව විය.

විශාල වැව් තනන ලද්දේද 'දානය' මූලික කරගෙනය. 'ශ්‍රම - දානය' වචනයේ උපත අප සංස්කෘතියේ පැවැති දාන සංකල්පය හා සම්බන්ධ විය. වැව් තනන්නට ශ්‍රමය දානය කෙරිණ. ජලය කාටත් පුද්ගලිකව වුවමනාය. ඒ සියලු දෙනාට ජලය ලබාදෙන්නට ශ්‍රමය දානය කරන කාටත් කුසල්ද අයිතිවේ.

මේ සියල්ලම පොදු ජනතාවගේ එක්තරා විශ්වාසයක් හා ලඟින් සම්බන්ධ විය. එනම් 'පින්', පිළිබඳ විශ්වාසයයි. 'පින' වැඩි වැඩියෙන් එකතු කිරීම මුදල් ඉතිරි කිරීම වැන්නක් විය. ඉතිරි කල මුදල් අවශ්‍ය හා හදිසි අවස්ථාවලදී ප්‍රයෝජනවත් වෙයි. 'පින්' ඊට වඩා වැදගත්ය. එය ජීවිතයට මෙන්ම ඊළඟ ජීවිතයටද ප්‍රයෝජනවත් වන්නේය. වැව් තැනීමෙන්, දාගැබ් සෑදීමෙන් තමන්ට මෙන්ම අනුන්ටද, භෞතික ප්‍රයෝජන බෙදා හදා ගැනීමට හැකි අතර 'පින්' ද තමා වෙනුවෙන් එකතු කරගත හැකිය.

බෝධිසත්වයන්ගේ පාරමිතා අතරට දානය මුලවෙයි. සාමාන්‍යයෙන් ගිහි කථාපුවත්වලදීද දානය, ශීලය, භාවනා සමග එකට එකතුව මුලින්ම ගමන් කරන්නේය. දානය, සත්වයන්ට වුවද ලබාදිය හැකිය. සමහරවිට පණ නැති ගස්වැල් ආදියට ජලය දැමීම දානමය ක්‍රියාව හා සම්බන්ධ වන්නේය.

බෞද්ධ දානමය සංකල්පය ත්‍රිවිධ මානයකින් ක්‍රියාත්මක වෙයි. භික්ෂූන් වහන්සේට දෙන දානය ඊට කේන්ද්‍ර වන්නේය. ඒ දානය හා සමගම දුගීමගී අසරණ යාචක ආදීන්ට පමණක් නොව බිලු කපුටු ආදීන්ටද ආහාර පාන ආදිය ලබාදෙනු ලැබේ. ඒ දානයේ තුන්වැනි මානයයි. විටෙක මේ මාන තුන එකටම එකම ක්‍රියාවලියක් ලෙසද, තවත් විටක ක්‍රියාවලින් තුනක් ලෙසටද පවත්නේය.

මේ සංකල්පය ගැන අප මෙතරම් විග්‍රහ කළේ දුගීමගී යාචකාදීන්ට දන්දීම කෙතරම් උසස් කටයුත්තක් ලෙස සිංහල බෞද්ධ සංස්කෘතිය වඩාත් අගය කරනු ලැබී දැයි පෙන්වා දීමටය. මහා මාර්ගය අසල පින්තාලි තබා නිතර නිතර පිරිසිදු ජලයෙන් ඒවා පුරවන ලද්දේ මග යන එන්නන්ගේ පිපාසය සංසිඳුවන්නටය. පලතුරු ගස් සිටවන ලද්දේ මිනිසුන් මෙන්ම සතුන් ද ඒ පලතුරු කාබී බඩගින්න නිවා ගන්නවා යැයි අභිප්‍රායෙනි. අව්වේ යන අයෙකුට පිහිට වීමට අතු පතරින් සැදි ගසක් සිටවන ලද්දේ මොහොතකට හෝ ඒ ගස මුලට පැමිණ යරොන්න තැනැත්තා සරසස නිවා ගනිතියි කල්පනා කරමිනි.

දානය පිළිබඳ මෙවන් සංස්කෘතික උල්පත් ඇති අපේ සමාජයේ යාචකයන්ට කෑමබීම, වස්ත්‍රාභරණ, ඉඳුම් හිටුම්, බේත්හේත්, ලබාදුන්නේ හදවත තුළින්ම නැගඑන පිරිසිදු චේතනාවෙනි. දානය උදෙක් යාචකයන් උදෙසා දෙන දෙයක් පමණක් නොවූ බව අපි කලින් කීවෙමු. දානය මහා ගංගාවක් නම් යාචකයන් උදෙසා දුන් දෑ ඒ ගඟේ එක් කුඩා අතු ඔයක් වැන්න. දානය පිළිබඳ සංස්කෘතික උවමනාව මුලු මහත් ජනතාවම සතුටුවක් විය.

එකල යාචකයන් සොළොස් වර්ගයක් සිටියත් ඒ සියලු දෙනාම දන් වැස්සෙන් සනයාලන්නට තරම් සමාජය පෝසත් විය. 'දන්දීම' යන වචනයෙන් කියවෙන්නේ දිගටම පවත්වාගෙන යන දන්වැටයි. දන්වැට පැවැත්වීම පෝසත්කමේ ලක්‍ෂණයක් විය. පෝසත්කම, පැරණි පිළිගැනීම අනුව ආභරණයක් වන්නේ ගුණවත්කමක් ඇති තැනය. දන්දීම ගුණවතකුගේ, පොහොසතකුගේ විශේෂ ලක්‍ෂණයකි. ඊට කලකට ඉහත "දනපති" කියා පරිහව මුඛයෙන් යෙදුණු වචනය අද "දානපති" නමින් ඇතැම් තැනැත්තෙක් සඳහා යොදන්නේ මේ දානමය ගුණය ඉස්මතු කරමිනි. පෙර සිටි සොළොස වර්ගයක යාචකයන්ගෙන් සමහරු තම දක්‍ෂකම් පෙන්වමින්ද, තවත් අය අනුන් රවටමින්ද, ඇතැම් දෙනා තම ගිලන්කමින් අබ්බගාතබවින් අනුන් තුල අනුකම්පාව උපදවමින්ද, සෙස්සෝ කතාවෙන්, තර්කයෙන්, හා අනාවැකි කියමින්ද යම්යම් දේ ලබාගත්හ.

පැරණි සමාජයේ පන්සල් බොහෝවිට වැඩිහිටියන්ට ඉතා දුබල වයසේදී පිහිටවූ ස්ථාන විය. දරුවන් විසින් නොසලකනු ලැබූ විට හෝ දරුවන් සමග විසීමට අකමැති වැඩිහිටියෝ පන්සල ආශ්‍රයට ගියහ. තවත් අය ගෙදර නිදාහදත්තන්, මුලු දවසම පින්කම් ආදියෙහි යෙදෙමින් පන්සලේ දහවල් ගත කලහ. මෙ ආදී වශයෙන් වයසට ගිය අයට හිඟන්නන් නොවී ප්‍රයෝජනවත්ව තම කාලය ගත කිරීමට එකල මාර්ග තිබිණි.

යම් ශාස්ත්‍රයක බිඳක් හෝ දන්නේ නම් ඒ මගින් තමන්ගේ ජීවිකාව ගෙනයෑමට තවත් අයට හැකිවිය. අනාගතය කියන්නට දන්නා නක්ෂත්‍රකරුවෝ, වාදකයෝ, ගායකයෝ එමෙන්ම නැටීමට හැකිවූවන් තම අවශ්‍යතා සඳහා මුදල් උපයාගත්තේ මේ දක්ෂතා උපයෝගී කරගෙනය. එබඳු තැන්වලදී මහජනයා ඒ අය නිසා අවුව ශ්‍රමයට වඩා වටිනා ප්‍රසාද දීමනා ඔවුන්ට දුන්හ.

අදත් ශ්‍රමයට වඩා වූ මේ ප්‍රසාද දීමනා දෙන සැටි රොඩී මිනිසුන් හා සම්බන්ධව අපට දක්නට ලැබේ. කුල යාචකයන් වූ ඔවුන් ගමකට එන්නේ තම සම්ප්‍රදායික අනුග්‍රාහකයන් සොයාගෙනය. එසේ එන විට හවරි, පනා, කොහු, මැටි භාණ්ඩ, ඉදල් ගෙන ඒම ඔවුන්ගේ සිරිත විය. අනුග්‍රාහක නිවෙස්වලින් මේ ද්‍රව්‍ය වෙනුවට ඒවාට වඩා වටිනා ප්‍රසාද දීමනා මවුන්ට ලැබේ. ආහාරපාන, වස්ත්‍ර, ආදිය මෙසේ දෙනවිට රොඩී මිනිසුන්ගෙන් ලබගන්නා වූ ඉදල් හවරි ආදිය වටිනාකමට කීපවරක් වඩා වටිනා දේ දීම ස්වභාවයයි.

යාචක ගනුදෙනුවේ මේ ස්වරූපය අද පවත්නේ රොඩී මිනිසුන් හා ඔවුන්ගේ සාම්ප්‍රදායික අනුග්‍රාහකයන් අතර පමණය. පැරණි කාලයේදී එය සෑම ගණයකම යාචකයන් හා අනුග්‍රාහක මහජනයා අතර පැවැති සම්බන්ධයේ වැදගත් ලක්ෂණයක් විය. දුගීමගී යාචකයන්ට දෙන දේ මැන බලා, කිරා බලා දීම පැරණි සමාජයේ ලක්ෂණයක් නොවිණ. තමාට සිය පුත්‍රයා වී පතක් මැන දීම ගැන අම්මා මෙසේ කියන්නීය: 'මැනලද පුතේ කිරි දුන්නේ මම උඹට? අම්මාට පමණක් නොව යමක් තමන්ගෙන් ඉල්ලන කාට වුවද කිරා බලා මැන යමක් දීම අතීතයේ සිරිතක් නොවිණ. රොඩී මිනිසුන් හා ඒ අයගේ අනුග්‍රාහක ගැමියන් අතර මේ චාරිත්‍රය අදත් පවතිනා බව පෙනේ.

අපේ රටේ යාචකයන් වැඩි වූයේ බෞද්ධ ඉගැන්වීම් නිසා යැයි පවසන සමාජ විද්‍යාඥයන්ද ඇත. "සමහර සංස්කෘතිවල හිඟා කෑම සමාජ අනුමත චර්යාවකි. (ශ්‍රී ලංකාවේ රොඩී පිරිස සාම්ප්‍රදායික වශයෙන් හිඟා කනඅය බව අප පිළිගෙන ඇත.) දුගීයන්ට දෙන දානය (බෞද්ධ රටවල නම් භික්ෂූන් වහන්සේ) අනාගත ජීවිතයේදී කෙනෙකුට පින් ලබාදෙන බව කියැවේ. ඒ නිසාම සංස්කෘතික මගින් යාචකයන් වර්ධනයට අනුබල දී තිබේ. " (රැල්ෆ් පීරිස් 1977,45)" " අත් පා කැපුණු බිඳුණු පැයවා ගිය වණ ඇති යාචකයෝ පදික වේදිකා වලත්, ප්‍රසිද්ධ ස්ථානවලත්, පන්සල් අවටත් දක්නට ඇත. ශාරීරික විකෘතීන් බරපතලසම දුගීබවේ බර වැඩි වූ තරමට එවන් අයට ආධාර කරන අය කරගන්නා පින වැඩිවන්නේය."

බුදු දහම උගන්වන 'පින' පිළිබඳ සංකල්පය යාචකයන් වැඩි කරන්නට හේතු විණිද? එසේ නම් පසුගිය අවුරුදු දෙදහස් පන්සියය තුල රටපුරා යාචකයන් ලක්ෂ ගණනක් බිහිවිය යුතුය. 1960 ගණන්වලදී ලංකාවේ යාචකයින් 5600 කට වඩා සිටියේ නැත. 1970 ගණන්වලදී 27000 ගණනට මේ ප්‍රමාණය වර්ධනය විය 1990 ගණන් වලදී යාචකයන් ගේ ගණන මීටත් වඩා බෙහෙවින් වැඩිවූයේ නම් 'පින' ආකල්පයට වඩා පරිබාහිර හේතු යාචකයන් වර්ධනයට සම්බන්ධ බව අපට මින් ප්‍රත්‍යක්ෂ වන්නේය.

පන්සල්වල යාචකයන් ගොඩගැහෙන්නේ පින් සංකල්පය නිසා නොවේ. පන්සල්වලට පල්ලිවලට කෝවිල් වලට මිනිසුන් වැඩි වශයෙන් යන එන නිසාය. එසේ යන එන අයගෙන් හැම කෙනෙකුම යාචකයන්ට මුදල් නොදෙති. නමුත් බුද්ධාගම හෝ ක්‍රිස්තියානි ආගම, මුස්ලිම් ආගම නිසා යාචකයන් වැඩි වී යැයි තීරණය කිරීමට මින් ඉඩ නොලැබේ. අදත් කොච්චිකඩේ පල්ලියේ හා දෙවටගහ මුස්ලිම් දේවස්ථානය අසල කොතරම් යාචකයන් ඇද්ද? මේ යාචකයන් වර්ධනය වීම ක්‍රිස්තියානි ආගම හෝ මුස්ලිම් ආගම හෝ ඒ ආගම් වල යහපත් දේ කිරීමට උගන්වා ඇති ධර්ම නිසා සිදු වී යැයි නිගමනය කිරීම තර්කානුකූල නිගමනයක් නොවේ.

අනිත් අතට බෞද්ධ උගැන්වීම අනුව මේ-මතයේ වැරැද්ද පැහැදිලිය. දානය ලබන තැනැත්තාගේ කුවාලයේ හයානකකම, අබ්බගාත බවේ දරුණු කම අනුව දෙන්නාවූ දානයෙහි ලැබෙන ප්‍රතිඵලය (පින) පුංචි ලොකු බවට පත්වන්නේ නැත. ඒ කාරණය බුද්ධාගම යන්තම්න්වත් දන්නා ඕනෑම අයෙකුට ප්‍රත්‍යක්ෂ දෙයකි. මා හිතන ලෝකයේ ජීවත්වනවිට බොරු කරන්නා හිතන්නෙක් බව දැන දැනත් බෞද්ධයෝ මනුට / ඇයට හිනමන් දුන්හ. 'උඹ කරන්නෙ බොරු. උඹේ සකුල අබ්බගාත නැහැ. ඒ වුණත් උඹ තන්න එපැය: මේ බත් කාපල්ලා, කියා අබ්බගාතබව මවාපාන හිතන්නන්ට බත්මුල් ප්‍රදානය කළ මිනිසුන් මම ප්‍රත්‍යක්ෂයෙන්ම දැක ඇත්තෙමි.

අපේ සමහර සමාජවිද්‍යාඥයන් කල්පනා කරන උගැන්වීම් බෞද්ධාගමේ නැත. බෞද්ධ රටවල, විශේෂයෙන් ලංකාවේ, යාචකයන් වර්ධනය වූයේ බුදුදහම නිසා නොවේ: වෙනත් සමාජීය-ආර්ථික සංස්කෘතික හේතු නිසාය. ඒවා තේරුම් නොගෙන, බුදුදහම කවදාවත් අපට නුගැන්වූ දේශනා සඳහන් කරමින්, යාචකයන්ට දන් දෙන්නේ මෙන්න මේ කාරණය නිසා යැයි ඒ අනුව කීම වැරදි ප්‍රකාශයකි.

අතීත සමාජයේ සොළොස් ගණයක යාචකයන් සිටියත් අපේ ඒ සමාජයට ඒ අය පාලනය කරගත හැකිවිය: දරාගත හැකි විය. සමාජයට යාචක ප්‍රශ්නය මෙසේ පාලනය කරගත හැකිවන්නේ යාචකයන්ගේ ගණන ස්වල්ප වූ විටය. නැත්නම් නූතනයේ මෙන් ප්‍රමාණයෙන් යාචකයන්ගේ ගණන වැඩිවනවිට එය බරපතල සමාජ ප්‍රශ්නයක් වන්නේය. සොළොස් ගණයක යාචකයන්ගෙන් වැඩි ගණනකට සමාජයේ ජීවත්වීමට මං සැලසිනි. මෙසේ සැලසුනු වර්ග පහත සඳහන් ඒවා විය.

1) පන්සල්: පන්සල්වල දානමාන නිසා භික්ෂූන්වහන්සේලාට මෙන් දුගීමගියන්ට ද ආහාරපාන ලැබිණ. සමහර දුගීමගීහු පන්සල් පිහිට කරගෙන වාසය කළහ.

2) රජතුමා පැවැත්වූ දන් සල්: රජතුමා විසින් වර දන්දීම පුරුද්දක් කරගත්තේය. එසේ දන්දීම නිසා යාචකාදීන්ට අවශ්‍ය දේ ලැබිණ. රජතුමා අනුගමනය කරමින් රටේ අවශේෂ ප්‍රභුවරුන් දන්වැටවල් පැවැත්වූහ.

3) තව්රුත් තමන්ගේ ධනයෙන් කොටසක් දානමානවලට වෙන් කළහ. අදත් වී අස්වැන්නෙන්, එළවළුවලින්, පොල් ගස් වලින් කොටසක් දෙවියන් සඳහා වෙන් කිරීම සිරිතකි. ඒ කොටස යොදාගන්නේ දානමාන සඳහාය. එයද එක්තරා ආයෝජනයක් ලෙස සැලකියහැකිය.

අපේරටේ මූලික අවශ්‍යතා නොලැබෙන සමාජ කොටස්වලට ඒවා ලබාදීමට යෙදූ සංස්කෘතික උපක්‍රම ගැන අප සොයා බලන්නේ නැත. දේවාලවල දාන ගැන කල්පනා කරනවිට සැහෙන කොටසකට අවශ්‍ය ආහාර ලබාදීමට මගක් යොදා ඇත. ගමක් ගානේ වරින්වර පවත්වන දේවදාන ඊට තවත් පිළියමකි. කිරිඅම්මලාගේ දානය ඉස්සර දුන්නේ අද වගේ වයසක අම්මලාට නොවේ. ළමයි වැදූ තරුණ අම්මලාටය. 'කිරි' 'පැතුරු' හා ධාන්‍ය ඒ දානයේ කොටස් විය. යම් යම් රෝග ඒවා සඳහාවූ හා වෙනත් පිළිවෙත් මුල් කරගෙන තරුණ අම්මලාගේ සෞඛ්‍යය ගැන එදා සමාජය කල්පනා කළ හැටි මින් පෙනේ. කතරගම දෙවියන්ගේ දානය දෙන්නේ පුංචි ළමයින්ටය. මේ ආදි වශයෙන් දාන සංකල්පය හා ක්‍රියාවලිය මගින් රටේ මූලික අවශ්‍යතා අඩු කොටස්වලට අතීත සමාජය යම් යම් දේ ලබාගැනීමට මග සකස් කොට තිබූ බව අපට පෙනේ. යාචක ප්‍රශ්නය සමාජයට දරාගත හැකි, පාලනය කරගත් දෙයක් වූයේ මේ නිසාය.

යාචකයා පහත් කොට සැලකීම එකල තිබුණාදැයි සැකසහිතය. භික්ෂූන් තවුසන් යාචක ගණයට ගණින් ගන්නා විට ඒ අයට ඉලක්කවූ ගරුසරුකමෙන් බිඳක් හෝ සාමාන්‍ය යාචකයාටද ලැබිණ. මහල්ලෙක්, යාචකයෙක් වී නම් ඔහු වැඩිහිටියෙකි. වැඩිහිටියන්ට සැලකීම අපේ සංස්කෘතියේ උදාර අංගයක් විය. යාචකයන් ගෙදරට ආ විට කවදාවත් බොරු කියා පන්නා ගැනීමේ සිරිතක් නොතිබිණි. හිඟන්නෙක් දුකින් යමක් කෑමට ඉල්ලූ විට ඔහුට යමක් නුදුන් නිසා ගෙයි තිබුන බත් මුට්ටිය ලේ බවට පත්වූ බව එක් ජනතාවක එයි.

දෙවියෝද බොහෝ විට යාචක වෙස් දරා, එති. ජාතක කතාවල නම් යාචකයන් ලෙස එන දෙවියන් ගැන සඳහන් වේ. කුස ජාතකයේ ශක්‍රයා යාචකයෙකුගේ වෙස් ගෙන පැමිණියේ මෙසේය.

යුගනෙත් සපිරි කබ සහ	කඳුළුත්
කොපුලත් ඇකිළී වැගිරි	ගියදත්
ජරපත් බමුණෙකු විලසින්	දුප්පත්
එමහත් පුරරද සබයට	වියපත්

ඒ බමුණා ආවේ " කෙතකට බැඳි පඹයෙකු ලෙස" මේ අනුව. සමහර විට යාචකයා වෙස්වළාගෙන එන දෙවියකු විය හැකිය. ඒ නිසා අප ඔහුට ගරු කිරීම, ඔහුගේ අවශ්‍යතා සපයීම උදාර කටයුත්තක් බව මින් ධවනිත වේද?

කාව්‍යශේඛරයේ කතාන්තරයට පසුබිම් වුයේ දඹදිව වුවත් එහි එන යාචකයා පිළිබඳ විස්තරයේදී කවියාට මතක් වන්නට ඇත්තේ අපේ රටේ එකල සිටි යාචකයන් බව අනුමාන කළ හැක. මේ යාචකයා තැනින් තැන සිඟා කමින් කහවණු දහසක් එකතු කරගත් බව කියැවේ.

ඒ දහස ඔහු බමුණු පවුලක් වෙත තබා ගිය බවද, පසුව ආ විට කහවනු දහස වියදම් වූ නිසා, බමුණු පවුලේ දියණිය ඔහුට විවාහ කොට දුන් බවද, පවසා ඇත. යාචකයන්, ආවාහ විවාහ කරගන්නට තරම් යෝග්‍ය අය බව ඒ කාලයේ සලකා ඇත. (අද සල්ලි එකතු කොට ඒවා පොලියට දෙන යාචකයන් මේ අවස්ථාවේදී මතක් වේ.)

සාමාන්‍යයෙන් අපේ පතපොතේ එන පුරාණ යාචකයන් නම් මහලු වයසක අයමය. වෙස්සන්තර ජාතකයේ අප ඔබට මීට කලින්ද මතක් කළ බමුණා ඔබට මතකද?

පැසි හිසක් නිකටක් කොනු ඇතිලේ
ගැසි කුදක් යන ගමනක් බකලේ

රොබට් නොක්ස් නුවර යුගයේ අපේරටේ තිබූ යාචකයනට යම්යම් දේ දීමේ ගුණය ගැන මෙසේ සඳහන් කරයි. "ඔවුහු (සිංහලයෝ) දුගියනට ආධාර දෙති. එසේ කරන්නේ සිංහලයනට පමණක් නොවේ: පිටරැටියනටද ආධාර දෙන්නාහ. ගෙදර පිසන සෑම සහල් බඳුනකින්ම මිටක් රැගෙන ඉවත තබන ඔවුහු ඒවා මල්ලක එකතු වුණු පසු තමන්ට කැමති විදියට දුගියනට දෙති. ඔවුහු එයට මිටිහාල් යැයි කියති."

"සිංහලයන් තමන්ගේ ජාතියේ අයට පමණක් මේ විදියට දානමාන සීමා කොට නැත. ඉස්ලාමීය ආගමේ යාචකයනටද ඔවුහු යම්යම් දේ දෙන්නාහ. මුස්ලිම් අයට නුවර දේවස්ථානයක් තිබේ. සෑම නිදහස් රටවැසියෙක්ම මේ දේවස්ථානයට පනමක් දීම රාජ නියමයකි. එය ගන්නට මුස්ලිම්වරු ගෙයක් ගානේ යති. එසේ යනවිට නිවසක් දොරගුලලා වසා තිබුනොත් ඔවුහු ඒවා කඩා බිඳ ගෙයි ඇති බඩුබාහිර රැගෙන යති. එසේ හිඟාකන්නට එනවිට ඔවුන් එන්නේ ලොකු විශ්වාසයකිනි. තමන් එසේ පැමිණ ඇත්තේ මිනිසුන්ගේ දානමය ගුණය වඩාලන්නට අවස්ථාව දීමට බව ඔවුහු ප්‍රකාශ කරන්නෝය. එසේම දානමය ගුණය මස්සේ ඔවුහු මිනිසුන්ගෙන් පුළුවන් තරම් ආධාර ලබාන්නාහ."

නුවර යුගයේ ඒවතු මේ මුස්ලිම් යාචකයන් යම්යම් දේ හිඟාකෑවේ හිඟා කෑම ගෞරවනීය වෘත්තියක් මෙන්ම රජතුමා විසින් තමාට පවරන ලද රාජකාරියක් යන හැඟීම පිටය. ඈත අතීතයේදී හිඟන්නන් සාමන් දීනයක් බව සැමවිටම සලකන්නේ නැතිව යාචක සොළොස් කොටසින් එක් වර්ගයක් පමණක් 'දීන' යන හැඳින්වීමෙන් මෙය පැහැදිලිය. යාචක වෘත්තිය අතීතයේදී වැදගත් ගෞරවනීය වෘත්තියක් ලෙස සැලකූ බවත්, රාජ්‍යය විසින් අනුමත වෘත්තියක් බවට පිළිගත් සැටිත් මින් පෙනේ.

අභිඝාතයන් හෝ ශාරීරික ආබාධ ඇත්තන් අතීත සමාජය විසින් ගරුකළු නොලැබිණ. ඊට හේතු කීපයක් වෙයි. එවැන්නන්ට ගැරහුවොත් ඒ නිසාම ගරහන තැනැත්තාටද මේ අත්බවේ හෝ ලබන අත්බවේ කර්මය පලදී එවන් තත්වයක්ම ලඟාවන බව විශ්වාස කිරීම පළමු හේතුවයි. දෙවනුව ශාරීරික ආබාධ ඇති අයට තමන් සතු කුමක් හෝ දක්ෂ බවක් දියුණු කරගැනීමේ අවස්ථාව සමාජය විසින් සලසනු ලැබීමයි. එය අන්තනගල්ල වංශයේ එන අන්ධ බ්‍රාහ්මණ අනාගතය කිව හැකි ශාස්ත්‍රයක් උගත්තේය. කෙනෙකුගේ පියවර හඬ අසා ඔහුට අනාගතය කිව හැකිය.

"ඒ දවු මත්තෙහි කරන ලද විශ්‍රාමශාලායෙහි හුන් නුවණැති, අන්ධ බමුණු මහල්ලෙක් ඒ කුමාරවරුන්ගේ පතුල් ඔබන ශබ්දය අසා තමා විසින් මනාව දන්නා ලද ලක්ෂණානුසාරයෙන් නුවණින් පරීක්ෂා කොට 'මොහු තුන්දෙනම සිංහලයට පෘථිවිශ්වරවූ රජ බවට පැමිණෙත් 'යි ශාලායෙහි හුන් සෙසු ජනයනට ප්‍රකාශ කොට කීවේය." (20-21)

මේ අන්දමින් රජයේ රහස් පරීක්ෂක කටයුතුවල යෙදෙන ශරීරාබාධ ඇත්තන් පෙර සිටි බව රජුගේ රජමාලිගාව පිළිබඳ විස්තරයේ දැක්වෙයි. 'මාළිගයේ ඒ ඒ ස්ථාන යන මේ තෙක් තැන්හි රැකවල පිවියවුන්ද,පිරිවරා හිටි කුරුන් කුදුන් අඳින්ද අල්ලාගෙන..." (උම්මග්ග ජතක......116-117

අතීතයේදී යාචකයන් අතර කුඩා දරුවන් සිටි බව දක්වන කිසිදු සාක්ෂියක් පැරණි සාහිත්‍ය හෝ ජනශ්‍රැතියේ දක්නට නැත. වෙස්සන්තර ජාතකයේ කුඩාදරුවන් දෙන්නා දන් දුන් බව පමණක් මේ අතින් යාචකළමයින් ගැන සඳහන් වන අප දන්නා එකම ප්‍රවෘත්තිය වෙයි. ජාලිය ක්‍රිෂ්ණජිනා මිස එවන් කුඩාදරුවන් යාචකලෝකයේ එකල එතරම් නොසිටියත් අද නම් යාචක ලෝකය ඒ අයගෙන් පිරී ඇත. පැරණි සමාජයේ කුඩා දරුවන් යාචකයන් අතර නොසිටීමට ප්‍රධාන හේතුව කුඩා දරුවන් මොනම ආකාරයකින්වත් යාචක දරුවන් ලෙස හැඳින්වීමට සමාජය තුළ තිබූ අකැමැත්ත බව කිව හැකිය. ඒ නිසා සොළොස් වර්ගයක් යාචකයන් අතර මොනම ආකාරයකින්වත් හිඟන දරුවන් ගැන කියවෙන්නේ නැත. නූතන යුගයේ වුවත් අපට යාචකයන් අතර කුඩා දරුවන් හමුවීම ආරම්භ වූයේ 1970 ගණන් වල සිටය. ප්‍රථමයෙන්ම එක් පවුලක් දෙකක් දරුවන් සමග හමුවූ අතර පසුව මේ දරුවන් සහිත පවුල් ගණන වර්තමානයේදී ප්‍රබල පවුලක් බවට පත්වන තරමට ක්‍රමයෙන් වර්ධනය විය.

7 යාචක පවුල

පවුල ගැන අප බොහෝ විට සාකච්ඡා කරන්නේ එය සමාජ සංස්ථාවක් ලෙස සලකමිනි. අතීතයේදී එනම් 1948 දී ශ්‍රී ලංකාව නිදහස ලබන කාලයේ හිගන පවුල් හමුවීම ඉතා කලාතුරකින් විය හැකි සිද්ධියකි. හිගන පවුල් පළමුවෙන්ම අප විසින් දක්නා ලද්දේ 1960 ගණන්වල අවසානයේදීය. ඊළඟ දසකයේදී මේ පවුල්වල සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩිවිය.

අතීතයේදී ස්ත්‍රීන් හා දරුවන් හිගන්නන් බවට පත්වීම සමාජය අනුමත කරන දෙයක් නොවිණ. ඉතා මහලු ස්ත්‍රියක් වුවත් හිගාවියක් වීම බෙහෙවින්ම අස්වාභාවික සිද්ධියක් විය. ගැහැනියක එසේ හිගාකෑම ඒ තැනැත්තියගේ ඥාතීන් පමණක් නොව සකල වර්ගයා විසින්ම තමන්ට සිදුවන බලවත් අවමානයකැයි සලකනු ලැබිණ. ඒ නිසා මොනයම් හේතුවකින් හෝ ගැහැනියක් හිගාකෑමට යන්නේ නම්, එය නවතාලන්නට ඇය අයත් සමූහයා දැඩි වෙහෙසක් ගත්තේය. එහෙත් විවිධ ආර්ථික හා සමාජීය හේතු නිසා ප්‍රථමයෙන්ම මහලු බවට පත් ගැහැනු හා පිරිමි, තමන්ට සලකන්නට කෙනෙකු නැති වූවිට හෝ තම දූදරුවන් තමන්ට නොසලකන විට, කරකියාගත හැකි කිසිවක් නැතිව හිගන තත්වයට 'පවුලක් ලෙස පා නැගූහ. ඒ පවුලේ එදා සිටියේ වියපත් තාත්තා හා අම්මා පමණය.

එක්දහස් නවසිය හැට ගණන්වල සිට රටේ ආර්ථිකය ක්‍රමයෙන් පිරිහීම නිසා මෙවන් පවුල් වැඩි වශයෙන් හිගන ජීවිතයට පත්විය. එක්දහස් නවසිය හැත්තෑගණන්වල වැඩිහිටි මහලු පවුල් වලට අමතරව මැදිවියේ පවුල් තම දරුවන් සමග හිගාකන්නට වූහ. ඊට හේතු සංකීර්ණ විය.

ගම්වල තමන්ට ජීවිතය ගෙන යෑමට මගක් නැති වූ විට, එක්දහස් නවසිය හැත්තෑගණන්වල ඇතිවූ ඉඩම් ප්‍රතිසංස්කරණ කටයුතු නිසා උත්හිටි තැන් අහිමිවූ විට මේ අය පවුල් පිටින් හිගන රැළට එක්වූහ.

ස්වභාවික පවුල් - අම්මා, තාත්තා හා දරුවන් ලෙස ප්‍රථමයෙන්ම හිගන ලෝකයට එක්වූයේ මැදිවියේ අයයි. නමුත් 1970 ගණන්වල අග වනවිට තරුණ පවුල්ද ඊට එක්විය. මේ තරුණ තාත්තලාට ඕනෑනම් රක්ෂාවක් කරකියා ගන්නට බැරිකමක් නැතත් ඔවුන් කල්පනා කළේ තම බිරිය හා දරුවන් හිගන කමේ යොදවා ඉන් ලැබෙන ආදායමින් සුවසේ ජීවත්වීමය. මේ තරුණ තාත්තලා

ඇබ්බැහි වූවන්වූය. ඔවුන්ගේ බොහොම දෙනෙක් මත්පැන් හෝ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්වූය. ඔවුන්ගේ ඒකම කාර්යය බිරිඳ හා දරුවන් යොදවා මුදල් ලබාගෙන ඒවා වැය කොට මත්පැන් හෝ මත්ද්‍රව්‍ය පාවිච්චියයි. මේ උවමනාව නිසා බිරිඳ හා දරුවන් සමාජ විරෝධී කටයුතුවල යෙදුනත් මේ තාත්තලා ඊට අනුබල දෙනවා මිස විරුද්ධ වන්නේ නැත.

මේ අතර තවත් අසාමාන්‍ය වර්ගයේ පවුලක් හිඟන ලෝකයට එක්වුණි. එම පවුල විවාහයක් වී හෝ එකට ජීවත්වී තැනුනු අඹු-සැමි සබඳකමක් හා ඒ තුලින් උපදින දරුවන්ගෙන් යුක්ත පවුලක් නොවිණ. ඒ පවුලේ තාත්තා ගාල්ලෙන් වැනි නගරයකින් පැමිණි අතර අම්මා ආවේ අම්පාරෙන් විය හැකිය. ඔවුන් දෙදෙනා එකතුවූයේ විවාහවීමෙන් බැඳී හෝ කාලයක් ගමේ එකට සිටීමෙන් නොවේ. ඔවුන් එකට සිටින්නට පටන් ගත්තේ හිඟන ලෝකයට ආවාට පසුවය. ඔවුන්ගෙන් ළමයි තුන්දෙනා රටේ නොයෙක් පළාත්වලින් ඇවිත් පවුලට එක්වූ අයයි.

ඉංග්‍රීසියෙන් නම් මෙවැනි පවුල්වලට Fictive Families - යන නම යොදති. මගේ ඉංග්‍රීයි පොතේ මම ඒ පවුල් NEO NATURAL යන නමින් හැඳින්වූවෙමි. නව ස්වභාවික පවුල යනු එහි සාමාන්‍ය අදහසයි. විවාහ සම්බන්ධතා හෝ එකට කලක් ජීවත්වීමේ සම්බන්ධතා නැති මේ අය හිඟන ලෝකයට ඒමට පෙර එකිනෙකාට ආගන්තුකයන්ය. ඔවුන් පවුලක් ලෙස එක්වූයේ හිඟන ලොවේදීය. නමුත් නීතිගතවූ හෝ චාරිත්‍රගත වූ විවාහයක් ඔවුන්ට නැත. මෙහිදී ඔවුන් ජීවත් වන්නේ එක පවුලක් මෙනි. 'තාත්තා' හා 'අම්මා' අතර මෙන්ම ළමයින් අතර ද සම්බන්ධතා ඉතාමත් සමීපව පවතින්නේය.

අපට හමුවූ මෙවන් පවුල් කීපයක කතාන්තර ඔබට රසවත් වේනැයි සිතමු. ගමේ ගස් යමින් ජීවිකාව ගෙන ගිය මැදිවියේ මිනිසෙක් ගහෙන් වැටී තුවාල විය. ආරෝග්‍ය ශාලාවේ කාලයක් ගත කොට සුවපත් වූවත් ගමට ආපසු ගොස් රක්ෂාවක් ලබාගැනීමට ඔහුට නොහැකිවිය. ඔහුගේ නම ඇන්ඩ්‍රූ සිඤ්ඤෝ යැයි කියමු. ගමේ ඉන්නට බැරි තැන ඔහු නගරයට විත් හිඟාකන්නට විය. ඇන්ඩ්‍රූ සිඤ්ඤෝ බිරිඳද තම දරුවන් විසින් අතහැර දමනු ලැබිය. කලකට පසු ඕ නගරයට පැමිණ ඇන්ඩ්‍රූ සිඤ්ඤෝට එකතුවිය. මුල් කාලයේ හිඟන පවුල් මහලුවියේ හිඟන අය අතරින් බිහිවූයේ මෙසේය.

ඒබරන් මැදිවියේ මිනිහෙකි. ඔහු ජීවත්වූයේ නුවර පළාතේය. ඉඩම් හිමියෙකුගේ වත්තක සිට ඔහු ඉඩම් ප්‍රතිසංස්කරණ පනතින් පසු ඉන් ඉවතට දමන ලදී. සිටින්නට නිවහනක් නැති ඒබරන් ළමයි හා බිරිඳ සමග මහ පාරට බැස්සේය. නුවර වවුමේ ටකරන් කබල් කීපයක් යට ජීවත් වන ඔහු හා ඔහුගේ පවුල අපට හමුවන විට හිඟන පවුලකි. ඒබරන් වැඩක් කරන්නට තැනින් තැනට ගියත් ඔහුට එහෙම වැඩක් ලැබෙන්නේ කලාතුරකිනි.

අප්පුහාමි බදුල්ලේ සිට කොළඹට ආවේ සනීප කරන්නට බැරි යැයි සිතූ තුවාලයක් සනීප කරගැනීමටය. දීර්ඝ කාලයක් ආරෝග්‍යශාලාවේ ගත කළ අප්පුහාමි දැකගන්නට ගමෙන් කිසිවෙක් ආවේ නැත. අප්පුහාමි ආරෝග්‍යශාලාවෙන් එළියට බැස්සේ හිඟන්නෙක් ලෙසිනි. කලක් යන විට ඇග්නස් හමුවිය. ඇග්නස්

පැමිණියේ නන්මිත වළාහෙනි. ඒ දෙදෙනා එකට ජීවත් වීමෙන් හිඟනාහෙළුව අනාථ සිය දරුවන් තුන්දෙනෙක් පවුලට එකතුවිය. ඉන් කෙල්ලොලන්නා/ වැඩිමලා දෙවැන්නා දුවකි. තව දී ඇත්තේ වාසනා කියාය; තුන්වැන්නා පුතාය. මේ පවුල හිඟන ලෝකයේ වාසය කරන්නේ සාමාන්‍ය පවුලක් ලෙසය. 'අම්මාට' හා 'තාත්තාට' අම්මා තාත්තා යැයි අමතන දරුවෝ තම තමන්ට අයියා - අක්කා - නංගී - මල්ලී කියා ආමන්ත්‍රණය කරති.

නව ස්වභාවික පවුල යැයි හැඳින්වූවත් මේ පවුල තුළ සහයෝගීතාව සාමාන්‍ය පවුලක් තුළ මෙන්ම ප්‍රබල විය. 'අම්මා' හා 'තාත්තා' කෙරෙහි දරුවන් තුළ තිබූ සෙනෙහස හා බැඳීම විශාලය. මේ අයගේ කාර්යභාරයන් පවුල් සාමාජිකයෝ හොඳින් දැන සිටියහ. එබඳු පවුලක් සියා කෙනෙක් අසනීප වූ විට පවුලේ සියලු දෙනාම ඒ තැනැත්තා වෙනුවෙන් කැප වූ හැටි මට මතකය. මේ නව පවුල දකින මට, මානව විද්‍යාවේ හා සමාජවිද්‍යාවේ 'පවුල' පිළිබඳ විවරණය අලුත් විය යුතු යැයි සිතිණ.

හිඟන පවුල්වල මෑත විකාශනය කොළඹ නගරය තුළ ඉතාවි දෙකක් සිස්සේ ඔබට දැකගත හැක. ඉන් එකක් නම් ගස්යට ඉන්නා හිඟන පවුල්ය. මීන් ඉතාම ප්‍රකට පවුල මෑතක් වනතුරුම හැව්ලොක් ටවුමේ බී.ආර්.සී. පිට්ටනියේ භූගගනයට ජීවත් විය. ගස්යට ජීවත්වන මේ පවුල් හා සමාජ තවත් පවුල් කඩපිල් යට රාත්‍රිය ගත කරති. මෙසේ කඩ රාත්‍රියේ වසා දැමූ විට කඩපිල්වල කාලය ගත කරන හිඟන පවුල් දවාලට ඒ තැන්වල දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. නමුත් ගස්යට ඉන්න පවුල් දවල් කාලයටත් මේ 'ගස' තම 'නිවස' බවට පත් කරගෙන සිටිති. එය ඔවුන්ගේ උරුමයක් කොට සලකති. සමහර හිඟන පවුල් මේ ගස්යට නිවාසවල අවුරුදු ගණන් ලගින්නෝය.

අම්බලම් බහුල යුගවලදී, විශේෂයෙන් මා හිඟාකන කාලයේ හිඟන පවුල් වැඩි වශයෙන්ම සිටියේ අම්බලන්වලය. බෙල්ලන්විල පන්සලට යන පාරේ වෙල ළඟ තිබූ අම්බලමේ වාසය කළ හිඟන පවුල සමග මම ද කලක් නැවතී සිටියෙමි. ඒ පවුල අම්මා, තාත්තා හා ළමුන් දෙන්නෙකුගෙන් සමන්විත විය. පවුලේම තැනැත්තෙක් ලෙස සලකන ඔලුව ලොකු අබ්බගාතයෙක්ද අම්බලමේ වාසය කළේය. (අම්බලමේ බිම නිදාගත් මට කලක් සිරුරේ කුණ්ඨයක්ද සෑදිණ)' ඔලුව ලොකු හිඟන්නාට පවුලේ අය ආදරයෙන් සැලකූහ. නමුත් එනාවක් පැදුරකින් සිරුර වසාගෙන අම්බලම ඉස්සරහ පාර අයිනේ නිදා සිටි ඔහු ලොරියකට යට වී මළේය. ඉතා ප්‍රසන්න ගතිගුණ ඇති මේ 'ඔලුබක්කා' මට අදත් සිහිවේ. ඔහු මිය යන විට වයස නිහඬවත් නැතැයි මම සිතමි. හිඟන පවුල පවුලේ සාමාජිකයෙකු මළාක් මෙන් ඔහුගේ වියෝගයෙන් දුක් වූහ. නමන්ට හැකි පමණ පින්කම් කොට ඔහුට පින් අනුමෝදන් කළහ. දැන් ඒ පරණ අම්බලම වෙනුවට අලුත් අම්බලමක් සාදා තිබේ.

අම්බලම් සිංහල රජ කාලයේදී සාදන ලද්දේ එහාමෙහා ගිය සෑම ජාතියකම මගීන්ගේ සුඛවිහරණය සඳහාය. පිටරටවලින් පවා පැමිණි සංචාරකයන් මේ අම්බලන්වල විවේක ගන්නට රැඳුනු බව ගිරා සංදේශය කියයි. අම්බලම එදා ප්‍රියජනක ස්ථානයකි. ඒ අවට ඇති වනයේ තිබෙන පලතුරු ගස්වලින් පලතුරු කඩාගෙන අනුභව කළහ. සුන්දර ඇලදොලින් නා සැනහී කාලය ගත කරන්නට මේ කාටත් අවස්ථාව තිබිණ. ගිරා සන්දේශය කවියා මෙවන් අම්බලමක සිරිය වර්ණනා කරන්නේ මෙසේය.

නිල් පැහැබර තොළ අතු මැදුරු   විසිතුරේ
දිගු තරසර කදු මහ වීදි   මනහරේ
රැදි පියකරු බිඟු දද සෙනග   නොවිතුරේ
තුරු කදුවුර සැතපෙව අම්බලම   කරේ

'අම්බලම' ඔහු විසින් හඳුන්වනු ලබන්නේ 'විශ්‍රාම ශාලාවක්' ලෙසය.

සපැමිණි දෙස   තුරින්
සරනසට මග   යතුරින්
සැදී තත් පල   තුරින්
තුටුව සැතපුණි දනන්   අතරින්

අප දන්නා කාලයේ මේ අම්බලම් මගීන්ට තාවකාලික නවාතැනක් වූයේ නැත. ඒවායේ හිගාන්නන් පදිංචි වන්නට පටන් ගත්තේ 1950 ගණන්වලින් පසුව යැයි මට සිතේ. ලංකාවේ සෑම ප්‍රකට අම්බලමක් තුළම මම යාචකයෙකු හැටියට 'ලැග' ඇත්තෙමි. නුවර පාරේ කඩුගන්නාව කන්දට නගින විට ඇති අම්බලම රජයෙන් ප්‍රතිසංස්කරණය කොට ආරක්ෂා සහිතව පවත්වන එකක් නිසා එය පමණක් යාචකයන්ගේ ඉලක්කයට ලක් නොවිණ. අනික් සෑම අම්බලමක්ම අද ගරා වැටී ඇත. අම්බලම නඩත්තු කිරීමේ වගකීම කාටවත් නොතිබුන නිසා යාචකයන්ට යන්තම් හිසට සෙවනක් කරගත හැකි ස්ථානද සදහටම නැතිව ගියේය.

අම්බලමක බොහෝවිට හිගන පවුල් කිපයක්ම පදිංචි විණ. ඒ පවුල් සියල්ලක්ම එක්තරා වයෝවෘද්ධ නායකයෙකු යටතේ පාලනය වූ බව ප්‍රකාශ කළ යුතුය. නායකයා පත්වූයේ හිගන්නන් විසින් තෝරාගෙන නොවේ. ඔහු සතු යම්යම් දක්ෂකම්, විශේෂ දැනුම මෙන්ම හිගන ලෝකයට 'එහා' අය සමග ඇති සම්බන්ධකම් එම ප්‍රධාන විය. හිගන ලෝකය පාලනය කළ මුදලාලිලා හා ඒ අයගේ හයිකාරයන් හිගන සමූහ නායකයන් කෙලින්ම පත් නොකළත්, එබඳු දක්ෂකම් ඇති කවුරුත් පිළිගන්නා අයට නායකයන් වීමට මග පැලසුන බව ඉතා පැහැදිලිය.

හිඟන ලෝකයට පැමිණියාට පසු 'විවාහ' වන හිඟන පවුල් අපට හමුවී ඇත. විවාහය සඳහා ලියාපදිංචි කිරීමක් හෝ උත්සවයක් මෙහිදී සිදු නොවේ. ගැහැනියගේ කැමැත්ත අනුව එකඟ වන බව තමන් අයිති සමූහයේ අන් අයටත්, නායකයාටත් දැන්වීම ඒ අයගේ සිරිතය. එදාට පසු මේ දෙන්නා අඹුසැමියන් හැටියට සලකන අතර, අනිත් අය ඔවුන්ට පවුලක් ලෙස ගත කරන්නට ද ඉඩ සලසති. අඹු සැමියන් සතු කායීභාරයන් හා පිරිත් ඔව්නු මැනවින් ඉටු කරති.

හිඟන පවුලක කාර්යයන්හි වඩාත් වැදගත් කොටසක් ඉටු කරන්නේ අම්මාය. දරුවන් හා සැමියා පිළිබඳ වුවද (ඔහු මත්ද්‍රව්‍ය ඇබ්බැහි තරුණයෙකු නොවූවිට) තීරණ ගන්නට ඇය සතු බලයක් ඇත. අන් අය සමග කතාබහ කිරීමේදී හා කටයුතු කිරීමේදී සාමාන්‍ය ජීවිතයේ ගැහැනියක, විශේෂයෙන් මහලු නොවූ ගැහැනියකට උරුම වූ ලැජ්ජාව ඇය කෙරෙහි දක්නට නැත. බිය සැක නැතිව ඕනෑම පිරිමියෙකු සමග ඕ කතා බහ කරයි. අපවල් වැඩේ ගැහැනියක වන ඇයට සුදුසු නැතැයි හිඟන ලෝකයේ පිළිගැනීමක් නැත. ඇය සතු බලතල සීමාවන අවස්ථාවන් දෙකක් ඇත. එනම් ලිංගික හැසිරීම් වලදී හා ස්වාමියා මත්පැන්-මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි නැනැත්තෙක් වූ විටය.

ළමයි හා ස්වාමියා උපයන මුදල් බොහෝ විට ලැබෙන්නේ බිරිඳ අතටය. එය ආහාරපාන ආදියට හා වෙනත් කටයුතු සඳහා යොදන්නේ ඇයයි. මේ තත්වය දක්නට නොලැබෙන්නේ අප කලින් කීවාක් මෙන් බීමත්කමට හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි ස්වාමිපුරුෂයෙක් ඉන්නා පවුල්වල පමණි.

දරුවන් සමාජානුයෝජනය කරන්නේ මවයි. සාමාන්‍ය පවුලක මෙන් 'නිවසේම' වැඩි කාලයක් ගත කිරීමට මේ හිඟන දරුවන්ට ඉඩක් නැත. හිඟාකෑම සඳහා වැඩි කාලයක් ගත කරන ඔවුන් රාත්‍රියේ වුවද නින්ද යනතෙක් කාලය ගත කරන්නේ පවුල සමග නොව අවට සමාජය සමගය. අම්බලමක වැනි තැනක නවාතැන් ගත් යුගයේ අම්බලමේ ඉන්නා යාචක සමූහය දරුවන්ගේ සමාජානුයෝජනයෙහි වැදගත් විය. අද අම්බලම් නැතත් දරුවන්ගේ සමාජානුයෝජනය වන්නේ පාරේදීය. පවුලක් හා සමූහයෙන් සිදුවිය යුතු වැදගත් කාර්යයක් සිදු නොවන සැටිත්, ඉන් ඇතිවන අනාගත ප්‍රතිඵලත් ඔබට වටහාගත හැකිය.

දරුවන් අම්බලමක සමාජානුයෝජනය වනවිට අම්බලම තාවකාලික නිවසක් මෙන් පිහිටවිණ. මෙහිදී කුඩා දරුවන් හැම විටම හිඟාකෑවේ නැත. ඔව්හු අම්බලම අවට භූමියේ විවිධ ක්‍රියා කරමින් කාලය ගත කළහ. ගමක් අසල නම් ගමේ දරුවන් සමග එකට සම්මිශ්‍රණය වූහ. කොහේ ගියත් 'ගෙදරය' කියා ඊමට තැනක් ඔවුන්ට තිබිණ. අද පාර අද්දර හෝ ගහක් යට හෝ වරින් වර කඩපිල් යට වසන ඔවුන්ට ගෙදරක් කියා ආපසු නිවසට හරි එන්නට තැනක් නැත. ඔවුන්ගේ සමාජානුයෝජනය ඒ නිසා සියීකඩ ගොස් විනාශ වී තිබේ.

පාරේ හැදෙන දරුවා බහ තෝරන කාලයේ සිට ආශ්‍රය කරන්නේ තමාට එවා වැඩිමහල්, දුසිරිත් වලට හුරු පුරුදු වූ වැඩිහිටි කැනැත්තාය. සමාජ විරෝධී ආකල්ප හා චර්යා බහුල අවට ලෝකය දරුවාද ඒවාට ලේසියෙන් ඇද ගනියි. මෙහිදී ලබන ඔහුගේ අත්දැකීම් ඉතා කටුකය. කිසිදාක පාසැල්යාමට ඔහුට ඉඩක් නැත. අධ්‍යාපනයක් නොලැබෙන නිසා මානසිකව ඔහුගේ හෝ ඇයගේ වර්ධනයක් සිදු නොවේ. කා බී ඇඟපත වැඩුනත් මනස පටන් ගත් තැනමය. එහි වර්ධනයක් නැත. නැත්නම් එය ඇදී යන්නේ නරක අතට පමණි. එය පිරෙන්නේ සමාජවිරෝධී ආකල්පයන්ගෙන් හා චර්යාවලිනි.

අබ්බගාත දරුවන්ට මොනම සමාජානුයෝජනයක්වත් නැත. හිඟන ගැහැනු මෙබඳු දරුවන් විකුණා දමන්නට මාන බලති. දරුවා යන්තම් ලොකුවෙන විට කැරැට්කාරයෙකුට ඔහු හෝ ඇය විකිණිය හැකිය. ඊට පසු ඒ දරුවා ජීවත්වන්නේ අනික් අයට සල්ලි හම්බකර දෙන්නටය. යාන්තමින් කෑමට යමක් දී ඒ දරුවා තැනින් තැන ගෙන ගොස් මුදල් ගරන්නට සැරසුනු මිනිසුන් හිඟන්නන් අතර හා ඔවුන්ගෙන් මෙපිට කැරැට්කාරයන් අතරද දක්නට පුළුවන.

එක්තරා අබ්බගාත දරුවකුගේ දින චර්යාව එකල මම නිරීක්ෂණය කළෙමි. මේ දරුවාට නැගිට ගන්නට බැරිය. ඔහු ඇදගෙන ගියේ අත් කරත්තයක දමාගෙනය. ඔලුව අසාමාන්‍ය ලෙස ලොකු, බඩද විශාල අතපය හීනි ඔහු දකින අයගේ සිත තුල නිකම්ම අනුකම්පාව එහා උපදී. කැරැට්කාරයනට මේ දරුවාගේ ආකර්ෂණය ඒ නිසාය. ඔව්හු උදේට කහට කෝප්පයක් දවාලට පාන් කෑල්ලක් හෝ බනිස් ගෙඩියක්, රෑටත් කුමක් හෝ ආහාරයක් දී දරුවා තැනින් තැන ගෙන යති. හවසට රුපියලක් හෝ පහ පනහක් යාචකයකුටම දී දරුවාගේ මලමුත්‍රා ඉවත් කොට ශුද්ධ පවිත්‍ර කරවති.

එක් මාසයක් තුල මා දුටු ඒ දරුවා හා සම්බන්ධ දින රටාව මෙසේය.

දින 1-3 සමූහයක් විසින් කුලියට ගන්නා ලදී. (මේ සමූහය හිඟන්නෝ නොවේ: කැරැට්කරුවන්ය)

4-8 තවත් සමූහයක් විසින් කුලියට ගෙන එක්තරා ආගමික ස්ථානයක් ළඟ තබා ගැනිණ.

9-16 තවත් සිද්ධස්ථානයකට වෙනත් සමූහයක් විසින් ගෙන යන ලදී.

17-21 තවත් ආගමික උත්සවයකට කුලියට ගනු ලබයි.

22-24 කොළඹ හා තදාසන්න ප්‍රදේශවල පාර අද්දර ප්‍රදර්ශනය විණ.

25-30 තවත් ආගමික සිද්ධස්ථානයක් ළඟ තබා ගන්නා ලදී.

මේ දරුවාට එකල වයස අවුරුදු හතක් පමණ වන්නට ඇත. මීට අවුරුදු කනකට පසුවත් ඔහු ජීවත් විය. මම ඉන් පසු ඔහු නුදුටුවෙමි. නමුත් මේ මුළු මහත් කාලය තුළම ඒ දරුවාගේ බඩ පිරෙන්නට එක බත් වේලක් ඔහුට ලැබිණි දැයි මට සැක සහිතය. සිද්ධස්ථානයක් අසල තබා සිටින විට ඔහුට දෙන වද දුටු මගේ හදවත කම්පා කරන සුළු විය. වරින් වර හිඟමන් ඉල්ලුවේ නැත්නම් සෙනඟ එහාමෙහා යනතුරු බලා ඉන්නා තැරැව්කාරයා දරුවා කොනිත්තයි, 'තොට දවාලට කන්න දෙන්නෙ නැහැ' යි තර්ජනය කරයි.

මෙවාට අමතරව 'හරියට හැසිරුනේ නැත්නම්' මේ අබ්බගාත දරුවන්ට සවස් ජාමයේ දෙන ශාරීරික වද ගැන එක් යාචකයෙක් මට පැවසුවේය. දරුවාට මරණ බිය ඇති කිරීම දඬුවමේ පරමාර්ථය වන්නේය. දවස පුරාම වතුර බිඳුවක් වත් නොදී වද දෙන ආකාරය පුදුමාකාරය. මෙබඳු උග්‍ර සමාජවිරෝධී, මිනිස්කමටත් විරෝධී ක්‍රියා ඇතිවන්නේ අබ්බගාත දරුවන් හිඟන ලෝකයට ගෙන යැමට ඉඩ දීමෙනි. මානසික හෝ ශාරීරික අංග විකල දරුවන් සෑම කෙනෙක්ම නිවාසවලට ඇතුළු කොට මැනවින් රැක බලා ගන්නට තරම් අප සූදානම් නොවන්නේ ඇයි? එසේ කළොත් අප අදහන බුදු දහම ක්‍රියාවට නැඟීමත් ඉන් සිදු නොවේද? අපේ ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් සහෝදරවරුන්ද කවුරුත් ඒ ශ්‍රේෂ්ඨ ආගම්වල උගැන්වීම් තුලින් මේ ප්‍රශ්නය දිහා බැලිය යුතුය. එය කාගේත් යුතුකමක් වන්නේය.

අංගවිකල (අබ්බගාත) දරුවන්ගේ සමාජානුයෝජනය කෲර අත්දැකීමකි. පළමුවෙන්ම වැදූ මව විසින් අත් හරිනු ලබන ඒ දරුවා එතැන් සිට වැටෙන්නේ අපායකටය. වැදූ මවත් එවන් දරුවෙකු සිහා කා හෝ හදාවඩා ගන්නවා මට දකින්නට ලැබුණේ විරල වශයෙනි. දරුවා තැරැව්කාරයන් විසින් භාරගනු ලබන්නේ වෙන්දේසියේ දැමීමටය. එසේ වෙන්දේසියට ගිය පසු තැරැව්කාරයෝ දරුවා එහාමෙහා ගෙන යති. යාචකයන්ට දරුවා ළඟ සිටින්නටත් 'මේ මගේ පුතා දුව' කියකියා දුටුවන් තුළ අනුකම්පාව උපදවන්නටත් බල කරති.

හිඟන පවුල්වල දරුවන්ගේ ගණන බොහෝ විට සාමාන්‍ය වශයෙන් 5-5 ක් පමණ වන්නේය. තමන්ගේ සෞඛ්‍යය ගැන පවා සිතීමට ඔවුන්ට විදියක් නැත. උත්පත්ති පාලන ක්‍රම ගැන ද මොනම දැනීමක් වත් ඔවුන් සතු නොවේ. හිඟන්නන්ට විනෝදාස්වාදය සඳහා ඇති එකම මග මිනිත්තු කීපයකට මෙසේ ශාරීරික වශයෙන් එක්වීමය. අප එකල නගරයේ අහඹු නියැදියක් හැටියට ගත් පවුල් සියයකින්

පවුල් 44 කට එක්පවුලකට දරුවන් 3 - 5 දක්වාත්

පවුල් 34 කට දරුවන් 6 - 8 දක්වාත්

පවුල් 16 කට දරුවන් 8 දක්වාත්,

පවුල් 6 කට දරුවන් කිසිවකු නැතුවත් දක්නට ලැබිණ.

දරුවාගේ වටිනාකම දැන් දැන් හිඟන පවුලට දැනෙන්නේ ඔහු හම්බ කරදෙන මුදල අනුවය. මේ නිසා ඉතා කුඩා දරුවන් පවා හිඟමනට යැවීමට තාත්තලා අම්මලා පැකිලෙන්නේ නැත. බිම දනගාමින් යන යන්නමින් ඇවිදින්නට පුළුවන් දරුවා වුවත්, බස් ඇතුලට යවා දනගාවමින් මුදල් එකතු කරගන්නේ එවන් දරුවකුගේ ශ්‍රමය පවා යමක් උපයා ගන්නට යොදවමිනි. ඒ දේ කරන්නේ බොහෝ විට ජීවත්වන්නට වෙන මගක් නැති නිසාමය.

හිඟන පවුල් කීපයක් එකට ඉන්න විට ඥාති සම්බන්ධතා නිකම්ම ගොඩනැගේ. මේ ඥාති සම්බන්ධතා සමාජඋරුමයක් නිසා පහළ වූ ඒවා නොවේ. ඒවා විවාහය නිසා ඇති වූයේද නැත. එකට ජීවත්වීමේ සමාජමය අත්දැකීම නිසා උපතලද ඒවාය. 'අම්මා' 'තාත්තා' 'සීයා' 'ආච්චි' 'මාමා' 'නැන්දා' ආදී වශයෙන් ඔවුන් අතර ප්‍රකට නෑකම් උපතින් හෝ විවාහයෙන් මතුවන නෑකම්වලට වඩා ව්‍යවහාරයේදී ප්‍රබලය.

ඥාති සම්බන්ධතා ඇතිවන්නේ උපතින් හෝ විවාහයෙන් යැයි අපි සමාජ විද්‍යාවෙන් හා මානව විද්‍යාවෙන් ඉගෙන ගත්තෙමු. ඊට වඩා වෙනස් විදිහකට ඥාති සම්බන්ධතා මෙහිදී ගොඩ නැගේ. 'නව පවුලක් එකට සම්පව වාසය කරන විට යම්යම් කාර්යභාරයන් ඉෂ්ට කරන විට මතුවන්නා වූ එබඳු ඥාති සම්බන්ධතා විවරණය කරන්නට අප අලුත් සංකල්ප යොදාගත යුතු නැද්ද? ලංකාවේ සමාජ හා මානව විද්‍යාව හදාරන්නන්ට මේ ගැටලු ගැන සොයා බැලීමට දැන් කාලය පැමිණ ඇත.

එනම් හැම නෑකමක්ම, අත්දැකීමෙන් වර්ධනය වුනු කාර්යබාරයන් සතුව ගොඩ නැගීමයි. 'තාත්තා' 'අම්මා' 'අයියා' 'අක්කා' 'මල්ලී' 'නංගී' වන්නේ එක පවුලක උපන් නිසාම නොවේ. උප්පත්තියෙන් හෝ නෑකමින් ගොඩ නැගුණු පවුල් යාචකයන් අතර ඇති බව අපි කීවෙමු. උත්පත්තියෙන් හා නෑකමින් ගොඩ නැගුනත් ඒ පවුල් වලද නෑ සබඳකම් යම් කිසි ක්‍රියාත්මක කාර්ය භාරයක් උඩ රඳා පවත්නා බව දැකිය හැකිය.

මෙවන් කාර්යභාරයක් සතු 'තාත්තා' හා 'අම්මා' මෙවන් කටයුතු කරන අය' වන්නේ යැයි දරුවෝ දනිති. 'අයියා' හැම තිස්සේම සාරගා ඇද් මාත් කළ යුතුය: අක්කා හා නංගීද එබඳුය. ක්‍රියාත්මක කාර්යභාර පිළිබඳ මේ සාධකය නිසා ඔවුන්ගේ ඥාතීත්වය අමුතු රටාවක් ගනියි. වැඩි මහල්ලා 'වරද' පෙන්වන්න යන්නේ නැත. ප්‍රබල වරදක් වුහොත් පමණක් ඒ වරදකරු බේරා ගැනීමට වැඩිමහල්ලා ඉදිරිපත් වනු ඇත. පැටලිල්ල මහ හැරවීමටය නායකයා ඉදිරිපත් වන්නේ. කවුරුන් හෝ සමාජ විද්‍යාඥයෙක් මේ අයගේ ක්‍රියාත්මක කාර්යභාර ඥාතීත්ව රටාව විග්‍රහ කළ යුතුය.

යාචකයන්ට ඇති ප්‍රධානම කරදරය බරපතල අසනීපයක් වීමය. එහා මෙහා යන්න එන්න පුළුවන් තරමේ අසනීපයක් නම් රස්සාව කරගෙන ජීවත්වීම දුෂ්කර නැත. නැගිටගන්නට බැරි තරමේ රෝගයක් වූ විටය ඔවුන් බෙහෙත් ගැනීමට හෝ ආරෝග්‍යශාලාවට යෑමට කල්පනා කරන්නේ, සුළු අසනීපවලට උණට, බඩේ අමාරුවට, වාතගායට, ඇවිලිල්ලට, ඇස් රුදාවට, බල්ලන් හැපූ විට, යකුනු වැහුනු විට (මානසික රෝගවලට) බොහෝ විට බෙහෙත් හේත් සමූහයේ නායකයා දනියි.

සාමාන්‍ය සමාජයේ මෙන් යාචක ලෝකයේද ඉඳහිට නක්ෂත්‍රකාරයන්, ගුරුකම්කාරයන් හමුවිය හැකිය. මෙබඳු අය නායකයන් නොවුනත් ඔවුන්ට එක්තරා අන්දමක ගරුසරුකමක් හිඟන්නන් අතර ඇත. අභිචාර පිළිබඳ සිංහල ගැමි සමාජයේ, සමහර විට ද්‍රවිඩ හෝ මරක්කල සමාජයේ ඇති විශ්වාස මේ අය අතරද තිබේ. 'ඇස් වහ' 'කටවහ' ඉන් ප්‍රධානය.

වරක් මා සමග සිටි හිඟන පවුලක කුඩා දරුවෙකුට ඇඟ පුරා බිබිලි දැම්මේය. ඇගේ අම්මා වහා මෙවන් ගුරුකම්කාරයෙක් සොයාගෙන ගොස් අපේ ගම්වල කරන්නාක් මෙන්ම ඇස් වහට වතුර මතුරවාගත් සැටි මට මතකය. ඒ වගේම අසුබ දවස් ගැනද, හිඟමනේ යන්නට පිටත් වූ විට පළමුවෙන්ම හමුවන නිමිත්ත ගැනද ඇදහීම හිඟන්නන් අතර ඇත.

'කවදාවත් නාකි ගෑනියෙක්, හාමුදුරුනමක්, උදැල්ලක් ආයුධයක් ගත්ත කෙනෙක්, මූසලයෙක් හම්බවුනොත් එදාට හිඟමන් යන්න එපා. තුට්ටු දොයිතුවක් හම්බවෙන්නේ නැහැ. යන්න යන ගමනට පය ගැටුනොත්, හූනෙක් කෑගැහැව්වොත්, බල්ලෙක් කන්පට ගැහුවොත් යන්න එපා. තමුන්ට නරකක් වෙන්න පුළුවන්.'

මගේ හිඟන ගුරුවරයා මට කියා දුන් මේ වචන මා කුඩා කල ගමේ අප වැඩිහිටි අයගෙන් ඉගෙන ගත් දේවල්මය. මෙවන් දේ අසන්නේ නැතිව හිඟමනේ ගිය සිරිමලා නම් තහයට අහන්නේ නැති හිඟන්නෙක් විය. 'ඌ යන කොටම බල්ලා කන්පට ගැහුවා. ඒ විතරක් නම් මදෑ කකුල ගලක හැපුනා. මම ඌට යන්න එපා කිවුවා. ඌ ගියා. මොකද වුනේ? පිස්සු බල්ලෙක් කෑවා. ඌට ජීවත් වන්න පුළුවන් වුනේ දවස් හතයි? මේ සුබ නිමිති හා අසුබ නිමිති රඳා පවතින්නේ හිඟා කෑම යන විට ඇතිවිය හැකි ලාභ හා අලාභ සලකාගෙනය. 'අද මේ මූසලයා හමු වූනොත්, තුට්ටු දොයිතුවක් හම්බ වෙන්නේ නැහැ. 'අර පින්වන්ත එක්කෙනා හම්බවුන හැම දවසකම බඩපුරා කන්න ලැබුණා' මේ අන්දමින් යාචකයන් කතා කරන හැටි මට නිතර අසන්නට ලැබිණ.

හිඟන්නන්ගේ චර්යාධර්ම, අභිචාර විධි, විශ්වාස ආදිය ආරක්ෂා වෙන්නේ මෙබඳු නිතර දෙවේලේ කියන නිදර්ශන නිසාය. ඒ නිදර්ශනවලට මුල් වූ වන් අප දන්නා හඳුනන අය හෝ අපේ වැඩිහිටි උදවියගේ මතකයේ තිබුනු අය වීම ඉතා වැදගත් ලක්ෂණයකි. සිරිමලා ගැන මම වෙනත් වැඩිහිටි හිඟන්නන්ගෙන් එකල ඇසීමි. කව්රුත් කීවේ එකම කතාවය. ඒ හැම දෙනාම වගේ සිරිමලා ගැන දැන සිටියහ.

හිඟන පවුල්වල ඉඳහිට දකින සාමාජිකයෙකු නම් බල්ලාය. බල්ලන් සහිත පවුල් මෙන්ම වයසක හිඟන ගැහැනුන්ද කීප දෙනෙක් මට එකල දකින්නට ලැබිණ. අද අගනුවර හා තදාසන්න ප්‍රදේශ වටා යන විට බල්ලන් ඇති කරන

හිඟන්නන්ගේ ප්‍රමාණය වැඩි වී ඇතිබව පෙනේ. මීට හේතුව තනිකම නිසා බල්ලාට හිඟන පවුල හෝ හිඟන්නා ආදරයක් දැක්වීමයි. බල්ලාද පුදුම හිතමිතෙක් ඇති තම ස්වාමියාට ලෙන්ගතු වන්නේය. හිඟන්නන් යම් තැනකට යන්නට පෙළඹෙන්නේ නම් මේ පුරතල් සතුන්ද එහි ගෙන යෑමට ඔවුන්ට ඉඩ දීම ප්‍රශංසනීයය. වර්තමානයේ නම් කොළඹ ප්‍රදේශයේ පමණක් බල්ලන් පුරතලුන් ලෙස සලකන පවුල් සෑහෙන ගණනක් මා දැක ඇත.

බල්ලන් මුලින් ඇති කළේ වයසක තනි ගැහැනු උදවියයි. 'ඌ මට පුතෙක් වගේ.' කියමින් තමන්ගේවන් සෙනෙහස නොලැබුණු වයසක ගෑනු ඒ ආදරය මේ පුරතල් සතා තනියට ඇති කිරීමෙන් ලබාගන්නාය. වයසක ජෝඩු, බල්ලන් තම 'පවුලට' එක් කරගත්තු විලසට මම දුටුවෙමි. 'අපේ පවුලට තුන් දෙනායි. මායි, මගේ ගෑනියි, බල්ලයි. ඌ තමයි අපේ පුතා' කියා මේ අය කීහ. තුන්වෙනුව හැදුණු පවුලක් එක්කම තාත්තා, අම්මා, දරුවන් සමග එකට ඉන්න බල්ලන්ය. පාර අද්දරත්, ගස් යටත්, වෙන තැන්වලත් බලු සාමාජිකයන් සහිත හිඟන පවුල් සෑහෙන ගණනක් අද දක්නට ඇත.

ඉතාලියේ හොබෝඩා සිරකාරයන්ට මත්ස්‍යයන්, බල්ලන්, බළලුන්, පක්ෂීන් පුරතලුන් විදියට ඇති කිරීමට අවස්ථාව ලබාදෙන ලදී. එසේ කිරීමෙන් සිරකාරයාගේ තනිකම බොහෝදුරට මග හැරී යන අතර, සෙනෙහස නැමැති ගුණාංග මේ පුරතල් සතුන් එල්ලකරගෙන මතුවන බව සොයාගෙන තිබේ. ඒ සෙනෙහස නිසා කුරිරු කටයුතු වලට හසුවූ අපරාධකරුවෙකු ක්‍රමයෙන් යහපත් මිනිසෙකු වන්නට ඉඩ ඇති බව අපරාධ විද්‍යාඥයින්ගේ හැඟීමය.

හිඟන්නන්ගේ පවුල් ජීවිතයේ විනෝදය හවසට සියලු දෙනාම එකතුවීමයි. එසේ එකතු වූවත් සාමාන්‍ය පවුලක මෙන්ම පවුලේ සාමාජිකයන් අතර අන්‍යොන්‍ය සම්බන්ධ හා වර්ධනය වන වැඩපිළිවෙලක් ඔවුනට නැත. අපේ ගමේ බෞද්ධ සිංහල පවුලක නම් පවුලේ අන්‍යොන්‍ය සම්බන්ධතා දියුණු කරන පහක් විය.

1) පවුලේ කව්රුත් එකට ඉඳගෙන (එක වේලාවකදී) ආහාර ගැනීම.

2) පවුලේ උදවිය එකට ආගමික වතාවත්වල යෙදීම.

3) පවුලේ උදවිය එකට පොතක්/ පතක් කියවීම/ එය අසාගෙන සිටීම.

4) දෙමාපියන් අතර හා මෙන්ම දෙමාපියන් හා දරුවන් අතරද නිතර නිතර කතාබහ අවස්ථා ලබාදීම.

5) දෙමාපියන් හා දරුවන් එකම ඒකකයක් ලෙස විවිධ වැඩකටයුතුවල යෙදීම (කාම්කර්ම කටයුතුවලට ගිය විට පුංචි ලොකු කාටත් කළ හැකි වැඩක් ඒ කටයුතුවල තිබිණ.)

යාචක පවුලේ මේ කිසිවක් සිදුවන්නේ නැත. 'මම හිඟාකාලා මෙන්න හම්බවුන සල්ලි. මෙයින් මට මෙච්චර ඕනෑ. මගේ වියදමට. මෙන්න ඉතුරුවා?

යි. කියමින් අම්මා අතට මුදල් දෙන දරුවා තමාගේ කාර්ය මෙය බව කල්පනා කරයි. අම්මාට තාත්තාට අපේ ගම්වල පවත්නා ගරුසරුකම, ඉටුකළ යුතු චාරිත්‍ර ආදිය ගැන ඔහුට උගැන්වීමක් ලැබෙන්නේ නැත. පවුලක් හැටියට, හිඟන පවුල පවතින්නේ එකිනෙකා තමන්ට ඇති ක්‍රියාත්මක කාර්යභාර කීපයක් ඉටුකිරීම ගැන පමණක් සලකාගෙනය. නමුත් දරුවා ලොකු වනවිට අම්මා - තාත්තා හෝ පවුල ගැන කල්පනා කරන්නේ නැත. තමන්ගේ අවට පරිසරයෙන් ඔහු ලබන සමාජානුයෝජනයට අනුව කෙසේ හෝ තමන් ජීවත්විය යුතු යැයි ඔහු සිතනු. පිය තම පවුලට හෝ අනුන්ට පිහිටවීමක් ඒ ආධාරවීමෙන් ලබන සන්තෝෂයක්, තෘප්තියක් ඔහුට හෝ ඇයට ඇතිවන්නේ නැත.

තනිකම හිඟන පවුලට මෙන්ම ඒ ඒ යාචකයාට ඇති ප්‍රධාන ප්‍රශ්නයයි. මේ තනිකම නැතිකරගන්නේ කොහොමද? විනෝදාස්වාදය ලැබීමට ඇති විවිධ විකල්ප අවස්ථා ගැන දැනගැනීමට තරම් නුවණක් ඔවුන්ට ලැබී නැත. අධ්‍යාපනය නැතිකම ඊට ප්‍රධාන හේතුවයි. ඒ නිසාම ඉතා ලේසියෙන් මත්පැනට හෝ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමට සමහර තරුණ හිඟන්නෝ පෙළඹෙති. හැදී වැඩී එන පිරිමි ළමයින්ට මේ ආකල්පය තදින් බලපායි.

හිඟන්නන් තමන්ටම ආවේණික චර්යාධර්ම රැසක් රකින බව ඔවුන්ගේ පවුල් ජීවිතය දිහා බලන අපට පෙනේ. පවුල් කන අය කාමමිථ්‍යාචාරයේ හැසිරෙන්නේ කලාතුරකිනි. ස්ත්‍රී දූෂණය ගැන මෑතක් වනතුරුම ඔවුන් අතර මට දකින්නට නොලැබිණ. මෑතක වුවද හිඟන ගැහැනුන් දූෂණය කරනු ලැබුවේ යාචක සමාජයට බැහැරවූ වැදගත් යැයි කියන මිනිසුන් විසිනි.

හිඟන්නන් සැම දෙනෙක්ම විනෝදය සඳහා මත්පැන් බොන්නේ නැත. හැම පවුලක්ම පාහේ මත්පැන් බීම පිළිකුල් කරති. ඉඳහිට කීපදෙනෙක් හොර රහසේ අරක්කු, කසිප්පු ආදිය පානය කරතත්, මත්පැන් බීම, අනාචාරයේ හැසිරීම, මත්ද්‍රව්‍ය භාවිතය හෝ සොරකම් යාචක සංස්කෘතියේ ලක්ෂණ නොවේ. 'පවුල' අපේ සමාජයේ පවත්නා පවුලක් හැටියට නොතිබුනත්, හිඟන සමාජයේ ඉලක්ක ඉටුකරගැනීම ඔවුනගේ පවුල්වලින් ලැබෙන ආධාරය සුළුපටු නොවේ.

හිඟන පවුල ගැන කල්පනා කරනවා නම් ඒ පවුල, පවුලක් හැටියට ඉදිරියට පවත්වාගෙන යමින්, දරුවන් ප්‍රයෝජනවත් ලෙස සමාජානුයෝජනය කරන්නට මාර්ගයක් එළිකර දීම වඩාත් උචිතය. එසේ කරන විට හිඟන පවුල අද මුහුණ දෙන ප්‍රශ්න ගැන සලකා බලා නූතන ජීවිතයේ ඔවුන් ඉදිරියේ ඇති බාධක තේරුම් ගෙන එසේ කිරීම ඉතා යෝග්‍ය වන්නේය. දැනට යන්තමින්වත් ඉතිරිව ඇති හිඟන පවුලේ පදනම බිඳ දමන කිසිදු වැඩ පිළිවෙලකින් මේ ප්‍රශ්නය විසඳීමට කවර ප්‍රයෝජනයක්වත් ලැබිය නොහැකිය.

හිඟන ප්‍රශ්නය සැහැල්ලු කරන්නට සමත්වන සමාජපාලනයක් සෑහෙන දුරකටවත් ඇති කරගත හැකිවන්නේ හිඟන පවුල් ප්‍රයෝජනයට ගෙන ඒ ඔස්සේ සාමානය සමූහ පාලනයක් ඇති කිරීමෙනි. මේ පවුල් වලට ස්වභාවික පවුල් මෙන්ම, නව ස්වභාවික පවුල් වල (කෘත්‍රිම) අයද ඇතුළත් විය යුතුය. හිඟන පවුල ඒකකයක් ලෙස නොසලකා කෙසේවත් මේ ප්‍රශ්නය විසඳිය නොහැක. එබඳු පලේ අවබෝධයකින් කටයුතු කිරීමෙන් හිඟන දරුවන්ට උචිත සමාජානුයෝජනය ලබාදී, ඔවත් ඊළඟ පරපුරේදී යාචක ලෝකයෙන් ඈත් කොට, වගකීමක් ඇති හරවත් අපේක්ෂා පහළ කරගෙන, තෘප්තිමත් ජීවිත ගතකළ හැකි මිනිසුන් බවට පත්කරන්නට හැකිවනු ඇත.

8 මහරගම හා රත්නපුරයේ යාචකයන් ගැන කළා වූ ක්ෂුද්‍ර අධ්‍යයනයක්

සමාජ විද්‍යාව උගත් ඔබ සාර්ව-සමාජ විද්‍යාව හා ක්ෂුද්‍ර - සමාජ විද්‍යාව කියන වචන දෙක අසා ඇති. නොයෙක් දෙනා මේ දෙක ගැන විවිධ අන්දමින් කතා කරනවා. නමුත් ඒ ක්ෂේත්‍ර දෙකේ වෙනස් තේරුම් ගන්න ඔබට අවශ්‍ය වචන තුනක්: පමණි: කාලය, පසුබිම හා සංඛ්‍යාව මේ වචන තුනයි.

සමාජ විද්‍යාව යම්කිසි සෑහෙන දික් කාලයක් වැය කොට, වඩා පළල් වූ පසුබිමක, සංඛ්‍යාවෙන් වැඩි පිරිසක් ගැන පර්යේෂණයක් කරනවා නම් එය සාර්ව සමාජ විද්‍යාත්මක පරීක්ෂණයකි. මම අවුරුදු ගණනක් ගතකොට, එක් අවුරුද්දක් හමාරක් පමණ හිඟන්නෙක් ලෙස වාසය කරමින්. ලංකාවේ යාචකයින් ගැන පර්යේෂණයක් කළා. මීට සෑහෙන කාලයක් ගියා, පසුව මුළු ලංකාව අසුකරගත් නිසා පළල් එකක් වුවා: යාචකයන්ගෙන් සාමාන්‍ය වැඩි ප්‍රමාණයක් මගේ අධ්‍යයනයට ලක්වුවා. ඒ නිසා එය සාර්ව සමාජ විද්‍යාත්මක පර්යේෂණයක්.

මහරගම, නුගේගොඩ පුංචි නගර දෙකක්. මම ඒ නගර දෙකේ ජීවත්වන යාචකයන් ගැන ඓතිහාසික කාරණාද ප්‍රයෝජනයට රැගෙන 1962-77 කාලසීමාව තුල සමාජ විද්‍යාත්මක ගවේෂණයක් කළා. එය දීර්ඝ කාලීන නොවූ කාලයෙන් අඩු, පළල් නොවූ පසුබිමක, ස්වල්ප දෙනෙකු (සිය ගණනක් වූ යාචකයන්) අරභයා ගැඹුරට කළ ක්ෂුද්‍ර පර්යේෂණයක්.

මට මෙය කරන්න හැකි වුනේ මම සෑහෙන කලක් මහරගම වාසය කළ නිසාත්, මගේ ශිෂ්‍ය කාලය තුල රත්නපුරේද වසර ගණනාවක් ජීවත් වූ නිසාත්ය. රත්නපුර සිටි කාලයේ මම යාචක සමීක්ෂණයක් ගැන කල්පනා නොකළෙමි. නමුත් එහි ජීවත්ව සිට හදාගත් පසුබිම 1962-77 කාලය වනවිට යාචකයන් ගැන සොයා බලන්නට මට අගනා පිටුවහලක් විය. මහරගම කාලයක් ජීවත් වීම නිසා (1960 - 64) යාචක ප්‍රශ්න සියැසින් දැක බලා ප්‍රත්‍යක්ෂ කරගැනීමට පුළුවන් විය.

මහරගම නගරය මේ කාලය වන විට 40000 ක් පමණ ජනගහනයකින් යුතු නගරයක් විය. සුළු නගර සභාවක් එකල තිබිණ. අද ඇති ජනගහනය

එදා තිබූ ජනගහනයට වඩා බෙහෙවින් වැඩිය. ඊට හේතුව පිටපළාත්වලින් පැමිණි අය කොළඹට නුදුරු නිසා මහරගම ඉඩකඩම් මිලට ගෙන පදිංචි වීමය. කොළඹ රැකීරක්ෂාවට යෑමට මහරගම ඔවුනට පහසු තැනක් විය. නගරය වටා කර්මාන්ත ව්‍යාපාර ගණනාවක් ඇතිවිය. ගුරු පුහුණු විද්‍යාලය (අද ජාතික අධ්‍යාපන ආයතනය) පිළිකා රෝහල, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ජාතික තරුණ සේවා මධ්‍යස්ථානය, දන්ත වෛද්‍ය පාසැල ඉන් කීපයක් විය. මීට අමතරව අධ්‍යාපනය අතින් උසස් යැයි සැලකෙන පාසැල් කීපයක ද එහි විය. විද්‍යාලංකාර පිරිවෙනෙහි ශාඛාවක් පන්නිපිටියේ පිහිටා ඇත. බටහිර වෛද්‍යවරු කිහිප දෙනෙක්ම මහරගම තම ඖෂධාගාලා පිහිට වූහ. ප්‍රකට ආයුර්වේද වෛද්‍යවරු ද මහරගමත් ඊට යාබද ආසන්නයේත් ජීවත් වූහ.

මහරගම, කලක් කෝට්ටේ පාර්ලිමේන්තු ආසනයට ඈඳා තිබුනත් පසුව තනි ආසනයක් බවට පත්විය. උගත් යැයි සම්මත පිරිසක් මහරගම නගරය හා අවට ප්‍රදේශවල වාසය කරන බව සාමාන්‍ය පිළිගැනීමයි. අද දවස වන විට මහරගම ප්‍රදේශය පළාත් සභාවක් පිහිටුවා ඇත. නගරය ක්‍රමයෙන් විශාල විය. ජාතික මට්ටමේ රාජ්‍ය බැංකු හා රාජ්‍ය නොවන බැංකු කීපයක්ම නගරයට අවතීර්ණ විය. බෞද්ධයන්ගේ සම්මානයට පත්වූ බෞද්ධ මධ්‍යස්ථානයද, දැඹිවල පාරේ බෞද්ධ කටයුතු සඳහා කැපවිය.

ඉතා ඉක්මනින්ම වෙනස්කම්වලට භාජන වූ මහරගම නගරයේ වැඩි වශයෙන් මධ්‍යම පංතිය හා පහළ මධ්‍යම පංතිය ජීවත්වන නගරයකි. නගරයේ සතියකට තුන්වරක් පොලවල් පැවැත්වේ. අසල ගම්වලින් මෙන්ම ඈත පළාත්වලින්ද මේ පොලවල්වලට බඩු ගෙන ඒමට මෙන්ම පොළට විත් බඩු මිලට ගැනීමට වෙළෙන්දන් හා මිනිසුන්ගේ පැමිණීම සිදුවේ. කොළඹ කන්තෝරුවල හා පෞද්ගලික ආයතනවල විවිධ අන්දමේ රක්ෂාවල් කරගෙන යෑම මේ අයගෙන් වැඩි දෙනෙකුගේ දිවිපෙවෙත විය.

ඒ කාලයේ හැටියට මසකට රුපියල් 5000 ක ලබනවා නම් ඒ තැනැත්තා ඉහළ පංතියක තත්වයේ ආදායමක් ලබන බව පිළිගැණින. එවන් අය මහරගම නාගරික සමාජයේ එවකට දක්නට ලැබුවේ සියයට හතරක් පමණි. වැඩි දෙනාස් මසකට රුපියල් 400 සිට 1200 දක්වා ලබන්නන් වූ අතර නගරයෙන් එහා ගම්වල කෘෂිකර්මය තම ජීවිකාව කරගත් ගොවීන්ද, වෙනත් කම්කරුවන්ද දක්නට ලැබිණ.

රත්නපුර මහරගමට වඩා බෙහෙවින් වෙනස්ය. කළු ගඟ අද්දර පිහිටි රත්නපුරය කඳුරටට සබරගමුවෙන් පිවිසෙන දොරටුව වන්නේය. මේ නගරය සබරගමු පළාතේ කළුගඟ සමීපව පිහිටීම නිසා වරින් වර ඇතිවෙන ගංවතුර උවදුර මේ නගරයට උරුම වූවක් විය. දේශගුණය මහරගමට වඩා වෙනස්ය.

විශේෂයෙන්ම රත්නපුරයට අවුරුද්ද පුරාම වර්ෂාව ලබයි. මහරගම නිවීන දින ඉඳේශයේ පිහිටා ඇති අතර මේ නගරයේ උෂ්ණත්වය ඉහළ මට්ටමක ඇත. වඩාත්ම වැසි ලැබෙන්නේ නිරිතදිග මෝසම් සුළං කාලයටය.

රත්නපුරය මැණික් ගැන ප්‍රසිද්ධය. නමුත් භූතනයේ නම් රත්නපුරයේ පමණක් නොව සබරගමුවෙන් එහා පළාත්වලද මැණික් දක්නට ලැබේ. බෞද්ධයන්ට අසහාය සිද්ධස්ථානයක් වූ ශ්‍රී පාදය පිහිටා ඇත්තේ සබරගමු පළාතේය. සමනල ගලට අධිපති සමන් දෙවියන්ගේ ප්‍රධාන දේවාලය ඇත්තේ රත්නපුරයේය. නගරයේම එකල ජනගහනය 31,000 ක් විය. මුලු මහත් රත්නපුර දිස්ත්‍රික්කයේ මේ කාලයේ ජනගහනය 7,26,000 කි. ඒ අය අතර ප්‍රධාන වශයෙන් සිංහල බෞද්ධයන් සිටියත්, තේ රබර් වතුවල දෙමළ ජනතාවද, සමහර මෙවල මුස්ලිම්වරුද වූහ. මැණික් ව්‍යාපාරය පිළිබඳව එකල මුල් තැනක් ගෙන සිටියේ මුස්ලිම් වෙළෙන්දන්ය.

රත්නපුරයේ මැණික් වෙළඳාම හා මැණික් වෙළෙන්දන්ගේ ගොඩනැඟිලි දකින විට එක්වරම පෙනෙන්නේ මහරගම නගරයේ සාපේක්ෂක දුප්පත්කමය. රුපියල් 4000 කට වඩා උපයන අය මහරගම එකල සිටියේ සියයට 4 ක් වුවද, රත්නපුරයේ එබන්දන්ගේ සංඛ්‍යාව සියයට 12 ක් විය. එහෙත් නගරයේ වැඩිහරියකගේ ආදායම රු. 200 - 600 දක්වා වූ බව කිව යුතුය. රත්නපුරයට උසස් විද්‍යාලද, බටහිර ආරෝග්‍යශාලාවක් හා ආයුර්වේද ආරෝග්‍යශාලාවක් බෞද්ධ, හින්දු හා මුස්ලිම් පූජනීය දේවස්ථානද විය. අප කලින් කී සමන් දේවාලයට අමතරව පොත්ගුල් විහාරය, කුකුළුවා විහාරය, වැනි ප්‍රකට ආගමික සිද්ධ ස්ථානද පිහිටා ඇත්තේ රත්නපුරයට භුදුරුවය.

1962 - 63 කාලයේදී (අපේ යාචක සමීක්ෂණය අරඹන මුල් යුගයේ) මහරගම ජීවත් වූයේ යාචකයන් 11කි: රත්නපුරයේ 12කි. මේ යාචකයන් 23 දෙනාටම එක්තරා පොදු ලක්ෂණයක් තිබිණ. එනම් ඔවුන් හැමදෙනාම වාගේ යම්කිසි ශාරීරික ආබාධයකින් පෙළීමය. මහරගම සිටි ඉතා මහලු සාත් කවිරුන් නැති මිනිසෙකු හැරුණුකොට අන්‍ය යාචකයෝ සියලු දෙනාම අංග විකල වූවෝ වූහ. සමහරු කොරුය, සමහරු අන්ධයන්ය, සමහරු ගොලුවන්ය. රත්නපුරයේ අයගෙන් දෙදෙනෙක් මහලු, දුබල අය වූහ: අනික් දහදෙනා අංග විකල වූවෝය. නගර දෙකේම වැඩිහරියක්ම වූයේ පිරිමින්ය. ඇත්ත වශයෙන් මහරගම යාචකයන් 11 න් ගැහැනු තුන්දෙනෙකි: රත්නපුරයේ තත්වයද එසේම විය. මේ සියලු දෙනාම වයසින් අවුරුදු 45 ඉක්මවූවන් වූ බව පෙනේ.

මේ 23 දෙනාගේම ජීවිත ඉතිහාසය එකල අපි සටහන් කරගත්තෙමු. ඔවුන් නගරයට පැමිණියේ ළඟපාත ගම්වලිනි. ඒ ගම්වල මේ අය ගැන කියාගන්නට කිසිවෙකු සිටියේ නැත. සමහරු උපතින් ආබාධිත කෙනෙ

උද අයවූහ, අනිත් නැනැත්තන් ආබාධිතයන් බවට පත් වී ඇත්තේ යම්කිසි හදිසි අනතුරකිනි. ඒ නිසාම හිඟාකෑම රක්ෂාව කරගැනීමට මේ අයට සිදු විය. තමුන්ට සුළු උදව්වක්වත් දීමට කව්රුත් නැතිවීම මේ තත්වය උද්‍යාකරවීමට බෙහෙවින් හේතු විය.

ඔවුන් නගරයට ආකර්ෂණය වූයේ විවිධ හේතු නිසාය. සමහරු මොනත් හෝ තාවකාලික අවශ්‍යතාවකට අහම්බෙන් නගරයට විත් එහි දින කිහිපයක් නැවතී, දිගටම ඒ 'තවාතැන' දීර්ඝ එකක් බවට පත් කළේ ඉන් ජීවත් වීමට ද ආදායමක් ලැබුන බැවිනි. තවත් අය තමන් දන්නා වෙනත් යාචකයන්ගේ කතාබහට ඇදී ආ අයයි. මුලදී පැමිණි විට නගරයේ හයිකාරයන්ගෙන් මොවුන්ට හොඳ රැකවරණයක් ලැබිණ. ඒ සඳහා සැහෙන 'කප්පමක්' හයිකාරයන්ට ගෙවිය යුතු විය. එසේ කප්පන් ගෙව්වාට පසු නගර වීදියේ හයිකාරයෝ හිඟන්නන් ආරක්ෂා කළහ.

ඇත්ත වශයෙන්ම මේ සෑම යාචකයෙකුම ගම්බදින් නගරයට ආ අයයි. මහරගම එකොළොස් දෙනාගෙන් එක්කෙනෙකුට වත් සමීප ඥාතියෙකු සිටියේ නැත. ඔවුන්ට අයිති සුළු ඉඩම් කැබැල්ලක් හෝ වෙනත් වස්තුවක්ද නොවිණ. දන්නා අඳුනන සුළු උදව්වක් හෝ ගත හැකි ගමේ ඉන්නා නැදෑයෙකු හෝ මිත්‍රයෙකු ගැන කියන්නා යැයි කී විට ඔවුන්ට එවැන්නෙකු ගැන සඳහන් කළ නොහැකි විය. ඔවුන් කී දේ ගම්වලට ගොස් විමසා බැලූ විට සත්‍යය බව අපට පෙනිණ. ඈත ඥාතීන් හෝ සමීප නොවූ මිතුරන් සිටියත් ඒ කව්රුවත් මෙවැනි අවස්ථාවකදී මේ අයට උදව් දෙන්නට එන අය නොවන්නේය. ගමේ සිටියදී හිඟා නොකා හිගා කෑමට ඔවුන්ට සිදු වූයේ නැතිබැරිකම නිසාය. සමහර අවස්ථාවල යමක් කෑමට බීමට ඉල්ලා ගැනීමට ඔව්හු අවට ගම්වලට ගියහ. රත්නපුරේ සිටි 12 දෙනාගෙන් හත් දෙනෙක් මේ තත්වයේ අය වූහ.

මහරගම ඉතිරි 6 දෙනා හා රත්නපුරේ ඉතිරි 8 දෙනාට ගමේ පවුල් සම්බන්ධතා තිබිණි. ඔව්හු මේ තමන්ට සම්බන්ධ පවුල් ගැන නිතර කතාබහ කළහ. නමුත් ඒ පවුල් වල අය දුගී දුප්පත් දුබල අය නිසා මේ නැනැත්තන් වෙනුවෙන් ඒ අයට කළ හැකි උදව්වක් නොවිණ. තමන්ගේ ගෙයක් හෝ පැලක් යන්තම් අටවා තිබූ පර්චස් කීපය හැර වෙනත් ඉඩමක් ඒ පවුල්වල කාටවත් තිබුනේ නැත. දරුවන් හත් දෙනෙකුට වඩා ඇති පවුල් හතරක් විය. සැහෙන කාලයකට පසුව යාචක බවට පත්වූ මේ නැනැත්තන්ට ඔවුන්ගේ හතක් විවිධාකාරයෙන් සැලකූහ. නමුත් මොන හේතුවක් නිසා හෝ ඔවුන්ගේ ඒ ආධාර දිගින් දිගටම හීනවීම නිසා මේ අය යාචකයන් හැටියට ජීවත්වීමට තීරණය කළ බව පෙනේ.

මේ යාචකයන් හා සම්බන්ධ ගමේ පවුල් දෙකක උදවිය අපට මෙසේ කීහ. 'මේ අය අපට නින්දා කරනවා. අපි පෝසත් නැතුවට ඒ අයට කන්න අඳින්න දෙන්න අපට බැරි නැහැ. නමුත් ඒ අය ඒකට කැමති නැහැ. ඒ නිසා ඒ අය අපටත් ලැජ්ජා කරමින් ටවුමේ හිඟා කනවා. අපිට දැන් ලැජ්ජාව නිසා ටවුමට යන්න බැහැ.'

මහරගම හා රත්නපුරේ සිටි ඒ සෑම හිඟන්නෙක්ම කියවන්ට ලියන්ට නොදන්නා අය වූහ. මවුන් කවදාවත් පාසැලකට ගොස් තිබුනේ නැත. මවුන් ළමා කාලයේ අධ්‍යාපනය ලබාදිය යුතුම යැයි කියා ඒ අයගේ වැඩිහිටියන් හා සමාජය නොසිතන්නට ඇත. අත් කැපුව, පරණ කොන්දොස්තරවරයෙකු' හැර අනිත් අය ඒන්කෝනකවත් රක්ෂාවක් සෑහෙන කලක්වත් කර නැති බව පෙනුණි. ලියන්නට කියන්ට නොදත් නැනැත්තා කුමන ආකාරයෙන් 'බස් කොන්දොස්තරකම' කළාදැයි අපට පැහැදිලි නැත. (ලියන්ට කියන්ට නොදන්න සෑහෙන සංඛ්‍යාවක් රේස් පත්තර බලා, රේස් පුදුවේ යෙදෙන හැටි අප නොයෙක් විට දැක ඇත.)

මේ නැනැත්තන් හිඟන වෘත්තියට පැමිණීම කුමන අන්දමේ ක්‍රියාවලියක් තුලින් සිදුවූවා දැයි සොයා බැලීම වැදගත්ය. හිඟන වෘත්තියට මවුන් ආකර්ෂණය වුනේ කොහොමද? මවුන්ට මේ සඳහා වූ අභිප්‍රේරණය කෙබඳු එකක්ද? මවුන් යාචක වෘත්තියට මුලින්ම ඇදුනේ කොහොමද? මවුන් හා කළ දීර්ඝ කතා බහ වලින් හා ඔවුන්ගේ මුල් ගම්වලට ගොස් නෑදෑ මිත්‍රයන් සමග කළ පුද්ගලහමුවලින් අපට මේ ක්‍රියාවලිය වටහා ගැනීමට මග එළිවිණ.

ගමේ ඉන්නා විට මේ අයට ලැබුන වැදගත්ම ආධාරය ආහාර විසක් අනුන්ගෙන් ලැබීමය. මෙයද ලැබුනේ ඉතාමත් දන්නා හඳුනන තැනකිනි. එසේ ලැබුන ආහාරය වුවත් සෑම වේලක්ම කුස පුරා ලබාගන්නට මගක් නොවිණ. ගමේ ගෙදරක පන්සලක සාංඝික දානයක් දෙන විට නම් මේ අයට කුස පුරා බත් වේලක් ලබාගත හැකි විය. එසේ වුවත් මවුන් සිත නිතර ඇදී ගියේ නගරයටය. විවිධ හේතූන් නිසා එහි ඇදී ගොස් එහි ඉන්නා යාචකයන් හා මිතු දහම් ගොඩනගා ගැනීම නිසා මවුන්ට ගම සඳහටම අමතක විය.

අපට තරුණු කී එක් යාචකයෙකුගේ වචනවලින් මේ කතාන්තරය මෙසේය ඉදිරිපත් කළ හැක්කේ

'මට නෑදෑයෝ කව්රුත් නෑ මහත්තය. මං එහේ ඉන්න කොට කව්රු හරි දුන්න බත කටක් කාලා තමයි හිටියේ. ඔය වෙසක් දවසක් වගේ දවසක නැත්නම් සාංඝික දාන දවසක තමයි මගේ බඩ කට පිරෙන්න යමක් ලැබුනෙ. මේ දවස්වලට මිනිස්සු දානෙ දෙන ගමන් අපිටත් කන්න දුන්න. මේ විදිහට ගෙදරකින් බඩ පුරා වේලක් නොලැබුනොත් මම බඩගින්නෙ තමයි හිටියෙ. මං මේ ඇඳගෙන ඉන්න සරමයි කමිසෙයි මට දුන්නෙත් අනුන් තමයි.

'ඉතින් මෙහෙම ඉන්න කොට මං අසනීප වුනා. කව්රුත් නැතු මං බලාගන්න හිටියෙ. 'ඉස්පිරිතාලෙ පලයන්' කියල තමයි කව්රුත් කීවේ. ඉස්පිරිතාලෙ ගිහින් ලෙඩේ හොඳ උනාට පස්සෙ මට ගෙදර එන්න සල්ලි නැතු. මම හිඟා කෑවා. ඉතින් මේ සල්ලි වලින් මොනව හරි කාලා බඩ පුරවා ගත්ත. නගරයෙ හිඟන්නො මට හම්බ වුනා. ඒ අය කීප දෙනෙක් මට යාලු වුනා. මගේ අසරණ තත්වය ඇහැව්වාම ඒ අය කිව්වා 'තත්වය මෙහෙම නම් ගමට ගිහිල්ලා ඇති වැඩේ මොකක්ද? මෙහේ ඉඳල අපි වගේ හිඟා කාලා කනා බොනා එක තමයි හොඳ කියල? බස් ස්ටෑන්ඩ් එකේ එහෙම හිඟා කෑවොත් සල්ලි ටිකක් ලැබෙන බව ඒ අය කිව්වා. ඒ අය මාව බස් ස්ටෑන්ඩ් එක ගෙ ගෙන

හිඟන්නන්ගෙ ලොක්කට අඩුන්නල දුන්නා. එයා මගින් නගරාංකාරය ළඟට ගිහින් හිඟාකන්න මග පාදා දුන්නා. නගරාංකාරය හිඟන්නෙක් නොවෙයි. අපි කාටත් පුරින් කරදරයක් වෙන්න නොදී බලාගන්නෙ එයා.

'අපේ හිඟන ලොක්කා කිව්වා මම මාසෙකට එයාට රුපියල් 20 ක් ගෙවන්න ඕන කියා. 'එහෙම නැතුව උඹට හිඟා කන්න දෙන්න බැහැ. රුපියල් ත් මට දෙන්න බැරි නම් හිඟා කන්න එපා.' 'මම මුලදී බය හිතුනා කොහොමද මේ රුපියල් විස්සක් හොයන්නෙ කියලා. මගේ යාලු හිඟන්න' කිව්වා බය වෙන්න එපා. ඔයාට දවසකට රුපියල් දහයක් හොයා ගන්නැකි. එයා තමයි ගමට යන්න නොදී නවත්ත ගත්තෙ. හිඟන නායකයාගේ වචනෙට ගරු කරලා කටයුතු කරන්න මට කිව්වෙ.

'මම කවදාවත් හිඟා කාල නැහැ එතකොට මේ වැඩේ ඉගෙන ගත්තෙ නැතුව කොහොමද කරන්නෙ. මගේ ගමේ අයගෙන් කවදාවත් මම හිඟාකෑවෙ නැහැ. මේ අය මං දැක්කම කන්න බොන්න.මොනවා හරි දුන්නා. දැන් එහෙම නොවෙයි. මට ඉල්ලන්න වෙලා. ඒත් කවදාවත් දැකල නැති, නන්නාඳුනන අයගෙන් හිඟා කන්නේ කොහොමද? මගේ යාලු හිඟන්න මට ඒකට ක්‍රමයක් කිව්වා. කතාවක් ගොතලා කියන්න කිව්වා. මම ඉස්පිරිතාලෙට බෙහෙත් ගන්න ආවා. මම ලෙඩෙක්, දැන් ගෙදර යන්න විදිහක් නැහැ. කීයක් හරි පින් පිණිස දෙන්න මට බස් ගාස්තුවට. වැඩේ හරි ගියා. මගේ කතාවට කව්රුත් රැවටුනා. නමුත් මට හැමදම එකම දේ කියන්න බැහැ. මිනිස්සු මාව දැක අඳුනාගත්තාම මම එහෙම කිව්වොත් මං බොරුකාරයෙක් කියල කියාවි. ඒ හින්දා මම ඒ කතාව දවස් දෙක තුනකින් නැවැත්තුවා.

'මගේ හිඟන යාලුව කිව්වා. දැන් ඉතින් අලුත් කතාවක් හදන්න මේ හොඳයි කියලා. අතක් කැඩිලා කියල කියන්න කිව්වා. අත කැඩිච්ච විදිහට රෙදි පටිවලින් ඔතන්න පුළුවන් අය ඉන්නවා කිව්වා. මට ලැජ්ජා හිතුන බොරු කරන්න. නමුත් බඩගින්නෙ ඉන්නෙ කොහොමද? මගේ අත එහෙම වෙළුවට පස්සෙ මම ඒකා පෙන්නලා සල්ලි ඉල්ලන්න පටන් ගත්තා. අද දිනකට මම රුපියල් දොළහක් විතර හම්බ කළා. හයිකාරයන්ට' කප්පන් ගෙවුවට පස්සෙ, හදට කාලා බීලා ඉන්න තරම් මුදල් මට තියෙනවා. උත්සව කාලවලදි මගේ ආදායම් ඉහළ යනවා. ඒ හින්දා මට දැන් අඩියක්වුනත් ගහන්න පුළුවන්. ඉස්සර නම් අපේ ගමේ අය දැක්කාම මට ටිකක් ලැජ්ජයි. දැන් එහෙම එකක් නැහැ. මට දැන් ගානක් නැහැ.'

හිඟන්නෝ සමූහයක් වශයෙන් එකිනෙකා හා සුළුම විදිහට සම්බන්ධ වෙන්නාහ. පිටින් ඉන්නා හයිකාරයන් නිසා මේ සමූහ සම්බන්ධතාව අලුත් ශක්තියක් ලබන්නේ නොසිතන විදිහටයි. නායකයා නිසා සම්බන්ධය තවත් සවිවුරු වන බව පේනවා. රත්නපුරයෙන්, මහරගමත් නගරයේ හිඟන්නට අවසර දෙන්නේ (ඒ ඒ පැතිවල හිඟා කන්නට) නායකයාලුයි. මේ නගර දෙකේම හුඟාක් හිඟා කෑමෙන් මුදල් උපයන්න පුළුවන් බස්නැවතුම්පොළ තෙයි. ඒ නිසාම එතැන හිඟාකන්නට දෙන්නේ නායකයාට වැඩි ගණනක් දෙන අයටයි.

නායකයාටත් පාරේ හයිරන්ලාටත් දෙන මුදල හැම හිඟන්නෙක්ම ගෙවිය යුතුය. ඇත්ත වශයෙන්ම හිඟන්නන් පාලනය කරන්නේ සමූහයේ නායකයා හා විදියේ 'හයිරන්ලාය'. ඒ අයට විරුද්ධ වන්නට හිඟන්නන්ට බැරිය. හයිරන්ලාට විරුද්ධ වුනොත් හිඟාකෑම් පැත්තක තබා ගුටි කන්නට සිදුවෙයි. නායකයාට විරුද්ධ වුනොත් හිඟාකන්නට තැනක් නැතිවෙයි. හිඟාකන්නට තැනක් පමණක් නොව, වේලාවද ලැබෙන්නේ ඔහුගෙනි. උදේ වරුවේ උඹ මෙතන හිටපන්, සවස් වරුවේ උඹ එහා පැත්තට පලයන් කියා අණ කරමින් කාලය හා තැන නියම්කර බෙදා දෙන්නේ ඔහුය.

හිඟන්නන් පාලනය වන ජනචර්යා හා ගණචර්යා තිබේ. කිසිම හිඟන්නෙක් හිඟාකන්නට ගොස් තවත් හිඟන්නෙක් පමග ඒ ගැන බහින් බස් වීම නොකළ යුතුය. කවිරුන් හෝ දුන්නාවූ හිඟමන් අඩුවුනත් ඒ ගැන නරක විදිහට කතා නොකිව යුතු වේ. හිඟන්නෙක් හිඟන විට එතනට පැමිණ දෙවැන්නා බලයෙන් හිඟාකෑම වැරදිය. යම් තැනක සමූහයක් වශයෙන් ඉන්නා විට උයාගන්නා ආහාරපාන සඳහා හැමදෙනාම දායක විය යුතුය.

1967 - 68 කාලයේදී මහරගම හා රත්නපුරයේ හිඟාකන්නන්ගේ ගණන 27 හා 24 තෙක් ඉහළ නැංගේය. මෙයට රත්නපුරයේ හිඟන්නන් 09 දෙනෙක්, මහරගම හිඟන්නන් 5 ක්ද දක්නා ලදී. 1970 - 71 වන විට රත්නපුරයේ හිඟන්නන් 176 ක්ද, මහරගම 54 ක් ද වූහ. මේ වර්ධනයට විවිධ හේතු මුල් විය. මේ කාලය වනවිට ආර්ථික පදුබෑස්ම නිසා බොහෝ පවුල් වලට වැඩිමහත් නෑදෑයන් නඩත්තු කළ නොහැකි විය. වැඩිමහත් නෑදෑයන් කියා මෙහි සීවේ තමන්ගේම පවුලේ (Nuclear, Family අණු පවුලේ) අය නොව මහ පවුලේ අයය. තමන්ගේ දෙමාපියන් හා බිරිඳගේ දෙමාපියන් හා මාමලා බාප්පලා මේ ගණයට අයත් වූහ. පවුලේ ප්‍රධානියාගේ ආදායම වෙනදා නඩත්තු කළ මේ වැඩිමහත් නෑදෑයන් නඩත්තු කිරීමට ප්‍රමාණවත් නොවිණ. ඉන් සිදුවූයේ එබඳු අය පවුලෙන් ගිලිහී හිඟමනට වැටීමය. රත්නපුරයේ සිටි 176 දෙනාගෙන් 34 ක් එවැනි අය වූ අතර, මහරගම 54 දෙනාගෙන් 13 දෙනෙක් ඒ ගණයට අයත් වූහ.

මේ කාරණය තවත් පැහැදිලි කර ගැනීමට 1970 - 71 දී මේ ප්‍රදේශ දෙකේ හිඟන්නන් අයිති පවුල්වල ප්‍රධානියන්ගේ ආදායම් තත්වය ගැන සොයා බලමු. මහරගම හා රත්නපුරයේ මේ 47 දෙනාම ආවේ මේ ග්‍රාමීය පවුල්වලිනි. එක් පවුලකටවත් නිෂ්පාදන වටිනාකමක් ඇති ඉඩම් නොතිබිණි. හිඟන්නෝ ඒ පවුල්වල සමීප නෑදෑයෝ වූහ. ඒ හැමදෙනෙක්ම (දෙදෙනෙක් හැර) වයසින් 50 ඉක්මවූ අය වූහ. යථෝක්ත දෙදෙනාගේ වයස අවුරුදු 27 ත් 31 ත් විය.

පහත සඳහන් සටහනෙන් මේ අයගේ ඥාති සම්බන්ධතා ගැන ඔබට අදහසක් ඇති කරගත හැකි වන්නේය.

නෑකම				
හිඟන්නන්ගේ ගණන	නාන්නාගේ/අම්මාගේ සොහොයුරු	පියා/ආච්චි	ඥාතිසොහයුරු සොහොයුරියන්	අවශේෂ (තමන්ගේ පියා මට ඇතුලුව)
47	09	13	12	13

1968 අවුරුද්දට පෙර මේ අය ජීවත් වූයේ තමන්ගේ පවුල් සමගය. (මේ අයගෙන් හත්දෙනා ගෙන් 12 ක් සාන්තාවෝ වූහ.) කලක් යනවිට පවුලේ තමාට කලින් ලැබුණු තැන හා ආදර සැලකුම් ක්‍රමයෙන් අඩුවන බව ඔහුට පෙනිණ. මීට අමතරව පවුල් 14 ක ප්‍රධාන ආදායම් උපදවන්නාට එක්කෝ තම ආදායම් මග (වෘත්තිය) අහිමි විය. නැත්නම් ඔහු මිය ගියේය. පවුලේ ඉතිරි අයට ඒ නිසාම ගමෙන් ඉවත් වන්නට සිදුවිය. නැත්නම් ගමේම වෙනත් තැනක් පදිංචි වන්නට කරුණු යෙදුණේය. මේ කාරණා නිසා පවුලේ මෙතෙක් රැදී සිටි වැඩිමහල් නෑදෑයන්ට තැනින් ඉවත් වී යෑමට සිදුවිය.

මේ 47 දෙනාගෙන් 36 ක් ලෙඩරෝග, අංග විකලතා ආදියෙන් පිරුණු අය වූහ. සමහරුන් ලෙඩ වූ විට ආරෝග්‍යශාලාවට ගෙනයන ලද්දේ වී නමුත්, පසු ගෙදර කරා ගෙන ගොස් නැත. තවත් අය ගෙදර ගියත්, ඉස්සර මෙන් පවුලේ සාමාජිකයන් ලෙස නතර වී සිටීමට ඔවුන්ට නොහැකි විය. ඒ නිසාම ඔවුහු යාචක ලෝකයට නිකම්ම තල්ලු වූහ.

මහරගම හා රත්නපුරයේ සිටි සිඟන්නන් 230 දෙනාගෙන් 47 දෙනෙක් වැඩිමහත් ඥාති සම්බන්ධ ඇති අය වී, කල්යාමේදී පවුලෙන් ගිලිහී යාචක ලෝකයට ආ අය බව අපි කියමු. ඉතිරි 183 දෙනාගේ තත්වය කුමක්ද? ඒ අය සිඟාකන්නට පෙළඹුනේ ඇයි? මේ 183 දෙනාගේ 50 දෙනෙක් ස්ත්‍රීහු වූහ. ඉතිරි අය පිරිමිය.

මේ 183 දෙනාගේ වයස් බෙදියෑම අනුව මෙසේ වර්ග කළ හැකිය.

අවුරුදු 75 ට වඩා	22
60 -75 දක්වා	58
50 - 59 දක්වා	73
40 - 49 දක්වා	16
40 අඩු	14

අවුරුදු 60 ට වැඩි අය දෙස බැලුවහොත් මොවුන් කොටස් දෙකකට බෙදා කළ හැකි බව පෙනේ. එබඳු අයගෙන් සමහරක් ඉඩකඩම් ආදී වස්තුව හිමිව උපන් අයයි. ඒ ඉඩකඩම් හා වස්තුව තම දරුවන්ට පැවරීමෙන් පසු ඒ දරුවෝ තම දෙමාපියන් අකාරුණික ලෙස අත්හැර දැමූහ. දරුවන් විසින් එසේ අත්හැර දැමුවා වූ පියෙකුගේ කතාන්තරයයි මේ:

'මම ගොවියෙක්. මට පුත්තු හතරකුයි, දූලා තුනකුයි සිටියා. මමත් බිරිඳත් අපට පුළුවන් හැම දෙයක්ම දරුවන් වෙනුවෙන් කළා. දරුවන්ට හොඳට උගැන්නුවා. ඒ අයට හොඳ රස්සාවල් ලැබුණා. ඒ අයගෙන් එක්කෙනෙක් හැර

අනික් හැම දෙනාම කසාද බැඳලා තියෙන්නෙ ගමෙන් පිට. වැඩිමහල් අය බන්දලා ඉවරවෙලා, ගමේ අපේ ගේ පුංචිම දුවට ලියලා දුන්නා. එයා කසාද බැඳලා, අපිත් බලාගෙන ඉඳියි කියලා අපි දෙන්නාම හිතුවෙ. නමුත් අපේ බලාපොරොත්තු කඩඋනා. බෑණා අපිට වෙනස්කම් කරන්න පටන් ගත්තා. මට මගේම ගෙදර ජීවත්වෙන්න බැරි තරමට තත්වය නරක් වුණා. ඒගොල්ල අපිට ගෙදරින් යන්න කිව්වෙ නැහැ. නමුත් අපට යන්න වෙන විදිහට ඒගොල්ලෝ වැඩ කළා. මගේ ගෑනි ලෙඩ උනාම ඒගොල්ල ඈව ඉක්මනට ඉස්පිරිතාලෙට ගිහින් දැම්මා. නමුත් අම්මා බලන්න ගියේ නැහැ. ඇයට සනීප වුනාම මම ලැජ්ජාවට ආපහු ගමට යන්න හිතුවෙ නැහැ. වතුමේ පුංචි රක්ෂාවක් සොයා ගන්න, ගෑනිත් එක්ක ජීවත් වෙන්නයි මගේ අදහස තිබුණේ. මෙ වත්තක් බලාගත්ත. නමුත් ගෑනි නිතර නිතර ලෙඩ වුන නිසා රක්ෂාවට යන්න බැරිව රස්සාව නැති වුණා. ඇය අන්තිමේ දුකසේ ඉඳලා මළා. අනික දරුවන් ළඟට මම ගියේ නැත්තේ ඒගොල්ලන් ඒ විදිහම නිසා. මම දැන් ජීවත් වෙන්නෙ හිඟා කාලා. දරුවන් ළඟට ගිහින් හැල්ලු වෙලා හිත නරක් කරගන්නවාට වැඩිය හොඳයි නේ, හිඟා කන එක.'

ගම්වල පරිසරයෙන් එහෙම පිටින්ම උදුරා වැටී නගරයට ගිහින් හිඟන්නන් වූ අයත් අප අතර ඇත. මොකක් හෝ හේතුවක් නිසා ගමෙන් ඉදිරි ඉවත විසිවීම නිසාම ඔවුහු නගරයට යති. නගරය තමයි ජීවත්වෙන්න හොඳ තැන කියා කල්පනා කරගෙනයි මෙසේ යන්නේ. නගරයේ කඩ සාප්පුවල, කර්මාන්ත ශාලාවල, ආරෝග්‍යශාලාවල, රජයේ කායාීලවල, වැඩපොළවල මොනවා හරි රැකියාවක් සොයාගත් නමුත් කලක් ඉන්න විට, විශේෂයෙන් වයසට යනකොට රස්සාව නැති වී යන්නේය. පවුල් බර උහුලාගන්න බැරිව හිඟන ලෝකයට වැටෙන ඔවුන්ට ආපසු ගමට යන්නත් බැහැ, නගරයේ හිටිය තැන ඉන්නත් බැහැ. වැනි තත්වයක්ය නිරායාසයෙන්ම ඇතිවන්නේ.

1973 ට පසු, තේවතුවල වැඩ කළ දෙමළ ජාතික කම්කරුවන් සෑහෙන ගණනක් මෙසේ වතුවලින් 'උදුරාලීම' නිසා හිඟන්නන්ගේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ නැංගේය. මේ කාලයේදී රත්නපුරයේ සිටියා වූ 622 ක් වන හිඟන්නන්ගෙන් 302 ක් ද්‍රවිඩ වූහ. අප 1970 - 71 ගැන කතා කරනවා නම්, එකල මෙහි සිටියේ දෙමළ ජාතික හිඟන්නන් 6 දෙනෙක් පමණි. තේ වතු ජනසතු කළේ මේ වකවානුවේදීය. වතුවලින් එහාට තල්ලු වූ විට ඉන්දියානු දෙමළ ජාතිකයන්ට එකම පිළිසරණ වූයේ හිඟාකෑමය. තමන්ගේ විශාල සංඛ්‍යාවක් දරුවන් ඉන්නා (5 කට වැඩි) පවුල් සමග ඔව්හු රත්නපුරයේත් ඉන් එහා නගරවලටත් ඇදී ගියහ. මහරගම වැනි තේ වතු ඉලක්කයෙන් ඈත නගරවලට ඔවුන් පැමිණියේ නැත. මහරගම මෙකල සිටි හිඟන්නන් 147 දෙනාගෙන් ද්‍රවිඩ ජාතිකයන් සිටියේ තිදෙනෙකු පමණි.

මේ යාචකයන්ගේ සමහර පවුල් ඔවුන් හිඟන වෘත්තීය අතහැර ආපසු එන්නේ නම් බාරගන්නට සූදානම් බව අපට කීහ. යාචකයන් එසේ කල්පනා කළේ නැත. දැන් හිඟන සමූහයා අතර ජීවත් වන්නට ඔවුන්ට අමුතු 'එක්වන්කමක්' ඒ සමූහයෙන් ලැබේ. ගමට ගියත් මේ පවුල්වල අය ඉස්සර තිබූ ලැදියාව සෙනෙහස යළිත් තමන්ට ලබාදෙතැයි ඔවුහු සැක කරති. ඉස්සරත් පවුලේ උදවිය තමන්ට පලා නොබෙදා පිටවී යන්නට තරම් තත්වයක් ඇති කළ සැටි ඔවුනට මතකය.

'අපි ආයි ගියත් ඔය ටික තමයි. දැන් ආපහු එන්න කියන්නේ ලෝක ලැජ්ජාවට. මිනිස්සු අහන නිසා 'කෝ අරයා දැන් හිඟා කනවා නේද' කියා. ඒ ගියත් ටික දවසක් සලකාවි. ඊට පස්සෙ වෙන්නෙ ඉස්සර වෙච්ච දේමයි. ලෙඩක් හැදුනාම ඉස්පිරිතාලෙට ඇද දමාවි. අපි බලන්න එන්නේ නැහැ. අපි ලෙඩ සනීප වුනාම යන්නෙ කොහාටද? කවිද අපිව පිළිගන්න ඉන්නේ? මැරෙනකන් මෙහෙම ඉන්න එක හොඳයි. ඔය පරණ දුක අපි ආයිත් විඳින්න ඕන නැහැ.'

9 යාචක ජනගහනය වර්ධනය වූ අන්දම (1960 - 1995 දක්වා)

පසුගිය දශක හතර තුළදී යාචක ජනගහනය ක්‍රමයෙන් වර්ධනය විය. එක්දස් නවසිය හැටගණන් වලදී රටේ ජනගහනය 10,382,000 ක් වන විට, අපේ නගරවල යාචකයන් 1046ක් දක්නට ලැබිණ. මීට ග්‍රාමීය යාචකයන් 500 - හෝ 600 ක් එකතු කළ විට ඒ කාලයේ පූර්ණ යාචක ජනගහනය පිළිබඳ හැඟීමක් ඇති කරගත හැකිය. කුල යාචක ගණයෙහිලා ගිනිය හැකි රොඩී මිනිසුන් ද (1967 දී 3400කි) එකල වාසය කළ බව අප අමතක නො කළ යුතුය.

එක්දාස් නවසිය හැත්තෑ ගණන්වල ආරම්භයේදී මෙරට යාචක ප්‍රමාණය 13, 286 ක් විය. මේ සංඛ්‍යාව 1972 - 76 කාලය තුළත්, 1976 න් පසුවත් ඉතා ශීඝ්‍රව වර්ධනය වූයේය. මගේ ක්ෂේත්‍ර අධ්‍යයනය අවසන් වූ 1976 - 77 වකවානුව ළඟාවන විට මේ රටේ යාචක සංඛ්‍යාව 24, 9484 ක් විය. මුළුරට දූරාම විසිර සිටි මගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා සර්වෝදය ස්වේච්ඡා සේවකයන් ලවා එකල සෑම ගමකම, නගරයකම හිඟන්නන් ගණන් කරන්නට මට හැකිවිය. මේ සංඛ්‍යාව මනාව පුහුණු කළ මගේ පශ්චාත් උපාධි පර්යේෂකයන් ලවා යළිත් නිධුණු සෝදිසියට භාජන කරන ලදී. ශ්‍රී ලංකාවේ මේ කාලයේ ජනගහනය 1971 දී 12,690,000ක් බවත් 1981 දී 14,347,000 ක් බවත් මතක තබා ගැනීම ප්‍රයෝජනවත්ය.

1987 කාලය වනවිට අපේ පූර්ණ ජනගහනය 16,361,000 ක් විය. මෙසේ ජනගහනය වැඩිවීම නිසා මෙන්ම, ඒ ඒ රජයන් අනුගමනය කළ අදූරදර්ශී දේශපාලන වැඩ පිළිවෙල නිසා, ඇතිවූ ප්‍රතිඵල භයානකය. සමහරවිට ඒ ඒ ආණ්ඩු මේ ආකාරයේ සමහර පියවර ගත්තේ ඉතා පිරිසිදු අදහසින් වුවත්, ඒවායේ සමාජීය බලපෑම ඉතා කණගාටුදායක විය. ඉන් සිදුවූයේ සමාජය එක්තරා අන්දමක විසංවිධානයකට භාජනය වීමයි: යාචක සංඛ්‍යාව වර්ධනය වීමයි.

අපේ පූජනීය ස්ථාන දිහා බැලුවොත් යාචක සංඛ්‍යාව වැඩිවූ සැටි අවබෝධ කරගන්නට පුළුවන. බෞද්ධ මෙන්ම ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් ජනප්‍රිය පූජනීය ස්ථාන යාචකයන්ගේ කේන්ද්‍රස්ථාන විය. අනුරාධපුරයේ 1962 දී 102 ක්ව සිටි හිඟන්නන්ගේ ගණන 1976 - 78 දී 622 ක් බවට පත්විය. කතරගම 1962 සිටියේ 88කි: 1976 - 78 වනවිට 671කි. මේ අන්දමින් තලවිල, මුන්නේශ්වරම, බෙල්ලන්විල, කැළණිය, කොච්චිකඩේ, කළුතර, බදුල්ල, ඇස්වාටුවුව දඹගහ යන ස්ථානවල පිහිටි බෞද්ධ, ක්‍රිස්තියානි, මුස්ලිම් පූජනීය ස්ථානවල යාචක සංඛ්‍යාව පුදුමාකාර ලෙස ඉහළ නැංගේය.

එක්දාස් නවසිය හැටගණන්වල හා හැත්තෑගණන්වල යාචක ජනගහනයේ ප්‍රධාන ලක්ෂණ ගැන මදක් විමසා බලමු. හැටගණන්වලදී නගරවල ජීවත්වූ 046 ක් වූ හිඟන්නන්ගේ ස්ත්‍රීන් සිටියේ හතරෙන් එකක් පමණි. ග්‍රාමීය ප්‍රදේශවල ස්ත්‍රී යාචකයන් දක්නට ලැබුණේම නැත. ඉඳහිට ළමයෙක් යාචකයන් අතර සිටියත් ඒ දරුවා බොහෝවිට අබ්බගාතයෙක් විය. හිඟාකෑම ළමයින්ට මෙන්ම තරුණ වයසේ අයටද නොගැලපෙන කාරියක් ලෙස සලකනු ලැබූ නිසා ළමයි හා තරුණයන් මෙකල හිඟන්නන් අතර දක්නට නොලැබිණ.

හැටගණන්වල අග හා හැත්තෑගණන් වනවිට මේ තත්වය වෙනස්විය. 1966-67 දී යාචක ජනගහනයෙන් සියයට හතළිහක් ස්ත්‍රීහු වූහ. මීට පෙර ග්‍රාමීය ප්‍රදේශවල ස්ත්‍රී යාචකයන් නොසිටියත්, හැටේ දශකයේ අග වනවිට එවන් අය විශේෂයෙන්ම මැහැලි යාචකයන් ගම්වලත් දකින්නට ලැබිණ. 1976-77 වනවිට පිරිමින්ගේ ගණනටම සමාන වන ස්ත්‍රී යාචක සංඛ්‍යාවක් අපේ හිඟන ලෝකයට එරුම විය.

මා කලින් කිවා සේ තරුණ වයසේ අය නම් එක්දාස් නවසිය හැටගණන්වල මුලදී බෙතකටවත් හිඟන්නන් අතර සොයාගත නොහැකි විය. නැටවර හෝ තරුණ අයෙක් සිටියේ නම් ඒ නැනැත්තා ආබාධිත තත්වයට පත්වූ අයෙකි. හැත්තෑවේ දශකයේ තරුණ යාචක පිරිස පුදුමාකාර ලෙස වර්ධනය විය. 1963 - 64 දී නගරවල අප කළ අහඹු නියැදි සමීක්ෂණයකදී හමුවූ නැටවර හා තරුණ වියේ අය යාචක පිරිසෙන් සියයට 12 ක් පමණ විය. මේ හැම කෙනෙක්ම පාහේ ආබාධිත හෝ රෝගී අය වූහ. 1972 - 73 දී මේ සංඛ්‍යාව සියයට 35ක් විය. එබඳු අය අතර අඩක් පමණ කිසිදු අසනීපයක් ආබාධයක් නැති තරුණ - තරුණියෝ දක්නට ලැබිණ. 1976 - 77 දී මේ තරුණ ජනගහනය තවත් සියයට 1 කින් වර්ධනය වූයේය. යාචකයන්ගේ බෙදී යාම වයස අනුව මේ ආකාරයෙන් දැක්විය හැකිය.

වයස	1963-64	1976-77	1994-95
10ට අඩු	01	08	09
11 - 19	05	16	17
20 - 30	07	19	20
31 - 50	22	32	24
51 - 70	43	16	20
70ට වැඩි	22	09	10

1963 - 64 යුගයේදී සියයට 65 ක් ව සිටි වයසක යාචකයන්ගේ ප්‍රමාණය 1976 - 77 වනවිට සියයට 25 ක් දක්වා පහළ වැටිණි. මීට හේතු දෙකක් ප්‍රධාන විය. 1971 දී ඇතිවූ තරුණ කැරැල්ල නිසා වීදිවල හිඟාකෑම හා ජීවත්වීම කළ නොහැකි විය. රජය මගින් ඉදිරිපත් කළ සහනාධාර නිසා හිඟා නොකා ජීවත්වීමට බොහෝ මහලු අයට හැකිවීම දෙවැනි හේතුවය. 1994-95 වනවිට වයසක යාචක ජනගහනය සියයට 30 ක් බවට පත්විය. මෙය මෙසේ සිදුවූයේ මේ කැරැල්ල 1987 - 89 කාලයේදී තවත් තරුණ කැරැල්ලක් රටේ පැවැති අතරය. මේ කැරැල්ල මැඩීමට රජය ගත් පියවර නිසා වීදිවලින් යාචකයන් අතුගාදැමී ගියේය. තමුත් වයසක අයට ඇති පිළිසරණ අඩුවීමෙන් හා ආර්ථික - සමාජ සාධක ඒ අය පහළම තලයෙන් යාචක ලෝකයට තල්ලු කිරීමෙන් සිදුවූ ප්‍රතිඵලය මෙසේ මහල්ලන් හිඟන්නන් අතර ගණනින් වැඩිවීමය. ක්‍රි.ව. 2000 වනවිට මේ තත්වය

ඉතා බරපතල වනු ඇත. අපේ මහලු අයට මීට වඩා සානුකම්පිත වැඩ පිළිවෙලකින් ඔවුන්ගේ ප්‍රශ්න විසඳාගැනීමට මාර්ගය සලසන්නට අප උනන්දු නොවුවහොත් විසිඑක්වැනි ශතවර්ෂය ළඟාවනවිට මේ කාරණය අපට බරපතල සමාජ ප්‍රශ්නයක් බවට පත්වනු නොඅනුමානය.

ග්‍රාමීය පසුබිමින් ගත් අහඹු නියැදි සමීක්ෂණයක ක්‍රමයෙන් වර්ධනය වූ ගැමි හිඟන ජනගහනයේ ප්‍රතිශතය පිළිබිඹු කරන්නේ මේ අන්දමිනි. මේ නියැදිය තෝරාගත්තේ ගම් 216 කිනි.

වයස	1963-64	1976-77
10ට අඩු	-	02
11 - 19	-	09
20 - 30	02	12
31 - 50	31	28
51 - 70	39	28
70ට වැඩි	28	21

1976 - 77 වකවානුවේදී මේ අහඹු නියැදි සමීකරණය සඳහා ගම් 1500 ක් තෝරා ගත්තෙමි. එසේ කළේ අහඹු නියැදියෙන් ලත් දත්ත සෝදිසි - මාදිසියකට ලක් කොට ඒ නියැදියේ නිවැරදි බව වටහාගැනීමට අප තෝරාගත් ගම්වලින් 163 ක එකද යාචකයෙක්වත් දක්නට නොලැබිණි. යාචකයන් හඳුනාගැනීමට ලේසිවනු සඳහා මෙන්ම ඒ ඒ අය වයස අනුව ඛෙදා ගැනීම උදෙසා පහත සඳහන් පළල් වර්ග ලක්ෂණ සිත තබාගන්නට සමීක්ෂකයනට උපදෙස් දුනිමි.

(1) ළදරුවන් (2) ළමයින් (3) තරුණයන් (4) මැදිවයසේ අය (5) මහලු අය (6) ඉතා මහලු අය හා රෝගාතුර වූ අයද වූහ. මෙහිදී අවුරුදු 60ට වඩා වයස යාචක උදවියගේ ගණන ක්‍රමයෙන් වැඩිවන බව පෙනී ගියේය.

යාචකයන් අතර සාක්ෂර බව ඉතා අඩුය. අකුරු උගෙනීමට හා කියවීමට දත් ස්වල්ප දෙනාට පවා දැන් එය අමතකවී ගොස් ඇත. වැඩිදෙනෙක් කිසිදු කුශලතාවකට හිමිකම් නොකියති. පොතක්, පත්‍රයක් කියවා විවේකය ගත කරන එක් අයෙකු පමණි මගේ පර්යේෂණ කාලය තුළ දුටුවේ. ඒ බොතේජු ආතාය. මේ තැනැත්තා ගැන මගේ 'තුංකුම වන්දන' පොතේ (පිටු 71 - 72) මා විසින් සඳහන් කොට ඇත.

1976 - 77 අවුරුද්දේ අගනුවර ජීවත් වූ යාචකයන් අතර අහඹු නියැදියකින් සමීක්ෂණයක් කළෙමු. අපට අවශ්‍ය වූයේ මේ අයගේ අධ්‍යයන පසුබිම ගැන දැන ගැනීමය. මීට හිඟන්නන් පන්සියයක් ඇතුළත් විය. ඒ අතරින් අප සොයාගත් තොරතුරු මෙසේය.

	සියයට ගණන
කියවීමට ලිවීමට නොදත් අය	26
කියවීමට ලිවීමට උගත් නමුත් පාසලේ 6වන:	
පංතියෙන් එහාට නොගිය අය	63
දහවැනි පංතිය දක්වා උගත් අය	08
උසස් අධ්‍යාපන සහතික තත්වයට (සාමාන්‍ය)උගත් අය	03

මෙහිද පවා ස්ත්‍රීන් සිටියේ පුරුෂයන්ට වඩා පහළ තත්වයකය. නිදර්ශනයක් ගතහොත් ලියන්ට කියන්ට නොදත් සියයට 26ක ගෙන් සියයට 21 ක් ස්ත්‍රීන්ය. එස්දාස් නවසිය හැටගණන්වල මුල හා අග යාචකයන්ගෙන් ඉතා ස්වල්ප ප්‍රතිශතයක් හැර අන් සියලු දෙනාම ලියන්නට කියන්නට නොදත් අය වූ බව මතක තබා ගතයුතුය.

1981 දී මුලුරට පුරාම අහඹු නියැදි සමීක්ෂණයක් අප විසින් කළේ මේ අධ්‍යාපන සාධකය සිත තබාගෙනය. අප මෙහිදී ඇසූ සරල ප්‍රශ්න කීපයක් විය. (1) පාසැල් ගියා ද? (2) දැනවත් ලියන්න කියන්න පුළුවන් ද? (3) දරුවන් පාසැල් යනවා ද? (4) එහෙම නැත්නම් දරුවන් පාසැල් යන්නට කැමති ද?

මේ සමීක්ෂණයට ගිහන්නන් 2000ක් පමණ ඇතුළත් විය. අප ලැබූ උත්තර මෙසේය.

	ඔව් නාගරික	ග්‍රාමීය	නැහැ නාගරික	ග්‍රාමීය
පාසැල් ගොස් ඇත.	64	16	36	84
ලිවීමට/කීමට දැනුත් පුළුවන	28	03	72	93
ළමයි අද පාසැල් යවයි	-	-	-	-
එසේ පාසැල් යවන්න කැමති ද?	02	-	98	100

යාචකයන් අතර කුමන ආකාරයේ කුශලතා දක්නට ලැබේ ද? මේවා වැඩි දියුණු කොට මවුන්ගේ ප්‍රයෝජනය සඳහා යොදාගත හැකි ද? මගේ දීර්ඝකාලීන අත්දැකීම් තුලින් මම, මා හා සම්බන්ධ වූ විශාල යාචක සංඛ්‍යාව අතර පහත සඳහන් කුශලතා ඇති අය දුටුවෙමි.

විදුලි කාර්මිකයන්	26
පයිප්ප වැඩකරුවන්	02
වඩුවන්	39
කම්මල්කාරයන්	09
මේසන්වරු	42
මෝටර්රථ කාර්මිකයන්	22
කාර්මිකයන් (වෙනත්)	18
මීට අමතරව යම් යම් කුශලතා ඇත්නම් ඒ අය	16

මේ සියලු දෙනාගේ ගණන 174කි. මෙබඳු අය යාචක ජනගහනය අතර මට මුණ ගැසුණු නැනැත්තන්ය. මීට අමතරව කලක් ගොවිතැන් කළ ගොවියන්, රියදුරන් ආදී මිනිසුන් ඔවුන් අතර ඇත. බොහෝ විට එවන් ඵලදායී ජීවන කුශලතා නැතිවී ගියේ හදිසි අනතුරකට භාජනයවීමෙන් වැනි අවාසනාවන්ත අවස්ථා මතුවීම නිසාය.

යාචක ජනගහනයෙන් 1000 ක් පළිත් අහඹු නියැදියකට ගෙන මම මේ ප්‍රශ්න ඇසුවෙමි.

1. ඔබ සතු කුශලතාවක් ඇද්ද?
2. ඔබ එය ප්‍රයෝජනයට ගන්න කැමති ද?
3. අවස්ථාව දුන්නොත් ඔබ අලුත් කුශලතාවන් ඉගෙන කැමති ද?

මගේ යාචක නියැදිය තෝරාගත්තේ සියලුම නගර (කොළඹ - මධ්‍ය ප්‍රමාණයේ හා කුඩා නගර) ඇතුළුව, ගම් 1500 කිනි. මට ලැබුණ ප්‍රතිචාරය මෙසේය.

ප්‍රශ්නය	ප්‍රතිශතයන් නාගරික	ග්‍රාමීය
1.	12 (ඔව්) 81 (නැහැ)	4 (ඔව්) 63 (නැහැ)
2.	36 (ඔව්) 49 (නැහැ)	7 (ඔව් 58 (නැහැ)
3.	10 (ඔව්) 43 (නැහැ)	03 (ඔව්) 82 (නැහැ)

(ඉතිරි අය උත්තර දුන්නේ නැත)

අපේ යාචකයන් රටේ ජීවත්වන සෑම මිනිස් කොටසකටම හා ආගමකටම අයත්ය. 1973 -74 කාලය තුළ යාචක ජනගහනයෙන් 68.02% ක් සිංහල බෞද්ධයෝ වූහ. 3.03%ක් සිංහල කතෝලික හා ක්‍රිස්තියානි අයය. 7.05%ක් මුස්ලිම් විය; සියයට 15 ක් හිංදු දෙමළ වූ අතර, සියයට 4.02 ක් දෙමළ ක්‍රිස්තියානි විය. ඉතිරි අය අවශේෂ කණ්ඩායම්වලට අයත් වූහ. ඉතා පළල් වශයෙන් ශ්‍රී ලංකාවේ පොදු ජනගහනය හා ජනගහන බෙදීම ජාති, ආගම් වශයෙන් යාචක ජනගහනය තුළත් දැකගන්නට පුළුවන.

1976 - 77 වන විට ලංකාවේ හිංදු ක්‍රිස්තියානි දෙමළ යාචක සංඛ්‍යාව වර්ධනය විය. මේ කාලයේදී ඒ යාචකයන්ගෙන් අඩකට වඩා දෙමළ අය වූහ. උඩරට තේ හා රබර් වතු වල වැඩකළ අය වතු ජනසතු කිරීම හා ඉඩම් පනත නිසා තමන් වාසය කළ ස්ථානවලින් ඉවත්ව ගොස් යාචක ජීවිතයට වැටුනාහ.

මේ අය තේ - රබර් වතුවලින් සංක්‍රමණය වූයේ අසල නගරවලටය. ඒ නිසා රබර් - තේ වතුවලට යාබද නගරවල යාචක ජනගහනය වැඩිවිය. නිදර්ශනයක් වශයෙන් ගතහොත් අවිස්සාවේල්ල ප්‍රදේශයේ යාචකයන් 216 ක සිට 800 දක්වා තාවකාලිකව වැඩි වූයේ මේ කාලයේදීය. ගම්පල 118 සිට 192 දක්වා, හැටන්හි 55ක් ද, 89 සිට 1471 දක්වාද, ගිනිගත්හේනේ 31 සිට 47 දක්වා ද මේ සංඛ්‍යාව ඉහළ නැගිනි. ජනාවාස, ආගමික සිද්ධස්ථාන මේ ආදියේදී හිඟන්නන්ගේ ගණන වැඩිවියැයි මීට ඉහත මතක් කළෙමු.

කොළඹ නගරය තුළ 1970 - 78 කාලයේදී දෙමළ යාචකයන්ගේ ප්‍රමාණය සියයට 26.8 දක්වා නැංගේය. මින් වැඩිදෙනෙක් තේ හා රබර් වතුවලින් සංක්‍රමණය වූ දෙමළ ජාතිකයින් විය. ක්‍රිස්තියානි පල්ලියක් වූ කොච්චිකඩේ පල්ලිය අසල පමණක් අලුතින් මේ කාලයේ එකතුවූ දෙමළ යාචකයින්ගේ ගණන 260 ක් විය.

1983 දී ඉතා ස්වල්ප, නමුත් සංවිධානයවූ සිංහල පිරිස් යැයි කියන අය ඇතිකළ (නමුත් මේ අය අතර සිංහල, දෙමළ මෙන්ම මුස්ලිම් මැරයෝද වූහ) ජාතිවාදී ප්‍රචණ්ඩ ක්‍රියා නිසා, දෙමළ ජාතික යාචකයන් වැඩිදෙනා උතුරු පළාතට ගියහ. සංවිධානාත්මකව ඔවුන් වවුනියාව ආදී ප්‍රදේශවල පදිංචි කිරීම දෙමළ ජාතිවාදී කොටස් වෙතින් සිදුවිය.

දකුණේ ජාතිවාදී - ත්‍රස්තවාදය මතුවීමත් සමග අනාථවූ සැහෙන සංඛ්‍යාවක් දකුණ බලා ආයේය. අනාථ කඳවුරුවල හා ස්වකීය නෑ මිතුරු ගෙවල් වල මේ අය නතර වූහ. මෙබඳු අයගෙන් කොටසක් යන එන මං නැතිව හිඟන ලෝකයට ප්‍රවේශ වූහ. අබ්බගාතයන්, කාන්කවරුවන් නැති ළමයි, පිළිසරණක් නැති මැදිවියේ හා මහළු වියේ අය මේ අතර දක්නට ලැබිණ.

1988 - 89 තරුණ කැරැල්ල නිසා වීදිවල යාචකයන් අන්තිමට අතුගෑවී ගිය හැටි කලින් සඳහන් කළෙමු. එහෙත් ඊට ටික කාලයකට පසු හිඟන්නෝ යළිත් තම කටයුතු පටන්ගත්හ. සංචාරක ව්‍යාපාරය ඔවුන්ගෙන් සමහරුනට ඵලදායී ක්ෂේත්‍රයක් විය. නගරයට ඇදී එමට අදත් ගමේ මිනිසුන් අතර බලවත් ආශාවක් පවතියි. එසේ නගරයට සංක්‍රමණය වී අතරමංවූ විට මේ අය අනිවාර්යයෙන් වැටෙන්නේ යාචක ලෝකයටය. 1976 කොළඹ නාගරයේ වාසය කළ යාචක ජනගහනයෙන් සියයට 56ක් පසුගිය අවුරුදු පහේදී ගමෙන් නගරයට පැමිණි අය විය. නගරයේ අවුරුදු පහලොවකට වඩා ජීවත්වූ යාචකයන් සිටියේ සියයට 3 ක් පමණි. ක්‍රි.ව. 2000 වනවිට අපේ යාචක ජනගහනය මීට වඩා බෙහෙවින් වැඩිවනු ඇතැයි මම සිතමි.

වර්තමානයේ 1976 වාසය කළ යාචක ජනගහනය මෙන් දෙගුණයක් හිඟාන්නන් අපට ඇත. තව වසර පහකදී මේ අයගේ ගණන දෙගුණ වේද? නගරයට ගමෙන් සංක්‍රමණය වීම, රජයෙන් ලබා දෙන සහනාධාර නපාදැමීම, ජීවන වියදම ඉහළ යෑම ආර්ථික - සමාජ පහළ තලයේ අය යාචක ලෝකයට වැටීම, යුද්ධයෙන් හා කැරලිවලින් අනාථ අබ්බගාත වීම, වයස්ගත අයට පිළිසරණක් නැතිවීම ඉතිරි වසර පහ තුළ යාචක ප්‍රමාණය වර්ධනය වීමෙහිලා කෙලින්ම බලපාන සාධක වීමට ඉඩ ඇත.

10 යාචකයන්ගේ ලිංගික ජීවිතය

යාචකයන්ගේ ලිංගික ජීවිතය මහා සමාජයේ කෙනෙකුට නොපෙනෙන තරම්ය. යාචකයෙකුටම මිස ඒ ජීවිතය දැක ගැනීමට බාහිර අයෙකුට කළ නොහැකිය. වැඩි දෙනෙක් ජීවත් වන්නේ කඩපිල්, අම්බලම්, පාරවල් අද්දර හා එළිමහනේම නිසා යාචකයන් කුමන ආකාරයෙන් තම ලිංගික කටයුතු කරනවාදැයි දැක ගැනීම සඳහා කල් ඔවුන් අතරම ජීවත් විය යුතුය.

මුල් කාලයේදී අප දුටු යාචකයන්ගෙන් වැඩි හරියක් මහලු, අබල දුබල පුරුෂයන්ය. ස්ත්‍රීන්ද ඊට කලකට පසු දුටුවේ ඒ අන්දමින් මහලු හා අබල දුබල තත්වයට ළඟා වූවාට පසුවය. ඒ අය අතර ලිංගික ආකර්ෂණයක් තිබීම හෝ ලිංගික සම්බන්ධතා දැක ගැනීමට නොතිබිණ. ලිංගික ජීවිතයක් කියා යමක් එකල තිබුනේ මැදි වයසේ, පවුල් වශයෙන් බැඳී සිටි යාචකයන් අතර පමණය.

'විවාහයක් චාරිත්‍රගතව ඔවුන් අතර සිදුවනු අප දැක නැත. සාමාන්‍ය ජීවිතයේ විවාහ වූ පවුල් යාචක ලෝකයට එක්වීම සිරිත විය. එකල ඒ පවුල්වලද වාසය සිදුවූයේ අම්බලම, ගරාවැටුන ගොඩනැගිල්ල වැනි තැනකය. එබඳු තැන්වල රාත්‍රී කාලයේ අඹුසැමියන් එකතුවීම සාමාන්‍ය දෙයක් විය. කඩපිලක නම් මහජනයා දකින්නට නැති මහ රෑ යාචක ස්ත්‍රීන් හා පුරුෂයන් එකතුවීම සිදුවිය.

වරක් එකල පාර්ලිමේන්තුව වූ දැනට ජනාධිපති ගොඩනැගිල්ල ඉස්සරහ මහ රෑ යාචකයන් කිහිප දෙනෙකු සමග මමද සිටියෙමි. අද මෙන් මුරකාවල් හෝ ආරක්ෂක සංවිධාන එකල නොවීය. පඩිපෙළ ඉස්සරහ රාත්‍රියේ යාචකයන් තුන් හතර දෙනා නිදාගෙන සිටියහ. වරක් පොලිසියේ නිලධාරීන් කිහිප දෙනෙක් මේ පඩිපෙලට විදුලි පන්දම් එළිය අල්ලන විට මැදි වයසේ යාචක ස්ත්‍රී පුරුෂ දෙන්නෙක් සංසර්ගයෙහි යෙදී සිටියහ. විදුලි එළිය නිසා ලැජ්ජාවට පත් ඔවුන් කීවේ 'මහත්තයෝ, අපි නිදාගන්නෝ' කියාය. රාලහාමිලා දෙන්නා එතැනින් වහා ඇදී යනු මට මතකය.

ලිංගික සම්බන්ධතා ඔවුනට ඇති කරගත හැක්කේ මෙබඳු අවස්ථාවල පමණය. ඊට තරමක ඉඩකඩක් වත් ලැබෙන එකම තැන අම්බලමය, නැත්නම් පාර අද්දර පොල් අතු කැලි කීපයක් දවටා හදාගත් (වර්තමානයේ නම් ඉටිරෙදි වලිනි.) තවාතැනය. අනික් හැම තැනකම මේ කාරිය සිදුවන්නේ මහ රෑ ය: ඉතා ඉක්මනින්ය. එය නිවිහැනහිල්ලේ සිදු කරගන්නට මොනම් මගක්වත් මේ අයට නැත. ඒ අතින් ඔවුහු මහමග සුනඛ ආදී තිරිසනුන්ටත් වඩා ශෝකජනක තත්වයක සිටිත්.

එක්දහස් නවසිය හැත්තෑ ගණන්වන විට ස්ත්‍රීන් හා දරුවන් යාචකයන් අතර වැඩිවිණ. යාචක බවට පත් පවුල්ද ගණනින් වැඩිවන්නට පටන් ගත්තේය. තරුණ හා මැදිවයසේ ගැහැනු මිනිස්සු යාචක ලෝකයට වඩවඩා අවතීර්ණ වන්නට වූහ. ලිංගික ජීවිතය පිළිබඳ ගැටලු බහුල වශයෙන් පැන නගින්නට වූයේ මේ අවස්ථාවේදීය. ඒවා විසඳා ගැනීම මේ අයට ඒ තරම් ලේසි වූයේ නැත.

මහලු දුබල පවුල් වලට වඩා ලිංගික ක්‍රියාත්මක බවට හැකියාව ඇති මැදි වයසේ පවුල්වල අය හා තරුණ අය රාත්‍රිය ළඟාවුන විට කඩවීදියේ, පාර අයිනේ ආදී ඕනෑම තැනක තම ආශාවන් සංසිඳවා ගත්හ. මේ හැසිරීම් රටාව ඔවුන්ගේ කුඩා දරුවන්ට අමුතු දෙයක් නොවිණ. ඒ අය යාචක සංස්කෘතියට සමාජානුයෝජනය වූයේ මෙවැනි සිද්ධීන් සිත පුරා ඇස පුරා දැක බලාගනිමිනි.

අම්මා හා තාත්තා මෙබඳු විදියට හැසිරෙනු පමණක් නොව සමහරවිටක අන්‍යයන්ද මේ කටයුතු කරනු ඔවුන්ට පෙනිණ. කාමමිථ්‍යාචාරය හිඟන්නන් විසින් අනුමත නොකෙරුණත් තම ස්වාමිපුරුෂයා හා බිරිඳ වෙනුවට අන් අය සමග කාම සම්බන්ධතා ඇති කරගත් අය ඔවුන් අතර වූහ. පරිසරය හා අවස්ථාව ලැබීම මෙවන් කටයුතුවලට පෙළඹීමට හේතුව විය.

අවට සමාජයේ සමහරු තරුණ යාචක ස්ත්‍රීන් හා සම්බන්ධතම් වඩාගත්හ. විශේෂයෙන්ම නගරයේ කඩපිල්වල ඉන්නා අවිවාහක හා විවාහක තරුණ හා මැදිවියේ අය මුදල් හදල් දී ස්ත්‍රීන් රවටාගෙන ලිංගික තෘප්තිය ලබාගත්හ. සමහර තරුණ යාචකයන් මත්පැනට හා මත්ද්‍රව්‍ය වලට වහල් වීම නිසා තම බිරින්දෑවරු ලිංගික තෘප්තිය උදෙසා අනුන්ට ලබාදීම ගැන ඔවුන් විරුද්ධ වූයේ නැත. මේ මත්ද්‍රව්‍ය ලෝලයන්ට අවශ්‍ය වූයේ කෙසේ හෝ තමන්ගේ ඇබ්බැහිය උදෙසා මුදල් ලබාගැනීමය.

තවත් අවස්ථාවල මානසික දුබලතා ආදියෙහි පෙළෙන යාචක ස්ත්‍රීන් නගරයේ විවිධ අය විසින් දූෂණය කරනා ලදී. ඒ දුගී අයට ඒ ගැන කාටවත් කීමට හෝ පොලීසියට පැමිණිලි කිරීමට මගක් නැතිවිය. ඔවුන් ගැබිනි වී දරුවා ලැබෙන තෙක් හිඟමනේ යෙදෙන සැටිත්, දරුවා ලැබුණු වහාම ඕනෑ කාට හෝ පවරා යලිත් පරණ ජීවිතයට එන හැටිත් අපට ප්‍රකාශනය විය.

තනිවම ඉන්නා කාන්තාවන් මැදිවියේ වුවත් තරුණ වියේ වුවත් නිතරම ලිංගික අනතුරට වැටෙන බව පැහැදිලිය. 1976-77 වර්ෂ වලදී කොළඹ නගරයේ එබඳු තනියම හිඟාකන තරුණ හා මැදිවියේ ස්ත්‍රීන් 286 ක් අපට දැකගත හැකිවිය. මින් සමහරක් ගෙවල්වල වැඩකාරකමට විත් දූෂණය කරනු ලැබ, දරුවන් ලැබ, අනේක විධ දුක්ගැහැට මැද අවසානයේ යාචක තත්වයට ඇද වැටුන අයයි. දෙවැනි කොටස ගණිකා වෘත්තියේ යෙදී කලකට පසු ඒ කටයුත්ත කර කියා ගන්නට නොහැකිව යාචකයන් වූ අයයි. තුන්වැනි කොටස යම්කිසි මානසික හේතුවක් නිසා ගම්බද නිවාසවලින් පැන නගරයට ආ අයයි.

යාචක කාන්තාවන් ගැන කතා කරන විට ඉහත කී 'තුන් කොටස ඉතාමත් වැදගත්ය. අද අපේ නගරවල ඉහළ හා මධ්‍යම පංතියේ ගෙවල්වල වැඩකාරකමට ඉන්න ස්ත්‍රීන්ට ඉතා හොඳින් වැටුප් ගෙවන, සලකන තැන්ද ඇත. ඒ අතරම හිරිහැර කරන, වැටුප් නොගෙවන, ලිංගික අතවරවලට ලක් කරන ගෙවල්ද ඇත. කාලයක් ගෙයින් ගෙට ගොස් මෙසේ ලිංගික අතවරට ලක් වූ කාන්තාව අන්තිමේ වැටෙන්නේ යාචක ලෝකයටය. එහිදීත් ඇය ලක්වන්නේ පෙර කී අන්දමේ ලිංගික අතවරයටමය.

ගණිකා වෘත්තියට එළඹෙන වැඩිදෙනෙක් මේ වෘත්තිය තෝරාගන්නේ සිය කැමැත්තෙන් නොවේ. තමන්ට ඒ කාරියේ යෙදෙන්නට බලකරන්නාවූ සමාජ, ආර්ථික, මානසික ආදී බලපෑම් නිසාය. ගණිකා වෘත්තිය නියැලීමද හැමදාම කළ නොහැකිය. අසනීපයක් ලෙඩක් වී දීර්ඝ කාලයක් වෘත්තියෙන් ඈත් වූ විට, වෘත්තියේ සංවිධායකයන් තරහ කරගත් විට, පෙර තිබුන ලිංගික ආකර්ෂණය නැති වූ විට ඒ කාන්තාව ඇද වැටෙන්නේ යාචක ලෝකයටය. පළමු කී අයට මෙන්ම මෙහිදී ඇයටද සිදුවන්නේ ලිංගික අතවර වලට මුහුණපෑමටය.

තුන්වැනි කොටස අතිශයින්ම කණගාටුදායක වන්නේ මානසික රෝගීන් නිසාය. ඔවුන්ට කවදාවත් ගණිකා ලෝකයේ වාසය කරන්නට බැරිය. සමූහයක් හැටියට යාචකයන් අතර සිටින්නටද නොහැක. මානසික රෝගී පිරිමියෙක් නම් තැනින් තැන ඇවිද ජීවත් වන්නට පුළුවන් වුවත්, ගැහැනියක් නම් සිදුවන්නේ හැකිතාක් ලිංගික අතවර වලට ලක්වීමය. කොළඹට තුදුරු නගරයක මෙසේ ජීවත් වූ මානසික ආබාධිත ගැහැනියක් ඒ නගරයේ ප්‍රසිද්ධ මුදලාලි කෙනෙකු විසින් කිහිපවරක් දූෂණය කොට, ආබාධිත දරුවන්ද ලැබ සිටි බව මා දැක ඇත. මහනුවර ප්‍රදේශයේ හිඟන කාන්තාවන් හතර දෙනෙක් (35-47 වයස් ගණන්) දරුවන් ප්‍රසූත කළේ, ඔවුන් කිපදෙනෙකුන් විසින් දූෂණය කරනු ලැබුවාට පසුවය. ඉන් අයෙක් පොලිස් භටයෙකු විය, දෙවැන්නා ගුරුවරයෙක්, අනෙක් දෙන්නා සුලු වෙළඳුන්ය.

තරුණ හා මැදිවියේ කාන්තාවන්ගේ ලිංගික ජීවිත බලහත්කාරකම් මුල්කරගත් එකකි. යාචකයන් අතර ඔවුන්ට ඉඩ දුන්නත් ඒ සමූහයෙන් ඈත් වූ විට මේ අයට ආරක්ෂා සපයන කෙනෙක් නැත. කොළඹ නගරයේ අප සඳහන් කළ 286 ක් වූ මෙබඳු ස්ත්‍රීන්ගෙන් 62 දෙනෙක් අපි ඉතා සමීපව කරුණු සෙව්වෙමු. එයින් 47 දෙනෙකුම ගැබ් ගත්තේ හිඟන්නන් අය බලයෙන් දූෂණය කරන ලද

නිසාය. ඔවුන් අපට කී සෑම තොරතුරක්ම සත්‍යයැයි කිව නොහැකි වුවත්, මෙවන් හිගන ගැහැණු උදවියගෙන් වැඩි හරියකට සිදුවන ලිංගික අතවර මේ යැයි අපට ඒ අනුව සිතාගන්නට පුළුවනා.

මේ 47 න්, එකොළොස් දෙනෙකු ගැබ්ගත්තේ නගරයේ හයිකාරයන් ඔවුන් 'දූෂණය' කළ විටය. අටදෙනෙකු පොලිස් භටයන් විසින්ද, 06 දෙනෙකු වෙළෙන්දන් විසින්ද, තවත් 6 ක් පදික වෙළඳුන් විසින්ද, අවශේෂ අය වෙනත් අයවලුන් විසින් දූෂණය කරනු ලැබිණ. 1979 න් පසු අපට හමුවූ මෙවන් ස්ත්‍රීන්ගෙන් සෑහෙන ගණනක් දූෂණය කරනු ලැබ ඇත්තේ ද්‍රවිඩ හමුදා භටයන් විසිනි.

මේ ගැහැණු 82 දෙනාගෙන් අවුරුදු 35 ට වඩා වැඩි අය සිටියේ තුන් දෙනෙක් පමණි. ඇත්ත වශයෙන්ම සිත්ගන්නා ලිංගික ආකර්ෂණයක් ඇත්නම් තිබුනේ ඒ තිදෙනාටය. නමුත් ලිංගික ආකර්ෂණය කියන්නේ අප එක් එක්කෙනාගේ ආශාවන් හා ඒ ඒ අනුව වෙනස් වන එකකි. ජාතක පොතේ එක කතාවක ඉතාමත් විරූපී දුටුවන් පිළිකුල් කරවන තරම් රූපයක් ඇති හැඩිති ගැහැනියට ඇතැම් රජවරු හා ප්‍රභූවරු ප්‍රිය කළහ. ඊට හේතුව අන්ධකාරයේ ඇගේ අත අල්වා ඒ ස්පර්ශයෙන් ලබන ඉමහත් සුවයයි. ඒ ස්පර්ශය ලැබුවාට පසු මේ තැනැත්තිය ඒ අයගේ ලිංගික ආකර්ෂණයට නොමඳව ලක්වූනාය.

ස්ත්‍රීන් ගැනද තත්වය මෙසේය. තවත් ජාතක කතාවක රජතුමාගේ බිරිඳ වන අගබිසව රජ නිදාගත් විට යහන් දිගේ පහළට බැස ඉතා පිළිකුල් සහගත කොර හිඟන්නෙකු හා සන්තෝෂ වූවාය. ඒ රජබිසවට මේ කොර විරූප හිඟන්නා පිළිකුලක් නොවිණ.

හිඟන ස්ත්‍රීන් එලෙස දූෂණය කළ අයවද මෙබඳු ලිංගික ආකර්ෂණයක් හිඟන ගැහැනුන් කෙරෙහි දකින්නට ලැබිණ යි අපට සිතාගත හැකිය. අප 'දූෂණය' යන වචනය මෙතනදී යොදා ගත්තේ ඒ ස්ත්‍රීන් තමන් බලයෙන් මේ කටයුත්තට යොදාගත් බව අපට කී නිසාය. ඔවුන් කෙතරම් දුරට මේ සඳහා එකඟතාවයක් ඇති කරගත්තා දැයි අපට ස්ථිරවම කිව නොහේ. ඒ ස්ත්‍රීන් එසේ දූෂණය කළ වග හිඟන්නන්ගේද පිළිගැනීම විය.

කොළඹින් පිට පළාත්වලද මෙසේ හිඟන ගැහැණු බලයෙන් දූෂණය කිරීම බොහෝ විට සිදුවේ. මහනුවර දළදා පෙරහැර සමයේ එබඳු සිද්ධි කීපයක්ම මම දුටුවෙමි. හිඟන ගැහැනුන් මෙසේ දූෂණය කිරීම නීතියට අසුවීමට තරම් වරදක් නොවේ. මන්ද? ඒ ගැහැනුන්ට නීතිය ඉදිරියට යා නොහැකි බැවිනි. නීතිය පොතක පමණක් තිබීමත්, සාමාන්‍ය ජීවිතයේදී ප්‍රයෝජනයට ගන්නට පුළුවන් ලෙස සකස් නොවීමත් කාරණා දෙකකි. නීතිය උගැනීමෙන් නීතිය හඳුන හැටි හා ඒ අනුව ක්‍රියා කරන හැටි උගෙනීමට හැකි අතර නීතිය සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය ලෙස ගලපාගත හැකිවන්නේ අපරාධ විද්‍යාව උගත් විටය.

බොහෝ විට යාචක ගැහැනුන් දූෂණයට කිරීම සිදුවන්නේ යාචකයන් අතින් නොවේ; පිට අය අතින්ය. සල්ලි දී ලිංගික කාරිය කරවා ගන්නට නම් ගණිකාවන් ඇත. නමුත් යාචක ගැහැනුන් දූෂණය කරන අයට, මේ බලහත්කාරකම නිසාම ලිංගික තෘප්තියක් ලැබේ. යාචක ගැහැනුන්ට හැර වෙන කාටවත් මෙබඳු අන්දමේ අතවර සිදුකොට, අමාරුවේ නොවැටී. ලිංගික තෘප්තිය ලබාගැනීම දුෂ්කරය.

මේ කාරණය ගැන අපේ සමාජයේ ශිෂ්ට යැයි කියන කවරුත් අවධානය යොමු කළ යුතුය. ගණිකාවන්ද මෙසේ බලහත්කාරයෙන් ගෙන දූෂණය කරනු ලැබුවත්, එබඳු ක්‍රියා නිතර සිදුවන්නේ නැත. ඒවාද බොහෝවිට සිදුවන්නේ වීදියේ ඉන්නා පහළම පෙළේ දුප්පත් ගණිකාවන්ටය. නමුත් යාචක ස්ත්‍රීන්ට නම් මේ භයානක අපරාධය නිතර සිදුවෙයි. මෙයින් ඒ අය රැකගන්නට මාර්ගයක් අදත් දක්නට නැත.

සමහර හිඟන්නන් අද 'පිම්පියන්' ලෙස කටයුතු කරමින් මෙවන් යාචක ස්ත්‍රීන් පිට අයට ලබාදීමට කටයුතු කරන සැටිද දැකගන්නට පුළුවන. අප කලින් කීවා සේ මත්ද්‍රව්‍ය හෝ මත්පැන්වලට ඇබ්බැහි වූ ඇතැම් තරුණ හා මැදිවයසේ යාචකයෝ තම බිරින්දෑවරු පමණක් නොව දරුවන්ද අනුන්ගේ ලිංගික තෘප්තිය උදෙසා සැපයීමෙන් මුදල් ලබා ගනිති.

සමහර හිඟන්නන් තම ස්ත්‍රීන් සමග සහවාසයෙහි යෙදෙන්නට මුලදී යොදාගන්නේ පොදු වැසිකිළිය. නමුත් කල් යාමෙන් අගනුවර ඇති මෙවන් පොදු වැසිකිළි, වීදිගණිකාවන් විසින් 'ආක්‍රමණය' කරන ලදී. අද හිඟන්නන්ට එවන් තැන්වල ඉඩ නැත. රාත්‍රියේ මඟින් නැති බස් ආවරණ ඔව්හු මේ සඳහා උපයෝගී කරගනිති. බස් නැවතුම්පොළවල, කොළඹ මෙන්ම පිට නගරවල අඳුරු මුළු මේ සඳහා ඔවුන්ට උදව් වන්නේය.

ලිංගික කාර්ය හිඟන්නාට එකම එක දෙයකට සීමා වී ඇත. එනම් ස්ත්‍රී පුරුෂ ලිංගික එක්වීමයි. ආදරය කිරීමත්, ලිංගික ක්‍රියාවට පෙරහුරුවක්, පිළියෙල කිරීමත් ඒ අයට නැත. ඔවුන් මේ කටයුත්ත කරන්නේ හොරකමක් කරන්නෙක් මෙන් නිසා එබඳු විනෝදයක් ලැබීමට ඉඩක් නැත්තේය. උපත් පාලනය පිළිබඳව ලිංගික ලෙඩරෝග ගැන හෝ මොනම අන්දමේ අවබෝධයක් වත් හිඟන ස්ත්‍රී පුරුෂයන් සතුව නැත.

ගැහැනු දරුවෙකු වැඩිවිය පැමිණි විට තනිකොට තබා කරන්නාවූ චාරිත්‍ර මහා සමාජයේ දක්නට ලැබෙතත් හිඟන්නන් අතර දකින්නට නොහැක. ගැහැනු දරුවා හිඟන සමාජයේ වැඩෙන්නේ පිරිමි දරුවාට වෙනස්ව නොවේ. ඇය ඇගේ සහෝදරයන් විදිහටම සමාජානුයෝජනයට පත්වෙයි. වෙනසකට ඇත්තේ ඇඳුම් පමණි. වැඩිවියට පත් වුවත් ඒ ගැන කලබලයක් කෙරෙන්නේ නැත. වෙනදා මෙන්ම අම්මා හා තාත්තාත්, පවුලේ උදවියත් සාමාන්‍ය කටයුතු කරගෙන යති. චාරිත්‍ර පිළිපැදීමක් කරන්නට තරම් ඉඩකඩක් හෝ පිළිවෙලක් ඒ හිඟන්නන්ට නැතිවීම මීට ප්‍රධාන හේතුවකි.

වර්තමානයේ නම් හිඟන ළමයි ලිංගික සම්බන්ධතා ඉතා ඉක්මනින් ඇති කරගන්නා බව පෙනේ. නගරයේ ජීවත්වන පිරිමි ළමයි අවට ඉන්නා අයගෙන් සමලිංගික ලිංගික හැසිරීම් උගනිති. ගැහැනු ළමයි ද ඉතා කුඩා කාලයේ ලිංගික අත්දැකීම් ලබන්නාහ. හිඟන ළමයින්ට මොනම පාසැල් යාමක් වත් නැති නිසා, මෙබඳු ලිංගික අත්දැකීම්වලින් ඇතිවන්නාවූ බරපතල විනාශය වටහාගත හැකිවන්නේ මෙබඳු ළමයි හැදී වැඩී ඉතා භයානක සමාජ විරෝධීන් වූ විටය.

හිඟන්නන් අතර ඉඳහිට සාමාන්‍ය නොවන ලිංගික චර්යා ඇති වැඩිහිටියන් අපට හමුවී ඇත. වරක් මට සමලිංගික සේවනයට පුරුදු වූ සමූහ නායකයෙක් හමුවිය. ඔහුගේ වයස අවුරුදු පනහක් පමණ විය. ඔහු අවිවාහකය. නමුත් හෙතෙම වයස 30 පමණ හිඟන තරුණයෙක් තම සහකරු වශයෙන් තබාගත්තේය. මේ ගැන සමූහයේ තව්රුත් දැන සිටියත් ඔහු නායකයා නිසා එබඳු චර්යාවක් අවශේෂ අය අතින් හෙළා දැකීමට භාජන වූයේ නැත. යාචකයන් පොදු වශයෙන් ගත් කල්හි අවට මහා සමාජයේ ඇතැම් අයමෙන් මෙන්ම මෙබඳු සමලිංගික සම්බන්ධකම් මොනම අයුරින්වත් අනුමත කළේ නැත.

හිඟන්නන් අතර ප්‍රේම සම්බන්ධතා ඇතිවූයේ ඉතා කලාතුරකිනි. තරුණ හිඟන ගැහැනු පිරිමි ළමයි මෙවැනි සම්බන්ධතා ඇති කරගෙන වැඩි කලක් නොගොස් වෙන පළාත්වලට පලා ගිය වග අසන්ට ලැබිණ. ඇත්ත වශයෙන්ම සාමාන්‍ය යාචකයන්ට නම් ප්‍රේම කිරීමට තබා එය ගැන කතා කිරීමට වත් කාලයක් නැත. ඔවුන්ගේ ජනශ්‍රැතියේ පවා පෙම්කවි යැයි කිව හැකි කවි හෝ සංන්දර ගැන අසන්නට ලැබෙන්නේ කලාතුරකිනි.

පවුලේ ලිංගික සම්බන්ධතා ඇතිවන්නේ ස්ත්‍රියට අවශ්‍ය විදිහට වඩා පිරිමියාට අවශ්‍ය ආකාරයටය. මේ කටයුත්තේදී ස්ත්‍රියට ලැබෙන තැන තීරණය වන්නේ පිරිමියාගේ ආකල්ප මතය. ඇය පිරිමියාට කෙසේ වුවත් හැම විටම අවනත විය යුතු යැයි පිළිගැනීම ඔවුන් අතර දක්නට ලැබේ.

සමහර අවස්ථාවල අනවශ්‍ය දරු ගැබක් ඇති වූ විට එය නැතිකර ගැනීමට සූදානම් වූ හිඟන ගැහැනුන් අපට හමුවී ඇත. බොහෝ විට එසේ වන්නේ හිඟන සමාජයට බාහිර පිරිමි කෙනෙක් හා සම්බන්ධව එසේ ගැබ්ගත් කල්හිය. එවිට ඒ නැහැත්තා දරුගැබ විනාශ කිරීමට ස්ත්‍රිය පොළඹනු නැත. මෙබඳු අවස්ථා එතරම් නැතත්, නූතන සමාජයේ නාගරික ප්‍රදේශවල විශේෂයෙන් කොළඹ නගරය හා එය අවට, මෙබඳු ක්‍රම මගින් ගබ්සා කර ගැනීමට පෙළඹෙන්නා වූ හිඟන ගැහැනුන් දැකගත හැකිය.

හිඟන්නෝ ගණිකා වෘත්තිය අනුමත නොකරති. එය පිළිකුල් කිරීම ඔවුන්ගේ සිරිතය. තමන් නැවසෙන ප්‍රදේශයේ පිම්පියන් හා ගණිකාවන් ඇත්නම් ඔවුන්ගෙන් ඈත් වී කටයුතු කිරීමට හිඟන අය මහන්සි ගනිති. 1960 ගණන්වල පිම්පියන් හැටියට කටයුතු කළ හිඟන්නන් කිහිපදෙනෙක් සිටිය බව මට මතකය. ඒ අය වැඩි හරියක් සිටියේ මරදානේ, කොටුවේ හා බොරැල්ලේය. අද 'පිම්පි' යෙකු වීමට යාචකයෙකුට බැරිය. මන්ද? අන්‍ය වෘත්තීය පිම්පියන් ඔහුට ඒ කටයුත්ත කරන්නට ඉඩ නොදෙන හෙයිනි.

සංචාරකයන්ගේ පැමිණීමෙන් පසු සමහර සංචාරකයන් යාචක ළමයින් හා ගැහැනුන් සමග ලිංගික කටයුත්තෙහි යෙදෙන්නට සැරසුන අවස්ථා අපට හමුවී ඇත. ඊට හේතු සංචාරකයන් මිල මුදල් හා තෑගිබෝග ලබාදීමට දක්වන ප්‍රියමනාප බවයි. එසේම යාචකයන්ව ප්‍රිය කරන ලිංගික ආශාවන් ඇති සංචාරකයන් මේ අතරින් කැපී පෙනෙයි. සංචාරකයන්ගෙන් යමක් හිඟාකා ජීවත් වීම කරනත්, මුදල් වලට කැමැත්තෙන් ලිංගික කටයුතුවලට ඇදී යාම හිඟන්නන් පොදුවේ ප්‍රිය කරන කාරියක් නොවේ. එබඳු ලිංගික ක්‍රියා සඳහා පොළඹාගත් යාචක ළමයින් හෝ ගැහැනු ගැන අසන්නට ලැබෙතත්, යාචකයෝ පොදුවේ එබඳු කටයුතු පිළිකුල් කරති.

ස්වභාවයෙන්ම යාචකයන් අපිරිසිදුය. ඔවුන් අඳින්නේ පළඳින්නේ මේ අපිරිසිදුකම කැපී පෙනෙන නියායෙනි. එසේ නොකරතොත් මිල මුදල් ආධාර ලබාගැනීම කළ නොහැකි බව ඒ අයගේ කල්පනාවය. අපිරිසිදුකම ඔවුන්ගේ සංස්කෘතියේ අනිවාර අංගයක් වී ඇත. පුද්ගලිකව සිරුරද, ඇඳුම් පැළඳුම් ද, වාසය කරන ස්ථානද මෙසේ අපිරිසිදුව පවත්නා සැටි හිඟන අය වරක් දුටු කෙනෙකුගේ සිතේ ඇඳෙන ලක්ෂණයකි. බාහිර සමාජයෙන් යාචකයන්ගෙන් ලිංගික තෘප්තිය ලැබීමට එන අය මේ නිසා පුදුමාකාර ලිංගික ආශාවන්ගෙන් යුක්ත වූවන් විය යුතුය.

11 හිඟාකන්නේ ඇයි?

හිඟාකන්නේ ඇයි කියන ප්‍රශ්නයට එක වල්ලේ නිශ්චිත පිළිතුරක් දීම ඉතා දුෂ්කරය. ඇමරිකානු පර්යේෂකයෙකු වූ හාර්ලන් ඩබ්ලියු ගිල්මෝර් වරක් සඳහන් කළ ප්‍රකාශයක් මෙහිදී මතක් කිරීම ප්‍රයෝජනය. ඔහු විශ්වාස කළ අන්දමට හිඟන්නන් ඇතිවන්නේ සමාජයට, සමාජයේ ජීවත්වන සෑම කෙනෙකුම යෝග්‍ය රැකීරක්ෂාවල නිරත කරලීමට දුෂ්කර නිසාය. ඒ නිසා යාචකයෙකු වීම හා වෙනත් ආකාරයෙන් සමාජයෙන් ක්‍රමිකව ඉවතට තල්ලු කරන ලද තැනැත්තකු වීම මූල්‍යමය අතින් වාසිදායක වන්නේය. මේ මූල්‍යමය වාසියට වඩා සාර්ථක වෙනත් කිසිම විකල්පයක් සොයා ගන්නට නොහැකි වී ඇත. එසේ ම කිසිදු සමාජ හංවඩුවකින් එය නැවැත්විය නොහේ. ඒ නිසා බොහෝ දෙනෙක් රජයෙන් ලැබෙන සහනාධාර හෝ වඩා අඩුවෙන් වැටුප් ලැබෙන රැකීරක්ෂා හෝ ප්‍රතික්ෂේප කොට යාචක වෘත්තියට ඇදී යාම ස්වභාවිකය.*

අපේරටේ නම් හිඟන්නන්ට හෝ හිඟනකමට සමාජ හංවඩුවක් ගසා නැත. සංස්කෘතික උරුමයන් අනුව අප හිඟන්නාව සලකන්නේ සමාජයේ පිහිට අවශ්‍ය තැනැත්තෙකු හැටියටය. බුදුදහමේ එන කර්මය, පොදු ජනයා විවරණ කරගත් අන්දමට හිඟන්නන්ව උපදින්නේ තමන් කළ කර්මය අනුවය. මේ කර්මය වෙනස් කරගන්නට පුළුවන් බව බුදුදහමේ උගන්වා ඇති සැටි ඒ අයට නොපෙනීම කණගාටුවට කරුණකි. නරක යැයි කියන කම් (අකුසල) කළාවූ විට, අබ්බගාතයෙකු වැනි තත්වයක ඉපදීමට එය හේතුවෙයි. එවැනි අබ්බගාතයන්ට සැලකීම අප විසින් කළ යුතුය. එය අප කරගන්නා පුණ්‍ය කර්මයකි.

අද ලෝකය අබ්බගාතයන් හා අංගවිකල අයට අනික් අයට මෙන්ම ස්වභාවික අයිතිවාසිකම් (මිනිස් අයිතිවාසිකම්) ඇති බව අවධාරණය කරයි. ඒ තැනැත්තන්ට අන් අයට මෙන් රැකීරක්ෂා ලබාදීම යුතු බවද කියන්නේය. එසේ වුවද ලෝකය සෑම රටකම ජීවත්වන සෑම දෙනෙකුටම රක්ෂා සැපයීම දුෂ්කරව තිබියදීත් අංග විකල අය සියලු දෙනාටම එසේ රක්ෂා සැපයිය හැකි වේවිද? තරහකාරී බව අගයන සමාජයක අන්‍යයන් හා කරවකර තරඟකරන්නට බැරි පිරිසක් ඒ කාර්යයට යොමු කළ යුතුද? ඊට වඩා මෙබඳු තැනැත්තන්ට තමන්ට පුළුවන් කටයුත්තක් කිරීමට ඉඩ තබා, ඉතිරි හරිය සහනාධාර වලින් සපුරාලීම වඩාත් සුදුසු නැත්ද?

---

* හාර්ලන් ඩබ්ලියු ගිල්මෝර් - ද බෙගර්

අපේරටේ බෞද්ධ භික්ෂූන්වහන්සේලා එක්තරා අන්දමක යාචකයන් වන්නේ භික්ෂාවෙන් උන්වහන්සේ යැපෙන නිසාය. නමුත් අප කවදාවත් උන්වහන්සේ යාචක නමින් හඳුන්වා නැත. යාචකයා කෙරෙහි සමාජය තුල පිළිකුලකට වඩා එක්තරා අන්දමක අනුකම්පාවක් හා ගෞරවයක් මිශ්‍ර හැඟීමක් ඇති බව පෙනේ. අනුකම්පාව එල්ල වන්නේ ඔහුගේ කණගාටුදායක තත්වයටයි, ගෞරවය ඔහුගේ වැඩිමහලු වයස් හා වැඩිහිටි පෙනුම නිසා ඉබේම මතුවන්නකි.

අපි සමාජයේ විවිධ තලවල අයගෙන් යාචකයන් ඒ ගැන ප්‍රශ්න කළෙමු. මේ තල අතරට සමාජයේ ඉහළ මධ්‍යම පංතිය, පහළ මධ්‍යම පංතිය, පහළ පංතිය හා ඉහළම පංතිය ඇතුළත් විය. එකල පහළ පංතිය ලෙස අප සැලකුවේ මසකට රුපියල් 200 ක් හා ඊට අඩුවෙන් උපදනා අයටයි. පහළ මධ්‍යම පංතිය වූයේ මසකට රුපියල් 200 සිට 500 දක්වා ලබන්නා කොටසටයි. ඉහළ මධ්‍යම පංතිය වූයේ 500 - 800 දක්වා ලබන අයයි. රුපියල් 800 වඩා උපයන අය ඉහළම පංතිය ලෙස ගත්තෙමු.

මේ අය එකල (1976) ලබාදුන් උත්තර පහත සඳහන් සටහනින් ඔබට අවබෝධ කරගත හැක.

1. හිඟාකෑම සමාජ හංවඩුවක්ද?

	ප.ප.	ප.ම.ප.	ඉ.ම.ප.	ඉ.ප
1. නැත	88	64	41	02
2. ඔව්	12	21	28	81
3. උත්තර නැත		15	31	17

2. හිඟාකෑම සමාජ අවශ්‍යතාවක්ද?

	ප.ප.	ප.ම.ප.	ඉ.ම.ප.	ඉ.ප
1. නැත	08	13	57	03
2. ඔව්	87	63	34	96
3. උත්තර නැත	05	24	09	01

3.	ඔබ හිඟන්නන්ට හිඟමන් දිය යුතුය.				
1.	නැත	දද	00	08	92
2.	ඔව්	99	95	76	08
3.	උත්තර නැත	01	05	16	
4.	හිඟාකෑම නීතියෙන් තහනම් කළ යුතුද?				
1.	නැත	99	91	42	02
2.	ඔව්	00	08	56	95
3.	උත්තර නැත	01	01	02	04

අප මේ සඳහා යොදාගත්තේ අහඹු ස්ථාරායන නියැදියකි. ඒ අනුව එක් පංතියකින් 100 දෙනෙක් තෝරාගන්නා ලදී. ඒ අය අතර ගැහැනු, පිරිමි හා ගැමි නාගරික ප්‍රදේශ එක හා සමානව නියෝජනය වන පරිදි නියැදිය තෝරාගත්තෙමු. මේ නියැදියේ ප්‍රතිඵල අනුව සමාජයේ පහළ පංතිවල අය හිඟාකන සමාජයට අවැඩකාරී සංවිධු ගැසිය යුතු ක්‍රියාවක් ලෙස නොසලකන බව පෙනේ. මෙවන් ආකල්පයක් සැදී ඇත්තේ මධ්‍යම හා ඉහළ පංතිවලය. ඉහළ පංතියේ අය හිඟාකෑම නීතියෙන් තහනම් කිරීම යෝග්‍ය යැයි ප්‍රකාශ කරති. අපේ ප්‍රධාන නගරය ඇතුළු ජනාකීර්ණ ස්ථානවල අප කළ විමසුමක් අනුව යාචකයන්ට වඩාත් පිහිට වන්නේ සමාජයේ පහළ තලවල නැනැත්තන්ය. පහළ පංතියෙන් හා පහළ මධ්‍යම පංතියෙන් සියයට 78 ක්ද, ඉහළ මධ්‍යම පංතියෙන් සියයට 1885 ක්ද හිඟන්නන්ට හිඟමන් නිතර දෙන අතර, ඉහළම පංතියෙන් හිඟමන් දෙන්නේ සියයට 04 ක් පමණි.

හිඟාකෑමට පෙළඹෙන හේතු අතර ආර්ථික හේතුව ප්‍රධානය. ඇත්ත වශයෙන්ම සමහර හිඟන්නන්ට හිඟාකෑම සඳහා ආර්ථික උවමනාවක් නැති නැත්ද ඇත. එවැනි හිඟන්නන් මානසික හෝ සමාජීය හේතුවක් නිසා මේ වෘත්තියට පෙළඹෙන බව පෙනේ. මෙයින් මොනම හෝ එක් හේතුවක් පමණක් ගෙන සාධාරණ වශයෙන් හිඟාකෑමට මේ හේතුව මුල් වී යැයි දැක්වීමට වඩා සංකීර්ණ හේතු එකට ගුලිවී හිඟාකෑම උදෙසා අවශ්‍ය පසුතලය සකස් කරන බව වටහා ගැනීම වඩාත් ප්‍රයෝජනය.

නෙල්ස් ඇන්ඩර්සන් නමැති ඇමරිකානු සමාජ විද්‍යාඥයා මෙවන් යාචකයන් හා ස්ථිර නැවතුමක් නැතිව සමාජයේ පාවෙන්නන් ඇතිවන්නට මූලික හේතු හයක් දක්වයි: 1) තාවකාලික රැකීරක්ෂා අවස්ථා පමණක් ලැබීම හා අවශේෂ කාලයේදී රැකීරක්ෂා නැතිවීම. 2) කර්මාන්තමය වශයෙන් මොනම

පුරුද්දක් හෝ පුහුණුවක් නැතිකම 3) පෞරුෂයේ ඇති දුබලතා 4) පුද්ගලයාගේ ජීවිතයේ ඇතිවන උග්‍ර කම්පන අවස්ථා 5) තමන් යම් ජාතියකට (කලු ජාතිය) අයත්වීම 6) තැනින් තැන ඇවිදීමේ ආශාව. ඒ හේතූන්ය. මේ අතරට ආර්ථික බෙලහීනතාව හෝ සමාජ හෝ සංස්කෘතික හුරුපුරුදු, ශාරීරික හෝ මානසික දුර්වලතා, අධ්‍යාපනයේ අඩුකම හා හිඟාකෑම කරදර අඩු ජීවිතයක් ලෙස සැලකීමේ ප්‍රවණතාව එකතු කරගත් විට, හිඟාකෑමට පෙලඹෙන සංකීර්ණ හේතු සියල්ල වටහාගත හැකි වන්නේය.

අප දුටුවා වූ ඉතාමත් වැදගත් හේතුවක් වන්නේ හිඟන්නන් අතර විධිමත් හෝ නොවිධිමත් අධ්‍යාපනයක් නැති කමය. 'හිඟන මහත්තුරු' හා 'පෙත්පම් රැගෙන යන හිඟන්නන්' ස්වල්ප දෙනෙක් හැරුණ විට සමස්ත හිඟන පරපුරම වැඩිහරියක් අධ්‍යාපනයක් නොලද අයයි. මේ අධ්‍යාපනික මන්දපෝෂණය හිඟන ලෝකයෙහි රැඳී සිටීමට තුඩු දෙන ප්‍රධාන සාධකය වන්නේය. පාසැලකට ගොස් අටවැනි ප්‍රමාණය දක්වා ඉගෙන, මේ ඉගෙනීමෙන් අදත් යම්කිසි ප්‍රයෝජනයක් ලබන තැනැත්තෙකු මේ අය අතර එකල මට හමුවූයේ ඉතා කලාතුරකිනි.

තරමක් දුරට හෝ ඉහළට උගත් අය කිහිපදෙනෙක් වර්තමාන හිඟන්නන් අතර ඇත. විශ්වවිද්‍යාලයේ උගත් ශිෂ්‍යයෙක්ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ද මට හමුවී ඇත. මේ මන්ත්‍රීවරයා දුටු මොහොතේ මට ඇති වූ හැඟීම් එකතු කරමින් එදා ලියූ පද්‍යයක් මට මතක් වූයේ ඔහුගේ අතීතය ඒ පද්‍යයෙන් කාව්‍යමය ලෙස විවරණය වූ හෙයිනි.

ඔබට මතකද හිතවත
දසක දෙකකට එහා කාලය
එදා ඔබ සිතාදුන වෛරැදි රජෙක් සේ
ගරු ගාම්භීරව වැජඹුන හැටි

ඔබේ කටහඬ යබා ගැබ
සිංහ නාදය මෙන් පැතිරුනා
ඔබේ රුව පුවත්පත්වල බොඳ වුනා
කිත් ගොස ගලා ගිය සැටි සඳ රැස් වතුර මෙන්
බකල ගමන අබිබවා

එදා ඔබේ කලිසම් කමිසවල
සාක්කු පිරිගියා

දෙගොඩ තලා ගැලූ මුදල් වරුසාවෙන්
මිතුරන් හා සතුරන්
කවු පිරුනු දැතින් දුන්,
ලබා ගත්තට යම් යම් සහන

---

* නෙල්ස් ඇන්ඩර්සන්. ද හෝබෝ, චිකාගෝ 1983, 8

ගබ්සා කරන්නට යුතුකම
අද අත පොල්කටුව තැතත්
ඔබ හෙලන බැල්මෙන් පෙනේ
යමක් ඔබ පතන බව

ඔබ පහස තොලත් යොවුන් සාපාක්
එකල නගරය තුල නොවීන
අද නොඑයි, හපුටු වෙසඟනක්වන්
තෙල් වත් කරන්නට
නිවෙන පොල්තෙල් පහන දැක

නිවෙනු මැන හිතවතානනි, දැවි දැවී
කල පාපයෙහි අනිවූ තම සිහි වේවී *

රටක ඇතිවන ආර්ථික පරිහානිය යාචකයන් වර්ධනය වීමට ප්‍රබල හේතුවක් වෙයි. ආර්ථික අතින් දුබල, සමාජමය අතින් මහා ලෙස ශක්තිමත් නොවී ඇති කොටස් ආර්ථික පරිහානියත් සමඟ පහළට ඇද වැටේ. ඒ අයට උදව් කරන්නට කවුරුත් නැත. කාටත් අනුකම්පාවෙන් අත් අය උදව් කළේ ආර්ථික අහේනිය අඩු ආර්ථික තරඟ අඩු පැපවත් කාලයේය. දැන් එවැනි දුගී පවුල්වල ළමයි නිකම්ම හිඟන්නන් වෙති. සමහර මව්වරුන් දරුවන් වීදිවල අනාථ කර දැමූ විට, ඒ දරුවන් ඊළඟට යොමු වන්නේ යාචක ජීවිතයටයි. ඊට වඩා විකල්පයක් ඔවුනට නැත. තමන්ට ආදරය සෙනෙහස නැති පවුලක එන්වීමට වඩා හිඟාකමින් ජීවත්වීම යහපත් යයි සිතන දරුවන්ද ඇත. සමාජයේ පහළට එකවරම වැටෙන්නට පුළුවන් තලවල ජීවත්වන සෑම දෙනාක්ම පාහේ, ආර්ථික දුබලතා සමග ඇදවැටෙන්නේ මේ යාචක ලෝකයටය. මෙවැනි තලයක ඉන්නා කවරෙකු වුවද පහත සඳහන් කාරණා එකක් හෝ කීපයක් සිදුවීමෙන් හිඟන තත්වයට ඇදවැටීම සිදුවන්නට පුළුවන.

1. පවුලේ රක්ෂාවක යෙදී සිටින ප්‍රධාන කැනැත්තා මියයෑමෙන් හෝ ඒ අයට රක්ෂාව නැතිවීම.
2. තමන් විශාල ණයක් වූ නිසා ඉන්න ගේදොර විකුණා ඉන් ඉවතට යෑමෙන් වෙනත් ස්ථානයක් මිලට ගැනීමට ආර්ථික පිටුවහලක් නැතිකමින්.
3. ස්වාමි පුරුෂයා මත්පැන්, මත්ද්‍රව්‍ය ලෝලයෙකු වීමෙන්, ක්ෂුද්‍රවට නැතිවීමෙන්

* ඇත්තුාවයි 1973 49-50

4. ස්වාමිපුරුෂයා අපරාධකරුවෙකු වී දීර්ඝ කාලයකට සිරයට යෑමෙන්.

5. විශාල පවුලක් අතහැර සැමියා ඉවතට යෑමෙන්

6. පවුලේ නෑදෑයන් විසින් කොන් කරනු ලැබීමෙන්, පීඩනයට ලක් කරනු ලැබීමෙන්

7. පවුලේ සෙනෙහස එහි දරුවන්ට නොලැබී යාමෙන්

8. මූලික අවශ්‍යතා, දැන් ඉන්නා තත්වය අනුව සපුරා ගැනීමට නොහැකි වීමෙන්

9. අම්මා තාත්තා දෙන්නාම නැතිවී, දරුවෙකුට වෙනත් පිහිටක් නොමැතිවීමෙන්

10. සමාජමය වශයෙන් පීඩනයට අසුවීමෙන්.

ආර්ථික වශයෙන් මතුවන පීඩාවන් මෙන්ම සමාජීය වශයෙන්ද පීඩා සිදුවිය හැකිය. ඉතා බරපතල වගකීම් හා දරුවන් දෙන්නෙක් ඇති පවුලකට, තමන් ඉන්න තැනින් වෙනත් තැනකට ගොස් පදිංචි වන්නට සිදුවුනා යැයි කල්පනා කරහොත් මේ කාරණය වටහාගත හැකිය. ගමේ ජීවත්වූ මෙබඳු පවුලක් නගරයට එයි. ගමේ ජීවත් වූවත් මෙන් නගරයේ ජීවත්වීමට ඔවුන්ට නොහැකිය. නගරයේ ජීවත්වන්නට නිවහනක් නැත. ආර්ථික පිටුබලයක් නැත. ඔව්හු මේ නිසා සමාජමය වශයෙන් අසරණයෝ වෙති. හිඟාකෑමට නිකම්ම ඇදීයාමට ආකර්ෂණයක් මේ සමාජමය පීඩනය නිසා ඔවුනට ඇතිවේ. ඔවුන් දැන් සමාජයෙන් කැපීවූවන් ලෙසය ඔවුන්ට දැනෙන්නේ.

ඇතැම් විට අලුතින් පිහිටවන ලද ජනපදවලද මෙතැනි සිදුවීම් දක්නට පුළුවන. ජනපදයක අලුතින් පදිංචි වීමට යන්නේ තමන්ගේ ගම සමග සියලුම සම්බන්ධතා අතහැර දැමීමෙන් පසුවය. නමුත් ජනපදයට පදිංචිවීමට ගියාට පසු ඉඩම් කැබැල්ලක් ලබාගැනීම මිස වෙනත් කිසිම අවශ්‍යතාවන් සපුරාගැනීමට නොහැකිවන අවස්ථා ඇත. එබඳු තැනකදී යම් අන්තර සබඳතා ලිහිල්වූ පවුලක් වේ නම් ඒ පවුල එක්කෝ හැඩි කිදියෑම හෝ , නැත්නම් එහෙම පිටින්ම අනුන්ගෙන් යැපෙන තත්වයට වැටීම නැවැත්විය නොහේ.

නගරයට පදිංචියට එන විශේෂයෙන් මුඩුක්කුවල හෝ පැල්පත්වල ජීවත්වන පවුල් හිඟන වෘත්තියට වැටෙන්නේ අවස්ථා තුනක් මගිනි.

1. නගරයට පැමිණුනාට පසු පැල්පතේ හා මුඩුක්කුවේ සංස්කෘතියට ඔවුන් අනුගත නොවීම. මේ තැන්වල වාසය කරන අය බොහෝ විට තම මූලික අවශ්‍යතා ඉටුකරගන්නට සමාජ විරෝධී ක්‍රියාවලින් අනුගමනය කරන අවස්ථා

ඇත. මත්පැන්, මත්ද්‍රව්‍ය අලෙවි කිරීම, ගණිකා වෘත්තිය, සුලු සොරකම්, සූදුව මීට උදාහරණය. මූඩුක්කු සංස්කෘතියට ආවේණික තවත් ලක්ෂණ රැසක්ද ඇත. මේවාට අනුගත නොවන අය, ඒ සමාජ සංස්කෘතික තලයෙන් පහළට ඇද වැටේ. එසේ ඇද වැටෙන්නේ යාචක ලෝකයටය.

2. මේ සංස්කෘතික - සමාජ තලයේ සිටියදීම යාචක වෘත්තිය වරින් වර අනුගමනය කිරීමෙන් මූලික අවශ්‍යතා පිරිමසා ගත හැකිය. නිදර්ශනයක් වශයෙන් දැක්විය හැක්කේ පසුගිය අවුරුදු දහයකට දොළහකට පෙර පිහිටුවන ලද අගනුවරට නුදුරු එක්තරා ජනාවාසයකි. මේ ජනාවාසයේ ඉන්නා ඇතැම් තරුණ හා මැදිවියේ පිරිමි අගනුවරට විත් යාචක වෘත්තියේ යෙදෙන්නාහ. තමන්ගේ ජනාවාසයේදී ඔවුන් කටයුතු කරනුයේ සාමාන්‍ය වාසීන් ලෙසය. ඔවුනුන් යාචකයන් වී ඇත්තේ ඉන් ලේසියෙන් ලැබෙන ආදායම නිසාය.

3. පහළ පංතියේ සිට විවිධ හේතු නිසා තවත් පහළට වැටෙන තැනැත්තන් යාචක තත්වයට වැටෙන්නේ 'තාවකාලික යාචක තත්වයක' පසුවීමෙන් ඉක්බිතිවය. පහළ පංතියේ සිටියදීම ඔවුන්ගේ දුක්ඛිත තත්වය නිසා අන්‍යයෝ ඔවුන්ට උදව් කරති. සමහර විට ඒ උදව් කරන්නේ මේ අයගේ ඉල්ලීම නිසා නොවේ. එවිට කාලයක් යනවිට සිදුවන්නේ මේ අය සහමුලින්ම යාචක තත්වයට පත්වීමයි. තාවකාලික යාචක පියවර ඔවුනු මේ තත්වයට ගෙන එන පෙරනුරුවක් වැන්න. තව තවත් ඔවුනගේ ප්‍රශ්න උග්‍ර වනවිට ඔහු මේ තාවකාලික යාචක තත්වය ස්ථිර තත්වයට හරවා ගනිති.

අංගවිකල. අබ්බගාත අයට අතීත සමාජය තුල නම් පවුල් හා සමූහයාගේ පිහිට අපේක්ෂා කරන්නට පුළුවන් විණි. එබඳු අය බලා කියා ගැනීම පවුල හා සමූහයා සතු යුතුකමක් විය. ජනගහනය අධික වීමෙන්ද, පවුල හා සමූහය තුල පැවති දැඩි අන්තර් සම්බන්ධතා බිඳී යෑමෙන්ද, ආර්ථික පිටුබලයේ පිරිහීමෙන්ද අද තත්වය වඩාත් බරපතල වී ඇත. අබ්බගාත, අංගවිකල අය පවුලට බරක් ලෙස සැලකීම අද සමාජයට වඩාත් හුරුය. ඒ අය තමන්ට පවුලෙන් ලැබෙන නොසැලකිල්ල නිසා නිතර අන්‍යයන්ගෙන් උදව් පතති. සමහරවිට පවුලේ අය මෙසේ අන්‍යයන්ගෙන් උදව් පැතීමට ඔවුනු උසිගන්වති. ඒ උදව් අපේක්ෂා කරමින්, අබ්බගාතයින් අංගවිකල ඇත්තත් අතරමං කරති.

අබ්බගාත වීම, අංග විකල අයෙකු වීම හිඟන කමින් යැපිය යුතු තත්වයකැයි නූතන සමාජයේ පිළිගැනීම වන්නේය. එබඳු අය කුඩා දරුවන් නම් ඔවුන් කාටත් ප්‍රදර්ශනය කොට ආධාර ලබාගැනීම සාමාන්‍ය සිරිතය. මුලදී ඔවුන් කාටත් ප්‍රදර්ශනය කොට ආධාර ලබාගැනීම සාමාන්‍ය සිරිතය. මුලදී

අබ්බගාත අංගවිකල අය කොටස් තුනක් වෙති. පුංචි ළමයි, තරුණ අය හා මැදිවියේ අය හා ස්ත්‍රීන් මෙ කොටස් තුනය. මා ගවේෂණ අරඹන කාලයේ, ඒ කියන්නේ හැට ගණන්වල මුල හා අග, ස්ත්‍රී අබ්බගාතයන් දක්නට නොලැබිණ. වර්තමානයේ නම් විවිධ රෝග බාධාවලට ලක්වූ අංගවිකල හා අබ්බගාත ස්ත්‍රීන් හිඟන්නන් අතර ඇත. මේ අය කවුරුත් කියන්නේ තමන්ට වෙන පිහිටක් නැති නිසා අනුන්ගේ පිහිට පතන බවයි. එය සත්‍යයකි. ඔවුනට වෙන පිහිටක් නැත. නමුත් කුඩා දරුවන් නම් තමන්ගේම අම්මලා සමඟ හිඟා කන්නේ කලාතුරකිනි. ඔවුන් අබ්බගාත වූ තරමට දකින්නන් තුළ අනුකම්පාව උපදවා මුදල් ලබා ගැනීමේ හැකියාව වැඩි වන නිසා තැරැව්කාරයන්ට ඒ අය ඉතා වැදගත්ය. තරුණ හා මැදිවියේ අබ්බගාතයන්, අංගවිකල අය තැරැව්කාරයන්ට අසුවන්නේ කලාතුරකිනි. එසේ අසුවන්නේ නම් එහාමෙහා ගිය නොහැකි, ශරීරයේ අසාමාන්‍ය විකෘති ඇති තරුණ හෝ මැදිවියේ තැනැත්තෙකු පමණි. මෙබඳු අති විශාල ශරීරයක් ඇති නුවර පළාතේ තරුණයෙකු මම මෑතදී කොළඹ නගරයේදී දුටුවෙමි.

විවිධ අසනීප වලින් පෙළීමද යාචකයෙකු වීමට සුදුසුකමකි: අභිප්‍රේරණය ලබාදෙන්නකි. පිළිකා සෑදීම, සුව නොකළ හැකි වෙනත් ලෙඩකින් පෙළීම, බරපතල ශල්‍යකර්මයක් කර තිබීම, මානසික රෝගයකින් පෙළීම තමන් නිකම්ම යාචකයකු බවට පත් කරයි. ඇත්ත වශයෙන්ම මේ අය කියන කතාව ඇත්තය. ඔවුනට උදව් කරන්නට කෙනෙක් ඇත. ඔවුනට දරුවන්, ඥාතීන් සිටින්නටද පුළුවන, නැතිවන්නටද පුළුවන. නමුත් සත්‍යය නම් ඒ කවුරුත් මේ අයට ආධාර නොකරන බවය. ඔව්හු ඒ නිසා මහජන ආධාර මත යැපෙන්නාහ. මහජන ආධාර නැත්නම් මේ අයට සිදුවන්නේ කුමක්ද?

මහලු අයෙකු වීම නිසාම යාචකයෙකු බවට පත් නොවී, දරුවන් විසින් අත්හැර දැමීම, හෝ තමන් යාචක ජීවන රටාවට ප්‍රිය කිරීම මහල්ලන් යාචකයන් වීමට ප්‍රධාන හේතුන්ය. තමන්ගේ දෙමව්පියන් අතහැර දැමීම අතීත සමාජයේ සිදුවූයේ කලාතුරකිනි. දේපල තිබුනත්, නැතත් අම්මා තාත්තා දරුවන් විසින් මහලු වයසේදී රැකගනු ලැබිණ. බුදු දහමින් ආභාසය ලද අතීතය සමාජය දෙමාපියන් දරුවන් අත්හැර දැමීමෙ නැත. එය පිළිගත් සමාජ ධර්මයක් විය.

වර්තමාන තත්වය ඊට ඉඳුරාම වෙනස්ය. පළමුවෙන්ම දෙමාපියන්ගේ දේපල තමන් ලියා කියාගත් පසු මහලු දෙමව්පියන් නිවසින් එළවා දමන හෝ ඒ අයට නිවසින් 'පල නොකියා' යන්ට සලසන දරුවන් අප අතර ඇත. සමහරවිට දෙමව්පියන් අංශභාග වැනි රෝගවලට භාජන වූ විට දරුවෝ ඒ අය අත් හරිති. ධනය ඇති, උසස් රැකියා කරන දරුවන් දෙමාපියන් මෙසේ අත්හැර දමා තිබෙනු මා දුටුවේ වරක් දෙවරක් නොවේ. විශාල මෝටර් රථයකින් පැමිණි පුතා, ඇස් යන්තමින් පෙනෙන වයසක අම්මා ආරෝග්‍ය ශාලාවට ගෙනියනවා කියා, ගෙදරින් ගෙනැවිත් සැතපුම් ගණනක් ඈත නගරයක දමා ගිය සැටි මට මතකය. තවත් වයසක තාත්තා කෙනෙකු සුසාන භූමියක් ළඟ දමා යන ලද්දේ ද පුතා හා ලේලිය විසිනි. තමන්ගේ දෙමාපියන් අනාථ නිවෙස් වලට යවා ප්‍රථම මාස දෙක තුන ඔවුනට ආධාර කොට, ඉන්බිනිව ඒ අය සදහට අමතක කරන දරුවන්ද ඇත.

දරුවන්, තම මහලු හෝ අබ දුබල හෝ අංග විකල දෙමාපියන් මෙසේ අතහැර දැමීම නිසා, ඒ අයට ප්‍රවේශ වීමට ඇති එකම ලෝකය, යාචක ලෝකයයි. එහිද්ද කිසිම හිඟාකෑමේ පුරුද්දක් නැති නිසාත්, හිඟන ලෝකය හා එහි අවට ගැන නොදන්නා නිසාත්, බොහෝ දුක් විඳින වයසක ඇත්තන් මට නිතර දක්නට ලැබී ඇත. එකපාරටම හිඟන ලෝකයට පාත් වී හිඟාකෑම සාටවත් කළ නොහැකි දෙයකි. අප කලින් කීවා සේ ඒ සඳහා එක්තරා සමාජානුයෝජනයක් අවශ්‍යය. මේ සමාජානුයෝජනය ගැන කවදාවත් හිඟාකා නැති මේ මහලු දුබල මිනිසුන් හා ගැහැනුන් දන්නේ කෙසේද?

හිඟාකෑම හා එහි ඇති විවිධ ක්‍රමෝපක්‍රම ඉගෙනීම යාචක සමාජානුයෝජනයෙන් පළමුවන පියවරකි. දෙවැන්න හිඟන ලෝකය සමග එකට පිරිද්දීමයි, සහවාසය කිරීමයි. තුන්වැන්න හිඟන ලෝකයට බාහිර අනුග්‍රාහක ලෝකය සමග අනුගත වීමයි, සම්බන්ධ වීමයි. මේ අනුග්‍රාහක ලෝකය හිඟන්නන්ට උදව් කරන අය පමණක් නොව හයිකාරයන්, හිඟන මුදලාලිලා හා වෙනත් සමාජ විරෝධී කටයුතුවල යෙදී ඉන්නා අය යමන්විත අවට ලෝකයයි. ඒ අය සමග අනුගත නොවී හිඟන ලෝකයේ ජීවත් විය නොහැක.

මෙබඳු ලෝකයට පත්වන කිසිවක් නොදන්නා අසරණ අම්මා තාත්තා එහි යහතින් සිටිනැයි දරුවෝ සිතති. තමන්ගේ ගෙදර බැල්ලත් වැදූ විට, බලු පැටව්, විශේෂයෙන්ම 'කිංකිපැටවු' රැගෙන ඈත පෙදෙසක දමා යන මනුෂ්‍යයා සිතන්නේ 'උන් මැරුවේ නැහැ. උන් හොඳින් ඉදිවී' කියාය. ඔහු එලෙස සිත හදාගනියි. තාත්තා, අම්මලා මේ විදිහට ඈත දමායන, තනි තරන එසේ කොට ඔවුන්ගෙන් ඉවත්ව යන දරුවන් මව්පියන් ගැන, සිතන්නේ මේ විදිහටය. සිත හදාගන්නේ මේ විදිහට වංක ලෙසය. නමුත් තත්වය ඉතා භයානකය.

යාචක ලෝකයට වැටෙන අසරණ මහලු මිනිසාට හෝ ගැහැනියකට හිඟමන් ලැබෙන්නේ ඉතා කලාතුරකිනි. මා දන්නා එවන් සමහර මහලු අය කෑම නැතිව, බිම නිදාගෙන වැස්සට තෙමී මිය ගියහ. 1976-79 දක්වා මෙසේ මිය ගිය, දරුවන් විසින් අනාථ කරනු ලැබූ දෙමාපියන්ගේ ගණන හැත්තෑ පහකට ආසන්නය. ඒ මා දන්නා අයයි. නොදන්නා අය තව කොපමණ ගණනක් සමාජයේ දක්නට ලැබේද?

මහලු අයට දැන් දැන් සමාජ ක්‍රමයේ ජීවත් වන්නට තැනක් නැත. ඉස්සර මහ පවුල තිබියදී (Extended Family) වැඩිමනත් නෑදෑයෝ ආච්චි, සීයා, නැන්දා මාමා ආදී එහි අවශ්‍ය සාමාජිකයෝ වූහ. අද තනි පවුල (Nuclear Family) එවැනි වැඩිමනත් නෑදෑයන්ට ඉඩකඩක් තබා සකස් වී නැත. ආර්ථිකව තනි පවුලට තමන්ගේ දරුවන් මිස වැඩිමනත් ඥාතීන් රැකිය නොහේ. වැඩිමනත් ඥාතීන්ට ජීවත් වන්නට තනි පවුල ඉන්නා කුඩා නිවසේ හෝ තට්ටු නිවසේ ඉඩක් නැත. වයසට යන විට පැන්ෂන් එක නැත්නම්, දේපල නැත්නම් මහලු අය ඉදිරි වැටෙන්නේ හිඟන ලෝකයටය.

ඇඟපත හොඳින් ඇති, තරුණ උදවිය හිඟාකන්නේ ඇයි? හිඟාකෑම ඉතා ලේසි ආදායම් මාර්ගයක් නිසාය. මම ඒ දිනවල රුපියල් දහතුනක් පමණ හිඟන්නකු ලෙස දිනකට උපයා ගත්තෙමි. 1960 ගණන් වල රුපියල් 13 කෙතරම් හොඳ ආදායමක්ද? විශ්ව විද්‍යාලයේ සහකාර කථිකාචාර්යවරයෙකු හැටියට මා මුලින්ම ලැබූ මූලික වැටුප රුපියල් 430 කි. හිඟන්නෙකු හැටියට මම ආහාර පාන, නැවතීම්, ඇඳුම් වලට වියදම් නොකොට රුපියල් 390 ක් පමණ මසකට හම්බ කළෙමි. මගේ ගවේෂණ සහායකයෙකු වූ ජී.කේ. තිලකරත්න 1969 දී හබරන හන්දියේ නැවතී විරිදු කියමින් පැය දෙකකදී රුපියල් 21 ක් උපයා ගත්තේය. කොළඹ සිට පොල්ගහවෙල කෝච්චියේ හිඟාකෑ මට රුපියල් අටක් පැය දෙකකදී ලැබිණ.

විවිධ දේශපාලන හා සමාජීය සාධකද හිඟන්නන් ඇතිවීම වර්ධනය කරයි. මම 1973 ඉඩම් පනත ගැන කීවෙමි. ඉතා යහපත් චේතනාවෙන් ඉදිරිපත් කළත් ඒ පනත ක්‍රියාත්මක වීම නිසා පෝසතුන්ගේ ඉඩම්වල රැඳී සිටි පවුල් රැසක් නිකම්ම ඒ තැන්වලින් ඉවත් කෙරිණ. තේ වතු ජාතිය සන්තක කිරීම උතුම් කරුණක් වුවත් ඉන් සෑහෙන ගණනක් මිනිසුන්ට (විශේෂයෙන් දෙමළ ජාතිකයන්ට) රකෂා නැතිවිය. උතුරේ යුද්ධය නිසා නැගෙනහිර හා උතුරුමැද පළාතේ දෙමළ - සිංහල - මුස්ලිම් මිනිසුන් අනාථ වී සෑහෙන කොටසක් හිඟන්නන් බවට පත්විණ.

පවුල් පිටින් හිඟන ජීවිතයට වැටීම පරම්පරා දෙකක අනාගතය අනිස්ථිර තත්වයට පත් කිරීමකි. දෙමාපියන් සමග දරුවන් හිඟන්නන් වූ විට, ඒ දරුවන්ද ඊළඟ පරපුරේ යාචකයන් වීම ස්වභාවික දෙයක් විය. නමුත් හැත්තෑ ගණන්වල සිට දෙමව්පියන් යාචකකම් කළත්, දරුවන් වර්ධනය වන විට යාචකකම වෙනුවට සමාජ විරෝධී වැඩවල නිරත වීම නිකම්ම සිදුවිණ. ගංජා, හෙරොයින් විකිණීම, සුලු සොරකම් කිරීම, ආදියට පුරුදු වූ දරුවෝ තරුණ වියට පත්වන විට හිඟාකෑම වෙනුවට සමාජ විරෝධී අපරාධ, ගණිකා වෘත්තිය වැනි කටයුතුවලට පුරුදු වූහ.

හිඟන්නන් ඇති වීමට අපේ මුඩුක්කු හා පැල්පත් හේතුවිනැයි තර්කයක් ඇත. මේ පැල්පත්වල ජීවත්වන අයගේ සංස්කෘතිය මහ පවුල් ක්‍රමය ඇතුළත් සංස්කෘතියට සමීප සංස්කෘතියකි. ඔවුහු මුඩුක්කුවේ ජීවත් වන්නේ එක පවුලක් හැටියටය. ඒ නිසා ඒ අය අතරින් හිඟන ලෝකයට ගිලිහී වැටෙන අය විරලය. ගමෙන් නගරයට පැමිණ පාර අද්දර පැලක් අටවා ගෙන සිටින පවුලක්, ඒ අයුරින් ජීවත් වන්නට බැරි වූ විට හිඟන ජීවිතයට වැටෙයි. මුඩුක්කුවට හෝ පැල්පතට එකතු විය හැකි නම් ඔවුන්ට යාචක ලෝකයට ඇතුළත්වීම අවශ්‍ය නොවේ.

කොළඹ ප්‍රදේශයේම ඇති ජනාවාසයක් ගැන මම කීවෙමි. මුඩුක්කු පැල්පත් ඇති මේ ජනාවාසයේ හිඟන්නන් ඇති නිසා ඒ ගැන මා කියන්නේ කුමක්දැයි ඔබ ප්‍රශ්න කරනු ඇත. මේ ජනාවාසයේ පැල්පත් හා මුඩුක්කු ඇති

නිසා මහ පවුල් ක්‍රමය එක්තරා විදිහකට එහි බලපවත්වයි. මේ ජනාවාසයේ හිඟන්නන් නැත. ඇත්තේ හිඟන වෘත්තිය ප්‍රයෝජනයට ගෙන ඉන් ඈතට ගොස් මුදල් උපයා ගන්නා හිඟන වේශධාරීන්ය. ජනාවාසය තුළ මා කලින් කීවා සේ ඔව්හු සාමාන්‍ය අය ලෙස ජීවත් වෙති.

හිඟන්නන්ට මුදල් දීම හිඟන වෘත්තිය දිගටම කරගෙන යෑමට අනුබලයක්ද? නැත යනු මගේ හැඟීමයි. අසරණ මහලු අබ්බගාත අංගවිකල අයට සමාජය හිඟමන් නුදුන්නොත් සිදුවන්නේ කුමක්ද? ඒ අයට හරියාකාර පිටුවහලක් විය හැකි දිනක පාරේදී දෙන හිඟමන් වෙනත් ආකාරයකට පරිවර්තනය කරන්නට හැකිවනු ඇත. අනික් අතට 'හිඟන වේශධාරියෙකුට' වුවත් යමක් දෙන නිසා ඔහු සමාජ විරෝධී වැඩ වලින් ඉවත් වනවා නොවේද?

ළමයින්ට හා අතපය වෙහෙසී වැඩක් කරකියාගත හැකි තරුණ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම ආධාර කිරීම නොකිරීම ප්‍රඥාගෝචරය. අවශේෂ හිඟන්නන්ට හිඟමන් නොදීමෙන් හිඟන වෘත්තිය අඩාල කිරීමට වඩා වෙනත් සමාජ ප්‍රශ්න ඇති කිරීමට මගක් වනු ඇත. හිඟාකෑමට පෙළඹෙන්නේ විවිධ සංකීර්ණ හේතු මත නිසා ඒ හේතු සාධකවලට පිළියම් යොදන තෙක් තාවකාලික පැලැස්තර වලින් සිදුවන සේවය සීමාසහිතය.

යාචක ලෝකයට පිවිසෙන හිඟන්නනන් එසේ එන්නේ මාර්ග තුනක් ඔස්සේය.

1. හිඟන ලෝකයට ක්‍රමයෙන් සමාජානුයෝජනය වීමෙන්
2. හදිසියෙන් හිඟන ලෝකයට පතිත වීමෙන්
3. තාවකාලික හිඟන්නන් ලෙස වෙස්වළාගෙන, යමක් උපයාගැනීමට මග යොදා ගැනීමෙන්.

හිඟන ලෝකයට සංකීර්ණ හේතුසාධක නිසා පිවිසෙන බොහෝ අය පුරම මාර්ගය ඔස්සේ එන අයයි. ඔවුහු හිඟන පවුල් හා මිත්‍රව කොයියම් විදිහකින් හෝ මේ සමාජානුයෝජනය ලබා ගනිති. සියයට අනූ දෙකක්ම හිඟන්නන් මේ ආකාරයෙන්ම හිඟන ලෝකයට අවතීර්ණ වන අයයි.

හදිසියේ හිඟන ලෝකයට වැටෙන්නේ දරුවන් විසින් අතහැර දමනු ලැබූ දෙමව්පියන් හෝ වැඩිහිටි නැදෑයන්ය. ඒ අය හිඟාකන්නේ කිසිදු සමාජානුයෝජනයක් නැතිවය. හිඟන ජීවිතය පුරුදු නැති නිසාම ඒ අය තමන් යාචකයන් වුවත්, යාචකයන්ට සමීප වන්නේ කලාතුරකින්ය. බොහෝවිට මා දැක ඇත්තේ ඉතා ස්වල්ප කාලයකින් ඔවුන් මිය යෑමයි. ඉදහිට යාචක ලෝකයට සමාජානුයෝජනය වන නැනැත්තෙක් පමණක් කලක් ජීවත් වෙයි.

තුන්වැනි ක්‍රමය හිඟන වේශධාරීන්ගේ ක්‍රමයයි. හිඟාකෑමට මෙන්ම හොරකම් කිරීමටත් හිඟන්නන්ගේ වේශය ගන්නා අය ඇත. දැන් දැන් අපරාධ කරන අයද දේශපාලන ප්‍රචාරකයෝද හිඟන වේෂය දරන්නාහ. මේ අය බිහිවීම හිඟන වෘත්තියේ නව ප්‍රවණතාවකි. මෙබඳු අයත් විවිධ ආබාධ ලොකු කොට පෙන්වා (අන්ධයන්, කොරුන් මෙන් පෙනී සිට) හිඟාකන යාචකයනුත් අතර වෙනසක් ඇත. හිඟන වේශධාරීන් ජීවත් වන්නේ සාමාන්‍ය මිනිසුන් අතරය.

හිඟන වේශය ආරූඪ කරගෙන හිඟාකන ඔව්හු නැවතත් තමන්ගේ ලෝකයට යති. හිඟන්නන් මොන උප්පරවැට්ටියක් හෝ යොදා හෝ දකින්නන්ගේ අනුකම්පාව දිනා ගන්නට තැත් කළත් ඔවුන් ජීවත් වන්නේ හිඟන ලෝකයේය. හිඟන වේශධාරීන්ට යන්තමින්වත් ළං වන්නේ හිඟන මහත්වරුය. අවිස්සාවේල්ල පළාතේ එවන්නෙක් ගැන මම දැන සිටියෙමි. කලිසම් කමිස ඇඳ එවක (1970 ගණන්වල) මහරගමට එන ඔහු මහරගම පොදු වැසිකිළියට ගොස් ඒවා ගලවා හිඟන වේෂය දරා ගනියි. ඉන් පසු හිඟාකන ඔහු නැවත මහරගමට විත් තම පුරුදු ඇඳුම ඇඳගෙන සාමාන්‍ය අයෙකු ලෙස ගෙදර යයි.

ඔහුගේ ගෙදර බලන්නට මමද ගියෙමි. තරුණ දියණිවරු දෙදෙනෙකුගෙන් (තිදෙනෙකු) යුත් ඒ පවුල වාසය කළේ තරමක් හොඳ නිවාසයකය. ගමේ සැමටත් ඔහු කීවේ කොළඹ රස්සාවක් කරන බවය. 'මහත්තයා' කියා ඔහුට ඇමතීම ගමේ සිරිත විය. 'මහත්තයා' ඇත්ත වශයෙන් ම හිඟන්නෙකු බව දැන සිටියේ මා පමණක්ද? ඒ තරමට හොඳින් මහත්තයා තම රක්ෂාව කරගෙන ගිය බව සඳහන් කිරීම වටී.

12 යාචක ලෝකය - නූතන ප්‍රවණතා (1977න් පසු)

මගේ ක්ෂේත්‍ර පර්යේෂණ අවසන් වූයේ 1977 දිය. නමුත් යාචක ලෝකය හා මගේ සම්බන්ධතා ඒ මොහොතේදී නැවතුනේ නැත. මම දිගටම ඔවුන් ගැන කරුණු සෙව්වෙමි. මගේ ශිෂ්‍යයන් ගෙන් මෙන් පශ්චාත් උපාධි පර්යේෂකයන්ගෙන්ද යාචකයන් පිළිබඳ තොරතුරු ලබාගත්තෙමි. මට හිතවත් යාචකයින්ද වරින්වර මට හමුවිණ. ඒ අයද යාචක ලෝකයේ අලුත් තොරතුරු මට මහත් අභිරුචියකින් විස්තර කළහ.

1995 වන විට, 1977 යාචක ජනගහනය මෙන් දෙගුණයක් යාචක සංඛ්‍යාව දියුණුවී යැයි මට කිවහැකිය. රටක දියුණුව හෝ පරිහානිය මනින්නට ඒ රටේ යාචක සංඛ්‍යාවද වැදගත් යැයි මට සිතේ. 1977, 24,984ක් වූ මේ අය 1995 ඒ වගේ දෙගුණයක් වුවත්, රටේ ජනගහනය එසේ දෙගුණ වී නැත. මේ සියල්ල සිදුවූයේ මහාපරිමාණයේ සංවර්ධන කටයුතු දැවැන්ත ලෙස රටේ සිදුවෙද්දීය.

ඕනෑම රටක සංවර්ධනය මනින්නට ඒ රටේ 'සමාජ මලමුත්‍ර' ලෙස සැලකිය හැකි මෙබඳු කොටස් විමසා බැලීමෙන් මගක් ලැබේ. මිනිස් සිරුරේ සෞඛ්‍යය ඒ අයගේ මල - මුත්‍ර විමසීමෙන් ලැබෙන්නේ යම්සේද, සමාජයේ 'මලමුත්‍ර' ලෙස සලකන අයගෙන් කොටසක් වූ යාචකයන් පරීක්ෂණයට භාජනය කිරීමෙන් ඒ සමාජයේ සෞඛ්‍යය (-සංවර්ධනය) ගැන අවබෝධ කරගත හැකිය.

මට 1977 න් පසු දකින්නට ලැබුණ ඉතාම කණගාටුදායක සිද්ධිය නම් අපේ වැදි මිනිසුන් අතර යාචක පරපුරක් බිහිවීමය. වනචාරී ප්‍රාථමික ගෝත්‍රයක් ලෙස සැලකුවත් වැද්දෝ තමන්ටම ආවේනික වූ සංස්කෘතියක අභිමානවත් කොටස්කාරයෝ වූහ. සිංහල බෞද්ධයා මේ අවුරුදු දෙදහස් පන්සියයක කාලය තුල එකම වැද්දෙකුවත් තම ආගමට හරවාගන්නට තැත් නොකිරීමෙන් වැද්දන් ගත කළ නිවහල් දිවිපෙවෙත හා ඊට අවටින් ලැබුණු අනුබලය ගැන වටහා ගැනීමට පුළුවන.

අද සමහර වැද්දෝ හිඟන්නන් බවට පත් සිටිති. දඩයමට ගිය කාට වුවත් පිටරට සංචාරකයන් එන විට ඒ අය ගෙන් යමක් හිඟාකන්නට බලා ඉන්නා වැද්දන් සෑහෙන ගණනක් දැකිය හැකිය හැකිය. මෙසේ වී ඇත්තේ අපේ මේ ඉතා වැදගත් මානව වර්ගයට කිසිදු රජයකින් තමන්ගේ යුතුකම ඉටු නොවීම නිසාය. වැද්දා ඒ නිසා දවසින් දවස දුප්පත්කමින් අන්ත දුප්පත්කමට ඇද වැටුණේය. අද ඔහු කිසිවක් කරකියාගත නොහැකිව අනුන්ට අතපාන යාචකයෙක් බවට පත්ව ඇත.

අපේ රට වැදි පරපුර නිසා මානව විද්‍යාත්මක වශයෙන් ලොවපුරා පතළ විය. නමුත් මෙබඳු කීර්තියක් අපට ගෙන දුන් වැද්දන්ට නිදහසේ තමන්ගේ ජීවන රටාව අනුව ජීවත්වන්නට අපි ඉඩ නුදුන්නෙමු. සංවර්ධනය නමින් අපි ඔවුන්ගේ ඔවුන්ගේ දරුවන්ද, අපේ ලිංගික කටයුතු වලට ඔවුන්ගේ ගැහැනු ද යොදා ගත්තෙමු. වැදි මිනිසා අසරණ වී කිසිවක් කර කියාගත නොහැකිව තමා බලන්න එන 'සුදු' මිනිසාට යාචක ලීලාවෙන් අත දික්කරන්නේ යන්තම් පණිනල ගැටගසා ගන්නටය.

අපේ නූතන සමාජය වැදි මිනිසුන්ට දුම්බීම, මත්පැන්, මත්ද්‍රව්‍ය, සුදුව, ලිංගික අපචාර පුරුදු කළා මිස කිසිදු වැදගැම්මකට ඇති කුසලතාවක් පුරුදු කළේ නැත. ප්‍රයෝජනවත් අධ්‍යාපනයක් ඔවුන්ට ලබාදුන්නේ නැත: වෙනස්වන සමාජයකට උචිත ලෙස හැඩගැසෙන්නට ඔවුන්ට හැකි වන්නට තිබුනේ එබඳු අධ්‍යාපනයක් මගින් පමණි. එදාවේල කන්න නැති වැදි දරුවා අඳින්නට ඇඳුම් පොත්පත් නැති දරුවා, පාසැල් යන්නේ කොහොමද? අප කව්රුවත් මේ කරුණු වටහාගත්තේ නැත. දැන් ඒ නිසා පැරණි වැදි පරපුර අපට දකින්නට ලැබෙන්නේ යාචක පරපුරක් ලෙසය.

සංචාරක ව්‍යාපාරය රටකට අවශ්‍යය. නමුත් රටක සමාජය හා සංස්කෘතියට හානියක් වන සංචාරක ව්‍යාපාරයක් ඇත්නම් ඒ හානිය ගෙනදෙන අංග හඳුනාගෙන ඒවා සංචාරක ව්‍යාපාරයෙන් ඈත් කළ යුතුය. සංචාරක හිඟන්නා මෑතදී ඇති වූවකි. මුලදී එක් හිඟන්නෙක් හෝ දෙන්නෙක් සංචාරකයන් පස්සේ ගියහ. කුඩා ළමයි පේලි සැදී ගියහ. පිටරටින් පැමිණෙන අය විශේෂයෙන් යුරෝපීය අය මේ රටේ ළමයි අතපාමින් ආවිට ඔවුන්ට මුදල් දුන්හ; තෑගි දුන්හ.

අද මේ නිසා සංචාරක යාචකයන් සෑහෙන රාශියක් දක්නට පුළුවන. ඒ අය කොළඹ මෙන්ම සංචාරක ව්‍යාපාරය බලපවත්වන ප්‍රදේශවල හිඟාකති. ඔවුන්ගේ ඉලක්කය සුදුහම ඇති සංචාරකයන්ය; ඒ අයගෙන් අපේ අයට වඩා මුදල් ලබාගැනීමට පුළුවන් බව මේ හිඟන්නෝ හොඳින් දනිති.

සමහර සංචාරක හිඟන ළමයි යමක් විකිණීමේ ව්‍යාජයෙන් සංචාරකයන් ළඟට එති. මේ සුලු දේ විකිණීමට වඩා යමක් හිඟාකෑම මේ ළමයින්ගේ පිරිතය. තමන්ගේ දුක් අඟවා සංචාරකයින්ගේ හිත් දිනාගත මෙසේ යම්යම් දේ ලබාගැනීමට මෙබඳු ළමයි අති දක්ෂයෝ වෙති. සමහර මුදලාලිලා මෙවැනි ළමයින් යොදා සංචාරකයින්ගෙන් මුදල් එකතුකර ගනිති.

උතුරේ යුද්ධය නිසා අපේ රටේ අලුත් යාචකයන් රැසක් බිහිවිය. අම්මා, තාත්තා නැතිවූ ළමයි, ස්වාමියා අහිමිවූ බිරිඳ, අතක් පයක් නැති බිඳී දුබලවූ පුද්ගලයා ඉතා ඉක්මනින්ම යාචක ලෝකයට නාතුවුනේය. එසේ සිහමත් යැද ජීවත්වීමට වඩා ඒ නැනැත්තාට කළහැකි වෙනත් වැඩි දෙයක් නොතිබිණ. දකුණේ 1988 -89 පැවති ත්‍රස්තවාදය නිසාද පවුල්වල තාත්තලා අහිමි වූ දරුවෝ ජීවත්වන්නට මගක් නැතිව හිඟන්නන් බවට පත්වූහ.

ත්‍රස්තවාදී කටයුතු නිසා අංග විකලවූවන් නගරයේ රථවාහන ආලෝක සංඥා පුවරු අසල හන්දිවලදී දැකගැනීමට ලැබීමෙන් නූතන යුගයේ යාචකයන්ගේ අළුතින්ම එකතුවක් හඳුනාගත හැකිය. බම්බලපිටිය, කොල්ලුපිටිය

ප්‍රදේශවල මේ අය බොහෝවිට දක්නට ඇත. වෙනත් රටවල රථවාහන ගමන් කරන මාර්ගයන්හි වර්ණ සංඥාපුවරු අසල මෙබඳු පුද්ගලයෝ නිතර ගැවසුනාහ. ශ්‍රී ලංකාවේ වර්ණ සංඥා පුවරු අසල මෙය දක්නට ලැබුණේ ඉතා මෑත සිටය.

ත්‍රස්තවාදී කටයුතු නිසා අනාථ වූ අය බොහෝ කඳවුරුවල රැඳී සිටිති. කොළඹ හා අවට රැඳී සිටින මේ අයගෙන් බොහෝ දෙනෙක් යම්යම් ජාවාරම්කාරයන් විසින් හිඟාකෑමෙහි යොදවනු ලැබේ. මින් සමහරු වර්ණ සංඥා පුවරු ඇති තැන් වෙත ගෙනියනු ලබන අතර අනිත් අය විවිධ ආකාරයෙන් හිඟාකෑමට පත්කරලන්නට කූට ව්‍යාපාරිකයෝ උගුල් අටවති. කලක් යනවිට කඳවුරට ආ අනාථ අබ්බගාතයා යාචකයෙක් බවට පත්වෙයි.

මේ යාචකයන් අතර ළමයි, තරුණ අය හා මහලු අය සිටිති. ළමයෙක් වඩාගත ඉන්නා තරුණ හෝ මැදවයසේ ගැහැනුන්ද ඒ අතර දක්නට පුළුවන. ඒ හැමදෙනාක්ම වාගේ අත පය කැඩුණු බිඳුණු අබ්බගාතයන්සේ දැකගත හැකිය.

මේ අය වර්ණ සංඥා පුවරු අසලට විත් සංඥා පුවරුවල වර්ණ වෙනස් වන තුරු නවත්වාගත ඉන්නා මෝටර් රථ වෙත ගොස් හිඟාකෑමෙහි යෙදෙති. මේ අතර සමහරු සංවිධානාත්මකව ඔවුන් ඒ කාර්යෙහි යොදවන එක්තරා කල්ලියක් විසින් මෙබඳු තැන්වලට ගෙනවිත් අතහරින බව අපට දැනගන්නට ලැබිණ.

නගරයේ මෑතදී යාචක පවුල් පාර අද්දර 'ගෙවල්' තනාගත හිඟාකන හැටි දැකගත හැකිය. මේ 'ගෙවල්' පොල් අතු හෝ පොලිතින් කොළවලින් සකස් කොට ඇත. ඒ ගෙවල් තුළ මුළු පවුලම වාසය කරති. ගෙවල් ඇත්තේ මහපාර අද්දරය. ඒ වාගේම පාර අද්දර දවස ගතකරන පවුල් නොතෙමී ඉන්නට පමණක් කොතැනකට හෝ රිංගා ගන්නා හැටි අපට දැක පුරුදුය. නුගේගොඩ එබඳු පවුල් කීපයක් ඇත. ඉන් එක් පවුලක් පල්ලිය ළඟ පදික වේදිකාවේ ජීවත් වෙති. ඒ පවුලේ තාත්තා අබ්බගාතයෙක්ය. ඔහු විටෙක රෝද පුටුවෙන් යයි. තවත් විටෙක බිම ඇද්දී ඇද්දී ගමන් යයි. ඔහුගේ බිරිඳ දරුවන් හා බල්ලා වාසය කරන්නේ පදික වේදිකාවේය. ඊට ටිකක් එහා මැදි හිඟන්නා තම පවුලේ දූවරු දෙන්නා හා බිරිඳ සමඟ හයිලෙවල් පාරේ කොන්වන්ට් එක ළඟ පාර අද්දර කල් ගෙවයි. ඔහුගේ බිරිඳට තවත් දරුවකු ලැබෙන්නට දැන් ලකුණු පහළවී ඇත. යාචකයා මේ ගැන මා සමඟ කතා කළේ බලවත් ආඩම්බරයකින් මෙනි. ළමයා ලැබුණු පසු ඔහුද මහ පාරේ යාචක පරපුරට අලුතින් එක්වන සාමාජිකයෙක් වෙයි.

කලකට පෙර කොළඹ ගජ්යට හිඟාකන පවුල් කීපයක් වාසය කළේය. හැව්ලොක් ටවුමේ බී.ආර්.සී. පිට්ටනියේ එක් කෙළවරක විශාල ගහයට දරුවන් කීපදෙනෙකුගෙන් යුත් හිඟන පවුලක් සෑහෙන කාලයක් වාසය කළා මට මතකයි. නූතන යුගයේ හිඟන පවුල් මහපාරේ පදිකවේදිකාවේම ජීවත් වීමෙන් පෙනෙන්නේ රටේ දරිද්‍රතාව ක්‍රමයෙන් පළේ වූ යැටිය. ඉස්සර හිඟන්නන් නැති තැන්වල අද හිඟන්නන් දකින්නට ලැබෙන්නේ ආර්ථික - සමාජ පීඩනය ක්‍රමයෙන් වර්ධනය වන නිසාය.

කලක් ගණිකා වෘත්තියේ සිට මහලු ස්ත්‍රීන් කීපදෙනෙකු මම යාචකයන් අතර දුටුවෙමි. ගණිකා වෘත්තිය දීර්ඝ කාලයක් කරන්නට පුළුවන් රක්ෂාවක් නොවේ. එය කලකට පසු නවත්වන්නට සිදුවේ. තමා වෙත එන අනුග්‍රාහකයින් අඩුවීම ඊට ප්‍රධාන හේතුවයි. අනුග්‍රාහකයන් අඩුවන්නේ තරුණ වයස ගෙවී ගොස් මහළු වී, ජරාජීර්ණ බවට පත්වන විටය. මේ ගණිකාවන් ඉන්පසු වැටෙන්නේ අනුන්ගෙන් ඉල්ලාගන කෑමටය. පැරණි ගණිකාවන් යාචක තත්වයට පත්වන හැටි මා දුටු ප්‍රථම අවස්ථාව 1977න් පසු දක්නට ලැබිණ.

කතා දමමින් හිගාකෑම කිරීම ඉස්සර තිබුණේ නැත. අද පිරිමි පමණක් නොව අනුන් රවටා ගැහැනු අය ද මෙසේ හිගාකෑමෙහි යෙදෙනු දැක්ම දුර්ලභ කරුණක් නොවේ. එබඳු ගැහැනු අය ඇඳපැළඳගෙන සිටින ආකාරයෙන් හෝ ඉංග්‍රීසි කතාකරන විලාශයෙන් කවදාවත් යාචකයන් යැයි සිතන්නට බැරිය. එවන් යාචක මහත්වරු මෙන්ම නෝනලාද අද රටේ ඇත.

මහලු අය සෑහෙන ගණනක් අද අමුතුම ආකාරයේ හිඟන්නන් බවට පත්ව ඇත. ඉස්සර නම් එබඳු අයෙක් හිඟන්නෙකු වීමට පෙර සෑහෙන සමාජානුයෝජනයකට ළඟුවෙයි. අද සමාජ - ආර්ථික වෙනස්වීම් නිසා බොහෝ මහලු අයට තම පවුල් සමඟ වාසය කිරීමට නොහැක. තාත්තා හා අම්මා මහලු වියට පත්ව රැකබලා ගැනීමට පුත්තු හා දූලා අකමැති වෙති. තවත් අයට තම මහලු දෙමාපියන් රැකබලා ගැනීමට අවශ්‍ය වුවත් එසේ කිරීමට පුළුවන් ආර්ථික හයියක් නැත. තත්වය මෙසේ නිසා දිනෙන් දින අසරණවී මහමගට වැටෙන මහළු යාචකයින්ගේ ගණන සුළු පටු නැත.

නුගේගොඩ නගරයේ 1995 මුලදී මෙබඳු යාචකයින් 87 ක් දක්නට ලැබිණ. 1994 අගදී එහි සිටියේ 32 ක් පමණි. මේ සියලුදෙනාම නුගේගොඩට ඈත ප්‍රදේශවල ජීවත් වූ අයයි. ඉන් සමහරු අතපය කැඩී හෝ ලෙඩක් වී දීර්ඝකාලයක් ආරෝග්‍යශාලාවක රැඳී සිටීම නිසා දරුවන් විසින් අමතක කරනු ලැබූ අයයි. තවත් අය දරුවන් විසින් උවමනාවෙන්ම නිවසින් එළියට දැමූ අයයි. තවත් කීපදෙනෙක් තමන් නිසා දරුවනට කරදර වන්නේයැයි සිතා තුමූම දරුවන්ගේ නිවෙස් වලින් ඉවත්වූවන් වන්නාහ.

වයසක තෙනෙක් හිතන්නේ පාරට ගියවිට තමන් නිකම්ම හිඟන්නෙක් වන්නට හැකි බවයි. පාරට යෑමේ වරද ඔවුන්ට තේරෙන්නේ දවස් කීපයක් ගියවිටය. පාර අයිනේ වාඩිවූ පලියට හිඟමන් ලැබෙන්නේ නැත. හිඟමන් ලබාගන්න විධි හා ක්‍රම දත යුතුය. ඒවා උගෙන ගන්නට පුළුවන් වන්නේ හිඟන ලෝකයට සමාජානුයෝජනය වීමෙනි. යාචක ලෝකය හඳුනා නොගෙන හිඟන්නෙකු විය නොහැක. එසේ නොවී හිඟන වෙස්ගන්නා යාචක ලෝකයේ අවතීර්ණ වන්නා එහි හුදකලා වෙයි. යාචක ලෝකයට පිහිටා ඇති යාබද විටි සංස්කෘතිය ගැන ඔහු හෝ ඇය දන්නා කිසිවෙක් නැත. යාචක ඥාතිය උගත්තේ නම් මේ පියල්ල ඔහුට හෝ ඇයට වැටහෙනු ඇත.

මහලු අය මෙසේ නිකම් යාචකයන් වී කව්රුවත් අනුකම්පාවෙන් දුන් දෙයක් රැගෙන, බොහෝ විට කිසිවක් නොලබා කුසගින්නේම මියයති. වැස්සට තෙමෙන

විට කඩපිලක ලගිනා ඔවුන් අවශේෂ යාචකයන් හා ඒ අයට අනුබද්ධ තැරැව්කරුවන් විසින් එළවා දමනු ලැබේ. කැමස් බීමක් පවා මේ අයට ලැබෙන්නේ කලාතුරකිනි. මෙබඳු මහලු අයගේ කණගාටුදායක තත්වය වටහාගත හැකි වන්නේ ඔවුන්ගේ ජීවිත අත්දැකීම් දන්නා අඳුනන අයෙකුට පමණි.

තරුණ හිඟන්නන්ගේ ප්‍රමාණය අද වර්ධනයවී ඇත. බොහෝවිට අපට දක්නට ලැබෙන්නේ තරුණ පුරුෂයා මත්පැනට, මත්ද්‍රව්‍යවලට හෝ සූදුවට ඇබ්බැහි වී සිටින සැටිත්, ඔහුගේ බිරිඳ දරුවන් සමඟ හිඟා කමින් සැමියා ඇතුළු පවුල නඩත්තු කරන සැටිත්ය. මේ තත්වය කොළඹ නගරයේ ඕනෑම තැනක දැකිය හැකිය. හවස්වරුවේ මහරගම වෙළඳසැල් සංකීර්ණයේ පැය කීපයක් ගත කළොත් එබඳු තරුණ යාචකයන් දුසිමක්වත් සොයාගත හැකිය. මේ තරුණයන් හිඟාකන්නේ නැත. හිඟාකෑමෙන් මුදල් උපයාගන්නේ බිරිඳ හා දරුවන්ය. ඔහු නඩත්තු වන්නේ මේ මාර්ගයෙනි.

අද ඇතැම් යාචකයන් (තරුණයන් නොවූවන්) මත්ද්‍රව්‍ය හා මත්පැන්වලට ඇබ්බැහි වී ඇත. කොළඹ නගරයේ 'වල' කියා තැනක් ඇත. නීතිවිරෝධී මත්පැන් විකුණන මෙතැන ඕනෑම වේලාවක මත්පැන් ගෙන මත්වී නිදන හිඟන්නන් හතර පස්දෙනෙක්වත් සොයාගත හැකිය. සමහර එබඳු අය හැත්තෑපහක් පමණ අපි එහි වරින් වර වැටී ඉන්නවා දැක ඇත්තෙමු.

මත්ද්‍රව්‍ය ගැනීම මීට පෙර කාලවලදී හිඟන්නන් අතර නොතිබිණ. ඉඳ හිට පමණ පානය කරන හිඟන්නෝ සිටියත් අවශේෂ යාචකයෝ ඒ තැනැත්තා පිළිකුලට ලක් කළහ. ඉහත යුගයේ ගංජා බීම පැහෙන ගණනක් කොළඹ හිඟන්නන්ට ඇබ්බැහි කොට ඇත. සමහර ව්‍යාපාරිකයන් විසින් හිඟන්නන් මත්ද්‍රව්‍ය ප්‍රවාහණයට හා විකිණීමට යොදා ඇත.

මත්පැන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ හිඟන්නන්ට ඒ සඳහා මුදල් අවශ්‍ය වූ විට එක්තරා ස්ථානයකට ලේ විකිණීමෙන් මුදල් ලබාගන්නට හැකිවී ඇත. හාරාහේන්පිට පැත්තේ පිහිටා ඇති මේ ස්ථානය පෞද්ගලික වෛද්‍යවරයෙකුගේ සායනයකි. මෙතැනට හිඟන්නන් ගේන්නේ තැරැව්කාරයන්ය. ඒ අයගේ ලේ ගෙන මේ සඳහා හිඟන්නන්ට මුදලක් ගෙවනු ලැබේ. මෙබඳු ලේ පුද්ගලික ආරෝග්‍යශාලාවලට සපයන බව සැලයි. තවත් සමහරු කියන විදිහට ඒ ලේ උතුරේ ත්‍රස්තවාදීන්ට ඉතා ඉහළ මිලකට විකුණනු ලැබේ.

නූතන යුගයේ ඇතැම් යාචකයින්ගේ ලිංගික චර්යා වෙනස්වී ඇත. මීට හේතුව වූයේ ඇතැම් පිටස්තර අය යාචක දරුවන් ලිංගික වශයෙන් ප්‍රයෝජනයට ගැනීමයි. මහලු යාචකයන් කුඩා දරුවන් මෙසේ යොදවා ගැනීම කොළඹ නගරයේ ඇතැම් පැතිවල දක්නට පුළුවනි. පිටකොටුව, ඇස්වාට්ටුව හන්දිය, කොම්පඤ්ඤ වීදිය මෙවැනි චරියා ඇති හිඟන්නන් දක්නට ලැබෙන ස්ථාන වෙයි. ඇස්වාට්ටුවේ සීයා කෙනෙකු කුඩා ගැහැනු ළමයෙක් තමාගේ අබ්බගාත කරත්තය තල්ලු කිරීමට යොදාගෙන ඇත. ඒ ළමයාගේ අම්මාත් ඉන්නේ වීදියේමය. මහලු සීයා මේ කුඩා දැරිය ලිංගික වශයෙන් ප්‍රයෝජන ගන්නා බව අම්මා නොදනියි. කරත්තය තල්ලු කළවිට දැරියට ලැබෙන බත්මුල අම්මා හා එක්ව බෙදාගන කන්නීය.

හිඟන ලෝකයේ කුඩා දරු දැරියන්ගේ තත්වය 1977 න් පසු ඉතා භයානක විය. මේ දරුදැරියන් පිටස්තර අය අතින් මෙන්ම හිඟන ලෝකයේ වැඩිහිටියන් අතින් විපතට පාත්‍රවීමේ ප්‍රවණතාව ක්‍රමයෙන් වර්ධනය වී ඇත. මෙය ඉතා භයානක වෙනස් වීමකි. යාචක ලෝකයේ වැඩිහිටියන්ට පාරේ ඉන්නා මේ දරුවන්ට තර්ජනයක් වෙනවා නම්, අප ඒ දරුවන් බේරාගන්නේ කොයි විදිහටද'

හිඟන දරුවන්ට තවත් භයානක තර්ජනයක් තිබේ. ඔවුන් අද සමාජානුයෝජනය වන්නේ පාතාලලෝකයට උචිත ලෙසය. තමන්ගේ අම්මා හා තාත්තා අයිති යාචක ලෝකය ඔවුන්ගේ සාමාජානුයෝජනය කෙරෙහි බලපාන්නේ ඉතා සීමිත ලෙසය. වීදියේ ගණන් කාරයා, පික්පොකට්කාරයා, පිම්පියා, ගණිකාව, හොරා, ගංජාකාරයා, කුඩුකාරයා, ලිංගික අපචාර කරන්නා, මිනී මරන්නා අතරය ඔවුන් හැදෙන්නේ. මෙවැනි මඩවලක ඒ මඩවලෙන් ඉහළ නැගී කුසුමක් සේ පිපෙන්නට ඔවුන්ට කවදාවත් ඉඩක් නැත.

අනාගතයේ මේ දරුදැරියන් පාතාල ලෝකයේ කොටස් කාරයන්ය. ළගනුවර ඇතැම් පෙදෙස්වල හිඟන ළමුන් හොරුන් විසින් මුලින්ම යොදනු ලබන්නේ ඔත්තු බැලීමටය. දෙවනුව මෝටර්රථ කෑලි සොරකම් කිරීම වැනි දෙයට ඒ අය යොදවති. ඉන්පසු වෙනත් අපරාධවලට පුරුදු කරවනු ලැබේ. හිඟන ගැහැනු ළමයි වැඩිවිය පැමිණීමටත් පෙර වීදියේ මැරයන් විසින් දූෂණය කරනු ලැබේ. මේ සියල්ලට විරුද්ධව නැගී සිටින්නට තරම් බලයක් අද හිඟන පවුලට හා හිඟන සමූහයට නැත. ඉස්සර නම් ඒ බලය ඔවුන් සතුව තිබිණ. ඔහු තම සමූහයේ අනන්‍යතාව ඒ කාලයේ ආරක්ෂා කළහ. අද සමාජයේ වෙනස්වීම් නිසා ඔවුන්ට එය කළ නොහැකි වී තිබේ.

ක්‍රි.ව.2000 දී අපේ යාචකයා කෙබඳු තත්වයකට පත්වේද? මේ ගමන් කරන ආකාරයට අපේ ආර්ථික සමාජීය කිඳවැටීම දිගටම තිබුනොත් ක්‍රි.ව. 2000 වනවිට අද ඉන්නා යාචකයන් මෙන් දෙගුණයක් යාචකයන් මේ රටට ඇතිවේ යයි මම කල්පනා කරමි. දැනට අප නොදන්නා අලුත් මාදිලියේ යාචක වර්ග මේ කාලය තුල බිහිවන්නට පුළුවන. යාචක තරුණයන් ත්‍රස්තවාදයට හෝ දරුණු අපරාධවලට නැඹුරුවීමෙන් බරපතල සමාජ ප්‍රශ්නවලට මුහුණ දෙන්නට අපට සිදුවනු ඇත. ලිංගික අපචාර යාචකයන් අතර සීඝ්‍රව වර්ධනය වනු ඇත. මත්ද්‍රව්‍ය ව්‍යාපාරය උදෙසා ඒ අය අතරමැදිකරුවන් ලෙස යොදාගැනීමේ ප්‍රවණතාවය ක්‍රි.ව. 2000 වනවිට විශාල දියුණුවක් ලබන්නට පුළුවන. එවිට අපරාධ සඳහා කෙලින්ම යාචක දරුවන් හා තරුණයන් සම්බන්ධ කරගන්නට පෙළඹීම සාමාන්‍ය සිද්ධියක් වීමට ඉඩ තිබේ. මහලු යාචකයන් සීමාන්තිකව වර්ධනය වීමෙන් වැඩිහිටි යාචක ප්‍රශ්නය විසඳීමට නොහැකි තරමේ උග්‍ර සමාජ ප්‍රශ්නයක් වීමද වැලැක්විය නොහැකිය.

13 මගේ යාචක සමාජානුයෝජනය සිදුවූ අන්දම

මා යාචකයෙකු බවට පත්වූයේ කෙසේදැයි මීට ඉහතදී කෙටියෙන් තැනින් තැන කියා ඇතත් මගේ යාචක සමාජානුයෝජනය සවිස්තර වශයෙන් ලේඛනගත කළොත් ඉන් සෑහෙන ප්‍රයෝජනයක් වෙතැයි විශේෂයෙන් මගේ මිත්‍ර බටහිර සමාජ විද්‍යාඥයෝ නිතර කීහ. මුල් කාලයේදී යම්යම් දේ සංක්ෂිප්ත වශයෙන් මට කියන්නට සිදුවූයේ විවිධ හේතු නිසාය. මා යාචකයකුව සිටි "ලෝකය" පැවතුණු සමාජය ක්‍රමක්‍රමයෙන් වෙනස්වන විට, යම්යම් චරිත මියගියවිට, වර්තමාන සමාජය හා මා ජීවත් වූ යාචක සමාජය අතර මොනම අන්දමේ අනන්‍යතාවක්වත් නැතිවී ගියවිට, පසුගිය කාරණා ගැන මදක් නිවීහැනහිල්ලේ කල්පනා කිරීම දුෂ්කර වන්නේ නැත.

1960 ගණන්වලදී මගේ මිත්‍ර කේ.ඒ.ඩී. පෙරේරා මහතාගේ මූලිකත්වයෙන් මුලින්ම හිඟන්නන් වන්නට අප වෑයම් කළ සැටින්, එහි ප්‍රතිඵලයත් ඔබ කියවා ඇත. වෙස්වළාගත හිඟන්නන් වීම නොකළ හැකි දෙයක් බව මට මින් ප්‍රත්‍යක්ෂ විය. මම ඉන් පසු යාචකයන් ගැන කරුණු සෙවීමි. 1964 ජර්මනියට ගොස් මගේ ආචාර්ය උපාධි තුනෙන් මා මුලින්ම ලබාගත් ආචාර්ය උපාධිය දිනාගෙන මෙරටට ආවාට පසුත් පෙරහිබූ උනන්දුවෙන්ම යාචකයන් ගැන සෙව්වෙමි. මා සමග පර්යේෂණවල නිරතවූ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ට තමතමන්ගේ ගම්වල, නගරවල යාචකයන් දැන හැඳිනගෙන ඔවුන් ගැන විස්තර ලියන්නටත්, යාචක සංඛ්‍යාලේඛන එකතු කරන්නටත් උපදෙස් දුනිමි. මගේ ශිෂ්‍යයෝ විශ්ව විද්‍යාලයේ උගෙන ගන්නා විටත්, ඉන්පසුව රැකියාවල නිරතවූ විටත් මට යාචක සංඛ්‍යාලේඛන හා යාචකයන් ගැන විවිධ තොරතුරු සැපයීමෙන් උදවු වූහ.

අප ප්‍රථමයෙන්ම යාචක සංඛ්‍යාලේඛන හදාගත්තේ කොළඹ නගරය විවිධ කුඩා ප්‍රදේශවලට කැඩීමෙනි. ඒ කුඩා ප්‍රදේශයේ ජීවත්වන ශිෂ්‍යයෝ තම ප්‍රදේශය තුළ යාචකයන් සියලු දෙනාම හොඳින් අඳුනා ගත්හ. ඔහුට/ඇයට බාහිරව මම වෙනත් අයද මේ කාරණය සඳහාම යෙදවීමි. මා එකල සර්වෝදය පර්යේෂණ ආයතනයේ ගරු අධ්‍යක්ෂව සිටි නිසා සෑහෙන පර්යේෂකයන් රැසක් මගේ විශ්ව විද්‍යාල ශිෂ්‍යශිෂ්‍යාවනට බාහිරව යාචකයන් පිළිබඳ කරුණු හා සංඛ්‍යාලේඛණ එකතුකිරීමට යොදාගත හැකිවිය. පාසැල්වල මා දන්නා අඳුනන ඉහළ පංතිවල ශිෂ්‍යයන්ද මේ කටයුත්ත සඳහා යොදා ගතිමි.

1967 - 70 වන පෙස් අවුරුද්දක් පාසා කොළඹ හා ප්‍රධාන නගරවල මෙන්ම සෑහෙන ගණනක් ගම්වලද යාචක සංඛ්‍යාව අපි දැනගන සිටියෙමු. ආගමික උත්සව පැවැත්වෙන විට ඒ ස්ථානවලට වන්දනාවේ යන අය සමග හෝ තනිව ගිය ශිෂ්‍යයෝ යාචකයන් ගණන් කළහ. 1971 කලබල නිසා මේ කටයුත්තට බාධාවක් සිදුවුවත් ඉන් ඉක්බිති 1976 වනතෙක් අපි මේ ගණන් කිරීම හා විස්තර සෙවීම කළෙමු.

මා මේ සියලු විස්තරවලින් සෑහීමකට පත්වූයේ නැත. මට ප්‍රත්‍යක්ෂ වූ සත්‍යය නම් යාචකයන් ගැන අභ්‍යන්තරික කරුණු දැනගන්නට යාචකයෙකු නොවී බැරි බවයි. වෙස්වළාගත යාචකයෙකු වීම භයානක කටයුත්තක් බව අපි 1960 දී අත් දුටුවෙමු. ඊටත් වඩා එය දිගටම කරගත යා නොහැකි කටයුත්තක් විය. යාචක ජීවිතය ගැන අවබෝධ කරගැනීමට යාචකයෙකු වන්නේ කෙසේද?

මේ අතර මා කලක් තිස්සේ විවිධ අන්දමේ යාචකයන්ට හා ඒ අය හා සම්බන්ධ පුද්ගලයන්ට උදව්පදව් කළෙමි. මේ උදව්පදව් මුදලින් කළ ඒවා නොවේ. ලෙඩක් දුකක් වූ විට මා දන්නා වෛද්‍යවරයෙකු සොයා ආරෝග්‍යශාලාවෙන් ආධාරය ලබාදීම ඉන් එක් උදව්වකි. මා මෙසේ උදව් කළ අය අතර පිට පළාතක ලොකු මුදලාලි කෙනෙක් විය. ඔහුගේ දරුවාට බරපතල අසනීපයක් සෑදී එය සුව කරගැනීමට හැකිවූයේ මා මැදිහත්වී හඳුනා දුන්, එකල මගේ මිත්‍රයෙකු වූ අයිවර් ඔබේසේකර වෛද්‍යවරයා නිසාය. මුදලාලි තම පුත්‍රයාගේ ජීවිතය ගැලවුනේ මා නිසා යැයි මට බෙහෙවින් කෘතඥ විය.

දැන් ඔහුට අවශ්‍ය වූයේ මට සෑහෙන උදව්වක් කිරීමටය. මුදලින් හෝ ඉඩමක්, ගෙයක්, වාහනයක් ලබාදීමෙන් හෝ එය කරන්නට ඔහු ඉදිරිපත් විය. මම මේ යෝජනා සියල්ලම ප්‍රතික්ෂෙප කළෙමි. ඒ මුදලාලි යාචක ලෝකය හා දැඩිලෙස සම්බන්ධ බව මම දැන සිටියෙමි. මට අවශ්‍ය වූයේ කෙසේ හෝ ඔහුගේ උපකාරය ලබා යාචක ලෝකයට හිඟන්නෙකු ලෙස පිවිසීමය.

අපට උවමනා දෙයක් ලබාගැනීම දැඩිසේ උත්සාහ කිරීම මා උගත්තේ පැරණි ජාතක කතා හා බෞද්ධ කතා කියවීමෙනි. තමන් අපේක්ෂා කරන දෙය ලැබෙන තෙක් නොපසුබටව කටයුතු කිරීම ගැන මම දැන සිටියෙමි. හත්අවුරුදු හත්මසක් නිග්‍රෝධ සාමණේර හිමියන්ගේ බ්‍රාහ්මණ ගෙදරට පිඩුසිඟා ගිය හාමුදුරුවන්ට පිණ්ඩපාතය තබා වචනයකින්වත් සංග්‍රහ කිරීමක් ලැබුනේ හත්අවුරුද්දක් හා හත්මසක් ගෙවුන විටය. මුදලාලි මට කුමන උපකාරයක් කරන්නට හැදුවත් මා කතා නොකර සිටියේ ක්‍රමක්‍රමයෙන් ඔහුගේ සිත එක් තැනකට ගෙනැවිත්, මාගේ අභිප්‍රාය දැන්වීමටය.

මගේ අභිප්‍රාය දැනගත් මුදලාලි එක්වරම එය ප්‍රතික්ෂෙප කළේය. 'මය මොඩ වැඩේ කරන්නෙ නැතිව වෙන ඕනෑම දෙයක් ඉල්ලන්න' යැයි ඔහු කඳුළු පිරුණු දෙනෙතින් මා දෙස බලා මට කීවේ, මා කෙරෙහි ඇතිකරගත් බලවත් අනුකම්පාවෙන් බව මට අදත් සිහිවන්නේය. මුදලාලිගේ සහායට එකතුකරගත් කොළඹ පළාතේ 'ගණින්නාරයෙකු' මම ඇඳින සිටියෙමි. මගේ හිතවතෙකුවූ ඔහුටද මේ කාරණය පුද්ගලිකව කියා මුදලාලිට ඒ මගින් කරුණු කීවෙමි.

'මහත්තයාට හෙනහුරු අපලයක් ලබිලා. කරපු පවි ගෙවන්නත් එපායැ. සමහරවිට හිඟන්නෙක් නොවුනොත් වෙන බරපතල කරදරයක් වෙන්න පුළුවන්. ඒක නිසා ඕක කරලා දෙමු' යි කී මුදලාලි මට කොන්දේසි කීපයක් පැනවීය. මා කවරදාකවත් මේ උදව්ව කළේ ඔහු යැයි කොතැනකදීවත් අනාවරණය නොකිරීම ඉන් පළමුවැන්නය. මේ කරන කටයුත්තෙන් මට මොන විපත්තියක් වුනත් ඔහු ඊට සම්බන්ධ නැති බව තේරුම් ගැනීම දෙවැන්නය. මේ කරුණු ගැන දළදා වහන්සේ ඉදිරියේ දිවුරීම තුන්වැන්නයි.

එක් දිනක මුදලාලිගේ මොරිස් ඔක්ස්ෆර්ඩ් රථයෙන් නුවර ගිය අපි දළදා මාළිගාවට ගොප් පූජාවක් තබා වතාවත් ඉටු කළෙමු. මුදලාලි එදා පූජාව සිටි හාමුදුරුවන් දැන හැඳින ගෙන එසේ වූවත් නිසා මා සමග ඒ සියලු පුද පූජා කඩිනම් ගිවිස ගත්තා සේ කළ හැකිවිය. මා දිවුරුම් දුන් පසු මුදලාලිගේ මුහුණේ බැරෑරුම්කම මදක් අඩුවිය. පිළිබඳ නුවර සිට කොළඹ ගිය පවා මුදලාලිගේ මුහුණේ ඒ බැරෑරුම්කමේ සේයාවක් දක්නට ලැබුණේ මා මේ කරන්නට යන ක්‍රියාවෙන් යම් අමාරුවක වැටෙතියි ඔහු කල්පනා කළ නිසාද?

ඉන් පසුව මුදලාලි පොරොන්දු වූ පරිදි සියල්ල ඉතා ඉක්මනින් සිදුවිය. යාචක ලෝකය කෙතෙක් දුරට ඔහුගේ අයෝමය ග්‍රහණය තුළ සිටින්නේදැයි මට අවබෝධ වූයේ මේ සියල්ල සිද්ධ වන විටය. මට කඳුරට පළාතේ ප්‍රාදේශීය අගනුවරක අම්බලමක් වැනි ගොඩනැගිල්ලක නැවතීමට සිදුවිය. මේ ස්ථානය හිඟන්නන් සැහෙන ගණනක් එකතු වන තැනකි. එහි නායකයා වෙනට පාවා දෙනු ලැබූ මම එතැන් පටන් හිඟන ලෝකයට ක්‍රමයෙන් සමාජානුයෝජනය වීමි.

මුදලාලි විසින් මා එකතු කරන ලද යාචක නඩයට පසළොස් දෙනෙක් පමණ අයිති වූහ. සමහර දිනවලට අපේ නඩය සිහක් හෝ තිස්පහක් සංඛ්‍යාවක් ඉහළ යයි. එසේ වන්නේ තැනින් තැන හිඟා කෑමට ගිය යාචකයින් යම්යම් අවස්ථාවල නඩයට එකතුවීමෙනි. පරණ දිරාගිය ගොඩනැගිල්ලක අපි වාසය කළෙමු. පරණ අම්බලම්, අතහැර දමා ගිය ගොඩනැගිලි, බස් නැවතුම්පළවල්, හා වෙනත් රජයේ හෝ පෞද්ගලික, ප්‍රයෝජනයට නොගන්නා ගොඩනැගිලි මෙන්ම කඩවල්ද, යාචකයන් වන අප සැමගේ වාසස්ථාන විය.

අපේ හිඟන නඩයට නායකයෙක් විය. අවුරුදු හැටක් පමණ වූ ප්‍රතාපවත් පුද්ගලයෙකි. මා අඳුනන මුදලාලි පුද්ගලිකවම මේ නායකයාට කතාකොට මා බාර දුන් නිසා ඔහු මට විශේෂ අනුග්‍රහයකින් සැලකීය. මගේ 'රහස' මුදලාලි ඔහුට කීවේ නැත. 'මෙන්න මූ මං අඳුනන කොල්ලෙක්. උඹලාගේ වැඩට යොදා ගනිල්ලා. උඹට හොඳට සලකපන්' කියා මා බාර දුන් බව මම දැන සිටියෙමි. එකල මගේ පෙනුම තරුණ නිසා රැළට බැඳීමේදී මුදලාලි කී කරුණු ගැන මඳ සැකයක්වත් ඇති නොවීණ. හිඟන ලෝකයට අනුගත වන ලෙස මා නිල වශයෙන් සමාජානුයෝජනය වූයේ මේ වකවානුවේදීය.

ඒ සියල්ලටම කලින් මුදලාලි ඈත පිටිසර ගමකින් 'මගේ නම' සොයාගත්තේය. ඒ ගමේ පවුලකට මා අයත් බව කියන්නට හේ මට කීය. 'තාත්තාගේ' හා 'අම්මාගේ' නම්ද මට ලැබිණ. අවුරුදු 15-16 කාලේ ගෙදරින් පැන ගිය බවත්, එදා සිට මේ දක්වා නිදැල්ලේ හැසිරුන බවත්, පසුව මුදලාලිට හමුවූ බවත්, පවසන්නට මුදලාලි මට කීය. මේ කාරණා කෙතරම් වැදගත්දැයි මට අවබෝධ වූයේ පසුවය.

මා හිඟන රැළට එකතු වාට පසු අපේ හිඟන නායකයා මගේ විගතුග වීමසා බැලීය. ඔහු මෙසේ කළේ තමාට හමුවන හිඟන්නන් මගේ නම, පවුලේ තොරතුරු දී ඒවා ඇත්තදැයි සොයා බැලීමට කීමෙනි. වාසනාවකට මෙන් එහෙම ගමක් මෙන්ම, මුදලාලි දුන් නමින් පවුලක්ද ඒ ගමේ විය. ඒ පවුලේ තරුණ ගැටවරයෙක් අවුරුදු 15 - 16 පැන ගිය වගත්, ඔහුගේ නමත් හිඟන්නෝ ආපසු සොයාගත්හ. මා බොරු කාරයෙක් වී නම් මේ මූලික විමසීමේදීම මට සිදුවන්නේ හිඟන ලොවින් ඉවත්වීමටය.

විනය නීතිවලට අනුව සාසනයට බඳවා ගන්නා සාමණේර කෙනෙකුගේ 'ජාතිගොත්ත' සෙවීම ගැන මම, පසුගිය කාලයේදී දැඩි උනන්දුවක් දැක්වීමි. ජාති ගෝත්‍ර යනු කුලගෝත්‍රය බව එකල උගතුන්ගේ මතය විය. නමුත් හිඟන අත්දැකීම් ලැබීමෙන් පසු මම ඒ මතය වෙනස් කළෙමි. හිඟන්නන් කුලගෝත්‍ර සෙවීමක් නැත. ඔවුන් කුලගෝත්‍ර සොයනවා යයි කියන්නේ, යාචකයෙකුගේ කල්ක්‍රියාව ගැන සොයා බැලීමය. තාත්තා හා අම්මා කොයි විදිහේ අයද? සහෝදර සහෝදරියන් කොයි විදිහේ අයද? ඔවුන් කිසි දිනක අසල් කුලයට හෝ ජාතියට උයිනි අයද කියා සොයා බැලීමක් එකල සිද්ධ නොවීය. අපේ සතිකාවන්වල එන ජාතිගෝත්‍ර සෙවීමද මෙබඳු දෙයක් බව අද මගේ පිළිගැනීමය. නුවර යුගයේ එය තරමක් වෙනත් වුවත් මුලදී ඉන් සෙව්වේ කෙනෙකුගේ ජාතියට හා ගෝත්‍රයට වඩා පවුලේ පූර්ණ කල්ක්‍රියාව බව මම අදහස් කරමි.

මෙතැන් සිට මට ගුරුවරයෙක් පත් කරනු ලැබිණ. ඔහු සමග හිඟාකෑමේ යෙදුනෙමි. ඔහු හිඟාකන්නට යන විට පසුපස ගොස් ඔහුට ආධාර කරන මට, මගේ ගුරුවරයා අප යන එන 'හිඟන පථය' ගැන කියාදුන්නේය. පන්සල් තියෙන්නේ මෙතැනය, පන්සල්වල උත්සව පවතින්නේ අසවල් දවස් වලටය, මේ පන්සලේ ලොකු හාමුදුරුවෝ හොඳයි, දෙවැනි හාමුදුරුවෝ වසවර්තියෙක් යනාදී වශයෙන් අප යන පථයට අසුවන පුද්ගලයන් ගැන විස්තර කියා දුන්නේය.

තුන්මාසයක් තුල මා උගත්තේ අපේ හිඟන පථයට අසුවන ප්‍රදේශයේ 'යාචක භූගෝල ශාස්ත්‍රය'යි (ඒ කියන්නේ හිඟාකෑමට යාසුතු ප්‍රදේශවල ස්වභාවය), යාචක සමාජ විද්‍යාව (සිඟන කාරියට වඩා සුදුසු ගෙවල්, වෙළඳසල්, හා පුද්ගලයන්) යන යාචක විද්‍යාවය. (ඒ කියන්නේ හිඟාකන හැටි), මීට අමතරව යාචක ජනශ්‍රැතිය මට ඉගෙන ගන්නට ලැබිණ.

මාස තුනක් ඉගෙනීම කෙරෙන අතර වරින් වර ගුරුවරයා නොයෙක් දේ මගෙන් ප්‍රශ්න කරයි. මගේ උත්තර ඔහු විටක හරිගස්සයි. විශ්ව විද්‍යාලයේ දේශන පවත්වන අප අප කරන දේශන ශිෂ්‍යශිෂ්‍යාවන්ගේ සිත් තුලට යනවාද නැද්ද කියා දන්නේ නැත. ශිෂ්‍යශිෂ්‍යාවනට අප කියන දේ ඉගෙන ගන්නට අවශ්‍යද? ඉන් ඔවුන්ට කුමන ප්‍රයෝජනයක් සිදුවේද කියා අප දන්නේ නැත, ඒ ගැන සොයන්න මහන්සි වන්නේත් නැත. නමුත් යාවක උගැන්වීම් මීට වෙනස්ය.

යාවක අපට උගන්වන සෑම දෙයක්ම අපේ ජීවිතයට ප්‍රායෝගිකව අවශ්‍ය වන්නේය. ඒ අවශ්‍යතාව යමක් උගැන්වූව වහාම අපට පෙන්වා දීම ගුරුවරයාගේ සිරිත විය. එබඳු ප්‍රායෝගිකත්ව නැඹුරුවක් ඇතිව විශ්ව විද්‍යාලයේද අධ්‍යාපනය ලබා දෙන්නේ නම් කෙතරම් අගේ දැයි හිඟන්නෙකුව සිටි අවස්ථාවලදී මම මගෙන්ම ප්‍රශ්න කළෙමි. විශේෂයෙන්ම හිඟන ශික්ෂණය මට ලබාදීමට මගේ යාවක ගුරුවරුන් ගත් වෙහෙස මට අදත් මතක් වෙයි. එහෙත් විශ්ව විද්‍යාල ශිෂ්‍යශිෂ්‍යාවන් අපගෙන් ලබාගන්නා ශික්ෂණය කුමක්ද?

'දවස් ගානක් වුනත් බඩගින්නේ ඉන්න පුරුදු වෙයන් පුතා' කී ඔහු මා ඊළඟ දවසේ ඈත පෙදෙසකට කැඳවාගන ගියේය. උදේ සිටන් රෑ වෙනතුරු ඇවිදීම හැර බත් කටක් හෝ පාන් කෑල්ලක් අපට ලැබුණේ නැත. යන්තම් යමක් කන්ට ලැබුණේ රෑ බෝවී නවාතැනට ආ විටය. ඊළඟ දවසේ තවත් ඈත මා කැඳවාගන ගිය ගුරුවරයා එදා හා ඊට පසුවදාත් මට කුසගින්නේ ඉඳීමට සැලැස්විය. මා ආහාර නොගත්තාසේම ඔහුද ආහාර ගත්තේ නැත. රෑ අතුවක නිදාගන්නා අතර බඩගින්නේ නිදිමත නැතිව එහාමෙහා හැරෙන මා දෙස බැලූ ඔහු මෙසේ කීවේය. 'ඔහොම තමයි බඩගින්න ඉවසාගෙන ඉන්න බැරිනම් හිඟන්නෙක් වෙන්න බැහැ. බඩගින්න කොච්චර දරුණුද කියලා උඹට තේරෙනවද? ඔය ටික දන්නවනම් හිඟන අපට බත්කටක් නොදෙන කෙනෙක් මේ රටේ ඉන්න එපාක් නැහැ'.

මම බඩගින්න මුලින් හඳුනාගත්තේ මේ මොහොතේය. දුෂ්කර ක්‍රියා කොට අත්තකිලමතානුයෝගය වටහාගත් බුදුන් වහන්සේගේ ක්‍රියාපටිපාටිය මට මතක් විය. උන්වහන්සේ තමන් වටහාගත් සත්‍යය දෙසට ගමන් කළේ මේ අන්දමේ ප්‍රායෝගික උපක්‍රම මගින් බව මට සිහිපත් විය. මා යාවකයන්ගෙන් ලත් අත්දැකීම් පසුකාලයක නැවත නැවතත් ප්‍රත්‍යවේක්ෂණය කිරීමෙන් ලැබුනාවූ ප්‍රයෝජන ඉමහත්ය.

මගේ යාවක පුහුණුව අවසන් වූයේ ඒවක එදා දඹදිව තක්සලාවේ ලත් අත්දැකීම් යිහියට ගෙනෙන සිද්ධියකිනි. මා සමග ගමන් යනඑන විට ඉතා තදුරු, යාවකයන්ට කවදාවත් නොසලකන, සතයක් නොදෙන පුද්ගලයන් ගුරුවරයන් විසින් මට පෙන්වා දෙන ලදී. දිනක් ඔහු මට කතාකොට 'පුළුවන් නම් ගිහින් මේ අයගෙන් හිඟමන් ඉල්ලාගන එනවා' කියා කීවේය. 'උඹේ දක්ෂකම බලන්න පුළුවන් එනකොටයි'.

මම බයේ ගැහෙමින් ඒ අයගෙන් හිඟාකෑමේ යෙදුනෙමි. එක් ගෙදරකදී මෙහෙකාරයෝ ගෙහිමියාගේ උගැන්වීම නිසා පරුෂ වචනයෙන් බැණ මා එළවාගත්හ. තවත් තැනකදී නපුරු ගෘහමූලිකයෑ ලිහා එවූ බල්ලාගෙන් මා බේරුණේ අනුනවයෙනි. තුන්වැනි තැනදී මා හිඟමන් ඉල්ලූ හැටියේම ලැබුණේ කන හරහා පහරකි. එදා මුළු දවසේම එක් අවස්ථාවක හැර මට මුහුණ දෙන්නට සිදුවූයේ මෙවන් අවස්ථාවලටය. නමුත් එක් නිවසකදී, මගේ යාචක ගුරු ඉතාමත් නපුරු යැයි පෙන්වූ ගැහැනියක් මට අනුකම්පාවෙන් සැලකුවාය. මම ඇගේ නිවසට ගොස් හිඟමන් නොඉල්ලුවෙමි. ගේ දොරකඩ මා හිටගෙන සිටිනාවිට මැදිවියේ ගැහැනියක වූ ඕ ඉවතට ආවාය. 'උඹ මොකද?', යැයි ඈය ඇසුවේ තර්ජනාත්මක ලෙසය. 'හිඟමන් ඉල්ලන්න ආවාද?' 'නෑ' යයි මම කීවෙමි.

'උඹ හිඟන්නෙක් නේද?' ඕ නැවතත් රවාගෙන ඇසුවාය.

'ඔව්, නමුත් මම මෙහාට ආවේ හිඟාකන්න නොවෙයි'

'එහෙනම්'

'වලව්වේ හාමුගේ මුහුණ දිහා බලලා යන්න. වලව්වෙ හාමුගෙ මූහුණ පින්පාටයි කියා ගමේ අය කියනවා. මට බලන්න ආස හිතුනා'

මා හිතන විදිහට මේ කෲර යැයි සම්මත ඒ ගැහැනියගේ මුණේ සිනා හිරුපොදක් ප්‍රථම වරට පහළ වුනේ එදා වන්නට ඇත.

'මෙහෙ වරෙන්. ඔහෙන් ඉඳගනින්' ඇය අණ කළාය. මම බිඳුලේ වාඩිවුණෙමි. 'මගේ මුහුණ පින් පාටට උඹට පේනවද?'

මම ඉස වැනිමි. ඇගේ මුහුණ දිහා බලා සිටිනු මිස වැඩිය කතා කරන්නට යෑම අගුණයැයි මට සිතිණ. ඕ මෙහෙකාරියකට කතා කළාය. 'මෙන්න මූට කන්න දීපන්. යනකොට අර චූටි මහත්තයගෙ සරම් ඇති එකක් දීපන්' කියූ ඇය, 'උඹ මේ පැත්තේ ආවොත් ආයිත් අපේ ගෙදරට වරෙන්' කීවාය.

චූටි මහත්තයා යැයි කීවේ තරුණ වයසේ මියගිය ඇගේ පුතාටය. ඇගේ සැමියාද හදිසියේ මියගොස් ඇත. මේ සියල්ල නිසා ඇගෙ ජීවිතයට ඇති වූ තනිකම හා වේදනාව කෙතරම් වන්නට ඇද්ද? මිනිසුන් හෝ ගැහැනුන් සිත්පිත් නැති තත්වයට පත්වන්නේ මෙවන් කෲර ජීවිත අත්දැකීම් නිසාද?

මගේ හිඟන ගුරා මේ අත්දැකීම් ඉහළින්ම අගය කළේය. 'උඹ දැන් බැණුම් අහන්න දන්නවා. ඔය වලව්වේ මහත්තයා උඹට සැලකුවා කිව්වාම උඹ දක්ෂම හිඟන්නෙක් බව මට පේනවා'.

මේ මගේ අවසාන භික්ෂු විභාගයයි. විශ්ව විද්‍යාලයේ අවුරුදු ගණනකට පසු ප්‍රශ්න පත්‍රවලට උත්තර ලිවීමට වඩා මෙය කෙතරම් ප්‍රායෝගිකද? දිසාපාමොක් එදා ජීවකට කීවේ තක්සලාව පිහිටි ප්‍රදේශය වටා ගොස් බෙහෙතකට නොගන්නා ගසක් කොළක් පැළෑටියක් ඇත්නම් ගෙන එන්නටය. මුලු මහත් ප්‍රදේශයම පීරූ ජීවකට බෙහෙතකට නොගන්නා එවැනි ගහක් කොළක් පැළෑටියක් සොයාගත නොහැකි විය. මටද මුහුණ දීමට සිදුවූ මේ 'පරීක්ෂණය' මා මෙතෙක් උපාගත් අත්දැකීම් හා දැනීම් උරගා බලන අවස්ථාවක් නොවීණිද? භික්ෂුකමට මගේ චරිතය සුදුසුද? මා උගත් උපක්‍රම සරිලන්නේද කියා සොයා බැලුවේ කෙතරම් සූක්ෂම ලෙසද?

සමාජ විද්‍යා හා මානවවිද්‍යා පර්යේෂණවලට ක්ෂේත්‍රයට ගිය අවස්ථාවලදී මිනිසුන්ගෙන් මා ප්‍රතික්ෂේපවූ අවස්ථා එමටය. සමහර මිනිස්සු හා ගැහැනු මගේ මුහුණට කඩා පැන්නාහ. සමහරු බැණ වැදුණාහ. තවත් පර්යේෂණවලදී මම ගුටිබැටවලට භාජන වීමි. මේ සියල්ල දරා ගන්නට තරම් විශාල හදවතක්, ඉවසීමක්, මිනිසුන් හා ගැහැනුන් සමග ලෙන්ගතුකම ඇති කොට කටයුතු කිරීමට තරම් ශක්තියක් හා ධෛර්යයක් ලබාගන්නට හැකි අත්තිවාරම මා තුල සකස් වූයේ මේ යාචක ජීවිතයෙනි.

දිනක අපේ නායක යාචකයා අවට සියලු යාචකයන් රැස්කළේය. එදා රෑ බතක් විශාල මුට්ටියක ඉදවන ලදි. හරක් මස්, හා වෙනත් මස් වර්ග (බාපත්) බත් හැළියට දමා පිසන ලද බත අප හැමදෙනාටම බෙදා දුන්නේ නායකයාය. ඒ හා සමගම කසිප්පු හැළියක්ද සොයා ගෙනවිත් තිබීණ. ඉන් ප්‍රථම උගුර නායකයා පානය කළේ මහත් භක්තියකිනි. ඊළඟ උගුර මා පානය කළ යුතු විය. ඊට කලින් භික්ෂු ජීවිතය ගැන වාක්‍ය කීපයක් උස් හඬින් කී නායකයා මගෙන් දිවුරුම්දීමක් පිරිස ඉදිරියේ ලබාගත්තේය. කවදාවත් භික්ෂු ජීවිතයටහෝ භික්ෂූන්ට එරෙහිව කිසිවක් නොකරන බව මගේ හිසට අත ගසා මට දිවුරන්නට සිදුවිය.

අපේ විශ්වවිද්‍යාලවල නවක වදයට පසු අලුත් ශිෂ්‍යයන් ලවා කරවන අසභ්‍ය දිවුරීම් මට සිහිවිය. ශිෂ්‍යයන් පමණක් නොව නවක භික්ෂූන් වහන්සේලා ලවා පවා සමහර ජ්‍යෙෂ්ඨ භික්ෂූන් බලයෙන් කරවන මේ අසභ්‍ය කුණු දිවුරීම් මා විසින් එකතු කොට ඇත. ඒවාට සම කරන විට භික්ෂුන්නන්ගේ දිවුරීම් කෙතරම් වාම් අර්ථවත් ශීලාචාර ඒවාද? අප ගත කරන භික්ෂු ජීවිතයට හෝ භික්ෂු සහෝදර සහෝදරියකට විරුද්ධව කවදාවත් කටයුතු නොකිරීම මේ දිවුරීමේ හරය විය. එක් කුණුහරුපයක්වත් එහි ඇතුළත් නොවුන අතර දිවුරීම කරන ලද්දේ ඉතා ගෞරවාන්විත ලෙසය.

මේ යාතුකර්මයට සහභාගී වූ සියලු දෙනම පිසින ලද බත කෑහ. මස් නොකන මා කට කැඹුවේ එක් බත් කටක් පමණි. මත්පැන්ද නොගන්නා මගේ උගුර තවත් යාචකයෙක් බලෙන් පෙවූ කසිප්පු පොල්කට්ටක් නිසා පිළිස්සී ගියේය. බත් කට වමනය කළ මම එතනම ඇලවීමි. රෙයි මතින් නින්ද ගොස් යලි මා අවදිවූයේ පාන්දර කාලයේය. ආහාර භුක්ති විඳ කසිප්පු බී මගේ සහෝදර හිඟන්නෝ කැතින් කැත වැටී නිදා හුන්හ. ඔවුන් පසුවදා හිඟමන් ගියේත් සෑහෙන දවල් වූවාට පසුවය.

මට ලබාදුන් මේ සමාජානුයෝජනය හිඟන්නෙකුව සිටීමට අවශ්‍ය සියලුම දැනනුවණ මා වෙත ප්‍රදා කළේය. හිඟන ජීවිතය පමණක් නොව ඉන් බැහැර වූ කටයුතුවල යෙදීමටත්, විශේෂයෙන්ම වෙනත් එවන් දුෂ්කර පර්යේෂණවල යෙදීමටත් අවශ්‍ය පදනමක් මේ අත්දැකීම්වලින් මට ලැබිණ. මම ලංකාව පුරාම පාගේ වරින් වර ඇවිද හිඟාකෑමේ යෙදුනෙමි. මේ ගමන්වලින් මා ලත් අත්දැකීම් තවත් ග්‍රන්ථ කීපයකට සෑහේයැයි මම සිතමි. කාලවේලාව ලැබුනහොත් ඒ සියල්ල පාඨකයනට දීම මගේ කල්පනාවයි.

14 යාචක ප්‍රශ්න විසඳන්නේ කෙසේ ද?

කිසිම සමාජ ප්‍රශ්නයක් සහ මුලින්ම ම විසඳන්න අපට පුළුවන් වන්නේ නැහැ. සමාජයට බලවත් සේ අහිතකර නොවන තැනට ඒ ප්‍රශ්නය පත්කරවන්න හැකිනම් අපට ඒ සමාජ පාලනයට යටත් කළා කියා සැනසෙන්න ඉඩ තියෙනවා. යාචක ප්‍රශ්නයත් අද සමාජයේ බලවත් අසංවිධාන තත්වයන් ඇතිකරන තරමේ ප්‍රශ්නයක් බවට පත්වී තිබෙන බව පේනවා

මේ ප්‍රශ්නය ප්‍රථමයෙන්ම හොඳින් අවබෝධ කරගන්න ඕනෑ. මගේ මේ ග්‍රන්ථය කියවූ විට යාචක ප්‍රශ්නය ගැන සෑහෙන අවබෝධයක් ලැබෙනවා. ඒ අනුව මොනවිදියේ උපාය මාර්ගද මේ ප්‍රශ්නය විසඳාගන්න යොදාගත හැකි වන්නේ කියා සොයා බලන්න ඕනෑ. ප්‍රශ්නය ඉතාම බරපතල විදිහට බලපාන යාචක කොටස් කවරේද කියා මුලින්ම සොයා ගැනීම ඉතා වැදගත්.

කුඩා ළමයි හා වයසක අය යාචකයන් අතරින් මුලින්ම අපේ උනන්දුව යොමුවිය යුතු අයයි. එක්දහස් නවසිය හැට ගණන්වල යාචකයන් අතර කුඩා ළමයි හිටියේ ඉතා ටික දෙනායි. නමුත් දැන් ළමයි ඉතාමත්ම වැඩිවෙලා. මේ ළමයින්ගෙන් ප්‍රථමයෙන්ම අබ්බගාත දරුවන් ගැන අපි කල්පනා කරන්න ඕනෑ. මෙතරම් අවාසනාවන්ත මිනිස් කොටසක් යාචකයන් අතර නැත. ඒ ළමයින්ව හිගාකෑම සඳහා උපයෝගී කර ගන්නේ ඉතාමත් කණගාටුදායක විදිහටය. අබ්බගාත නැත්නම් ආබාධිත ළමයෙක් උපන් විට අම්මා ඒ ළමයා අරන් හිගාකන්න යෑම ස්වාභාවිකයි. එහෙම ළමයි ව්‍යාපාරිකයන්ට විකුණා හිගාකෑමේ යෙදවීම නිතර කෙරෙයි. හිඟන වෙන්දේසිවල පවා මේ ළමයින් විකුණා කහ හැටි අපි දැකලා තියෙනවා. අදත් එසේ ළමයි මෝටර් රථවල තියාගන රටපුරා ගොස් ආධාර එකතු කරන අය ඉන්නවා.

ආබාධිත ළමයි මේ විදිහට අසරණ කිරීම බරපතල පාපයක්.

අපේ රටේ ආබාධිත ළමයි මේ විදිහට අසරණ කිරීම බරපතල පාපයක්. රජයත්, ප්‍රාදේශීය පාලන තන්ත්‍රත්, රජයේ නොවන සංවිධානත්, මහජනයා එකතු කරගෙන ආබාධිත ළමයින් උදෙසා නවාතැන්පල හා රැකවරණ ශාලා පැවැත්වීම ඉතා වැදගත්. පළාතකට එකක් ගානේ ඒවා තනා, ළමයින් එවාට භාරගැනීම ජාතික යුතුකමක්. ඒ අතරම ආබාධිත ළමයින් ඉන්න පවුල්වල ඒ ළමයි හදාගන්න සෑහෙන ආධාරයක් රජයෙන් ලබාදීම කෙරෙන්න ඕන. ඒ ආධාර රාජ්‍ය නොවන

සංවිධාන, පළාත් වෙනත් සමිති සමාගම්වල අවධානය යටතේ පිළිවෙල සරන්න පුළුවන.

ඊට පස්සේ කිසිම ආබාධිත ළමයෙක් හිඟාකෑමට යොදා නොගත යුතු යැයි නීතියක් ගේන්න ඉඩ ලැබෙනවා. නීතිය ඉතාමත් තද විය යුත්තේ ආබාධිත ළමයි ව්‍යාපාරවලට යොදාගන්න මුදලාලිලාටයි, ඒ අයගේ යානවාහන, ගොඩනැඟිලි, වස්තුව රාජසන්තක කෙරෙන නීතිරීති ආවොත් ඒ අය පුංචි ළමයි මේ විදියට වැරදි වැඩවලට යොදාගන්නේ නැහැ.

ඊළඟට ආබාධිත නොවන යාචක ළමයි ගැන හිතන්න ඕනැ. අදත් එන්න එන්න මෙවැනි දරුවන්ගේ ගණන වැඩිවෙනවා. යාචක ළමයි තව අවුරුදු කීපයකින් යාචක ලෝකයේ ඉන්නේ නැහැ. අද යාචක ළමයා හෙට සර්ව සම්පූර්ණ සමාජ විරෝධියෙක් වෙනවා. ඔහු හෝ ඇ සමාජානුයෝජනය ලබන්නේ යාචක ලෝකයෙන් නොවෙයි. යාචක ලෝකය හා බද්ධ වූ පාතාලලෝකයෙනුයි. තව අවුරුදු දහයක් විතර යනකොට දහස් ගණනක් පුංචි යාචක ළමයි අපරාධකරුවන් වනු දැකීමට අපි කැමතිද? සමාජයට මේ සමාජබර උසුලාගන්න එදාට පුළුවන්ද? මේ ප්‍රශ්නයට විසඳීමක් ගැන අපි කතාකරන්න ඉන්නේ එදාට ද?

යාචක ළමයින්ට අද තවත් කොටස් එකතුවෙනවා. සමහරු වීදි ළමයි යන වැරදි නාමය යටතේ... මේ කොටස්. සෙනෙහස හා සමාජානුයෝජනය නැතිව හැදෙන මේ ළමයින්ට ඒ දෙක ලබාදෙන්න අපිට බැරිද? යාචක ළමයි විදියේ නැත්නම් පාතාලලෝකයේ සංස්කෘතියට අසුවී ඒ අනුව ඔවුන්ට සමාජානුයෝජනය වීමට අපි ඉඩ පලසනවද?

දැන් ඉතාමත් වැදගත්, විශේෂයෙන්ම කොළඹ ඉන්නා මේ යාචක ළමයින්ට (1) සුදුසු සමාජානුයෝජනයක් ලබාදීම (2) සෙනහසක් උණුසුමක් ලබාගන්නට උපාය මාර්ග නැනීමයි, මේ ළමයි පාසැල්වල යවන්නට කටයුතු සැලැස්වීම එක් අතකින් වැදගත්. අනිත් අතට දෙමාපියන් ඉන්නවානම් ඒ අයට කරුණු කියා, උදව් ලබාදී මේ ළමයි ඒ අය අතර සෙනහස ගොඩනැගීම හෝ වෙනත් පවුල් සමඟ සම්බන්ධතා ඇති කොට එබඳු තත්වයක් මතුකිරීම කළයුතුම කාරියක් ය.

ජීවිතයේ සෙනෙහස නැතිවීම, විශේෂයෙන් ම ළමා කාලයේ ඒ සෙනෙහස අහිමිවීම, පසු කාලයේ ඒ දරුවා සමාජ විරෝධියෙක් කිරීමට මුල්ම අඩිතාලම දමයි. කුඩා කාලයේ අම්මා තාත්තා ඇතුළු පවුලේ අයගෙන් ලැබෙන සමාජානුයෝජනය අහිමි වී, පාසැල් අධ්‍යාපනයට හා සමාජානුයෝජනයට ගෝචර නොවී, සමාජයේ පාවෙමින් සිට, වීදියේ ජීවිතයට සමාජානුයෝජනය වන දරුවා නවතින්නේ සමාජ විරෝධී කටයුතු ඉහළින් අගය කරන දරුණු ලෝකයකය. වර්තමාන සමාජය මේ කාරණය අද තේරුම් ගතහොත්, අපේ දේශපාලන තීරණ ගන්නා අය ගත යුතු තීරණය අනාගතයට නොතබා අද අදම ගතහොත් ඉන් සිදුවිය හැකි ප්‍රයෝජනය ඉමහත්ය.

වයස්ගත උදවිය කොටස් කීපයකට බෙදේ. ඉතා දුබල ඉතා වයස්ගත අය මින් ප්‍රධානය. මේ අයට තම් මොනම හවිහරණක්වත් නැත. හිගාකන්වත් බැරි තරම්ය. සමහරවිට ගල්‍යකම් වැනි ප්‍රතිකාරවලට භාජන වී ගෙදරදොරට යා නොහැකි තත්වයක ඇතැම්හු සිටිති. ඊළඟට අබ්බගාත නැත්නම් ස්වාභාවික ආබාධිත අය දැකගත හැකිය. මේ දෙගොල්ලන්ම මහලු නිවාසවලට නතර කිරීම කළ යුතුය. එක් පළාතට එක් මහලු නිවාසයක් ගණනේ යටත් පිරිසයින් සූදානම් කළ යුතු ය.

අද බොහෝ වයසක අය නිකම්ම හිඟමනට වැටෙති. එසේ සිදුවන්නේ විවිධ හේතු නිසාය. ඒ අය සඳහා මෙවන් වැඩිහිටි නිවාස තිබිය යුතුය. අපේ ආගමික මධ්‍යස්ථාන මුල්කරගත මේ නිවාස ඇති කළ හැකිය. සමාජ සේවා අමාත්‍යාංශය මගින් සමාජ සේවා දෙපාර්තමේන්තුව මුල් කරගෙන එවන් නිවාසයක් කතරගම පිහිටුවීමට කටයුතු කරන ලදී. කතරගම පැමිණෙන බැතිමත්හු දානමානාදියට රුචිකරති. ඒ අයගේ ආගමික හැඟීමෙන් ප්‍රයෝජන ලබා මේ වයසක උදවියට ආහාරපානාදිය ලබාගැනීමට මග සැලසෙන අතර, සැලැස්මේ ආකාරයට වයසක අයගේ හැම මූලික අවශ්‍යතාවයක්ම ඉටුකෙරෙන පරමාර්ථයෙන් මේ නිවාසය සකස් කිරීමට යෝජනා කොට තිබිණි. මුල් සැලැස්මේ ආකාරයටම මේ නිවාසය සකස් වෙන්නේනම් ඉන් සිදුවන සේවාව ඉතා විශාල වනු ඇත. ඒ අනුවම තවත් වැඩිහිටි නිවාස රැසක් විවිධ ආගමික මධ්‍යස්ථාන අසල ඇති කළ හැකිය.

රජය හා පළාත් පාලන ආයතන මගින් මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන වෙතින්ද , විශේෂයෙන්ම වැඩිහිටි සරණ (HELPAGE) වැනි ආයතන මගින් මේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කළ යුතුය. වැඩිහිටි නිවාසවල මූලික අවශ්‍යතාවලට අමතරව වැඩිහිටියන්ට අවශ්‍ය වන්නේ සෙනහසේ උණුසුමය. ජීවිතයේ පශ්චිම භාගයට සැපත්වූ මේ වයස්ගත වූ අයට ආහාරයට වඩා නැත්නම් ඒ තරමටම සෙනහස අවශ්‍යය. සමහර නිවාසවල මේ සෙනහස ඇත. බොහෝ තැනවල එය දක්නට නැත. මේ රටේ වැඩි ජනතාවක් බෞද්ධයන් නිසා ඒ සෙනහස වැඩිහිටියන්ට දීමට බෞද්ධයන් වහවහා ඉදිරිපත් විය යුතුමය.

ඇතැම් පවුල්වල තුලම වැඩිහිටියන්ට ජීවත් වීමට හැකි පරිදි දුගී දුප්පත් අසරණ පවුල්වලට යම්කිසි ආධාරයක් සැලසිය හැකිය. බොහෝ වයසක අයට පවුලින් සෙනහස ලැබුනත්, ඒ තැනැත්තාට ආහාර වේලක් ලබාදීමට පවුලට නොහැකිය. ඒ ආහාර වේල තිබෙනවා නම් මේ ආච්චිට හා සීයාට පවුල තුලම ජීවත්වන්න පුළුවන්: හිඟමනේ හා ඉබාගාතේ යන්න ඕනැ නැහැ.

බොහෝ පළාත්වල දැන් දිවාසරණ මධ්‍යස්ථාන දක්නට ලැබේ. දාවල් කාලයේ සියලා, ආච්චිලාට මේ මධ්‍යස්ථානවලට ඇවිත්, යම් ආහාරයක් රැගෙන කතාබහ කොට සමිති සම්මාදන් වී, හවස ගෙදර යා හැකිය. පවුලට ඇති බර ඉන් සැහෙන්න අඩුවේ. රටපුරාම මේ දිවාසරණ මධ්‍යස්ථාන ඇතිවන්නේ නම් වයසක උදවියට ජීවත් වීමේ උණුසුම ඇතිවී ඒ අයගේ ජීවිත මීට වඩා සුන්දර වන්නේ නැද්ද? අපේ පන්සල්වල දිවාසරණ මධ්‍යස්ථාන ඇතිකළ නොහැකිද?

මේ ආකාරයෙන්ම වැඩිහිටියන්ට, ළමයින්ට, තවත් අයට සරණ සපයන්න පුළුවන්. ඒ මාදිලියේ ඉතාම අර්ථවත් වැඩ පිළිවෙලක් හිටපු සමාජ සේවා අධ්‍යක්ෂ එන්. ඩබ්. ඊ. විජේවන්ත මහතා පවත්වාගන යනවා. ඒ මහතාගේ ආදරණීය පුත්‍රයා හමුදා සේවයේ නියුක්තව සිට මිය ගියා. තරුණ පුතා වෙනුවෙන් ඒ මහතා සැදූ ස්වර්ණමය ස්මාරකය තමයි කපිතාන් පරාක්‍රම විජේවන්ත අනුස්මරණ සංස්කෘතික පදනම.

අපි මියගිය අය සමරන්න කොයිතරම් මුදල් වියදම් කරනවාද? කනත්තේ ඇති ස්මාරකවලට ගිය මුදලින් වැඩිහිටි නිවාස, ළමා නිවාස කීයක් හදන්න තිබුනද? මේ සංස්කෘතික පදනම මගින් විජේවන්ත මහතාගේ නිවස වැඩිහිටියන්ට දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් කරල. එතැන අදත් වැඩිහිටියන් රාශියක් දවල් කාලය ගතකරනව. වැඩිහිටියන්ට විතරක් නොවෙයි තරුණයන් හා කාන්තාවන් උදෙසාත් මෙහි වැඩ පිළිවෙලවල් තියෙනවා. ළඟදී ඉතා වටිනා සේවයක් එතැනත් සිදුකළා. එනම් පුස්තකාලයක් විවෘත කිරීම.

පුස්තකාල විවෘත කිරීම නිසා මිනිසුන් වෙනස්වන හැටි මම හොඳින් දැක තියෙනවා. පොලිසියේ අපරාධ විමර්ශන අංශයට පුස්තකාලයක් එකල තිබුනේ නැත. පොලිසිය වෙනස් කරන්න නම් ඒ ඒ පොලිස් නිලධාරියාගේ ආකල්ප වෙනස් කරන්න ඕනෑබව මම කල්පනා කළා. මෙහෙම හිතාගන පුස්තකාලයක් විවෘත කරමුයි කියලා එකල අපරාධ විමර්ශන අංශය(C.I.D.) භාරව සිටි අමරසේන රාජපක්ෂ මහතාට යෝජනා කළා. ඒ මහතා යෝජනාව පිළිගත්ත විතරක් නොවෙයි, පුස්තකාලයක් පිහිටෙව්වා. අද වෙනතුරු එය තියෙනව. එය භාරව ඉන්නේ ඒ සඳහා පුහුණුවක් ලත් පොලිස් නිලධාරියෙක්. පුස්තකාලය නිසා අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් සෑහෙන ගණනකටම කියවන්න පුරුදු වුන බව මම දන්නව. කියවන්න පුරුදුවෙන කොට ඇතුළ වෙනස් වෙනවා. කර්කශ මිනිස් ගතිගුණ නැතිවී මෘදු මිනිස් ගුණ මතු වෙනවා.

මම පුද්ගලිකව යාවක ළමයින්ට කියවන්න පුරුදු කළා. වෙසඟනන් අතරින් කියවන්න කැමති අය කියවන්න උනන්දු කළා. මේ නිසා ඒ ළමයි වගේම වෙසඟනන්ද අතිශයින් වෙනස් වුනා. පොත් කියවීම අමුතු ශක්තියක් කෙනෙකුට ලබාදෙනවා. දැනනුවණත් විතරක් නොවෙයි මේ ලැබෙන බලය ඔහු මිනිස්කමට සමීප කරනවා. මිනිසුන් යක්ෂයින් වෙන්නේ මිනිස්කම නැති වෙලාවට. ඔවුන් දෙවියන් කරන්න පුළුවන් පොත්වලට. කියැවීමේ කුසලතාව මහන්සියෙන් ඇති කරන්න. අනික් සියල්ලම නිකම්ම යහපත් ලෙස සිදුවේවි.

මේ ළමා නිවාස හා වැඩිහිටි නිවාස හොඳට පැලපුම් කරන්න ඕනෑ. පළමුවෙන්ම ඒවා මේ අයගේ මූලික අපේක්ෂා අවශ්‍යතා ඉෂ්ට කරන තැන් විය යුතුයි. වීදියෙ ඉන්න හිඟන ළමයින්ට රෑ ගතකරන්න තැනක් හදා දෙන්න බැරිද? දැන් මම බස්නාහිර පළාත් සභාව හා ප්‍රධාන රජයේ සමාජ සේවා අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කරල එහෙම තැනක් පවත්වන්න යනවා. එතකොට ළමයි රෑ වීදියේ නැහැ. ඉන්නේ අප සමඟ. දවල් අම්මලා සමඟ. සමහරවිට ඔවුන්ගෙන් සෑහෙන කොටසක් දිවා පාසැල් යාවි. ක්‍රමයෙන් ඔවුන් සමාජානුයෝජනය කරන්නයි මගේ අදහස.

අපට කොච්චර රාජ්‍ය නොවන සංවිධාන තියෙනවද? මේවාට ළමයි හා වයසක උදවිය ගැන කරුණු සොයා බලා සාර්ථක වැඩ පිළිවෙල ඉදිරිපත් කිරීමට පුළුවන්. පන්සල් හා හාමුදුරුවරුන් රාශියක් අපට ඉන්නවා. මේ තරම් සමාජ සේවයට උචිත තවත් හොඳ සේනාංකයක් ලෝකයේ කුමන රටකවත් නැත. හාමුදුරුවරු පුරුදු පුහුණු කොට සමාජයේ දුබල කොටස් - ළමයින් හා වයසක අය - වෙනුවෙන් උදාර සේවයක් ඉටුකරන්න පුළුවන්. 'චරථ භික්ඛවෙ බහුජන හිතාය' කියා වදාළේ බුදුහාමුදුරුවොයි. උන්වහන්සේ වදාළ ඒ උපදේශය අපි යළිත් පණ ගන්වමුද?

තරුණ අයට හිඟාකෑමට මොනම අයිතියක්වත් නැත. මම හිඟාකන කාලේ තරුණයෙක් කියලා හිතන්න පුළුවන් එකම හිඟන්නා මම වෙන්න ඇති. 'යකෝ තෝ තරුණයෙක් හිඟාකන්න ලැජ්ජා නැද්ද. ඔය අත ඉස්පිරිතාලෙට ගිහින් සනීප කරගෙන වැඩක්පලක් කරපිය' කිය කී දෙනෙක් මට කිව්වද? තරුණයන් මෙන්ම තරුණියන්ද හිඟන ලෝකයෙන් අයින් කරන්න ඕනෑ. මේ අයගේ ජීවිත මග නංවන්න පුළුවන් යම් යම් කුශලතා ඒ අයට ලබාදුන්නොත්. මෙහෙම තරුණයෝ තම බිරිඳ හා දරුවන් හිඟාකෑමේ යවනවා. තමා මත්පැන් බොනවා, කුඩුගහනවා, රේස් දානවා.

මේ තත්වය නැති කරන්න නම් වීදිවල හිඟාකන තරුණ අයට යම්යම් කුශලතා පුහුණු කරවා ඒ අය සමාජයටත්, තමන්ටත් ප්‍රයෝජනවත් මිනිසුන් කරන්න ඕනෑ. මේ අතර හිඟාකෑම තරුණ අයට හා ළමයින්ට සම්පූර්ණයෙන් නීතියෙන් තහනම් කරන්න වෙවි. වීදියේ ජීවත්වෙන ඒ වගේ අය එවිට ක්‍රමයෙන් අඩුවෙලා යාවි. එක පාරට මේ වැඩේ කරන්න බැහැ. කරන්න ඕන ක්‍රමක්‍රමයෙන්, දීර්ඝ කාලයක් තුල.

යාචකයින් බවට පත්වන යමක් කරකියා ගත හැකි පවුල්වල උදවියට මුදල් ගෙවා නැවතිය හැකි මහලු නවාතැන්හල් හදන්න ඕනෑ. ඒවා එක් එක් අයගේ මුදල් යෙදවීමේ ප්‍රමාණය අනුව වෙන් කරන්න පුළුවන්. රක්ෂාවක යෙදී විශ්‍රාමයන කාන්තාවරුවත් නැති කෙනෙත් මේ නිකේතනයකට එන්න කැමති වේවි. සමහර දරුවොත් සල්ලි ගෙවා දෙමව්පියන් මේවායේ පදිංචි කරවාවි. විවිධ අසනීපවලින් පෙළෙන අය ගැනත් එබඳු නිකේතන සදනවිට සැලකිල්ලට ගන්න ඕනෑ.

හිඟන ප්‍රශ්න නීතියෙන් පමණක් විසඳන්න බැහැ. පොලීසිය ලවා හිඟන්නන් අල්ලා පිට පළාතකට ඇද දැමීමෙන් වැඩක් නැහැ. 1976 දී නොබැඳි සමුළුව අවස්ථාවේ මාද රිදීගමට ඇදගෙන ගියා. ලෝරියක දමාගෙන අරගෙන ගිය හිඟන්නන් ලෝරියෙ ගියේ මී හරකුන් වගේ හිඟන්නන් පිරුණා. කිසිම පහසුකමක් තිබුනේ නැහැ. සෑහෙන ගණනක් මිය ගියා. මම බොහොම අමාරුවෙන් කොළඹට පැනා ගත්තා. රජයට එදා උවමනා කළේ හිඟන්නන්, නොබැඳි සමුළුව වෙලාවේ කොළඹින් ඈතට දාන්න. අපේ මෙම නොබැඳි සමුළුවට ආ හැම රටකම වාගේ දුප්පත්කම හා යාචක ප්‍රශ්නය තිබුණා. අපි ඒ අයට අපේ ප්‍රශ්නය හංගන්න හැදුවා.

1989 සාර්ක් සම්මේලනය පවත්වන විටත් අපි කළේ මේ මේකමයි. එදාත් හිඟන්නන් පුනරුත්ථාපනය කරනවා කියා ඇද දැම්මෙ පිට පළාත්වලට. රාජ්‍යයක් මේ විදිහට කටයුතු කරලා සමාජ ප්‍රශ්න විසඳන්න බැහැ. ඉතා අනුකම්පාවෙන් හා අවබෝධයකින් ප්‍රශ්නය තේරුම් කරගෙන, ප්‍රශ්නය විසඳීමට උචිත උපක්‍රම යොදාගෙන, ඒ සඳහා පුහුණුව ඇති අය හවුල් කරගෙන ප්‍රශ්නය විසඳන්න ඕනෑ.

පොලිසියට මෙය විසඳන්න බැහැ. ඇස්වාට්ටුව අසල සුමානයකට වරක්වත් පොලිසිය හිඟන්නන්ට ගහනවා. ඒ අය මට නිතරම මේ ගැන කියනවා. ඇස්වාට්ටුව අසල හිඟන්නන්, විදි ළමයි, ගණිකාවන්, හා අපරාධකාරයන් ඉන්නවා. මේ අය සියලුදෙනාටම පොලිසිය සලකන්නේ එකම මිම්මකින්. කාටවුවත් පොලුවලින් ගහන එක මිනිස්කමට නොහොබිනා දෙයක් බව ඇතැම් පොලිස් නිලධාරීන්ට නොතේරෙන්නේ ඔවුන්ගේ හදවත් මෘදු හැඟීම්වලින් සන්නද්ධවෙලා නැති නිසායි.

යාචකයින් අලුත් ජීවිතයකට හැඩ ගස්වන්න ඕනෑ. මම ඒ සඳහා උවමනාවෙන්ම පුනරුත්ථාපනය කියන්නේ නැහැ. 'නවජීවනකරණය' මා යොදන වචනයක්. මේ අලුත් ජීවිතය සකස්විය යුත්තේ ඔවුන් දැන් ඉන්න වාතාවරණය එකපාරටම වෙනස්කරලා නෙවෙයි; ටිකින් ටික වෙනස් කරලයි. මේ යාචකයන්ගෙන් යෝග්‍ය අය තෝරාගෙන ඔවුන්ට දැනුවත්කමක් හා ශිල්පීය දැනුමක් දී සුදුසු රැකියාවල නියුක්ත කරන්න ඕනෑ. එතකොට ඒ අය ජීවිතයට තවත් විකල්ප තියෙන බව දැනගනීවි. ඔවුන් අද ගතකරන ජීවිතයට විකල්ප නැහැ. ඔවුන්ගේ ජීවිත නව ජීවනකරණයකට භාජන කළ යුත්තේ ජීවිතයේ විවිධ විකල්ප ඔවුන්ට ළඟා කිරීමේදී, ජීවත් වීමට ආශාව හා මිනිස් සෙනෙහස ඒ අයට ලබාදීමෙනි.

සමහර රටවල, විශේෂයෙන්ම දකුණු ඇමරිකාවේ ඇතැම් රටවල හමුදාව විසින් යාචකයන් මෙන්ම ගණිකාවන් විදිදරුවන් ආදීන්ද ඝාතනය කරනු ලැබේ. මේවගේ අය මෙසේ මරාදැමීම ඒ ප්‍රශ්නය විසඳීමට ඒකායන මාර්ගය බව මේ රටවල ඇතැම් පාලකයෝ සිතති. මේ පිළිවෙල කීපාකාරයකින් භයානකයි.

පළමුවෙන්ම මිනීමැරීම කිසිසේත් සමාව දියහැකි වරදක් නොවේ. මේ අය සැමදෙනා මනුෂ්‍යයන්ය. අපට ඒ අය මරාදමන්නට ඇති හේතුව හා අයිතිය කුමක්ද? දෙවනුව මේ අයගෙන් යාචකයන්, විදිදරුවන්, ගණිකාවන් හා එවන් අවශේෂ අය සමාජයට කළ වැරද්ද කුමක්ද ? ඒ අය අතර සමාජ වැරදි කළ අපරාධකාරයන් ඇතැයි සිතමු. එබන්දන් පවා වග විභාගයක් නැතිව මෙසේ මරා දැමීම නිරවද්‍ය ක්‍රියාවක්ද? අනිත් අතට සමාජ ප්‍රශ්නයකට මැදිවූ මිනිසුන් මරාදැමීම නිසා සමාජ ප්‍රශ්නයක් විසඳෙන්නේ නැත.

යාචකයන් බිහිවන්නට තුඩුදෙන සමාජ, ආර්ථික හේතු සොයා බලා ඒ හේතුසාධක ඇති නොවීමට වගබලා ගැනීමෙන් මේ ප්‍රශ්නය සෑහෙන දුරකට විසඳාලිය හැකිය. ජීවන තත්වය, මූලික අවශ්‍යතා පවා සපයාගන්නට ඉඩ නොලබන විට, සමාජයේ දුර්වලම පැත්ත අතරින් ඇතැමුන් යාචක ලෝකයට

ඇද වැටීම වැළැක්විය නොහේ. අප විසින් කළ යුත්තේ යාචක ලෝකයට මේ අය ඇද වැටීමට හේතු සාධක සොයා බලා ඒවා ක්‍රමයෙන් අඩුකරවන්නට කටයුතු කිරීමයි.

හිඟාකෑම නීතියෙන් තහනම් කිරීම තවත් අය නිතර කියන උපක්‍රමයකි. මෙය කළ නොහැකි දෙයකි. ජීවත්වන්නට මොනම ක්‍රමයක්වත් නැතිව ඉන්නා පුද්ගලයාට හිඟාකෑමත් තහනම් කළොත් සිදුවන්නේ සියදිවි නසා ගැනීමටය; නැතිනම් හොරරැළට එකතුවීමය. තරුණ, වයසක අයට හා ළමා උදවියට හිඟාකෑම නීතියෙන් තහනම් කළත්, එසේ කළ යුත්තේ හිඟාකෑමට ඇති විකල්ප වෙත ළඟා වීමට ඔවුන්ට අවස්ථාව සලසා දීමෙනි.

හිඟන්නන්ට හිඟමන් දෙන්න එපායායි කියා මහජනතාව දැනුවත් කිරීම, අවශ්‍ය බව තවත් අය නිතර කියති. එක්තරා පළාත්පාලන ආයතනයක් ලක්ෂ ගණනක් වියදම් කොට චිත්‍රපටයක් නිපදවීමට වරක් යෝජනා කළේය. 'මිනිස්සු හිඟමන් නුදුන්නොත්, හිඟන්නන් නැති වන බව' ඔවුන්ගේ අදහසයි. හිඟමන් දීම, දානමය කුශලකර්මය, පරිත්‍යාගය, කෘතඥතාව, දයාව ආදි ඉතා වැඩදායක ගුණධර්ම හා එබඳු හැඟීම් රැසක් හා සම්බන්ධ, අපේ රටේ දීර්ඝකාලීන ඉතිහාසයක් නැති චර්යා ගුණයක් බව මේ අයට අමතක විය. දියපාරකින් එක්තරා පිරිසක් දිය බොන නිසා කාටත් බොන්න බැරිවන ලෙස දියපාර වසා දැමීම ඔවුන්ගේ අදහස විය. එබඳු පුද්ගලයන් සමාජයේ තීරණගන්නා අංශවල හා පරිපාලන අංශවල නිරත වූ විට රටට සිදුවන විනාශය ඉමහත්ය.

යාචක ප්‍රශ්නය විසඳීම ක්‍රමවත් ක්‍රියාපරිපාටියක් අනුව සිදු විය යුතුය. සියලුම යාචකයන් අල්ලා වෙනත් ප්‍රදේශයක ගෙවල් දොරවල් තනා, කෘෂිකර්මය හෝ වෙනත් කාර්යක යොදන්නැයි බල කරමින් පුනරුත්ථාපනය කිරීමද අද ප්‍රචලිත අදහසකි. යාචකයන් එසේ පුනරුත්ථාපනය කළ එකද තැනක්වත් මා අදවන තෙක් ශ්‍රී ලංකාවේ තබා ලෝකයේ වෙන රටකවත් දැක නැත. අපේ පුංචි රටට මේ යාචක ප්‍රශ්නය විසඳීමට උවමනාවක් ඇත්නම් අමාරු නැත. අවශ්‍ය වන්නේ අනුකම්පාව හා අවබෝධයයි. මේ ගුණාංග දෙක නැතුව යොදන කිසිම සැලැස්මක් සාර්ථක වන්නේ නැත.

යාචකයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ගොඩනගා ගතහොත් ඒ ප්‍රතිපත්තියේ මූලිකාංග මෙසේ වෙතැයි හඟිමි.

1. සෑම අන්දමේ ජනප්‍රිය ආගමික ස්ථානයකටම යාතොට වැඩිහිටියන් සඳහා නිකේතන සකස් කළ යුතුය. ඒ ආගමික ස්ථානවලට එන පින්වතුන්ගේ ආධාර ඒ ස්ථානවලට ලබාගැනීම ඉතා වැදගත්ය.

2. ආබාධිත දරුවන් සඳහා රටපුරාම දෙරූ හා ළමා සුවබිම් (කෙමබිම්) පිහිටවීම යෙහෙකි. බොහෝ රාජ්‍ය නොවන සංවිධානවලට මෙහිලා ප්‍රධාන තැනක් ගත හැකිය.

මෙවැනි වැඩිහිටි මෙන්ම ළමා කෙම්බිම්වල ඒ අයගේ මූලික අවශ්‍යතා සපයාලීම ගැන මෙන්ම ඒ අයට ඉතා අවශ්‍ය මිනිස් සෙනහස ලබාදීම ඉතා වැදගත් වන්නේය.

3. යාචක පවුල් වෙනත් තැන්වල පුනර්රෝපනය කරනවා නම් දරුවන්ගේ අධ්‍යාපනය ඇතිකරලීමට මාර්ග යොදා, ඒ වැඩපිළිවෙල ගෙනයෑම යෙහෙකි.

4. නීතිය මගින් තරුණ අයට ළමා අයට හිඟාකෑම තහනම් කළ යුතුය.

5. වැඩිහිටි සරණ නිවාස දිවා සුරැකුම් මධ්‍යස්ථාන මෙන්ම අනා වර්ගවල ඒවාත් රටපුරා ඇතිකරලීමට අනුබල දිය යුතුය. වැඩිහිටියන්ට වාසි ගෙනදෙන ජාතික ප්‍රතිපත්තියක් රජය විසින් සකස් කිරීම යෙහෙකි.

6. ගැමි ප්‍රදේශවලින් නගරය කරා ඇදී එන පිරිස සොයා ඒ අයට යම් යම් කුශලතා පුරුදු කිරීම යෙහෙකි. ඒ අයගේ ප්‍රශ්න හඳුනාගෙන (පාසැල් හැරයාම, මත්පැන් භාවිතය, මත්ද්‍රව්‍ය ඇබ්බැහිය, මානසික ප්‍රශ්න, සූදුවට ගැතිවීම) වටහාගෙන ඒවා විසඳා ගැනීමට අනාගත දෙනා ගමන් මේ කුශලතා වර්ධනය සිදුකිරීම මැනවි.

7. ශ්‍රී ලාංකික සමාජයේ පැම අයෙකුටම වැඩිහිටියනට සරණවීම අනාථයන්ට පිහිට වීම ගැන අවබෝධයක් ලබාදිය යුතුය. පන්සල් ඉතා ලේසියෙන් දිවාසරණ මධ්‍යස්ථාන ලෙස යොදගත හැකිය. සන්නිවේදන මාධ්‍ය මෙන්ම අධ්‍යාපන ක්‍රමයද මේ සඳහා උපයෝගි කරගැනීම ඉතා අවශ්‍ය වෙයි.

8. ශ්‍රී ලාංකාවේ සංවර්ධිත සැලැස්මවල් පිළියෙල කිරීමේදී ඒවා තුල යාචකයන්ටද තැනක් ලබාදීම යෙහෙකි. මෙතෙක්කල් කිසිම සංවර්ධිත සැලැස්මකින් යාචකයන්ට යහපතක් වී නැත. ජනසවිය හා සමෘද්ධි සැලැස්මවල් ද යාචකයින් ගැන සලකා නොතිබීම කණගාටුවට හේතුවකි. දුප්පත්කම හා අන්ත දුගීකම ගැන කටයුතු කරන විට මේ අය ගැන සැලකීම ඉතා ප්‍රයෝජනවත්ය. දුගීකමේ අවම සීමාවටත් පහලින්ය මේ අය ජීවත්වන්නේ.